ශ්‍රී ලංකා
රක්ෂණ නියාමන
කොමිෂන් සභාව



අනාගතය සඳහා
ස්ථානගත කිරීම

වාර්ෂික වාර්තාව **2021**


පටුන

දැක්ම, මෙහෙවර	3
වසරේ වැදගත් සිදුවීම්	4
සභාපතිතුමාගේ පණිවිඩය	6
අධ්‍යක්ෂ ජෙනරාල්තුමියගේ සමාලෝචනය	10
කොමිෂන් සභාවේ සාමාජිකයින්	16
කොමිෂන් සභාවේ සාමාජිකයින් පිළිබඳව	18
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම	20
කාර්ය මණ්ඩලය	22
සමාලෝචන	
පොදු සමාලෝචනය	26
සංඛ්‍යානමය සමාලෝචනය	32
මෙහෙයුම් සමාලෝචනය	
- අධීක්ෂණ සමාලෝචනය	88
- නියාමන සමාලෝචනය	92
- විමර්ශන සමාලෝචනය	95
- වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සබඳතා සමාලෝචනය	98
- පරිපාලනමය සමාලෝචනය	101
- මූල්‍ය සමාලෝචනය	102
මූල්‍ය තොරතුරු	
- විගණකාධිපති වාර්තාව	106
- 2021 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම	116
- මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය	131
- මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය	132
- ශුද්ධ වත්කම් හා ප්‍රාග්ධන වෙනස්වීමේ ප්‍රකාශනය	133
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	134
- රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	135
- ගිණුම්කරණ ප්‍රතිපත්ති	136
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	142
පරිශිෂ්ඨය I	155
පරිශිෂ්ඨය II	156
පරිශිෂ්ඨය III	158
පාරිභාෂික ශබ්ද මාලාව	159

අනාගතය සඳහා
ස්ථානගත කිරීම

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව රක්ෂණ ඔප්පු හිමියන් ආරක්ෂා කිරීමට, නිරසාර රක්ෂණ කර්මාන්තයක් ඇති කිරීමට සහ ශක්තිමත් අධීක්ෂණ සහ නියාමන පාලන තන්ත්‍රයක් ඇති කිරීමට කටයුතු කරයි.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව අපගේ සමාජය සහ ආර්ථිකය අවදානම්වලට වඩාත් ඔරොත්තු දෙන තත්ත්වයට පත් කිරීමට කැපවී සිටියි. අපි වැදගත් සම්පත් ආයෝජනය කරන අතර මෙරට රක්ෂණ ඔප්පු හිමියන් ආරක්ෂා කිරීම සඳහා කර්මාන්තය සමග සහයෝගයෙන් කටයුතු කරන්නෙමු.





ශ්‍රී ලංකා
රක්ෂණ නියාමන
කොමිෂන් සභාව

දැක්ම

ආසියාවේ රක්ෂණ නියාමනයේ මිනුම් ලකුණ බවට පත්වීම.

මෙහෙවර

රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම සහ අභිවෘද්ධිය සඳහා පහසුකම් සැලසීම සිදුකරලමින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ යහපත සුරැකීම.



වසරේ වැදගත් සිදුවීම්

27
රක්ෂණ සමාගම්

70
රක්ෂණ තැරැව්කාර සමාගම්

43,934
රක්ෂණ සමාගම් නියෝජනය කරන රක්ෂණ නියෝජිතයින්

560
රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලියාපදිංචි රක්ෂණ නියෝජිතයින්

(Facebook, LinkedIn and YouTube)
සමාජ මාධ්‍ය නාලිකා එළිදැක්වීම

කොමිෂන් සභාවේ 20 වැනි සංවත්සර සැමරුම 2021/03/01 දින

රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය

	2021	2020	වෙනස %
දළ ලිඛිත වාරික ආදායම (රු. මිලියන)	233,512	208,265	12.12
මුළු වත්කම් (රු. මිලියන)	888,377	796,412	11.55
දළ දේශීය නිෂ්පාදනයේ % ලෙස ව්‍යාප්තිය	1.39	1.39	-
රක්ෂණ ඝනත්වය (රු.)	10,539	9,502	10.91

කොමිෂන් සභාවේ කාර්යසාධනය

ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදල (රු. මිලියන)	8,441.42	7,468.72	13%
සෙස් ආදායම (රු. මිලියන)	543.91	506.14	7%
වාර්ෂික ගාස්තුව (රු. මිලියන)	257.76	244.90	5%

රු. මිලියන 888,377
රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම්

රු. මිලියන 233,512
රක්ෂණ කර්මාන්තයේ දළ ලිඛිත වාරික ආදායම



සභාපතිතුමාගේ පණිවිඩය



රසික් සරූක් - ජනාධිපති නීතීඥ
සභාපති

සභාපතිතුමාගේ පණිවිඩය

කර්මාන්තයේ මුළු දළ ලිඛිත වාරිකය 12.12% ක ස්ථාවර වර්ධන වේගයක් පෙන්නුම් කරමින් 2021 දී වාර්තා වූ රු.මි. 208,265 ට සාපේක්ෂව රු.මි. 233,512 දක්වා ඉහළ ගියේය. වාරික වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වන්නේ දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයයි.

2020 වසරේ දී ඇති වූ වසංගතයත් සමග ශ්‍රී ලංකා ආර්ථිකයේ හැකිලීමක් සිදු වූ අතර 2021 දී එය යථා තත්ත්වයට පත්වෙමින් තිබුණි. කෙසේ වුවද, නැවත වරක් කොවිඩ්-19 වෛරසයේ ප්‍රභේද මතුවීමත් සමග රටේ ආර්ථික තත්ත්වය අනපේක්ෂිත ආකාරයෙන් වෙනස් විය. ජාතියක් වශයෙන් ශක්තිමත් ශ්‍රී ලංකාවක් ගොඩනැගීමේ අභියෝගයත් සමග අපි "නව සාමාන්‍ය" ජීවින ක්‍රමයකට හැඩ ගැසෙමින් සිටිමු. මෙම අභියෝග සහ අස්ථාවරත්වයන් මධ්‍යයේ 2021 සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

කාර්යසාධනය පිළිබඳ විශ්ලේෂණය

2021 දී ශ්‍රී ලංකාව කොවිඩ්-19 දෙවන සහ තෙවන රැල්ලට මුහුණ දුන් බැවින් රක්ෂණ කර්මාන්තය ඇතුළු සියලුම ව්‍යාපාර දැවැන්ත අභියෝග රැසකට මුහුණ දුන්නේය. "අතීතයේ නිසි ලෙස ක්‍රියාත්මක වූ දේ අනාගතයට සූදානම් වීමට ප්‍රමාණවත් නොවනු ඇත" යන සත්‍යය අවබෝධ කර ගැනීමෙන්, රක්ෂණ ක්ෂේත්‍රයේ යහපැවැත්ම සඳහා නවෝත්පාදන සහ ඩිජිටල් පරිවර්තනය හරහා අභියෝගවලට මුහුණ දීමට ශ්‍රී ලාංකීය රක්ෂණ කර්මාන්තය ඉක්මනින් අනුගත විය.

කර්මාන්තයේ මුළු දළ ලිඛිත වාරිකය 12.12% ක ස්ථාවර වර්ධන වේගයක් පෙන්නුම් කරමින් 2021 දී වාර්තා වූ රු.මි. 208,265 ට සාපේක්ෂව රු.මි. 233,512 දක්වා ඉහළ ගියේය. වාරික වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වන්නේ දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයයි. එමගින් 2021 දී රු.මි. 124,752 ක දළ ලිඛිත වාරිකයක් ජනනය කරන ලද අතර අතර එය 21.12% ක ඉහළ යාමකි. වසංගතයේ පැතිරීම මගින් මහජනතාවගේ අවදානම් පිළිබඳ දැනුවත්භාවය ඉහළ නංවා ඇති අතර ජීවිත ආරක්ෂාවේ අවශ්‍යතාවය වැඩි දියුණු කළේය. තවද, බොහෝ රක්ෂණකරුවන් බාධාවලින් තොර හිමිකම් පියවීම් ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීම සහ වසංගතයෙන් පීඩාවට පත් වූ ගනුදෙනුකරුවන්ට වැඩි ප්‍රතිලාභ ලබා දීම හේතුවෙන් රක්ෂණය පිළිබඳ මහජන විශ්වාසය වර්ධනය වීමට පටන් ගත්තේය. වසර තුළ දීර්ඝ කාලීන රක්ෂණ කර්මාන්තයේ කැපී පෙනෙන වර්ධනයට මූලිකව දායක වූයේ මෙම ප්‍රධාන අංග දෙකයි.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය 2021 දී 3.32% ක මධ්‍යස්ථ වර්ධනයක් අත්කර ගත්තේය. කෙසේ වෙතත්, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය 2018 සහ 2019 දී 7% ක පමණ වාරික වර්ධනයක් අත්කර ගත් පූර්ව වසංගත තත්වයට වඩා වර්ධන වේගය තවමත් පසුගාමී ය. මෝටර් රථ ආනයනය තහනම් කිරීමට රජය ගත් තීරණය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වාරික අයකර ගැනීමට බාධාවක් වූ මූලික හේතුව විය. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත දළ ලිඛිත වාරිකවලින් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් හිමි මෝටර් රථ රක්ෂණ පන්තිය, 2021 දී ඍණ වාරික වර්ධනයක් වාර්තා කළේ, මූලික වශයෙන් මෝටර් රථ ආනයනය තහනම් කිරීම හේතුවෙනි. කොවිඩ්-19 වසංගතයේ පසුකාලීන වැඩි වීම හේතුවෙන් වාරික අය කර ගැනීම තවත් දුෂ්කර විය. විශේෂයෙන් වසරේ තුන්වන කාර්තුවේදී අධික ලෙස බෝවන ඩෙල්ටා ප්‍රභේදය රට තුළ වේගයෙන් ව්‍යාප්ත වීම නිසා රට අගුලු දැමීම් සහ සංචරණය සීමා කිරීම් දිගටම පැවතුනි. මෙම අහිතකර තත්ත්වයන් යටතේ වුවද, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ අනෙකුත් සියලුම රක්ෂණ පන්ති වසර තුළ ධනාත්මක ව්‍යාපාර වර්ධනයක් පෙන්නුම් කර ඇත.

වර්තමාන වෙළඳපල මිල අනුව දළ දේශීය නිෂ්පාදිතයේ සමාන සමානුපාතික වැඩිවීමක් හේතුවෙන් රක්ෂණ ව්‍යාප්තියේ අනුපාතය පෙර වසරට සාපේක්ෂව 1.39% ලෙස නොවෙනස්ව පවතී. කලාපය තුළ සාපේක්ෂව අඩු රක්ෂණ ව්‍යාප්තියක් තිබුණද, ශ්‍රී ලංකාවට රක්ෂණය කරන ලද පාඩු සහ රක්ෂණය නොකරන ලද පාඩු අතර පුළුල් ආරක්ෂක පරතරයක් ඇති අතර, රට නිරන්තර ස්වාභාවික විපත්වලට නිරාවරණය වන බැවින් සහ අනතුරු සහ රෝගාබාධවලින් පැන නගින පාඩු ආර්ථික හා සමාජීය ගැටලුවලට තුඩු දෙයි.

ප්‍රධාන ජයග්‍රහණ සහ නිවැරදි මාවතට යොමු කිරීම

සාර්ථකත්වය යනු පරිපූර්ණත්වයේ ප්‍රතිඵලයකි; ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව 2001 වර්ෂයේ ස්ථාපිත කළ දින සිට රක්ෂණ කර්මාන්තයේ දියුණුව සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ අභිරුචීන් සුරක්ෂිත කිරීම සඳහා නියාමන ක්‍රියාමාර්ග අඛණ්ඩව ගෙන ඇත.

සභාපතිතුමාගේ පණිවිඩය

රක්ෂණ ක්ෂේත්‍රය තුළ සිය බලතල ක්‍රියාත්මක කරන අතරම, පාරිභෝගික අයිතීන් සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ රක්ෂණ නිෂ්පාදන මිලදී ගැනීමේදී වඩාත් දැනුවත්භාවයකින් යුතු තීරණ ගැනීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මහජනතාව සවිබල ගැන්වීම අඛණ්ඩව සිදු කර ඇත. සමාලෝචනයට ලක්වන කාල සීමාව තුළ, මුද්‍රිත, විද්‍යුත් සහ සමාජ මාධ්‍ය හරහා පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් සිදු කරමින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මහජනතාව සවිබල ගැන්වීම අඛණ්ඩව සිදු කර ඇත. කොමිෂන් සභාව මගින් එවැනි දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ අරමුණ වන්නේ රක්ෂණ ආවරණය සම්බන්ධයෙන් වන අයිතිය, රක්ෂණයේ වැදගත්කම, රක්ෂණ කර්මාන්තය සහ එහි නවතම වර්ධනයන්, සුදුසු රක්ෂණ නිෂ්පාදන තෝරාගැනීම, රක්ෂණ ඔප්පු හිමියන්ගේ දුක්ගැනවිලි සම්බන්ධයෙන් විසඳුම් ලබා ගැනීම සඳහා වන යාන්ත්‍රණයන් යනාදිය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම මගින් වර්තමාන සහ අනාගත රක්ෂණ හිමියන්ගේ රුචිකත්වයන් ආරක්ෂා කිරීමයි.


අනාගතය සඳහා වන අභියෝග

2022 තවත් අභියෝගාත්මක වසරක් වෙතැයි අපි අපේක්ෂා කරමු. තාක්ෂණය සහ ඩිජිටල්කරණය සමග අප ඉදිරියට ගමන් කිරීමත් සමග දත්ත ආරක්ෂාව සහ පාරිභෝගිකයින්ගේ පෞද්ගලිකත්ව අවශ්‍යතා සහතික කිරීම සඳහා කර්මාන්තය සයිබර් ආරක්ෂාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. මීට අමතරව, රක්ෂණ ක්ෂේත්‍රයේ ශ්‍රම බලකාය නම්‍යශීලී සහ නිර්මාණශීලී විය යුතු අතර ඔවුන්ගේ අධ්‍යාපනය දිගටම කරගෙන යාමට, ගෝලීය ව්‍යාපාරික පරිසරය පිළිබඳ පුළුල් ලෙස සිතීමට සහ වේගවත් වෙනසක් සඳහා සූදානම් වීමට අවශ්‍ය වනු ඇතැයි මම විශ්වාස කරමි. අප අඛණ්ඩව අනුවර්තනය වෙමින් නව්‍යකරණය කරන විට, අභියෝගවලට මුහුණ දීමට ප්‍රමාණවත් ලෙස ස්ථානගත වීමට අපට හැකි වනු ඇතැයි මම විශ්වාස කරමි.

අගය කිරීම

කොමිෂන් සභාවේ දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා කොමිෂන් සභාවේ මාගේ සගයන්ගේ දායකත්වය සහ ප්‍රයත්නයන් වෙනුවෙන් මාගේ කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. සියලුම රක්ෂණ සමාගම්, තැරැව්කරුවන් සහ බලයලත් අතරමැදියන්, ශ්‍රී ලංකා රක්ෂණ සංගමය, ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය, ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය ඇතුළු සියලුම ක්ෂේත්‍ර පාර්ශවකරුවන්ට සහ රක්ෂණ ඔම්බුඩ්ස්මන්හට ඔවුන්ගේ අඛණ්ඩ සහාය, විශිෂ්ට සහයෝගීතාව සහ අප සම අඛණ්ඩව පවත්වාගෙන යන සුහද සම්බන්ධතාව වෙනුවෙන් මම ස්තූතිවන්ත වෙමි.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යක්ෂ ජෙනරාල්, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම සහ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ වෘත්තීයභාවය සහ කැපවීම විශේෂයෙන් අගය කිරීමට කැමැත්තෙමි.



රසික් සරූක් - ජනාධිපති නීතීඥ
සභාපති



අධ්‍යක්ෂ ජෙනරාල්තුමියගේ සමාලෝචනය



දමයන්ති ප්‍රනාන්දු
අධ්‍යක්ෂ ජෙනරාල්

අධ්‍යක්ෂ ජෙනරාල්තුමියගේ සමාලෝචනය

සාමාන්‍ය රක්ෂණ කර්මාන්තයේ විවිධ උප පන්තිවලින් දළ ලිඛිත වාරිකයක් ජනනය කිරීමට දායක වූ මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2021 දී 6,620,274 ක් විය. 2020 ට සාපේක්ෂව මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 80,719 කින් වැඩි වී ඇත.

2021 වසර සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ජයග්‍රහණ පිළිබඳ වාර්තා කිරීමට ලැබීම පිළිබඳ මම සතුටට පත් වෙමි.

2021 වසරේදී ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට වසර 20 ක් ගත වීම හේතුවෙන් 2021 වසර කොමිෂන් සභාවට චේතිහාසික වශයෙන් වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. පසුගිය දශක දෙක තුළ, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අවංකභාවයෙන් සහ වෘත්තීමය හා විචක්ෂණශීලී අයුරින් රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යන බවට වග බලා ගන්නා අතරම එහි ප්‍රධානම වගකීම වන රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා තම නියාමන ව්‍යුහය සමතුලිත කිරීමත් සිදු කරන ලදී. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ස්ථාපිත කළ දින සිට එය සන්ධිස්ථාන ගණනාවක් පසු කර ඇත. ඒවා අතර රක්ෂණ කර්මාන්තයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එය ඵලදායී අයුරින් නියාමනය කිරීමට නීතිරීති, රෙගුලාසි සහ මාර්ගෝපදේශ සම්පාදනය කිරීම, ඉහළ යන ඉල්ලුමට සරිලන පරිදි වසර 2007, 2011 සහ 2017 දී 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත සංශෝධනය කිරීම, රක්ෂණ ඔම්බුඩ්ස්මන් යෝජනා ක්‍රමය ස්ථාපිත කිරීම සඳහා සහාය වීම, රක්ෂණ නියෝජිතයන් ලෙස කටයුතු කරන පුද්ගලයන් සඳහා ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය හරහා නිපුණතා පරීක්ෂණ පැවැත්වීම හඳුන්වා දීම, 2015 වසරේ සිට නීති පාදක ප්‍රාග්ධන රාමුවක සිට අවදානම් පාදක ප්‍රාග්ධන රාමුවක් කරා ගමන් කිරීම, අවදානම් පාදක අධීක්ෂණ රාමුවක් සැලසුම් කිරීම සහ යොදා ගැනීම, සංයුක්ත රක්ෂණ සමාගම් පද්ධතිය අහෝසි කිරීම සහ ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වෙනස් ආයතන ලෙස බෙදා වෙන් කිරීම, කර්මාන්තයේ ණය භාවිතය සංවිධිත කිරීම සඳහා වාරික ගෙවීමේ ඇපය (PPW) පිළිබඳ වගන්තිය හඳුන්වා දීම, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව මගින් සිය සමාගම් බලපත්‍රලාභී කොටස් හුවමාරුවක් මත ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාව ඇති කිරීම, අ.පොස. (සා.පෙළ) සහ අ.පො.ස. (උ.පෙළ) විභාග සඳහා වාණිජ විෂය ධාරාව යටතේ වන විෂයක් ලෙස රක්ෂණය හඳුන්වා දීමට ජාතික අධ්‍යාපන ආයතනය සමග විෂය නිර්දේශයක් සකස් කිරීම, රක්ෂණ ඔප්පු හිමියන්ගේ දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ රක්ෂණ හිමිකම් පියවීමට පහසුකම් සැලසීම සඳහා අංග සම්පූර්ණ විමර්ශන අංශයක් පිහිටුවීම, අවශ්‍ය පරිදි 98 වැනි වගන්තිය යටතේ නියෝග පැනවීම, නියාමකයාගේ නම ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ (IBSL) සිට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ලෙස වෙනස් කිරීම, සැප්තැම්බර් 1 වනදා ජාතික රක්ෂණ දිනය ලෙස ප්‍රකාශයට පත් කරන ලෙස ඉල්ලා සිටීම, රක්ෂණය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා සාමූහික සමාජ වගකීමට අදාළ මුල පිරීම් සිදු කිරීම සහ දිවයින පුරා රක්ෂණය පිළිබඳ පාරිභෝගික අධ්‍යාපන වැඩසටහන්/වැඩමුළු/සම්මන්ත්‍රණ පැවැත්වීම.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි 20 වැනි සංවත්සරයට අදාළව, වඩාත් පරිශීලක-හිතකාමී සහ අන්තර්ගතය පදනම් කරගත් තොරතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවිය නැවත ආරම්භ කර ඇති අතර, දැනුවත් කිරීම් වඩාත් හොඳින් සිදු කිරීම සඳහා රක්ෂණය පිළිබඳ පණිවිඩ බෙදා හැරීම සහ දැනුවත් භාවයෙන් යුතු පාරිභෝගිකයන් ඇති කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා YouTube නාලිකාව, Facebook සහ LinkedIn ආරම්භ කරන ලදී.

කොවිඩ්-19 වසංගතය අඛණ්ඩව ආර්ථික කටයුතුවලට බාධා එල්ල කළ බැවින් 2021 වසර රක්ෂණ අංශයේ ආයතන සහ රක්ෂණ පාරිභෝගිකයින්ට අභියෝගාත්මක වසරක් විය. අභියෝගාත්මක මෙහෙයුම් තත්වයක් තිබියදීත්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන බවට වගබලා ගත් අතර රක්ෂණ ඔප්පු හිමියන්ගේ විශ්වාසය ඉහළ නංවමින් ශක්තිමත් රක්ෂණ කර්මාන්තයක් ඇති කිරීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කර ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් කොවිඩ්-19 හේතුවෙන් සිදු වූ කඩා වැටීම නිසා ඇති වී තිබෙන අවිනිශ්චිතතාවයන්ට එරෙහිව රක්ෂණ කර්මාන්තයේ ස්ථායීතාව සහ රක්ෂණ ඔප්පු හිමියන්ට නම්‍යශීලී ලෙස සැලකීම සහතික කිරීම පිණිස විචක්ෂණශීලීව නියාමන ක්‍රියාමාර්ග ගෙන ඇත. කොමිෂන් සභාව එහි ප්‍රමුඛතම කාර්යයක් වන රක්ෂණ ඔප්පු හිමියන් ආරක්ෂා කිරීමට කැපවී සිටියි. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම ඉහළ නැංවීමට පියවර ගෙන ඇත. තවද, බොහෝ රක්ෂණකරුවන් කරදරයකින් තොර හිමිකම් පියවීම් ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීම සහ වසංගතයෙන් පීඩාවට පත් වූ ගනුදෙනුකරුවන්ට වැඩි ප්‍රතිලාභ ලබා දීම නිසා රක්ෂණය පිළිබඳ මහජන විශ්වාසය වර්ධනය වීමට පටන් ගත්තේය.

අධ්‍යක්ෂ ජෙනරාල්තුමියගේ සමාලෝචනය

ප්‍රධාන නියාමන මූලපිරිමි

කොමිෂන් සභාව පනතේ 96 (අ) වගන්තිය යටතේ වසර තුළ පහත සඳහන් විධානයන් නිකුත් කරන ලද අතර ඒවා පිළිබඳ විස්තර සාමාන්‍ය සමාලෝචනයේ දක්වා ඇත:

- 2021 විධාන අංක 01 - ලාභාංශ ප්‍රකාශනය සහ බෙදා හැරීම
- 2021 විධාන අංක 2 - කේත සැපයීම සහ කේත වෙනස් කිරීම පිළිබඳ සීමාව
- 2021 විධාන අංක 03 - මූල්‍ය අවභාවිතය හෝ වංචාව පදනම් කරගෙන සේවයෙන් පහ කිරීමට තීරණය කිරීමට පෙර නිසි ක්‍රියා පටිපාටිය අනුගමනය කර, විශේෂයෙන්ම ස්වභාවික යුක්ති මූලධර්මවලට අනුව කටයුතු කර සේවය අවසන් කරන ලද ඕනෑම පුද්ගලයෙකු ඕනෑම රැකියාවක යෙදවීමෙන් වැළකීම.
- 2021 විධාන අංක 4 - විදුලි සංදේශ සේවා සපයන්නන්ගේ සේවාවන් (ජංගම දුරකථන හරහා රක්ෂණය) සහ ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික කරුණු භාවිතය අවසන් කිරීම
- 2021 විධාන අංක 5 - රක්ෂණකරුවන්ගේ සහ රක්ෂණ තැරැව්කරුවන්ගේ ප්‍රධාන නිලධාරීන් පිළිබඳ විධාන අංක 9 (2016 මැයි 13) සංශෝධනය කිරීම

රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය

දළ ලිඛිත වාරිකය හා ව්‍යාප්තිය

2021 දී කර්මාන්තයේ මුළු දළ ලිඛිත වාරිකය (GWP) 12.12% ක ස්ථාවර වර්ධන වේගයක් පෙන්නුම් කරමින් 2020 දී වාර්තා වූ රු.මි. 208,265 ට සාපේක්ෂව රු.මි. 233,512 දක්වා ඉහළ ගියේය. වාරික වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක වන්නේ දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය වන අතර එය වසංගතය පැතිරීමත් සමග අවදානම් පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය ඉහළ යාම සහ ජීවිත ආරක්ෂාව සඳහා වන අවශ්‍යතාවය ඉහළ යාම හේතුවෙන් වසර තුළ සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කරයි. කර්මාන්තයේ දළ ලිඛිත වාරිකය 2017 දී වාර්තා වූ රු.මි. 164,960 ට සාපේක්ෂව 41.56% ක වර්ධනයක් පෙන්නුම් කළේය. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය 2021 දී යළිත් වර්ධනය වූ අතර 3.32% ක මධ්‍යස්ථ වර්ධනයක් අත්කර ගත්තේය. කෙසේ වෙතත්, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය 2018 සහ 2019 දී 7% ක පමණ වාරික වර්ධනයක් අත්කර ගත් පූර්ව වසංගත තත්වයට වඩා වර්ධන වේගය තවමත් පසුගාමී ය. 2021 අවසානය වන විට වෙළඳපොලේ ක්‍රියාත්මක වූ රක්ෂණ තැරැව්කාර සමාගම් මුළු දළ ලිඛිත වාරිකයෙහි 12.97% ක් නියෝජනය කරමින් රු.මි. 30,286 ක දළ ලිඛිත වාරිකයක් ජනනය කර ඇත.

සමස්ත දළ ලිඛිත වාරිකයෙහි කැපී පෙනෙන ඉහළ යාමත් සමග වුවද රක්ෂණ විනිවිද යාමේ අනුපාතය පෙර වසරට සාපේක්ෂව 1.39% හි නොවෙනස්ව පවතියි. පසුගිය වසර හත පුරාවට, රක්ෂණ විනිවිදීම 2017 දී වාර්තා වූ 1.24% සිට 2021 දී 1.39% දක්වා සුළු වශයෙන් ඉහළ ගොස් ඇත. අඩු උපයෝජ්‍ය ආදායම් මට්ටම් සහ රක්ෂණය කෙරෙහි වන අඩු අවධානය ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාප්තිය ඉහළ යාමට බලපාන ප්‍රධාන බාධක ලෙස පැවතුනි. රක්ෂණ සේවා විවිධ අංශවලට සහ විවිධ ස්ථානවලට ව්‍යාප්ත කිරීමෙන් ආරක්ෂණ පරතරය පියවා ගැනීමට කර්මාන්තය කැප වී සිටියි. ඒක පුද්ගල රක්ෂණ වාරික ප්‍රමාණය නියෝජනය කරන රක්ෂණ ඝනත්වය, වර්ෂය තුළදී රු. 9,502 සිට රු. 10,539 දක්වා හිතකර අන්දමින් වැඩිවීමක් පෙන්නුම් කළේය.

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි කාර්යසාධනය

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය එහි ප්‍රගතිශීලී ප්‍රවණතාව අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර 21.12% ක කැපී පෙනෙන දළ ලිඛිත වාරික වර්ධනයක් වාර්තා කළ අතර වාරික ආදායම අනුව රු.බී. 125 සීමාවට ළඟා වූ අතර පසුගිය වසර පහ තුළ ජීවිත රක්ෂණ අංශයේ ඉහළම වර්ධන වේගය වාර්තා කළේය. ව්‍යාපාර සහ මෙහෙයුම් ආකෘති ඩිජිටල්කරණය, නව්‍ය නිෂ්පාදන පිරිනැමීම්, බෙදාහැරීමේ නාලිකා ප්‍රශස්තකරණය ආදිය ජීවිත රක්ෂණ අංශයේ මෙම ප්‍රශංසනීය වර්ධනයට දායක වී ඇත. තවද, වසංගතය හේතුවෙන් අවිනිශ්චිතතාවයන්, රක්ෂණයේ වැදගත්කම සහ රක්ෂණ කර්මාන්තය පිළිබඳ විශ්වාසය මහජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවීම මගින් ජීවිත රක්ෂණ ක්ෂේත්‍රය වර්ධනයට දායක වී ඇත. 2017 සිට 2021 දක්වා, වන පසුගිය වසර පහ තුළ දිගුකාලීන රක්ෂණ කර්මාන්තය 10% කට වඩා වැඩි ස්ථාවර අනුපාතයකින් වර්ධනය වී ඇත. 2021 දී ජීවිත රක්ෂණ වෙළෙඳපොළ ව්‍යාප්තිය 0.74% ලෙස වාර්තා විය. වෙළෙඳපොළ ව්‍යාප්තිය ඉහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ ද අනෙකුත් රටවල් හා සසඳන විට එය තවමත් පහළ මට්ටමක පවතී.

2021 අවසානය වන විට බලාත්මක වූ මුළු ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 4,297,794 ක් වූ අතර එය 2020 දී වාර්තා වූ ප්‍රබල වර්ධනයට සාපේක්ෂව 5.76% ක සාමාන්‍ය වර්ධනයකි. නිකුත් කරන ලද නව ජීවිත රක්ෂණ ඔප්පු ප්‍රමාණය 3.37% කින් පහත වැටුණු අතර එම ප්‍රමාණය 873,762 ක් විය. බලාත්මකව පවතින ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස 19.40% ක් ද බලාත්මකව පවතින ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස 50.25% ක් ද විය.

සමාලෝචිත වර්ෂය තුළ දිගුකාලීන රක්ෂණකරුවන් විසින් දරන ලද හිමිකම්පෑම් රු.මි. 46,113 දක්වා තවදුරටත් ඉහළ ගොස් 21.64% ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි කාර්යසාධනය

පවතින කොවිඩ්-19 තත්වයන් සහ අභියෝගාත්මක ආර්ථික වටපිටාව මධ්‍යයේ වුවද සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රය පෙර වසරේ 2.25% ක අහිතකර ප්‍රවණතාවයට සාපේක්ෂව 3.32% ක සුළු ප්‍රගතියක් පෙන්නුම් කළ අතර එය රු.මි. 108,760 ක වාරික ආදායමක් වාර්තා කරමින් පසුගිය වසර පහ සඳහා වන ඉහළ ම දළ ලිඛිත වාරිකය වාර්තා කර ඇත. මෝටර් රථ ආනයනය සඳහා පනවා ඇති සීමාවන් පුළුල් කිරීම හේතුවෙන් 2021 වර්ෂයේදී මෝටර් රථ අලුතින් ලියාපදිංචි

අධ්‍යක්ෂ ජෙනරාල්තුමියගේ සමාලෝචනය

කිරීම අඛණ්ඩව පහත වැටුණු අතර 2020 දී වාර්තා වූ 44.8% ක පහත වැටීමට සාපේක්ෂව නව මෝටර් රථ ලියාපදිංචිය 83.3% ක සැලකිය යුතු අඩු වීමක් වාර්තා කර ඇත. එසේ වුවද, සමස්ත සාමාන්‍ය රක්ෂණ කර්මාන්තය 2021 දී ප්‍රගතියක් අත්කර ගනිමින් පසුගිය වසර පහ සඳහා වූ ඉහළම දළ ලිඛිත වාරිකය වෙත ළඟා විය.

සාමාන්‍ය රක්ෂණ කර්මාන්තයේ විවිධ උප පන්තිවලින් දළ ලිඛිත වාරිකයක් ජනනය කිරීමට දායක වූ මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2021 දී 6,620,274 ක් විය. 2020 ට සාපේක්ෂව මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 80,719 කින් වැඩි වී ඇත. තවද, පසුගිය වසර පහ තුළ මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාව සුළු වශයෙන් ඉහළ ගිය අතර 2021 දී 8.04% ක වර්ධනයක් වාර්තා කළේය. පෙර වසරවලට සමානව බහුතරය මෝටර් රථ උප පන්තිය නියෝජනය කළ අතර එය තෙවන පාර්ශ්ව රක්ෂණ ඔප්පු 3,285,221 කින් සහ විස්තීරණ රක්ෂණ ඔප්පු 2,671,816 කින් සමන්විත විය.

පසුගිය වසර පහ සමඟ සසඳන විට සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරයේ හිමිකම් පෑම් පෙර වසරේ 27.80% ක අඩු වර්ධනයට සාපේක්ෂව 2021 වසර සඳහා 42.71% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2020 වසර තුළ සිදු වූ අගුලු දැමීම් කිහිපයක ප්‍රතිඵලයක් ලෙස, විශාල හිමිකම් ප්‍රමාණයක් ප්‍රමාද වීම සහ ඒවා නිෂ්කාශනය කිරීම 2021 වර්ෂයේදී සිදු වීම හේතුවෙන් සෞඛ්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ හිමිකම් පෑම් වල ක්ෂණිකව ඉහළ යාමක් පෙන්නුම් කළේය. මීට අමතරව, නව කොවිඩ්-19 ප්‍රභේදයන් සංසරණය වීම සහ රෝගීන් සංඛ්‍යාව ඉහළ යාම වෛද්‍ය අවශ්‍යතා කෙරෙහි පුද්ගලයින්ගේ අවධානය වේගයෙන් ඉහළ නැංවූ අතර එය අවසානයේ සෞඛ්‍ය රක්ෂණ අංශයේ හිමිකම් පෑම්වල ඉහළ නැංවීමට ඉවහල් විය. හිමිකම් පෑම් වැඩිවීම හේතුවෙන් සාමාන්‍ය රක්ෂණ කර්මාන්තය ලාභය සුළු වශයෙන් අඩු වීමක් පෙන්නුම් කළේය. බොහෝ රක්ෂණකරුවන් ඩිජිටල් ක්‍රියාවලීන් වෙත වේගවත්ව හා බාධාවකින් තොරව මාරු වීම ඇති බැවින් පාරිභෝගික සබඳතාව දවස පුරාවටම පවත්වාගෙන යයි. එම නිසා වසර පුරාවට පාරිභෝගිකයන්ට අඛණ්ඩ සේවාවක් ලබාදීමට රක්ෂණකරුවෝ සමත් වූහ. වසංගතයෙන් විල්ලව වන බාධා ජයගැනීමේ ක්‍රමවේදයක් ලෙස ශ්‍රී ලංකාවේ රක්ෂණ සමාගම් වාරික චකිතු කිරීම, හිමිකම් ගෙවීම ආදියට අදාළව රක්ෂණ ඔප්පු හිමියන්ට ප්‍රතිලාභ කිහිපයක් ලබා දී ඇත.

ලාභදායී බව

2021 වසර සඳහා රු.මි. 42,762 ක ලාභයක් සහිත සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් රක්ෂණ ක්ෂේත්‍රය සමස්ත ලාභදායීත්වයේ (බදු පෙර ලාභය) 2.03% ක සුළු අඩු වීමක් අනාවරණය කළේය.

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය 2021 කාර්ය සාධනයට අදාළව යථා තත්වයට පත් වූ අතර ලාභදායීත්වයේ 20.82% ක වර්ධනයක් ළඟා කරගෙන ඇත. සමස්තයක් ලෙස ගත් කල, දළ ලිඛිත වාරිකයෙහි වර්ධනය, වසර තුළ ජනනය කරන ලද හිතකර ශුද්ධ ආයෝජන ආදායම සහ බොහෝ දිගු කාලීන රක්ෂණකරුවන් විසින් අනුගමනය කරන ලද දැඩි පිරිවැය ප්‍රශස්තිකරණය සහ සීමා කිරීමේ ක්‍රියාමාර්ග ලාභදායී බව ඉහළ නැංවීමට මූලිකව දායක විය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් මරණ ප්‍රතිලාභ, කල්පිරීමේ දී සිදු කරන ගෙවීම් සහ පවාරණ ගෙවීම්වල වැඩිවීම හේතුවෙන් රක්ෂණ හිමියන්ට හිමිකම් සහ ප්‍රතිලාභ මධ්‍යස්ථ ඉහළ යාමක් දක්නට ලැබුණු අතර එය ලාභදායී බව කෙරෙහි අහිතකර අන්දමින් බලපෑවේය.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත ලාභය වසරින් වසර 18.48% කින් පහත වැටී ඇත. වර්ෂය තුළ සාමාන්‍ය රක්ෂණ හිමිකම් පෑම් 13.72% කින් ඉහළ ගොස් ඇති අතර එමගින් ආර්ථික ක්‍රියාකාරකම් සහ සංචරණය සාමාන්‍යකරණය වීම පිළිබිඹු කරයි. එසේ වුවද, 2021 දී අමතර කොටස්වල මිල විශාල ලෙස ඉහළ ගියද මෝටර් රථ හිමිකම් පෑම් අඩු විය.

අනාගත දැක්ම

2022 තවත් අභියෝගාත්මක වසරක් වන බවැයි අපි අපේක්ෂා කරමු. රක්ෂණ වෙලඳපොල සුපරීක්ෂාකාරීව සිටිය යුතු අතර වසංගතයේ බලපෑම් කළමනාකරණය කිරීම මෙන්ම ආර්ථික පීඩනය හේතුවෙන් සිදුවිය හැකි ඕනෑම අනපේක්ෂිත අස්ථාවරත්වයක් කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතුය. නව පරිසරයක් තුළ ස්ථාවරව පැවතීම සඳහා ව්‍යාපාර ආකෘතීන් වෙනස් කරන අතරම වර්ධනයක් පවත්වා ගැනීමට ඉඩ සලසන අවස්ථාවන් රක්ෂණ කර්මාන්තය විසින් ලබා ගැනීම වැදගත් වේ.

2021 දී ගංවතුර සහ නියඟයන් අඛණ්ඩව පැවතීමෙන් ඇති විය හැකි අනතුර අවධාරණය කරයි. අනාගතයේදී ප්‍රබල ස්වභාවික විපත් ඇතිවීමට ඉඩ ඇති අතර වසංගතය එහි තුන්වන වසර දක්වා පැවතීම හේතුවෙන් ඵලදායී සෞඛ්‍ය උපාය මාර්ගයක් අත්‍යවශ්‍ය වේ. එබැවින්, නවෝත්පාදනය සහ ඔරොත්තු දීමේ හැකියා වර්ධනය දිරි ගන්වන සේවා පරිසරයන් සපයන අතරම ඕනෑම තත්වයකට අනුවර්තනය වීමට රක්ෂණ ව්‍යාපාර ආකෘතිය වැඩිදියුණු කිරීමට රක්ෂණකරුවන් නිරන්තරයෙන් ක්‍රම සෙවිය යුතුය.

එපමණක් නොව, පාරිභෝගික අධ්‍යාපනය, හිමිකම් පෑම් හැසිරවීම සහ පැමිණිලි නිරාකරණය මගින් රක්ෂණ ක්ෂේත්‍රය කෙරෙහි විශ්වාසය ගොඩනඟා ගැනීමට සහ ශක්තිමත් කිරීමට රක්ෂණකරුවන්ට උපකාර කළ හැකි අතර ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ අංශවල රක්ෂණ ප්‍රමාණය ඉහළ නැංවීම සඳහා ධනාත්මක පෙළඹවීමක් ඇති කළ හැකිය. මූල්‍ය සාක්ෂරතාවයෙන් යුත් පාරිභෝගිකයින්ට අවදානම් තක්සේරු කිරීමට සහ රක්ෂණ නිෂ්පාදන තමන්ගේ විශේෂිත තත්වයන්ට යෝග්‍ය වන ආකාරය පිළිබඳව දැනුවත් තීරණ ගත හැකිය. එබැවින්, රක්ෂණ වෙළඳපොලේ දිගුකාලීන වර්ධනයට පහසුකම් සලසමින්, ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය බාධාවකින් තොරව සහ තිරසාරව ක්‍රියාත්මක වීමට හැකි වන පරිදි මහජනතාවගේ මූල්‍ය සාක්ෂරතා

අධ්‍යක්ෂ ජෙනරාල්තුමියගේ සමාලෝචනය

මට්ටම ඉහළ නැංවීමට රක්ෂණකරුවන් පියවර ගත යුතුය.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා කොමිෂන් සභාව නොකඩවා බොහෝ නීතිමය ප්‍රතිසංස්කරණවලට සංශෝධන සිදු කරයි. රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයේ මූලික මූලධර්මවලට අනුකූල වන වඩා පුළුල් බලතල සහිත නව රක්ෂණ නියාමන පනතක්, ක්ෂුද්‍ර රක්ෂණ නියාමනය සහ අධීක්ෂණය සහ නිපැයුම් සමාලෝචනය පිළිබඳ වැඩි දියුණු කළ නීති, වෙළඳ දැන්වීම් සමාලෝචනය හා සාමාන්‍ය සහ දිගුකාලීන රක්ෂණ ඔප්පු සඳහා සම්මත ඔප්පු රාමුව මෙහි දී සිදු කෙරෙමින් පවතින ප්‍රධාන ප්‍රතිසංස්කරණ කිහිපයක් වේ. රක්ෂණ ක්ෂේත්‍රයේ සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා රක්ෂණ ක්ෂේත්‍රයේ කාර්ය සාධනයට බලපාන විවිධ සාධක මෙන්ම රක්ෂණ ඔප්පු හිමියන්ගේ රක්ෂණ අවශ්‍යතා සහ ආරක්ෂණ පරතරයන් හඳුනා ගැනීම සඳහා වෙළඳපල පර්යේෂණ සිදු කිරීමට ද කොමිෂන් සභාව අදහස් කරයි.


අගය කිරීම

අතිශයින්ම අස්ථාවර වසරක් තුළ ලබා දුන් සහයෝගය සහ මග පෙන්වීම වෙනුවෙන් සභාපතිතුමාට සහ කොමිෂන් සභාවේ සාමාජිකයින්ට මගේ කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. වසර ගණනාවක් පුරා කර්මාන්තය දියුණු කිරීම සඳහා ඵලදායී අදහස් ලබා දීම සම්බන්ධයෙන් රක්ෂණ ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන්ට මගේ ප්‍රශංසාව පළ කරන අතර ඉදිරි වසරවල දී ද ඔවුන්ගේ සහයෝගය අපේක්ෂා කිරීමට කැමැත්තෙමි.

වසර පුරා පෙන්නුම් කළ වෘත්තීයභාවය සහ කැපවීම වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායමට සහ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට අවංක ස්තූතිය පිරිනැමීමට කැමැත්තෙමි. ඔවුන්ගේ දැඩි උත්සාහය සහ කැපවීම හේතුවෙන් කොවිඩ්-19 වසංගතය මගින් විල්ල කරන ලද බාධාවන් සහ සීමාවන් නොතකා, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට එහි අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකි විය.



දමයන්ති ප්‍රනාන්දු
අධ්‍යක්ෂ ජෙනරාල්



කොමිෂන් සභාවේ සාමාජිකයින් සහ කාර්ය මණ්ඩලය

කොමිෂන් සභාවේ සාමාජිකයින්

ආර්. එම්. පී. රත්නායක මහතා

සංජීව දිසානායක මහතා



රසික් සරුක් මහතා
ජනාධිපති නීතීඥ
සභාපති


රාජා ගුණරත්න මහතා
හරිස් සල්පිටිකෝරාල මහතා
ඉන්ද්‍රා බදුගේ මෙනවිය
ඉවෙට් ප්‍රනාන්දු මහත්මිය

කොමිෂන් සභාවේ සාමාජිකයින් පිළිබඳව

01 රසික් සරූක් මහතා
ජනාධිපති නීතීඥ
සභාපති

ජනාධිපති නීතීඥවරයෙකු, රාජතාන්ත්‍රිකයෙකු හා රාජ්‍ය සංස්ථා රැසක හිටපු සභාපති වන රසික් සරූක් මහතා ජ්‍යෙෂ්ඨ නීතීඥයෙකි.

ඔහු සතොස ආයතනයේ සභාපති ධූරය දැරූ අතර ඔහුගේ සේවා කාලය තුළ එනම් 1978 සිට 1989 දක්වා වූ කාලය තුළ සතොස ආයතනය ලාභ ලබන හා ශක්‍යතාවයෙන් යුතු ආයතනයක් බවට පත් කළ අතර ඉඩම් සංවර්ධනය හා සීමා සහිත සතොස මෝටර්ස් හා සීමා සහිත ලංකා මිල්ක් ෆුඩ් වැනි ලැයිස්තුගත පොදු සමාගම් ගණනාවක් ස්ථාපනය කරමින් දේපළ රැසක් අත්පත් කර ගැනීමට මෙම ආයතනයට හැකි විය. ඔහු කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන අධිකාරිය සහ ලංකා බැංකුව යන ආයතනවල සභාපති ධූරය ද දැරීය.

ඔහු එවකට යුගෝස්ලෝවියානු ෆෙඩරල් ජනරජයේ තානාපති ලෙසත් ඉන් පසුව හංගේරියාවේ පළමු තානාපති ලෙසත් තානාපති සේවයෙහි කටයුතු කළේය. ඉන් පසුව, ඔහු සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් ලෙස පත් කෙරිණි.

ඔහු මාතර සර්වේෂස් විද්‍යාලයේ හා කොළඹ සහිරා විද්‍යාලයේ ආදි සිසුවෙකි.

02 ආර්. එම්. පී. රත්නායක මහතා

ආර්. එම්. පී. රත්නායක මහතා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ සේවයේ නිලධාරියෙකු වන අතර දැනට මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ලෙස සේවය කරයි.

ඔහු නෝර්වේ කෘෂිකාර්මික විශ්ව විද්‍යාලය වෙතින් ශාස්ත්‍රපති උපාධියක් සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා ගෙන ඇත.

ඔහු 1994 දී රාජ්‍ය සේවයට සම්බන්ධ වූ අතර ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ඇතුළු මහා භාණ්ඩාගාරය යටතේ පවතින දෙපාර්තමේන්තුවල විවිධ තනතුරුවල වසර 27 කට ආසන්න කාලයක් සේවය කර ඇත. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් සංවර්ධන ව්‍යාපෘති සඳහා විදේශ අරමුදල් රැස් කිරීම සඳහා සංවර්ධන හවුල්කරුවන්, ණය දෙන ආයතන සහ ප්‍රාග්ධන වෙළඳපොළ සමඟ සම්බන්ධීකරණය කිරීම සහ ද්වීපාර්ශ්වික සාකච්ඡාවලට සම්බන්ධවීම හා විදේශ මූල්‍ය නිසි කලට ලබාදීම සඳහා පහසුකම් සැලසීමේ වගකීම ඔහු සතු විය.

ඔහු දැනට ලංකා බැංකුව, ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ඇතුළු ආයතන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස භාණ්ඩාගාරය නියෝජනය කරයි. රත්නායක මහතා විවිධ ක්ෂේත්‍ර / විෂය ක්ෂේත්‍ර සම්බන්ධ ලිපි රාශියක් පළ කර ඇත.

03 සංජීව දිසානායක මහතා

සංජීව දිසානායක මහතා හොංකොං විශ්වවිද්‍යාලයෙන් මානව හිමිකම් පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (LLM) ලබා ඇත. ඔහු 1997 දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥවරයෙකු ලෙස ලියාපදිංචි විය. ඔහු ශ්‍රී ලංකා නීතිපති දෙපාර්තමේන්තුවට අනුයුක්ත නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයෙකු වන අතර දැනට සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ලෙස රාජකාරී ඉටු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිදහස් කර ඇත.

සංජීව දිසානායක මහතා නීතිපති දෙපාර්තමේන්තුවේ අපරාධ සහ සිවිල් යන දෙඅංශයේම අත්දැකීම් ඇති අතර දූෂණයට එරෙහි ඊජි ස්වාධීන කොමිෂන් සභාවේ ද කටයුතු කර ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය සහ ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නිල බලයෙන් පත් වූ සාමාජියෙකි.

04 ඉවෙට් ප්‍රනාන්දු මහත්මිය

ඉවෙට් ප්‍රනාන්දු මහත්මිය දැනට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථායීතාවය පිළිබඳ ක්ෂේත්‍රය භාර නියෝජ්‍ය අධිපතිවරියක් ලෙස කටයුතු කරයි. ඇය බැංකු අධීක්ෂණය සහ නියාමනය, විදේශ විනිමය කළමනාකරණය සහ මුදල් කළමනාකරණය යන ක්ෂේත්‍රවල මහ බැංකුවේ වසර 30කට අධික සේවා කාලයක් සම්පූර්ණ කර ඇත. මෙම කාලසීමාව තුළ ප්‍රනාන්දු මහත්මිය බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ සහ විනිමය පාලකවරිය ලෙස කටයුතු කර ඇති අතර බැංකු අධීක්ෂණ, මුදල්, විදේශ විනිමය සහ සේවක අර්ථසාධක අරමුදල යන දෙපාර්තමේන්තු භාර සහකාර අධිපති ධූරය ද හොබවා ඇත. ප්‍රනාන්දු මහත්මිය බැංකු අධීක්ෂණය සහ නියාමනය, සාමාන්‍ය බැංකු මෙහෙයුම්, යහපාලන භාවිතාවන්, දුර්වල බැංකු විශ්ලේෂණය, මුදල් කටයුතු, මුදල් කළමනාකරණය සහ නායකත්ව කුසලතා වැනි විවිධ

කොමිෂන් සභාවේ සාමාජිකයින් පිළිබඳව

අංශ පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම සඳහා වන දේශීය හා ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වෙනත් සංසද කිහිපයකට සහභාගි වී ඇත. ඇය රැකියාව ආශ්‍රිත විෂයයන් පිළිබඳ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් කිහිපයක සහ මණ්ඩල සාකච්ඡා කිහිපයක සම්පත් දායකවරියක් ලෙස කටයුතු කර ඇත. ප්‍රනාන්දු මහත්මිය දැනට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුව සහ ජාතික ගෙවීම් කවුන්සිලය, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය සහ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය යන ආයතනවල සභාපතිනිය ලෙසත් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සහ ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සාමාජිකාවක් ලෙසත් ක්‍රියා කරන්නීය. ඇය කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍යමය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියක් ලබා ඇත.

05 හරිස් සල්පිටිකෝරාල මහතා

හරිස් සල්පිටිකෝරාල මහතා බ්‍රිතාන්‍යයේ වරලත් කළමනාකරණ ගණකාධිකරුවන්ගේ ආයතනය හා ඇමරිකාවේ ජීවිත කළමනාකරණ ආයතනය යන ආයතනවල අධිසාමාජිකයෙකි. ඇමරිකන් ඉන්ටර්නැෂනල් ඇෂුවරන්ස් කම්පනි ලිමිටඩ්හි දිස්ත්‍රික් කළමනාකරුවෙකු හා උප සභාපති ලෙස ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයෙහි වසර 30ට වැඩි පළපුරුද්දක් ඔහු සතු වන අතර බෘනායි, සිංගප්පූරුව හා ශ්‍රී ලංකාව යන රටවල රක්ෂණ සමාගම්හි උපදේශකයෙකු ලෙස සේවය කර ඇත.

06 රාජා ගුණාරත්න මහතා

රාජා ගුණරත්න මහතා නීතීඥවරයෙකු වන අතර ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්ව විද්‍යාලයෙන් වාණිජ නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත.

ආර්. ගුණරත්න මහතා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නීති අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකි.

ඔහු ජාතික ඖෂධ නියාමන කොමිෂන් සභාවේ සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස ද රාජ්‍ය සේවයට දායක වේ.

ගුණරත්න මහතා ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ යාවජීව සාමාජිකයෙකු වන අතර බංග්ලාදේශයේ පෙව වෛද්‍ය සංගමයේ සහ ශ්‍රී ලංකා වෛද්‍ය-නීති සංගමයේ සාමාජිකයෙක් ද වේ.

එසේම ඔහු හිටපු ජාතික නිවාස කොමසාරිස්වරයා ද ජාතික නිවාස අධිකාරියේ අධ්‍යක්ෂ සහ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂවරයෙකුද වේ. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඔහු විවෘත විශ්ව විද්‍යාලයේ නීති අධ්‍යයන අංශයේ ප්‍රධානියා සහ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ වැඩබලන පීඨාධිපති වැනි බොහෝ තනතුරු හොබවා ඇත.

07 ඉන්ද්‍රා බදුගේ මෙනවිය

ඉන්ද්‍රා බදුගේ මෙනවිය නීතීඥවරියක් වන අතර ඇය නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. ඇයට රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වසර 26 කට වැඩි සේවා පළපුරුද්දක් ඇත. මෙම කාලය තුළ ඇය මහාමාර්ග අමාත්‍යාංශයේ නීති උපදේශක සහ ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ ප්‍රධාන නීති නිලධාරී ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු හොබවා ඇත.

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



01 දමයන්ති ප්‍රනාන්දු මහත්මිය (අධ්‍යක්ෂ ජෙනරාල්)
02 චමර් වීකනායක මහත්මිය (අධ්‍යක්ෂ අධීක්ෂණ)
03 සතීෂ් කුමාර් මහතා (අධ්‍යක්ෂ මූල්‍ය හා පරිපාලන)
04 ප්‍රභාෂිණී සමරකෝන් මහත්මිය (අධ්‍යක්ෂ විමර්ශන)
05 දීපිකා නවරත්න මහත්මිය (අධ්‍යක්ෂ වෙළඳපොල සංවර්ධන හා බාහිර සබඳතා)
06 රාජන් නිරූබසිංහම් මහතා (අධ්‍යක්ෂ නීති හා බලාත්මක කිරීම)



07 බිමිසර විජේසිංහ මහතා (සහකාර අධ්‍යක්ෂ වෙළඳපොල සංවර්ධන හා බාහිර සබඳතා)
08 සාරිකා වත්තුහේවා මහත්මිය (සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ)
09 චමර් හීනටිගල මහත්මිය (සහකාර අධ්‍යක්ෂ විමර්ශන)
10 ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා (සහකාර අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණ)
11 මලිති අම්බලන්ගොඩ මෙනවිය (සහකාර අධ්‍යක්ෂ නීති හා බලාත්මක කිරීම)


කාර්ය මණ්ඩලය



01. ඩෙසිකා රත්නායක මහත්මිය
02. හර්ෂණී පෙරේරා මහත්මිය
03. නටාෂා කීර්තිසිංහ මහත්මිය
04. ලසන්ති තොටහේවා මහත්මිය
05. පාරමී මුණසිංහ මෙනවිය
06. තිළිණී වාකිෂ්ඨ මහත්මිය
07. වීණා සෙනෙවිරත්න මහත්මිය
08. ඒ. ඩබ්ලිව්. සෙව්වන්දි මෙනවිය
09. සවිත්‍රා රණතුංග මහත්මිය
10. චතුනි තල්පාවිල මෙනවිය
11. තුෂාරි විජේගුණවර්ධන මහත්මිය
12. ශෂිනි වත්සලා මහත්මිය
13. මල්හාරි වික්‍රමසිංහ මහත්මිය
14. කලන පුෂ්පකුමාර මහතා
15. භානුක ගමගේ මහතා
16. රවිදු හංසක මහතා
17. සනත් උදයංග මහතා
18. නයන රවීන්ද්‍ර මහතා
19. අනුෂ්ක ඩිලාන් බණ්ඩාර මහතා
20. ලක්මිණ පතිරාජ මහතා



21. උපේන්ද්‍රා සෙනෙවිරත්න මහත්මිය
22. රුවිනි ලියනගේ මහත්මිය
23. පවිත්‍රා පුංචිහේවා මහත්මිය
24. සී.ඩබ්ලිව්.එස්.එස්. සුපුලි මහත්මිය
25. නිලංකා වලිසුන්දර මහත්මිය
26. චින්ද්‍යා තූලපිටිය මහත්මිය
27. ප්‍රියංගි ද සිල්වා මහත්මිය
28. කෝකිලා සිරිවර්ධන මහත්මිය
29. උපේක්ෂා ලියනගේ මෙනවිය
30. චන්දිමා කඹුරුගමුව මහත්මිය
31. සුජීවා රණසිංහ මහත්මිය
32. ශ්‍යාමලී අත්තනායක මහත්මිය
33. චමින්ද ලාල් කුමාර මහතා
34. හසංක රත්නසිරි මහතා
35. ඉමාෂා වඩුගේ මෙනවිය
36. නිසල් කරුණාරත්න මහතා
37. නලින් තලගල මහතා
38. මලින් පෙරේරා මහතා
39. චිතිරාජ් ශ්‍රීකාන්තන් මහතා
40. චරිත වික්‍රමසිංහ මහතා
41. නුවන් සුදර්ශණ මහතා



සමාලෝචන

පොදු සමාලෝචනය 26

සංඛ්‍යානමය සමාලෝචනය 32

මෙහෙයුම් සමාලෝචන 88

පොදු සමාලෝචනය

පනත ක්‍රියාත්මක කිරීම සහ නියාමන ප්‍රතිසංස්කරණ

නීති සම්පාදනය

රක්ෂණ කොමිෂන් සභාවේ ("මින් මතු කොමිෂන් සභාව" ලෙස හැඳින්වෙන) අරමුණ හා වගකීම වන්නේ ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර අවංකව සහ වෘත්තීමයභාවයෙන් හා විචක්ෂණශීලීව පවත්වාගෙන යාම තුළින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කිරීමයි.

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (මෙතැන් සිට "පනත" ලෙස හැඳින්වේ) මඟින් රක්ෂණ සමාගම්, රක්ෂණ තැරැව්කාර සමාගම්, රක්ෂණ නියෝජිතයින් සහ පාඩු ගැලපුම්කරුවන් නියාමනය සහ අධීක්ෂණය සඳහා අදාළ නීතිමය රාමුව සපයයි.

2007 අංක 27, 2011 අංක 3 සහ 2017 අංක 23 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් මඟින් එම පනත සංශෝධනය කර ඇත.

උප නීති සම්පාදනය

වර්ෂය තුළ පනත යටතේ සම්පාදනය කරන ලද උප නීති, නියාමන ප්‍රතිසංස්කරණ යටතේ පහතින් විස්තර කෙරේ.

නියාමන ප්‍රතිසංස්කරණ

පනතේ 96(අ) වගන්තිය යටතේ නිකුත් කරන ලද විධාන

1. 2021 විධාන අංක 01 - ලාභාංශ ප්‍රකාශනය සහ බෙදා හැරීම

කොමිෂන් සභාව කොටස් හිමියන්ට ලාභාංශ (අතුරු ලාභාංශ ඇතුළුව) ප්‍රකාශ කිරීමේදී සහ බෙදා හැරීමේදී රක්ෂණකරුවන් වෙත එහි සඳහන් නියමයන් සහ කොන්දේසි නිකුත් කර ඇත. මෙම විධානය 2021 මාර්තු 10 දින සිට බලාත්මක විය.

2. 2021 විධාන අංක 01 සඳහා කරන ලද සංශෝධනය - ලාභාංශ ප්‍රකාශනය සහ බෙදා හැරීම (සංශෝධනය)

ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ ඉල්ලීම සලකා බැලූ කොමිෂන් සභාව 2021 මාර්තු 10 දින නිකුත් කරන ලද 2021 විධාන අංක 1 හි 1(අ) අයිතමය සඳහා පහත අයිතමයන් ආදේශ කර ඇත:

i. සමාගම විසින් අසම්භාව්‍ය බැරකම් පිළිබඳ තීරණ ගනු ලැබ ඇත්තේ පුළුල් රාමුවක් මත පදනම් වූ නිසි පරීක්ෂාවකින් පසුව සහ සමාගමේ මූල්‍යමය සහ නුබුන්වත් තත්ත්වයෙහි තිරසාරභාවයට අදාළව ඒ හා සම්බන්ධ අවදානම තක්සේරු කිරීමෙනි.

ii. කොටස් හිමියන්ට යෝජනා වී ඇති ගෙවීම් සලකා බැලීමේදී මූල්‍ය සහ නුබුන්වත් තත්ත්වය කෙරෙහි වන බලපෑම. අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීමට රක්ෂණකරුවන් යටත් වේ.

2021 විධාන අංක 1 සඳහා වන මෙම සංශෝධනය 2021 අගෝස්තු 30 දින සිට බලාත්මක විය.

3. 2021 විධාන අංක 2 - කේත සැපයීම සහ කේත වෙනස් කිරීම පිළිබඳ සීමාව

කොමිෂන් සභාව විසින් රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් වෙත කේත ලබා දීම සහ වෙනස් කිරීම පිළිබඳ වන සීමාවන් සම්බන්ධයෙන් විධාන නිකුත් කර ඇත. මෙම විධානය 2021 මාර්තු 24 දින සිට බලාත්මක විය.

4. 2021 විධාන අංක 3 - විධාන අංක 14 (ප්‍රතිශෝධිත)

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී ඇති පුද්ගලයින්ට (රක්ෂණකරුවන්, තැරැව්කරුවන් සහ අලාභ ගැලපුම්කරුවන්) මූල්‍ය අවභාවිතය හෝ වංචාව යන පදනම මත සේවය අවසන් කර ඇති ඕනෑම ධාරිතාවක පුද්ගලයෙකු රැකියාගත කිරීමෙන් වැළකී සිටින ලෙස කොමිෂන් සභාව විසින් විධානය කර ඇත. 2018 ජනවාරි 9 දින නිකුත් කරන ලද විධාන අංක 14 එමඟින් අවලංගු කරන ලදී. මෙම විධානය 2021 ජූලි 29 දින සිට බලාත්මක විය.

5. 2021 විධාන අංක 4 - විදුලි සංදේශ සේවා සපයන්නන්ගේ සේවා ජාලය (ජංගම රක්ෂණය) භාවිතය අවසන් කිරීම සහ ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික කරුණු

රක්ෂණ ඔප්පු හිමියන්ට සහ සාමාන්‍ය ජනතාවට රක්ෂණ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා රක්ෂණකරුවන් විසින් ජංගම සහ ස්ථාවර දුරකථන මාර්ග වැනි විදුලි සංදේශ සේවා සපයන්නන්ගේ සේවා ජාලය භාවිතා කිරීමේ දැනට පවතින ක්‍රමය නවතා දැමූ ඉහත විෂය සම්බන්ධයෙන් කොමිෂන් සභාව රක්ෂණ සමාගම් වෙත විධාන නිකුත් කර ඇත. මෙම විධානය 2021 සැප්තැම්බර් 6 දින සිට බලාත්මක විය.

6. 2021 විධාන අංක 5 - රක්ෂණකරුවන්ගේ සහ රක්ෂණ තැරැව්කරුවන්ගේ ප්‍රධාන නිලධාරීන් පිළිබඳ විධාන අංක 9 (2016 මැයි 13) ප්‍රතිශෝධනය කිරීම

රක්ෂණකරුගේ හෝ රක්ෂණ තැරැව්කරුවකුගේ ප්‍රධාන නිලධාරියාට ප්‍රධාන විධායක නිලධාරි/කළමනාකාර අධ්‍යක්ෂ ලෙස කටයුතු කිරීම සහ සමාගමේ ව්‍යාපාරික කටයුතුවල දී සාමාන්‍ය පාලනය, මග පෙන්වීම සහ අධීක්ෂණය සම්බන්ධයෙන් ඔහු/ඇය වගකිව යුතුය යන අවශ්‍යතාවන් ඇතුළත් කරමින් 2016 මැයි 13 දිනැති විධාන අංක 09 සංශෝධනය කර ඇත. මෙම විධානයේ 01 වන ඡේදය 2022 නොවැම්බර් 1 දින සිට බලාත්මක විය.

පොදු සමාලෝචනය

වසර තුළ නිකුත් කරන ලද චක්‍රලේඛ

1. 2021 අංක 01 චක්‍රලේඛය - දියත් කිරීමට පෙර රක්ෂණ නිෂ්පාදන නිෂ්කාශනය කිරීම

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 37(1) සහ (2) වගන්තියේ දක්වා ඇති අවශ්‍යතා සලකා බැලූ කොමිෂන් සභාව, 37(1) වගන්තියේ දක්වා ඇති පරිදි නිෂ්පාදන/රක්ෂණ ඔප්පු ආකෘති පත්‍ර දියත් කළ හැක්කේ කොමිෂන් සභාවේ මතය අනුව ඒවා සාධාරණ සහ යුක්තිසහගත බවට කොමිෂන් සභාව තහවුරු කළ පසුව පමණක් බව සියලුම රක්ෂණ සමාගම් වෙත දැනුම් දී ඇත. සියලුම සාමාන්‍ය රක්ෂණ සමාගම් විසින් දියත් කිරීමට අවම වශයෙන් දින 30කට පෙර රක්ෂණ ඔප්පු ඉදිරිපත් කළ යුතු අතර දිගුකාලීන රක්ෂණ සමාගම් විසින් ව්‍යාපාරය ආරම්භ කිරීමට අවම වශයෙන් දින 45කට පෙර රක්ෂණ ඔප්පු ඉදිරිපත් කළ යුතුය. මෙම විධානය 2021 මාර්තු 23 දින සිට බලාත්මක විය.

2. 2021 අංක 2 දරන චක්‍රලේඛය - තෙවන පාර්ශවීය මෝටර් රථ රක්ෂණය ප්‍රවර්ධනය කිරීම/ ප්‍රචාරණය තහනම් කිරීම

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 3 වන වගන්තිය සැලකිල්ලට ගෙන කොමිෂන් සභාව විසින් තෙවන පාර්ශවීය මෝටර් රථ රක්ෂණය ප්‍රවර්ධනය කිරීම/ ප්‍රචාරණය තහනම් කරන ලදී. මෙම විධානය 2021 අප්‍රේල් 8 දින සිට බලාත්මක විය.

වසර තුළ ගන්නා ලද තීරණ

සංශෝධිත 2000 අංක 43 දරන පනතේ 88 වගන්තිය යටතේ ගන්නා ලද තීරණ

දැනට පවතින තීරණ අංක 10 වෙනුවට "දිගුකාලීන රක්ෂණය ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සඳහා ගෙවිය හැකි උපරිම කොමිස් මුදල්" පිළිබඳ වන නව තීරණ අංක 10 රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කරුවන් වෙත නිකුත් කරන ලදී. මෙම විධානය 2021 දෙසැම්බර් 6 දින සිට බලාත්මක විය.

වෙළඳ පොළ ව්‍යුහය

රක්ෂණකරුවන්


පනතේ 12 වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් පුද්ගලයකු රක්ෂණ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා දැනට ලියාපදිංචි වී හෝ පනත යටතේ ලියාපදිංචි වී ඇතැයි සැලකෙන්නේ නම් මිස, එම පුද්ගලයා ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරයක් සිදු නොකළ යුතුය.

පනතේ 13 වැනි වගන්තියට අනුව, ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරවල නිරත වීමට කැමති ඕනෑම පුද්ගලයකු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පොදු සමාගමක් සංස්ථාගත කර නිශ්චිතව දක්වා ඇති සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පනත යටතේ රක්ෂණකරුවෙකු ලෙස ලියාපදිංචි වී බලපත්‍රයක් ලබා ගත යුතුය.

වසර අවසාන වන විට සමාගම් 27ක් රක්ෂණකරුවන් ලෙස ක්‍රියාත්මක වෙමින් පැවතිණ. තවද, ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ් තවදුරටත් කිසිදු නව රක්ෂණ ගනුදෙනු භාර නොගන්නා අතර 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන අනුව ශ්‍රී ලංකාවෙන් පිටවීමට කටයුතු කරමින් සිටියි. එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් 2020 ජූනි 1 වන දින සිට නව ජීවිත රක්ෂණ ගනුදෙනු ප්‍රතිරක්ෂණය කිරීම නතර කර ඇත.

1 වන රූපසටහන මගින් සමාගම් විසින් නියැලුණු රක්ෂණ ව්‍යාපාර පන්ති නිරූපණය කරයි. ක්‍රියාත්මක වූ සමාගම් 27 න් සමාගම් 2 ක් දිගු කාලීන රක්ෂණ ව්‍යාපාර සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර යන දෙකේම නියැලී සිටි සංයුක්ත රක්ෂණකරුවන් වූ අතර සමාගම් 13 ක් දිගු කාලීන රක්ෂණ ව්‍යාපාර කරගෙන ගිය අතර සමාගම් 12 ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කරගෙන යමින් තිබිණි.

1 වන රූප සටහන - රක්ෂණ සමාගම් විසින් සිදු කරගෙන යන රක්ෂණ ව්‍යාපාර පන්තීන්



රක්ෂණ තැරැව්කරුවන්

රක්ෂණ තැරැව්කරුවෙකු යනු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත කර රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර කරගෙන යාම සඳහා පනත යටතේ ලියාපදිංචි වූ සමාගමකි. රක්ෂණ තැරැව්කරුවෝ ගාස්තු හෝ කොමිස් මුදල් අපේක්ෂාවෙන් රක්ෂණ සමාගමක් හෝ ප්‍රතිරක්ෂණ සමාගමක් සමඟ හෝ ඔවුන් වෙනුවෙන් රක්ෂණ ව්‍යාපාර ඇති කිරීම සඳහා රක්ෂණ සමාගම් හෝ රක්ෂණ සහතික දරන්නන් හෝ රක්ෂණය හෝ ප්‍රතිරක්ෂණය සඳහා යෝජනා කරන්නන් අතර අතරමැදියන් ලෙස කටයුතු කරති.


වසර අවසානයේදී රක්ෂණ තැරැව්කරුවන් ලෙස ලියාපදිංචි වූ සමාගම් ගණන 70කි. එම සමාගම් අතරින් සමාගම් 51ක් දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර දෙකෙහිම ලියාපදිංචි වී ඇති අතර සමාගම් 19ක් සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයේ පමණක් ලියාපදිංචි වී ඇත.

පොදු සමාලෝචනය

2 වන රූප සටහන මගින් වසර තුළ රක්ෂණ තැරැව්කරුවන් විසින් පවත්වාගෙන යන ලද රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර පන්ති දැක්වේ.

2 වන රූප සටහන

රක්ෂණ තැරැව්කරුවන් විසින් පවත්වාගෙන යනු ලබන රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර පන්තීන්



රක්ෂණ නියෝජිතයන්

පනත යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගමක් හෝ රක්ෂණ තැරැව්කාර සමාගමක් සමග ලියාපදිංචි වී සිටින සහ එම රක්ෂණ සමාගම් හෝ රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා රක්ෂණ ව්‍යාපාර සොයා දීම වෙනුවෙන් ප්‍රතිශ්ඨාවක් ලෙස කොමිස් ලබා ගන්නා පුද්ගලයින් රක්ෂණ නියෝජිතයන් වේ. එලෙස ලියාපදිංචිය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා ඇත.

පනතේ 34 වන වගන්තිය අනුව රක්ෂණ නියෝජිතයන් රක්ෂණ සමාගම්වලට රක්ෂණ ව්‍යාපාර සොයා දෙනු ලබන වැදගත් ප්‍රවාහයන්ගෙන් එකකි.


රක්ෂණ සමාගම් විසින් සපයා ඇති තොරතුරුවලට අනුව වසර තුළ දී රක්ෂණ නියෝජිතයන් ලෙස බඳවා ගෙන ඇති මුළු පුද්ගලයන් සංඛ්‍යාව දළ වශයෙන් 16,387 ක් පමණ වන අතර එය පසුගිය වසරේ බඳවා ගත් සංඛ්‍යාව වූ 15,913 ට සාපේක්ෂව 2.98%ක ඉහළ යාමකි.

වසර අවසානය වන විට රක්ෂණ සමාගම් නියෝජනය කරමින් සිටි මුළු තනි රක්ෂණ නියෝජිතයන් සංඛ්‍යාව 43,934 ක් පමණ වූ අතර එය පසුගිය වසරේ 43,342ට සාපේක්ෂව 1.37%ක ඉහළ යාමකි.

3 වන රූප සටහන මගින් රක්ෂණ සමාගම් සමග ලියාපදිංචි වී සිටින තනි රක්ෂණ නියෝජිතයන් පෙන්නුම් කරයි.

3 වන රූප සටහන

2021.12.31 දිනට මුළු රක්ෂණ නියෝජිතයන්



වසර අවසානය වන විට රක්ෂණ තැරැව්කාර සමාගම් නියෝජනය කරන මුළු රක්ෂණ නියෝජිතයන් සංඛ්‍යාව දළ වශයෙන් 560 ක් පමණ විය.

අලාභ ගැලපුම්කරුවන්

වසර අවසාන වන විට අලාභ ගැලපුම්කරුවෝ 23 ක් සිටියහ.

අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචි වීම පිළිබඳ රීති 2017 ජූලි 5 දිනැති අංක 2026/27 අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇත.

2011 වසරේ දී පනත 2011 අංක 3 දරන සංශෝධන පනත මගින් සංශෝධනය වූ පරිදි යම් තැනැත්තෙකු කොමිෂන් සභාව සමග ලියාපදිංචි වීමෙන් තොරව අලාභ ගැලපුම්කරුවකු (පනතේ 114 (1) යටතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි) ලෙස පෙනී සිටීම හා කටයුතු කිරීම තහනම් කරන ලදී. ලියාපදිංචි වීම සඳහා වන සීමිත ව්‍යතිරේකයන් 89අ (2) වගන්තියේ සඳහන් කර ඇත.

89 ආ වගන්තිය යටතේ අලාභ ගැලපුම්කරුවන්ගේ ලියාපදිංචි වීමට අදාළ සුදුසුකම් හා පළපුරුද්ද සඳහන් කරමින් රීති සෑදීමට කොමිෂන් සභාවට හැකියාව ඇත. පනතේ 89 ඇ (1) වගන්තිය අනුව අවශ්‍ය තොරතුරු, ලේඛන සහ ලියාපදිංචි කිරීමේ ගාස්තු නිශ්චය කරමින් රීති කොමිෂන් සභාව මගින් සකසනු ලැබේ.


ඒ අනුව, කොමිෂන් සභාව විසින් යම් තැනැත්තෙකු අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම් හා/ හෝ පළපුරුද්ද උක්ත රීති මගින් නිශ්චිතව දක්වා ඇත.

සමාගම්වල තත්වය හා ප්‍රාග්ධන වෙනස්කම්

කොමිෂන් සභාවේ ලියාපදිංචි රක්ෂණ සමාගම් අතරින් රක්ෂණ සමාගම් 9 ක් වර්ෂ 2021 දෙසැම්බර් 31 දිනට කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කොට ඇත. එනම් යුනියන් ඇෂුවරන්ස් පීවිල්සී, සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීවිල්සී, එච්වින්ඩී ඇෂුවරන්ස් පීවිල්සී, අමානා ටකාෆුල් ලයිෆ් පීවිල්සී, ජනශක්ති ඉන්ෂුවරන්ස් පීවිල්සී, ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පීවිල්සී, පීපල්ස් ඉන්ෂුවරන්ස් පීවිල්සී සහ සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් කම්පනි පීවිල්සී වේ .

ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොවූ රක්ෂණ සමාගම්වල ප්‍රතිශතය 4 වන රූප සටහනින් දැක්වේ.

4 වන රූප සටහන - ලැයිස්තුගත/ ලැයිස්තුගත නොවූ රක්ෂණකරුවන්ගේ තත්වය



පොදු සමාලෝචනය

2011 අංක 03 දරන සංශෝධිත පනතින් සියළු රක්ෂණ සමාගම් 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගතව තිබීම අවශ්‍ය වේ. සංයුක්ත රක්ෂණ සමාගම් 2015 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර ඒවායේ ව්‍යාපාර කටයුතු වෙන් වෙන් සමාගම් දෙකකට වෙන් කිරීමට සහ 2016 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර ලැයිස්තුගත කිරීමට ද අවශ්‍ය වේ.

2011 අංක 3 දරන සංශෝධිත පනත බලාත්මක වූ පසුව ලියාපදිංචිය ලැබූ නව රක්ෂණ සමාගමක් කොමිෂන් සභාව මගින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමෙන් පසුව වසර තුනක කාලයක් ඇතුළත දී 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගත විය යුතුය.

2011 ජූනි මාසයට පෙර ලියාපදිංචිය ලද රක්ෂණ සමාගම් 2015 පෙබරවාරි මාසය වන විට හෝ එදිනට පෙර එක් ව්‍යාපාර පන්තියක් සඳහා තමන්ගේ ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය රු.මි. 500ක අවමයක් දක්වා වැඩි කළ යුතු බවට කොමිෂන් සභාව නියම කර ඇත.

2011 ජූනි මාසයට පසුව ලියාපදිංචි වූ රක්ෂණ සමාගම්වලට රු.මි. 500කට නොඅඩු ගෙවා හිමි ප්‍රාග්ධනයක් ඇත.

රක්ෂණක සමාගම්වලින් සෙස් බද්දක් අය කිරීම

පනතේ 7 වන වගන්තිය යටතේ ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම සඳහා සෙස් බද්දක් අය කිරීමේ නියෝගයක් පනවන ලදී. 2002 ජූලි 9 වන දින අංක 1244/5 දරන ගැසට් නිවේදනය මගින් දිගුකාලීන රක්ෂණය ව්‍යාපාරය සමස්ථ ශුද්ධ වාරිකයෙන් 0.2%ක් ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක සමස්ථ ශුද්ධ වාරිකයෙන් 0.4%ක් ද වශයෙන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට බැර කළ යුතු බවට පැහැදිලි කොට ඇත. රක්ෂකයන්ගෙන් සෙස් බදු එකතු කිරීම 2003 ජනවාරියේ සිට ක්‍රියාත්මක වූ අතර 2021 වසරේ එසේ එකතු කරන ලද මුදරල රු.මි. 546 කි. සෙස් බද්ද හා ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ක්‍රියාකාරිත්වය 5 වන රූප සටහන මගින් දැක්වේ.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

පනතේ 103 වගන්තිය ප්‍රකාරව ස්ථාපනය කෙරුණු ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට රක්ෂකයන්ගෙන් එකතු කළ සෙස් බද්ද තැන්පත් කරනු ලැබේ.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ පොදු ආරක්ෂාව සහ වෙනත් විශේෂිත අවශ්‍යතා සඳහා වර්තමාන මෙන්ම අනාගත ඔප්පු හිමියන්ගේ ද යහපත උදෙසා මෙම අරමුදල පහත දැක්වෙන කාර්යයන් සඳහා යොදා ගනු ලැබේ.


ඇ) රක්ෂණ කර්මාන්තය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේදීත් රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීමේ කටයුතුවලදීත් සිදු වන වියදම් පියවාලීම සහ

ඈ) කොමිෂන් සභාව එහි බලතල, වගකීම් හා මෙහෙයුම් ක්‍රියාවට නැංවීමේ දී දරනු ලබන වියදම් පියවා ගැනීම.

ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ඇති වත්කම් රජයේ සුරැකුම්පත්වල සහ රජය බැංකුවල පවත්වා ගෙන යනු ලබන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කෙරේ.

2021 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ සංචිතය රු.මි. 8,444ක් විය. මෙය පසුගිය වසරට වඩා (රු.මි. 7,469ක) 19.45%ක වර්ධනයකි.

5 වන රූප සටහන - සෙස් බද්ද සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල



පොදු සමාලෝචනය

රක්ෂණ බදු

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල කිසිඳු පන්තියක් සඳහා වන බදු කිසිවක් දැනට ක්‍රියාත්මක නොවේ. 2002, 2005 සහ 2007 යන වර්ෂවල ජනවාරි 1 දින සිට අනුපිළිවෙලින් ක්‍රියාත්මක වන පරිදි මෝටර් රථ රක්ෂණය, ගිනි රක්ෂණය හා කම්කරු වන්දි රක්ෂණය මත ක්‍රියාත්මක වූ බදු අහෝසි කරන ලදී.

පනතේ බලපෑමෙන් නිදහස් වීම

1999 අංක 20 දරන කෘෂි හා වගා රක්ෂණ මණ්ඩලය, 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත මගින් ස්ථාපිත ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව සහ 1996 අංක 17 දරන සමාජ රක්ෂණ මණ්ඩල පනත යටතේ සාමාජික සමාජ රක්ෂණ මණ්ඩලය ආදියට පනතේ 12(3) වන වගන්තිය ප්‍රකාරව පනතේ ප්‍රතිපාදන අදාළ නොවේ.

ජාතික රක්ෂණ භාර අරමුදල (NITF)

2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මගින් ස්ථාපනය කරන ලද ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය, 2011 අංක 3 දරන සංශෝධිත පනත මගින් කොමිෂන් සභාවේ විෂය පථය තුළට ඇතුලත් කරනු ලැබ ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදල් පනත ප්‍රකාරව මුදල් අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලැබූ වර්ජන, කැරලි, සිවිල් කැලඹීම් හා ත්‍රස්ත අරමුදල ජාතික රක්ෂණ භාර අරමුදලට පවරන ලදී. ජාතික රක්ෂණ භාර අරමුදල වෙනුවෙන් වර්ජන, කැරලි, සිවිල් කැලඹීම් හා ත්‍රස්ත අවදානම් ආවරණය කෙරෙන රක්ෂණ කටයුතු කරන සමාගම් වී සඳහා අය කර ගන්නා වාරික මුදල් ජාතික රක්ෂණ භාර අරමුදලට බැර කළ යුතුය.

2007 අංක 27 දරන සංශෝධන පනත අනුව සියළු ලියාපදිංචි රක්ෂණ සමාගම්, ගැසට් පත්‍රයේ පළ කරන ලද අමාත්‍යවරයාගේ නියෝගය ප්‍රකාරව සාමාන්‍ය රක්ෂණ කටයුතු සඳහා වන ප්‍රතිරක්ෂණ වගකීමෙන් 50% නොඉක්මන ප්‍රතිශතයක් ජාතික රක්ෂණ භාර අරමුදලට ලබා දිය යුතුය. වර්ෂ 2012 දෙසැම්බර් 31 දිනැති අංක 1791/4 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව සියළු රක්ෂණ සමාගම් 2013 ජනවාරි 01 දින සිට සියලුම සාමාන්‍ය ප්‍රතිරක්ෂණ ඔප්පුවලින් පැන නගින සම්පූර්ණ වගකීමෙන් 30%ක ප්‍රතිශතයක් ජාතික රක්ෂණ භාර අරමුදලට දායක කළ යුතු බවට දන්වා ඇත. මීට පෙර මෙම ප්‍රතිශතය 20%ක් විය.

අදාළ අනෙකුත් කරුණු

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව (NCRS)

මෝටර් රථ වාහන පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව නම් වූ ආයතනය ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතියි. මෝටර් රථ රක්ෂණ ආවරණ ලබාදෙන රක්ෂකයින් සෑම කෙනෙකු ම තෙවන පාර්ශවීය ආරක්ෂණ ආවරණයකින් 2%ක් මාර්ග ආරක්ෂණ අරමුදලට දායක කළ යුතුය. (වර්ෂ 2021 ඔක්තෝම්බර් මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි 1% ක දායක මුදල 2% දක්වා ඉහළ දමා ඇත.)

මෙම දායක මුදල් මගින් හඳුනා නොගත් මෝටර් රථවලින් සිදු වන අනතුරුවල වින්දිතයන් සඳහා වන්දි ලබා දීමට භාවිත කරනු ලැබේ.

අන්තර් නියාමන ආයතන සභාව (FSOC)

අන්තර් නියාමන ආයතන සභාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිහිටුවන ලද්දක් වන අතර මූල්‍ය නියාමන අංශයේ ජ්‍යෙෂ්ඨ නියෝජිතයන් මෙම කවුන්සිලයේ සාමාජිකයෝ වෙති. මෙහි සභාපතිත්වය ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් උසුලනු ලබයි. මෙම ඉහළ මට්ටමේ කමිටුව පිහිටුවන ලද්දේ මූල්‍ය වෙළඳපොලෙහි ක්‍රමානුකූල වර්ධනය සඳහා අවශ්‍ය නිසි ප්‍රතිපත්ති සම්පාදනය හා සමස්ථ මූල්‍ය පද්ධතියේ ම අභිවෘද්ධිය උදෙසා සියළු නියාමන නියෝජිතයන් සම්බන්ධීකරණය කරමින් තොරතුරු හුවමාරු කර ගැනීම සඳහාය. කොමිෂන් සභාවේ සභාපති සහ අධ්‍යක්ෂ ජෙනරාල් විසින් අන්තර් නියාමන ආයතන සභාව නියෝජනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා රක්ෂණ සංගමය (IASL)

1989 වර්ෂයේ දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ සාමාජිකත්වය පනත යටතේ ලියාපදිංචිය ලබා ඇති සෑම රක්ෂණ සමාගමකට ම ලබා ගත හැකි ය.

සියළු රක්ෂණ සමාගම්හි ප්‍රධාන විධායක නිලධාරීන්ගෙන් සමන්විත විධායක කමිටුව සමස්ත කළමනාකරණය පිළිබඳ වගකීම දරයි.

පහත දැක්වෙන කමිටු විසින් විධායක කමිටුවට සහාය වෙමින් ස්වකීය වගකීම හා අදාළ වන්නා වූ විෂය ක්ෂේත්‍ර පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කෙරේ:

- ජීවිත රක්ෂණ සන්සදය
- සාමාන්‍ය රක්ෂණ සන්සදය
- මූල්‍ය තාක්ෂණ අනු කමිටුව
- නීති උපදේශන සන්සදය
- මානව සම්පත් අනු කමිටුව
- තොරතුරු තාක්ෂණය පිළිබඳ අනු කමිටුව
- අලෙවිකරණ හා විකුණුම් සන්සදය
- ජීවගණක අනු කමිටුව

ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය (SLIBA)

ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය නියෝජනය කරනු ලබන්නේ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සමග ලියාපදිංචි වූ රක්ෂණ තරැව්කාර සමාගම් වේ.

ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (SLII)

1982 වසරේ දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය ලාභ නොලබන සංවිධානයක් වන අතර එහි ප්‍රධාන අරමුණ වන්නේ රක්ෂණ ව්‍යාපාරයෙහි

පොදු සමාලෝචනය

නියුක්ත වන්නන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීමයි. ආයතනය අරමුදල් සපයා ගන්නේ රක්ෂණ සමාගම් වලින් පිරිනමන දායකත්වය තුළින් හා සාමාජිකයන්ගේ වාර්ෂික සාමාජික මුදල්වලිනි.

මෙම ආයතනය, ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනයට අනුබද්ධව ඇති අතර ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනය, ඉන්දියාවේ රක්ෂණ ආයතනය සහ ඉන්දියාවේ ජීවගණක සංගමය වැනි වෘත්තීය ආයතනවල විභාග ද මෙහෙයවනු ලබයි. රක්ෂණ කර්මාන්තයෙහි නියැලෙන්නන් සඳහා ආයතනය විසින් කෙටි කාලීන රක්ෂණ ඩිප්ලෝමා පාඨමාලා ද පවත්වනු ලැබේ. මීට අමතරව, අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) සම්මන්ත්‍රණ, රක්ෂණයට අදාළ සමුළු, අන්තර් රක්ෂණ සමාගම් පැන විසඳුම් වැඩසටහන් සහ අන්තර් රක්ෂණ සමාගම් ක්‍රිකට් සහ දැල් පන්දු තරඟාවලි පැවැත්වීම මෙමඟින් සිදු කෙරෙන අනෙකුත් ක්‍රියාකාරකම් කිහිපයකි.

රක්ෂණ නියෝජිතයන් ලෙස කටයුතු කිරීමට කැමැත්තක් දක්වන අය සඳහා පූර්ව බඳවා ගැනීම් පරීක්ෂණ පැවැත්වීමේ වගකීම කොමිෂන් සභාව විසින් මෙම ආයතනයට පවරා ඇත. මෙම ආයතනය විසින් රක්ෂණ ව්‍යාපාරයේ පන්ති දෙකටම අදාළ වන පූර්ව බඳවා ගැනීමේ පරීක්ෂණ ලිඛිත හා පරිඝණක පාදක යන දෙයාකාරයෙන් ම අඛණ්ඩව පවත්වාගෙන යනු ලබයි.

රක්ෂණ ඔම්බුඩ්ස්මන්

ශ්‍රී ලංකා රක්ෂණ සංගමය විසින් 2019 පෙබරවාරි මස රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා ලෙස ආචාර්ය රංජිත් රණරාජා මහතා පත් කර ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංගමය සමඟ ඇති කරගත් අවබෝධතා ගිවිසුම අනුව රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා සහ ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ සාමාජිකයින් වන රක්ෂණ සමාගම් රක්ෂණ ඔප්පු හිමියන් විසින් රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ආරවුල් නිරාකරණය හා සමථ කිරීම සඳහා තමන්ගේ උපරිමයෙන් කටයුතු කරනු ඇත.

රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය (IAIS)

රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයේ සාමාජිකයෙක් වශයෙන් ඔවුන් විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශන මෙන්ම ප්‍රධාන රක්ෂණ ක්‍රියාපිළිවෙත් සහ සංගමයේ ක්‍රියාකාරකම් ආදිය පිළිබඳ තොරතුරු නිතිපතා කොමිෂන් සභාවට ලැබේ. එම සංගමය විසින් නිර්දේශ කරනු ලබන ඇතැම් ප්‍රධාන රක්ෂණ ක්‍රියාපිළිවෙත් ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය ඵලදායී ලෙස අධීක්ෂණය කිරීමට සහ මෙහෙයවීමට කොමිෂන් සභාව විසින් යොදා ගනු ලැබේ.

රක්ෂණ නියාමකයන්ගේ ආසියානු සංසදය (AFIR)

කලාපීය රක්ෂණ නියාමන සහයෝගීතා යාන්ත්‍රණයක් වන රක්ෂණ නියාමකයන්ගේ අසියානු සංසදය 2006 දී ආරම්භ කරන ලද අතර චීන රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මේ සඳහා මුල පුරන ලදී. කොමිෂන් සභාව මෙහි සාමාජිකත්වය දරයි.

රක්ෂණ නියාමකයන්ගේ ආසියානු සංසදය ආසියාතික රක්ෂණ නියාමකයින්ගේ රට රටවල් අතර අධීක්ෂණ කටයුතු සඳහා ශක්තිමත් පදනමක් සපයයි.

රක්ෂණ නියාමකයින් අතර නියාමන තොරතුරු තාක්ෂණය හා නියාමන අත්දැකීම් හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සහ රක්ෂණ කර්මාන්තයේ වෘත්තිකයන් හුවමාරු කර ගැනීම රට රටවල් අතර පවතින නියාමනය කිරීමේ අවදානම අඩු කරමින් සහයෝගීතාව වැඩි දියුණු කරමින් ද රක්ෂණ කටයුතු නියාමනය කිරීමේ ශක්‍යතාවය වැඩි දියුණු කිරීම තුළින් ගෝලීය රක්ෂණ නියාමනයේ වඩාත් ක්‍රියාකාරී දායකත්වයක් ලබා දීම මෙහි අරමුණ වේ.

සංඛ්‍යානමය සමාලෝචනය

රක්ෂණ සමාගම් සඳහා කෙටි යෙදුම්

	රක්ෂණ සමාගමේ සම්පූර්ණ නම	කෙටි යෙදුම
1	ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්.	ඒඅයිඒ ලයිෆ්
2	අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්.	අලියාන්ස් ජෙනරල්
3	අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්.	අලියාන්ස් ලයිෆ්
4	අමානා තකාෆුල් පීවිල්සී	අමානා ජෙනරල්
5	අමානා තකාෆුල් ලයිෆ් පීවිල්සී	අමානා ලයිෆ්
6	ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පීවිල්සී	ආර්පිකෝ
7	සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්.	සෙලින්කෝ ජෙනරල්
8	සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්.	සෙලින්කෝ ලයිෆ්
9	කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්.	කොන්ටිනෙන්ටල්
10	කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ්.	කෝපරේටිව් ජෙනරල්
11	කෝප් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	කෝප් ලයිෆ්
12	ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	ෆෙයාෆස්ට්
13	එච්ඩීඑෆ්සී ඇෂුවරන්ස් පීවිල්සී	එච්ඩීඑෆ්සී ලයිෆ්
14	එච්ඩීඑෆ්සී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්.	එච්ඩීඑෆ්සී ජෙනරල්
15	ජනශක්ති ඉන්ෂුවරන්ස් පීවිල්සී	ජනශක්ති ලයිෆ්
16	ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්.	ජනශක්ති ජෙනරල්
17	ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ්.	එල්අයිසී
18	එල්ඕවිල්සී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්.	එල්ඕවිල්සී ජෙනරල්
19	එල්ඕවිල්සී ලයිෆ් ඇෂුවරන්ස් ලිමිටඩ්	එල්ඕවිල්සී ලයිෆ්
20	එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ්.	එම්බීඑස්එල්
21	ජාතික රක්ෂණ භාර අරමුදල	එන්අයිටීඑෆ්
22	ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	ඔරියන්ට්
23	පීපල්ස් ඉන්ෂුවරන්ස් පීවිල්සී	පීපල්ස්
24	සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ්	සණස ලයිෆ්
25	සණස ජෙනරල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ්	සණස ජෙනරල්
26	සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීවිල්සී	සොෆ්ට්ලොජික් ලයිෆ්
27	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්.	එස්එල්අයිසී
28	යූනියන් ඇෂුවරන්ස් පීවිල්සී	යූනියන් ලයිෆ්

සංඛ්‍යානමය සමාලෝචයෙහි වගු හා ප්‍රස්තාරවල දත්ත අර්ථ දැක්වීමේ දී පහත දැක්වෙන පොදු සටහන් ඌණපූර්ණයක් වේ:

1. මෙම වාර්තාවෙහි දක්වා ඇති තොරතුරු රක්ෂණ සමාගම් හා රක්ෂණ තැරැව්කාර සමාගම් මගින් සපයන ලද සංඛ්‍යාලේඛන මත පදනම් වේ.

2. ජාතික රක්ෂණ භාර අරමුදල මගින් ප්‍රතිරක්ෂණ හා රක්ෂණ ව්‍යාපාර යන අංශ දෙක පිළිබඳව ම කටයුතු කරන බැවින් සංසන්දනාත්මක පවත්වා ගැනීම සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල මගින් අවදානම් පාදක ප්‍රාග්ධනයට අදාළව ඉදිරිපත් කරන ලද දත්ත සැලකිල්ලටගෙන නොමැත.

3. ජාතික රක්ෂණ භාර අරමුදලෙහි වගා හා ණය ආරක්ෂණ යෝජනා ක්‍රමය "රක්ෂණය" වශයෙන් නොසලකන ලද බැවින් ඒවා මූල්‍ය දත්ත 2014 සිට සංඛ්‍යා ලේඛනවලින් ඉවත් කරන ලදී.

4. ඇතැම් වගුවල සංඛ්‍යා ආසන්නත ම සංඛ්‍යාංකයට වටයන ලදී. ඒ අනුව දක්වා ඇති එකතුව හා එහි සංරචකයන්ගේ එකතුව අතර යම් වෙනසක් පැවතිය හැකිය.

5. මින් පෙර ප්‍රකාශයට පත් කරන ලද සංඛ්‍යා සමඟ සැසඳීමේ දී වෙනස්කම් පසුව සංශෝධනය වී ඇත.

6. වරහන් තුළ දක්වා ඇති අගයන් ඍණ අගයන් වේ.

7. පහත සංකේත වර්තාව පුරා භාවිතා කර ඇත:

(අ) = ප්‍රතිස්ථාපිත හා විගණිත සංඛ්‍යා

(ආ) = තාවකාලික සංඛ්‍යා

= ශූන්‍ය

සංඛ්‍යානමය සමාලෝචනය

ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය පිළිබඳ දළ විශ්ලේෂණය

ගෝලීය රක්ෂණ වෙළඳපොළ පිළිබඳ සැකෙවින්

කොවිඩ් - 19 වසංගතයේ පැතිරී යාම මගින් ගෝලීය ආර්ථිකය කෙරෙහි දිගුකල් පවතින බලපෑම් එල්ල වී ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) ප්‍රකාශනවලට අනුව දැවැන්ත අභියෝග මධ්‍යයේ වුව ද 2021 දී ගෝලීය ආර්ථිකය ඇස්තමේන්තුගත 6.1% ක වර්ධනයක් සමග යථා තත්වයට පත් වෙමින් තිබේ. එමෙන්ම, කොවිඩ්-19 වසංගතය විසින් නිර්මාණය කරන ලද තත්වයන් යටතේ පුද්ගලයින් සහ ව්‍යාපාර වැඩි රක්ෂණ ආරක්ෂාවක් අපේක්ෂා කරන බැවින් ප්‍රධාන වශයෙන් දිගු කාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය යන දෙඅංශයේ ම අවදානම පිළිබඳ දැනුවත්භාවය ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස රක්ෂණ අංශය ද 2021 වසර තුළ වර්ධනයක් වාර්තා කර ඇත. ඉහළ ගිය ස්වභාවික ව්‍යසනකාරී අවදානම් සහ නැඟී එන වෙලඳපොලවල් ප්‍රමාණය තවදුරටත් ඉහළ යාම ද වඩා යහපත් වූ වර්ධන අපේක්ෂාවන් ඇති වීම කෙරෙහි බලපා ඇත.

Swiss Re හි ඇස්තමේන්තුවලට අනුව, 2020 වසර තුළ රක්ෂණ වාරික ප්‍රබල ලෙස අඩු වී ඇති පසුබිමක 2021 දී ගෝලීය රක්ෂණ වාරික 3.4% දක්වා වර්ධනය වීමක් සිදු විය. වසංගතය හේතුවෙන් අර්බුදකාරී අවස්ථාවක දී පුද්ගලයන් හා ව්‍යාපාර සඳහා මූල්‍ය සහන ලබා දෙන අවදානම් අවශෝෂකයක් ලෙස රක්ෂණ කර්මාන්තයේ වැදගත්කම ඉස්මතු කරන කම්පනයන් ඇති විය. බොහෝ පුද්ගලයන්ට තමන් සතු රක්ෂණය ප්‍රමාණවත් නොවන බව හැඟීයන බැවින් ඔවුහු වැඩි ආරක්ෂාවක් මිලදී ගැනීමට අපේක්ෂා කළහ. සමාගම් විසින් සැපයුම් දාම ගැටළු, ව්‍යාපාර කෙරෙහි බාධා එල්ල වීම සහ සයිබර් අවදානම් පිළිබඳ ඔවුන්ගේ දැනුවත්භාවය ද ඉහළ නංවා ඇත. මෙම සාධක රක්ෂණ සඳහා වැඩි ඉල්ලුමක් ඇති වීමට පාදක වී ඇති අතර එය වාරික වර්ධනයට හේතු වී ඇත. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වාරික අනුපාත, විශේෂයෙන්ම වාණිජමය මාර්ගවල, වැඩි වන ඉල්ලුමේ සහ උද්ධමන පීඩනයේ බලපෑම් අනුව අඛණ්ඩව ඉහළ යයි. කෙසේ වෙතත්, ලොව පුරා මෝටර් රථ රක්ෂණ වාරික වර්ධනයට චීනයේ බදු ඉවත් කිරීමේ අනුපාත කප්පාදුව බලපෑ අතර ඒ අනුව වර්ධන වේගය 2020 දී දැඩි ලෙස පහත වැටීමෙන් පසුව යථා තත්වයට පත් වීම ප්‍රමාද විය. ගෝලීය සෞඛ්‍ය සහ වෛද්‍ය රක්ෂණය 2021 දී ඉහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර ඊට බලපා ඇත්තේ අවදානම් පිළිබඳ වැඩි දැනුවත්භාවය සහ දැඩි ඉල්ලුමයි. එසේම, අවදානම් පිළිබඳ දැනුවත්භාවය සහ ඩිජිටල් අන්තර්ක්‍රියා ඉහළ යාමෙන් ඉල්ලුම වැඩි වීම හේතුවෙන් දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරවල වාරික මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කරයි.

පාරිභෝගිකයන්ගේ ආයෝජන කෙරෙහි වන ඇල්ම අඛණ්ඩව වැඩි වීම හේතුවෙන් යුරෝපයේ ඇතැම් උසස් වෙළඳපොළවල ඒකකවලට සම්බන්ධ ව්‍යාපාර යළි බෙහෙවින් ශක්තිමත් විය. ආසියාවේ වෙළඳපොළවල වාරික වර්ධනය සිදු වූයේ ආර්ථික පුනර්ජීවනය, අවදානම පිළිබඳ අවබෝධය ඉහළ යෑම සහ ඩිජිටල් බෙදා හැරීමේ මාර්ග භාවිතය හේතුවෙනි. වසංගත තත්වය හේතුවෙන් ලොව පුරා අවදානම පිළිබඳ දැනුවත්භාවය ඉහළ යාමට අමතරව බොහෝ නැඟී එන වෙළඳපලවල සමාජ ආරක්ෂණ පද්ධතිවල ප්‍රාථමික ස්වභාවය සහ වේගවත් ජනවිකසන වෙනස්වීම් දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා ස්ථිරසාර සංවර්ධනයක් සහ වර්ධනයක් සඳහා අවස්ථාවන් නිර්මාණය කළේය.

අඛණ්ඩ අඩු පොළී අනුපාතයන් සහ උද්ධමනය ඉහළ යාම ලොව පුරා රක්ෂණකරුවන්ගේ සැබෑ ආයෝජන ප්‍රතිලාභ සීමා කළේය. බොහෝ දිගු කාලීන රක්ෂණ සමාගම් තම නිෂ්පාදන කළඹ අඩු පොළී අනුපාත ගමන් පථයට ගැලපෙන පරිදි සකස් කරමින් සිටින්නේ නැවත සැලසුම් කරන ලද නිෂ්පාදන, ප්‍රතිමිලකරණය සහ ප්‍රාග්ධන ප්‍රශස්තකරණය රක්ෂකයාගේ ලාභදායිත්වය ඉහළ නැංවීම සඳහා ඉතා වැදගත් වන බැවිනි.

ව්‍යසන හේතුවෙන් සිදුවන කැපී පෙනෙන අලාභ සහ උද්ධමන පීඩනය ඉහළ යාම සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ හිමිකම් පෑම්වලට අදාළ පිරිවැය කෙරෙහි බෙහෙවින් බලපායි. බොහෝ ප්‍රදේශවල සංචරණ සීමාවන් ඉවත් කිරීමෙන් පසු මෝටර් රථ පන්තිය ක්‍රමයෙන් පූර්ව වසංගත හිමිකම් පෑම් මට්ටම් කරා ආපසු ගමන් කරමින් තිබිණි. තවද, ඉහළ යන මෝටර් රථ අමතර කොටස් මෝටර් හිමිකම් පෑම් ඉහළ යාම කෙරෙහි බලපා ඇත. සෞඛ්‍ය සේවා සහ වෛද්‍ය ව්‍යසන වැඩිවීම බැඳීම් සහ සේවක වන්දි හිමිකම් පෑම් කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කළේය. දරුණු කාලගුණික තත්ත්වයන් මත ඇති වූ ව්‍යසනකාරී සිදුවීම් හේතුවෙන් දේපල අලාභ සැලකිය යුතු ලෙස වැඩි විය. ස්විස් රේ සිග්මා වාර්තාවට අනුව, 2021 දී ස්වභාවික ව්‍යසනවලින් රක්ෂණය කර ඇති පාඩුව ඇ.ඩො.බි. 111 ක් පමණ වූ අතර එය ව්‍යසනකාරී පාඩු සම්බන්ධයෙන් රක්ෂණ කර්මාන්තයට දැරීමට සිදු වූ ව්‍යසන් අධික ම වසරවලින් එකක් බවට පත් විය. ඇමරිකා එක්සත් ජනපදයේ අයිඩා සුළි කුණාටුව, යුරෝපීය ගංවතුර සහ චීනයේ ගංවතුර වැනි විශාල ස්වාභාවික ව්‍යසනකාරී සිදුවීම් කිහිපයක් ගෝලීය රක්ෂණ පාඩු කෙරෙහි විශාල වශයෙන් දායක විය. දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයේ වසංගත ආශ්‍රිත හිමිකම් පෑම් 2021 දී ඇමරිකා එක්සත් ජනපදය, බ්‍රසීලය සහ මෙක්සිකෝව වැනි රටවල් කිහිපයක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය. වසරේ මුල් භාගයේදී ගෙවන ලද මරණ ප්‍රතිලාභ වැඩි වූ අතර අවසානයේ එන්නත් වැඩසටහන් සංඛ්‍යාව ඉහළ නැංවීත් සමග මරණ අනුපාතිකය අඩු විය.

වසංගත කාලය තුළ රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රත්‍යස්ථිතිය සඳහා දායක වූ ප්‍රධාන සාධකයක් වන්නේ ඩිජිටල්කරණයයි. බොහෝ රක්ෂණකරුවන් ටිකෙන් ටික විකුණුම් සහ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල

සංඛ්‍යානමය සමාලෝචනය

ඩිජිටල් ක්‍රියාවලීන් වෙත මාරු වී ඇති අතර එය සංචරණ සීමාවන් ක්‍රියාත්මක වූ කාල පරිච්ඡේද තුළ ව්‍යාපාරික කටයුතු කරගෙන යාමට බොහෝ දුරට උපකාරී විය. මෙම කර්මාන්තය නව තාක්ෂණික වර්ධනයන් සමග දැන් විකුණුම් සහ මෙහෙයුම් ක්‍රියාවලිවලින් ඔබ්බට ගොස් අවදානම් තක්සේරු කිරීම සහ පුරෝකථනය කිරීම වැනි ක්ෂේත්‍ර දක්වා ඉදිරියට ගමන් කරමින් තිබේ. තවත් ප්‍රධාන පරිවර්තනීය වෙනසක් වන්නේ ආසියාව ගෝලීය රක්ෂණ සංවර්ධනයේ ප්‍රමුඛස්ථානයට පත් වීමයි. ඉදිරි දශකය තුළ කලාපය ගෝලීය වාරික වර්ධනයෙන් 50%කට වඩා දායක වනු ඇතැයි පුරෝකථනය කර ඇත.

වසර ගණනාවක් පුරා, දේශගුණික විපර්යාස සහ ස්වභාවික ව්‍යසනකාරී අවදානම් නිවැරදිව තක්සේරු කිරීම සහ එමගින් රක්ෂිත පාඩු අවම කිරීම ලොව පුරා සිටින රක්ෂණකරුවන්ගේ ප්‍රධාන අවධානයට ලක්ව ඇත. බොහෝ දේශගුණ පුරෝකථන ආකෘති අනාගතයේ දේශගුණික විපර්යාසවලින් වඩාත් දරුණු කාලගුණික සිදුවීම් අපේක්ෂා කරන අතර වෙනස් වන සුළු කාලගුණික තත්ත්වයන්ගේ බලපෑම අවම කිරීම සඳහා තීරණාත්මක යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා සැලකිය යුතු ආයෝජනයක වැදගත්කම ඉස්මතු කරයි.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය සැකෙවින්

මූලික වශයෙන් කොවිඩ් -19 වසංගතයේ බලපෑම හේතුවෙන් 2020 දී ශ්‍රී ලංකා ආර්ථිකය තුළ 3.6% ක හැකිලීමක් දක්නට ලැබුණු අතර 2021 දී එහි 3.7% ක වර්ධනයක් වාර්තා විය. වසංගතය ආශ්‍රිත බාධාවන් ක්‍රමයෙන් අඩු වීම හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍ය තත්වයට පත්වීමත් සමග 2021 වර්ෂය තුළ ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනහිම ප්‍රගතියක් පෙන්නුම් කළේය. කෘෂිකාර්මික අංශය 2.0% කින් වර්ධනය වූයේ ප්‍රධාන වශයෙන් පොල් සහ සත්ව නිෂ්පාදන කටයුතුවල ව්‍යාප්තිය හේතුවෙනි. කෙසේ වෙතත්, සහල්, පළතුරු, එළවළු සහ අනෙකුත් පාන වර්ග සඳහා භාවිතා කරන බෝග වගාවේ අඩු වීම, අංශයේ ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපෑවේය. ගොවිතැන සඳහා අවශ්‍ය පොහොර සහ කෘෂි රසායන ද්‍රව්‍ය හිඟ වීම නිසා විශේෂයෙන් වසරේ දෙවන භාගයේදී අස්වැන්න අඩු විය. පෙර වසරේ කර්මාන්ත අංශය ප්‍රබල පසුබෑමකට ලක් වුවද ඉන් වෙනස්ව 2021 දී 5.3% ක වර්ධනයක් වාර්තා කර ඇත. නිෂ්පාදන ක්‍රියාකාරකම්වල යථා තත්වයට පත් වීමෙන් කර්මාන්ත අංශයේ වර්ධනයට මග පෑදුණු අතර ඉදිකිරීම් සහ පතල් කටයුතු මධ්‍යස්ථ ව්‍යාප්තියක් වාර්තා කර ඇත. 2021 දී සේවා අංශයේ ක්‍රියාකාරකම් 3.0% කින් ඉහළ යාමට බොහෝ දුරට මූල්‍ය සේවා සහ තොග හා සිල්ලර වෙළෙඳ ක්‍රියාකාරකම්වල ව්‍යාප්තිය හේතු විය. මෙම කාල පරිච්ඡේදය තුළ තොරතුරු තාක්ෂණ වැඩසටහන්කරණය, විදුලි සංදේශන සහ සෞඛ්‍ය ක්‍රියාකාරකම් ද ව්‍යාප්ත වූ අතර එය මූලික වශයෙන් වසංගතය හේතුවෙන් නිර්මාණය වූ ඉල්ලුම මගින් මෙහෙයවනු ලැබීය.

ආර්ථිකයේ ප්‍රධාන අංශවල වර්ධන වේගයක් පෙන්නුම් කළද, 2022 වසර ආරම්භයේ සිට සමාජ හා දේශපාලන පීඩනය ඉහළ නංවා ඇති පෙර පැවති සාර්ව ආර්ථික දුර්වලතා මගින් ඇති කරන ලද ව්‍යුහාත්මක ගැටලු සහ අවදානම් කිහිපයකට රට තවමත් මුහුණ දෙමින් සිටියි. (මූලාශ්‍රය - වාර්ෂික මහ බැංකු වාර්තාව, 2021)

2021 දී රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථිකය සුරක්ෂිත කිරීම සඳහා ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත. මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කිරීම සහ වෙළඳපොළට ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් සැපයීම මගින් රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයටම කාරක ප්‍රාග්ධන සහ ආයෝජන අවශ්‍යතා සඳහා අවශ්‍ය අරමුදල් පහසුකම් සැලසූ අතර එමගින් මහජනතාවට පොදු සේවා, උපයෝගිතා සහ භාණ්ඩ හා සේවා බාධාවකින් තොරව සැපයීම සහතික විය. කෙසේ වෙතත්, ඉහළ යන ගෙවුම් ශේෂ හිඟය, සැලකිය යුතු ණය සේවා වගකීම් සහ විදේශ සේවකයින්ගේ ප්‍රේෂණ අඩුවීම මධ්‍යයේ, විදේශ විනිමය සංචිත දැඩි ලෙස අඩු වීමට පටන් ගත් අතර එහි ප්‍රතිඵලයක් ලෙස, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ බොහෝ දුරට ද්‍රවශීලව පැවතුනි. පසුකාලීනව රජය විසින් පනවන ලද පොලී අනුපාත සහ මිල පාලනයන් වැඩි වුවද, මුදල් අවප්‍රමාණය වීම සහ ගෝලීය භාණ්ඩ මිල ඉහළ යාම මධ්‍යයේ උද්ධමන පීඩනය දැඩිව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආහාර මිල තවදුරටත් ඉහළ ගිය අතර අත්‍යාවශ්‍ය ද්‍රව්‍යවල හිඟය 2021 අග භාගයේ සහ 2022 ආරම්භයේ දිගටම පැවතුණු අතර එය ආහාර අනාරක්ෂිතභාවය සහ දරිද්‍රතාව වඩාත් නරක අතට හැරවිය හැකිය.

මෙම සෘණාත්මක ආර්ථික දෘෂ්ඨිය රක්ෂණ කර්මාන්තයට විවිධ ආකාරවලින් අභියෝග එල්ල කරයි. වැයකල හැකි ආදායම අඩු කිරීම වර්තමාන සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියාගේ වාරික ගෙවීමේ ශක්‍යතාව සීමා කරනු ඇති අතර අවසානයේ දී ඉහළ පවාරණයන් සහ අපගමනයන්ට තුඩු දිය හැකිය. ඉහළ උද්ධමනකාරී පරිසරයක් තුළ රක්ෂණකරුවන්ගේ මෙහෙයුම් සහ හිමිකම් වියදම් ඉහළ යනු ඇති අතර ඒ අනුව ඔවුන්ගේ සංචිත සහ බැඳීම් සඳහා වන ප්‍රතිපාදන සකස් කිරීමට රක්ෂණකරුවන්ට සිදු වනු ඇති අතර වාරික අනුපාත වැඩි කිරීමෙන් ඔවුන්ගේ නිෂ්පාදන තවදුරටත් ප්‍රතිමිලකරණය කරයි.

ශ්‍රී ලංකාවේ රක්ෂණ වෙළඳපළ

වසංගතයේ දිගුකාලීන බලපෑම් ආර්ථික ක්‍රියාකාරකම්වලට සහ සමාජයේ යථා පැවැත්මට තර්ජනයක් වූ හෙයින් ඒ කෙරෙහි රක්ෂණ කර්මාන්තය ඉක්මනින් ප්‍රතිචාර දැක්වූ අතර ධනාත්මක ප්‍රතිලාභ සහ වර්ධනය සඳහා වඩා යහපත් අවස්ථාවන් ලබාගෙන ඇති නවෝත්පාදන සහ ඩිජිටල් හැකියාවන් සමග එහි ව්‍යාපාර ප්‍රගතිය පවත්වා ගෙන ගියේය. ගෝලීය සන්දර්භයට සමානව, ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය 2021 දී ශක්තිමත්ව

සංඛ්‍යානමය සමාලෝචනය

පැවති අතර, 2020 දී කර්මාන්තයේ වර්ධනය යටපත් කරන ලද වසංගතය හේතුවෙන් විල්ල වූ අභියෝග අභිබවා යාමට සමත් විය.

2021 වර්ෂය අවසාන වන විට, රක්ෂණ කර්මාන්තය රක්ෂණ සමාගම් 27 කින් සමන්විත විය. එනම් දිගුකාලීන රක්ෂණකරුවන් 13 ක්, සාමාන්‍ය රක්ෂණකරුවන් 12 ක් සහ දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණ සේවා සපයන සංයුක්ත රක්ෂණකරුවන් 2 ක් ලෙසයි. 2021 දී කර්මාන්තයේ මුළු දළ ලිඛිත වාරිකය 12.12% ක ස්ථාවර වර්ධන වේගයක් පෙන්නුම් කරමින් 2020 දී වාර්තා වූ රු.මි. 208,265 ට සාපේක්ෂව රු.මි. 233,512 දක්වා ඉහළ ගියේය. වාරික වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක වන්නේ දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය වන අතර එය වසංගතය පැතිරීමත් සමග අවදානම් පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය ඉහළ යාම සහ ජීවිත ආරක්ෂාව සඳහා වන අවශ්‍යතාවය ඉහළ යාම හේතුවෙන් වසර තුළ සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කරයි. තවද, බොහෝ රක්ෂණකරුවන් කරදරයකින් තොර හිමිකම් පියවීම් ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීම සහ වසංගතයෙන් පීඩාවට පත් වූ ගනුදෙනුකරුවන්ට වැඩි ප්‍රතිලාභ ලබා දීම නිසා රක්ෂණය පිළිබඳ මහජන විශ්වාසය වර්ධනය වීමට පටන් ගත්තේය.

පසුගිය වසරේ වාර්තා වූ 2.25% ක ඍණ වාරික වර්ධනයට ප්‍රතිවිරුද්ධව, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය 2021 දී යළිත් ඉහළ ගොස් 3.32% ක මධ්‍යස්ථ වර්ධනයක් අත්කර ගත්තේය. කෙසේ වෙතත්, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය 2018 සහ 2019 දී 7% ක පමණ වාරික වර්ධනයක් අත්කර ගත් පූර්ව වසංගත තත්වයට වඩා වර්ධන වේගය තවමත් පසුගාමීය. මෝටර් රථ ආනයනය තහනම් කිරීමට රජය ගත් තීරණය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වාරික අයකර ගැනීමට බාධාවක් වූ මූලික හේතුව විය. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත දළ ලිඛිත වාරිකවලින් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් හිමි මෝටර් රථ රක්ෂණ පන්තිය, 2021 දී ඍණ වාරික වර්ධනයක් වාර්තා කළේ, මූලික වගශයෙන් මෝටර් රථ ආනයනය තහනම් කිරීම හේතුවෙනි. කොවිඩ්-19 වසංගතයේ පසුකාලීන වැඩි වීම හේතුවෙන් වාරික අය කර ගැනීම තවත් දුෂ්කර විය. විශේෂයෙන් වසරේ තුන්වන කාර්තුවේදී අධික ලෙස බෝවන ඩෙල්ටා ප්‍රභේදය රට තුළ වේගයෙන් ව්‍යාප්ත වීම නිසා රට අගුළු දැමීම් සහ සංචරණය සීමා කිරීම් දිගටම පැවතුනි. මෙම අහිතකර තත්ත්වයන් යටතේ වුවද, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ අනෙකුත් සියලුම රක්ෂණ පන්ති වසර තුළ ධනාත්මක ව්‍යාපාර වර්ධනයක් පෙන්නුම් කර ඇත.

පහත 1 ප්‍රස්තාරය සහ 1 වගුව මගින් දක්වා ඇති පරිදි දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය එහි ප්‍රගතිශීලී ප්‍රවණතාවය අඛණ්ඩව ඉදිරියට ගෙනගිය අතර 21.12% ක කැපී පෙනෙන දළ ලිඛිත වාරික වර්ධනයක් වාර්තා කරමින් වාරික ආදායම රු.බි. 125 සීමාවට ගෙනගියේය. වසංගත තත්වයක ප්‍රතිවිපාක අත්විඳීමත්, එවැනි අර්බුදයකින් ඇතිවිය හැකි අවදානම්වලින් තමන් ආවරණය කර ගැනීමේ වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් වීමත් සමග ජීවිත රක්ෂණය සඳහා ඇති ඉල්ලුම ඉහළ ගියේය. නව නිෂ්පාදන එළිදැක්වීම, ක්‍රියාවලි ඩිජිටල්කරණය, විවිධාංගීකරණය වූ බෙදාහැරීමේ මාර්ග සහ තවදුරටත් ශක්තිමත් කරන ලද නියෝජිත ආයතන වැනි විවිධ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම තුළින් දිගුකාලීන රක්ෂණකරුවන් මෙම නැගී එන වෙළඳපල අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ.

ජාතික රක්ෂණ අරමුදල විසින් වෛකල්පික රක්ෂණය පිළිගැනීම නැවත ආරම්භ කිරීම හේතුවෙන් 2021 දී සාමාන්‍ය රක්ෂණකරුවන් විසින් ජාතික රක්ෂණ අරමුදල වෙත පවරා ඇති ප්‍රතිරක්ෂණ වාරිකය නියෝජනය කරන ප්‍රතිරක්ෂණ වාරික ආදායම රු.මි. 3,235 සිට රු.මි. 3,549 දක්වා වැඩි වී ඇත.

සමස්ත දළ ලිඛිත වාරිකයෙහි කැපී පෙනෙන වර්ධනය සමග වුවද, වර්තමාන වෙළඳපල මිල අනුව දළ දේශීය නිෂ්පාදිතයේ සමාන සමානුපාතික වැඩිවීමක් හේතුවෙන් රක්ෂණ ව්‍යාප්තියේ අනුපාතය පෙර වසරට සාපේක්ෂව 1.39% ලෙස නොවෙනස්ව පවතී. කලාපය තුළ සාපේක්ෂව අඩු රක්ෂණ ව්‍යාප්තියක් තිබුණද, ශ්‍රී ලංකාවට රක්ෂණය කරන ලද පාඩු සහ රක්ෂණය නොකරන ලද පාඩු අතර පුළුල් ආරක්ෂක පරතරයක් ඇති අතර, රට නිරන්තර ස්වාභාවික විපත්වලට නිරාවරණය වන බැවින් සහ අනතුරු සහ රෝගාබාධවලින් පැන නගින පාඩු ආර්ථික හා සමාජීය ගැටළුවලට තුඩු දෙයි. අඩු උපයෝජ්‍ය ආදායම් මට්ටම් සහ රක්ෂණය කෙරෙහි අඩු අවධානයක් යොමු වීම ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාප්තියට බලපාන ප්‍රධාන බාධක ලෙස පැවතිය ද රක්ෂණ සේවාවන් විවිධ අංශවලට සහ විවිධ ස්ථානවලට ව්‍යාප්ත කරමින් ආරක්ෂණ පරතරය පියවා ගැනීමට කර්මාන්තය අප්‍රමාදව කටයුතු කරයි. එසේ වුවද, චීක පුද්ගල රක්ෂණ වාරික ප්‍රමාණය නියෝජනය කරන රක්ෂණ ඝනත්වය, වර්ෂය තුළදී රු. 9,502 සිට රු. 10,539 දක්වා හිතකර අන්දමින් වැඩිවීමක් පෙන්නුම් කළේය.

රට තුළ පවතින සංකීර්ණ ආර්ථික දුර්වලතා සහ ශිෂ්‍රයෙන් වෙනස් වන රක්ෂණ ක්ෂේත්‍රය සලකා බැලීමේදී රක්ෂණකරුවන්ට අනාගතය අභියෝගාත්මක වනු ඇත. උද්ධමන පීඩනය, අඩු කරන ලද පාරිභෝගික වියදම් සහ වෙනස් වූ පාරිභෝගික ජීවන රටාව කෙටි කාලීනව රක්ෂණ ඉල්ලුමට බලපානු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස පොලී අනුපාත ඉහළ යාම රක්ෂණකරුවන්ගේ ආයෝජන කළඹට වාසිදායක වනු ඇත.


වසංගතය පැවති කාලය තුළ බොහෝ රක්ෂණකරුවන් පාරිභෝගික අන්තර්ක්‍රියා වැඩි දියුණු කිරීමට සහ ඩිජිටල්කරණය වූ වේදිකා හරහා ශක්තිමත් පාරිභෝගික සබඳතා ගොඩනගා ගැනීමට දැනුවත්ව සිටි අතර එමගින් හුවමාරු කරගන්නා දත්තවල නිරවද්‍යතාවය ඉහළ නැංවීම සහ වඩාත් විචක්ෂණශීලී අවදානම් තක්සේරුව සඳහා පහසුකම්

සංඛ්‍යානමය සමාලෝචනය

සැපයීම සිදු කරනු ලබයි. එසේම, රක්ෂණකරුවන්ට පුද්ගල අවශ්‍යතා සපුරාලන පුද්ගලාරෝපිත රක්ෂණ ආවරණ සැපයීමට හැකි වන නිසා ඉහළ පාරිභෝගික තෘප්තියක් අත්කර ගත හැකි අතර විවිධ අවදානම් නිරාවරණයන් අනුව මිලකරණය වඩාත් නිවැරදි වනු ඇත. තාක්ෂණික වැඩිදියුණු කිරීම් සහ ඩිජිටල් මාතයන් හරහා දත්ත හුවමාරු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමත් සමග දත්ත ආරක්ෂාව සහ පාරිභෝගිකයින්ගේ පෞද්ගලිකත්ව අවශ්‍යතා සහතික කිරීම සඳහා කර්මාන්තය සයිබර් ආරක්ෂාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය.

1 ප්‍රස්තාරය

රක්ෂණ කර්මාන්තය තුළ වාරික ආදායම සහ වර්ධන අනුපාතය



1 වගුව

වාරික ආදායම සහ ව්‍යාප්තිය

	2017	2018	2019	2020 (අ)	2021 (ආ)
වාරික ආදායම - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය (රු.මිලියන)	71,571	80,294	88,787	103,000	124,752
වාරික ආදායමේ වර්ධන අනුපාතය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය (%)	12.75	12.19	10.58	16.01	21.12
වාරික ආදායම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය (රු.මිලියන)	93,389	100,586	107,685	105,265	108,760
වාරික ආදායමේ වර්ධන අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය (%)	17.34	7.71	7.06	(2.25)	3.32
මුළු වාරික ආදායම - රක්ෂණ ව්‍යාපාරය (රු.මිලියන)	164,960	180,880	196,472	208,265	233,512
මුළු වාරික ආදායමේ වර්ධන අනුපාතය - රක්ෂණ ව්‍යාපාරය (%)	15.30	9.65	8.62	6.00	12.12
ප්‍රතිරක්ෂණ වාරික ආදායම (රු.මිලියන)**	3,683	4,056	4,174	3,235	3,549
වර්තමාන වෙළඳපළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (රුපියල් බිලියන)*	13,328	14,291	14,997	15,027	16,809
දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතය %*	3.6	3.3	2.3	-3.60	3.7
ව්‍යාප්තිය % (රක්ෂණ ව්‍යාපාරයේ මුළු වාරිකය දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස)	1.24	1.27	1.31	1.39	1.39
ව්‍යාප්තිය % (දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වාරිකය දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස)	0.54	0.56	0.59	0.69	0.74
ව්‍යාප්තිය % (සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වාරිකය දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස)	0.70	0.70	0.72	0.70	0.65
රක්ෂණ ඝණත්වය - (මුළු වාරික ආදායම - රක්ෂණ ව්‍යාපාරය/ ජනගහනය) රු.	7,693	8,347	9,011	9,502	10,539
ජනගහනය (000 මධ්‍ය වාර්ෂික)*	21,444	21,670	21,803	21,919	22,156

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව හා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

වර්තමාන වෙළඳපළ මිලට අදාළ දළ දේශීය නිෂ්පාදිතය (2021) ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව මත පදනම්ව (2017) සිට යාවත්කාලීන කරන ලදී.

** ප්‍රතිරක්ෂණ වාරික ආදායම මගින් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත පවරා දෙන ලද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රතිරක්ෂණ වාරික අනිවාර්ය පැවරීම පෙන්නුම් කෙරේ.

සංඛ්‍යානමය සමාලෝචනය

රක්ෂණ සමාගම්හි මුළු වත්කම්

2020 වසරේ වාර්තා වූ රු.මි. 796,411 වත්කම් වලට සාපේක්ෂව 11.55% ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරමින් රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම් කළඹ 2021 අවසන් වන විට රු.මි. 888,377 දක්වා ඉහළ ගියේය. නියාමන අවශ්‍යතා අනුව අනාගත වගකීම් සපුරාලීම සඳහා ප්‍රමාණවත් වත්කම් පවත්වා ගැනීමට රක්ෂණකරුවන්ට අවශ්‍ය වන බැවින්, ප්‍රධාන වශයෙන් ව්‍යාපාර ප්‍රසාරණය සහ එමගින් ඇති වූ වගකීම් සංචිතවල ප්‍රමාණය වැඩි වීම හේතුවෙන් සමස්ත වත්කම් පදනමේ වැඩි වීමක් සිදු විය. කෙසේ වෙතත්, 2 වන ප්‍රස්තාරයෙහි පෙන්වා දී ඇති පරිදි 2021 දී වර්ධන වේගය අඩු වී ඇත. 2020 දී පනවා ඇති ලාභාංශ සීමාවන් ඉවත් කිරීමෙන් පසු වසර තුළ රක්ෂණකරුවන් විසින් ලාභාංශ බෙදාහැරීම් වැඩි කිරීම සහ එවැනි බෙදාහැරීම් සඳහා අරමුදල් සැපයීම සඳහා වත්කම් භාවිතා කිරීම කර්මාන්තයේ වත්කම් වර්ධනය කෙරෙහි කැපී පෙනෙන බලපෑමක් ඇති කළේය.

2021 දෙසැම්බර් 31 වන දිනට රු.මි. 632,627 ක් (2020 රු.මි. 562,706) වූ මුළු කර්මාන්ත වත්කම්වලින් බහුතරයක් දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර නියෝජනය කළ අතර පෙර වසරට සාපේක්ෂව 12.43% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. සාපේක්ෂව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් 2020 දී වාර්තා වූ 10.97% ක වර්ධනයට සාපේක්ෂව 2021 දී 9.92% ක වර්ධනයක් වාර්තා කරමින් ඉහළ යන ප්‍රවණතාවක් පවත්වා ගැනීමට සමත් විය. පෙර වසරවලට සමානව, කර්මාන්තයේ සමස්ත වත්කම් පදනමෙන් 80% කට ආසන්න ප්‍රමාණයක් මූල්‍ය ආයෝජනයන් විය. 2021 දී රජයේ සුරැකුම්පත්, සාංගමික ණය සහ කොටස් ආයෝජනවල වත්කම් 14% කට වැඩි ඉහළ යාමක් වාර්තා කළ බැවින් ඒවා වත්කම් වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපෑවේය. වසර අග භාගයේ පොලී අනුපාත ඉහළ යාමට පටන් ගැනීමෙන් පසු වර්ධනයක් අත්පත් කර ගත්තද අඩු පොලී අනුපාත තත්වය තැන්පතු ආයෝජනවල ආකර්ශනීය බව යටපත් කළේය.


ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ඉහළම දායකත්වය අනුව කර්මාන්තයේ සමස්ත වත්කම් කළඹෙහි ප්‍රධාන ස්ථානය දැරූ අතර, පසුව සෙලින්කෝ ලයිෆ්, ඒෂයිවී ලයිෆ්, යුනියන් ලයිෆ්, සෙලින්කෝ ජෙනරල් සහ අලියාන්ස් ජෙනරල් ද එහි දායකත්වය දැරිය. ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය සතු වත්කම් 2021 දී 8.79% කින් අඩු වූයේ මූලික වශයෙන් වසරේ 3 වැනි කාර්තුවේ එක් විශාල හිමිකම් පෑමක් පියවීම හේතුවෙනි.

2 වගුව
රක්ෂණ සමාගම්හි මුළු වත්කම්

	2017	2018	2019	2020 (අ)	2021 (අ)
දිගුකාලීන රක්ෂණය (රු.මිලියන)	391,890	430,759	485,121	562,706	632,627
වර්ධන අනුපාතය - දිගුකාලීන රක්ෂණය (%)	13.40	9.92	12.62	15.99	12.43
සාමාන්‍ය රක්ෂණය (රු.මිලියන)	185,583	196,005	205,130	227,640	250,217
වර්ධන අනුපාතය - සාමාන්‍ය රක්ෂණ (%)	6.67	5.62	4.66	10.97	9.92
ප්‍රතිරක්ෂණය (රු.මිලියන)	4,212	3,683	6,690	6,066	5,533
වර්ධන අනුපාතය - ප්‍රතිරක්ෂණය (%)	(26.82)	(12.54)	81.63	(9.33)	(8.79)
එකතුව (රු.මිලියන)	**581,685**	**630,447**	**696,941**	**796,412**	**888,377**
වර්ධන අනුපාතය - එකතුව (%)	**10.73**	**8.38**	**10.55**	**14.27**	**11.55**

සංඛ්‍යානමය සමාලෝචනය

2 ප්‍රස්තාරය
රක්ෂණ කර්මාන්තයෙහි මුළු වත්කම් සහ වත්කම් වර්ධන අනුපාතය



ප්‍රධාන මූල්‍ය අංශවල මුළු වත්කම්

2021 වසර තුළ ශ්‍රී ලංකා මූල්‍ය අංශය ස්ථාවරව පැවති අතර කොවිඩ්-19 වසංගතය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ ආර්ථික දුෂ්කරතා හේතුවෙන් පැන නැගුණු අභියෝග රැසක් මධ්‍යයේ මධ්‍යස්ථ කාර්ය සාධනයක් අත්කර ගැනීමට සමත් විය. 3 වගුවේ දක්වා ඇති පරිදි, 2021 දී මූල්‍ය අංශයේ සමස්ත වත්කම් 14.14% කින් ඉහළ ගිය අතර එය මූලික වශයෙන් බැංකු අංශය සහ ගිවිසුම්ගත ඉතුරුම් ආයතන මගින් මෙහෙයවනු ලබයි. සමස්ත මූල්‍ය අංශයේ කාර්ය සාධනය ලාභදායිත්වය සහ ණය වර්ධනය අනුව සැලකිය යුතු දියුණුවක් ලබා ඇත. බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවල පොළී සහ පොළී නොවන ආදායම් යන දෙකම ඉහළ ගිය අතර එමගින් අවසානයේදී එම අංශයේ ලාභදායිත්වය ඉහළ නැංවීය. ප්‍රධාන වශයෙන් විදේශ ප්‍රේෂණ අඩු වීම හේතුවෙන් වසර අග භාගයේ දී විදේශ විනිමය හිඟය වැඩි වූයේ ප්‍රධාන වශයෙන් අඩු වූ විදේශ ප්‍රේෂණ, සංචාරක අංශයේ ඉපැයීම් ඉහළ යාම මන්දගාමී වීම සහ ආනයන වියදම් ඉහළ යාම, බැංකු අංශයට අහිතකර බලපෑම් ඇති කිරීම හේතුවෙනි.

පෙර වසරවලට සමානව, 2021 අවසන් වන විට (2020 :72.9%) මුළු වත්කම්වලින් 74.7% ක් ප්‍රදර්ශනය කරමින් බැංකු අංශය මූල්‍ය අංශයේ ආධිපත්‍යය දැරීය. බලපත්‍රලාභී වාණිජ බැංකු 24ක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 6ක් 2021 වසරේ බැංකු අංශය නියෝජනය කළ අතර 16.87% ක සමස්ත වත්කම් වැඩිවීමක් අත්කර ගනිමින් ණය, අත්තිකාරම් සහ ආයෝජනවල සාධාරණ වර්ධනයක් පවත්වා ගැනීමට සමත් විය.

වසර තුළදී අයිරා, උකස් අත්තිකාරම් සහ ක්‍රෙඩිට් කාඩ්පත් වැනි ඇතැම් ණය නිෂ්පාදන ඉහළ වර්ධනයක් වාර්තා කළ බැවින් අඛණ්ඩ අඩු පොළී අනුපාතය ණය කළඹ ඉහළ නැංවීමට ඉවහල් විය. 2021 අවසානයේ දී මෙම අංශයේ ආයෝජන 16.4% කින් වර්ධනය වී ඇත්තේ ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන වැඩි වීම හේතුවෙනි.

බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, ග්‍රාමීය බැංකු සහ ණය දෙන සමුපකාර සමිති නියෝජනය කරන ලද අනෙකුත් තැන්පතු ලබාගන්නා මූල්‍ය ආයතනවල මුළු වත්කම් 2021 දෙසැම්බර් 31 දිනට රු.බි. 1,636.7 ක් විය. බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල වත්කම් වර්ධනය හේතුවෙන් මෙම අංශය වසර තුළ 6.1% ක වත්කම් වර්ධනයක් අත්කර ගෙන ඇත. ප්‍රධාන වශයෙන් මෝටර් රථ ආනයනය සඳහා පනවා ඇති සීමා කිරීම් හේතුවෙන් කල්බදුවල වර්ධනය අඩු මට්ටමක පැවතිය ද බලපත්‍රලාභී මූල්‍ය සමාගම් විසින් ලබා දුන් අනෙකුත් ණය සහ අත්තිකාරම් වසර තුළ කැපී පෙනෙන ඉහළ යාමක් වාර්තා කළේය. වසර තුළ ඒකකභාර කළමනාකරණ සමාගම්වල වත්කම් හැකිළීම හේතුවෙන් වත්කම් කළඹෙහි සුළු වර්ධනයක් පමණක් වාර්තා කිරීමට විශේෂිත මූල්‍ය ආයතන සමත් විය.

සංඛ්‍යානමය සමාලෝචනය

3 වගුව

ප්‍රධාන මූල්‍ය අංශ අතර මුළු වත්කම් ව්‍යාප්තිය

මූල්‍ය අංශ	2017		2018		2019		2020		2021	
	රු.බිලියන	%	රු.බිලියන	%	රු.බිලියන	%	රු.බිලියන	%	රු.බිලියන	%
බැංකු අංශය	11,897.4	69.7	13,711.4	72.2	14,442.1	71.9	17,087.9	72.9	19,969.9	74.7
වෙනත් තැන්පතු ලබා ගන්නා මූල්‍ය ආයතන	1,370.4	8.0	1,603.2	8.4	1,553.2	7.7	1,536.5	6.6	1,636.7	6.1
විශේෂිත මූල්‍ය ආයතන	388.9	2.3	241.1	1.3	286.7	1.4	386.5	1.6	387.7	1.4
ගිවිසුම්ගත ඉතුරුම් ආයතන	2,838.0	16.6	2,807.4	14.8	3,097.9	15.4	3,635.9	15.5	3,876.3	14.5
රක්ෂණ සමාගම්*	581.7	3.4	630.4	3.3	696.9	3.5	796.4 (අ)	3.4	888.4 (අ)	3.3
එකතුව	**17,076.4**	**100.0**	**18,993.5**	**100.0**	**20,076.8**	**100.0**	**23,443.2**	**100.0**	**26,759.0**	**100.0**

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව - වාර්ෂික වාර්තාව 2021


* රක්ෂණ සමාගම් වෙතින් ලද දත්ත මත පදනම්ව රක්ෂණ සමාගම්වල වත්කම් ප්‍රතිස්ථාපනය කෙරිණි.

2021 දෙසැම්බර් 31 වන විට වත්කම් රු.බි. 3,876.3 ක් වාර්තා කරමින් ගිවිසුම්ගත ඉතුරුම් ආයතන ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ සමස්ත වත්කම් පදනමට දෙවැනි ඉහළම දායකත්වය ලබා දුන් අතර මෙය 2020 අවසානයේ වාර්තා වූ වත්කම් රු.බි. 3,635.9 ට සාපේක්ෂව 6.61% ක වර්ධනයකි. සේවක අර්ථසාධක අරමුදල (EPF), සේවක භාර අරමුදල (ETF) සහ අනෙකුත් අනුමත විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් යනු ගිවිසුම්ගත ඉතුරුම් ආයතනවල ප්‍රධාන සංරචක වන අතර සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාර අරමුදලේ සාමාජිකයින්ගේ ශුද්ධ දායකත්වයේ ඒකාබද්ධ බලපෑම සහ අරමුදල්වල ආයෝජන හරහා උපයන ආදායම හේතුවෙන් ඔවුන්ගේ වත්කම් වර්ධනය විය. සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාර අරමුදලේ ආයෝජන කළඹ මූලික වශයෙන් සකස් වී ඇත්තේ රජයේ සුරැකුම්පත්වලින් සහ කොටස්, ස්ථාවර තැන්පතු සහ ආයතනික ණයකරවල ආයෝජනය කරන ලද සුළු මුදල් ප්‍රමාණයකිනි. (මූලාශ්‍රය - වාර්ෂික මහ බැංකු වාර්තාව, 2021)

රක්ෂණ සමාගම් 2021 වසර අවසන් වන විට රු.බි. 888.4ක් වාර්තා කරමින් 11.55% ක මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කර මූල්‍ය අංශයේ සමස්ත වත්කම් කළඹට සිය ධනාත්මක දායකත්වය අඛණ්ඩව ලබා දුන්නේය.

3 ප්‍රස්තාරය

2021 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන මූල්‍ය අංශවල මුළු වත්කම් ව්‍යාප්තිය



සංඛ්‍යානමය සමාලෝචනය

ලාභදායීබව

පසුගිය වසරේ ප්‍රශංසනීය මූල්‍ය කාර්ය සාධනයක් පෙන්නුම් කිරීමෙන් පසුව, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් ප්‍රධාන වශයෙන්, රක්ෂණ ක්ෂේත්‍රය සමස්ත ලාභදායී බව (බදු පෙර ලාභය) 2.03% ක සුළු අඩුවීමක් පෙන්නුම් කළේය. පහත වගුව 4 හි පෙන්වා ඇති පරිදි කර්මාන්තයේ ලාභය 2020 වර්ෂය සඳහා වාර්තා වූ රු.මි. 43,649 ට සාපේක්ෂව 2021 වර්ෂය සඳහා රු.මි. 42,762 ක් විය.

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය 2021 තුළ කාර්ය සාධනයට අදාළව ප්‍රබල ලෙස යථා තත්වයට පත් වූ අතර 20.82% ක (2020: - 9.36%) ලාභදායී බවක් අත්කර ගත්තේය. ඒඅයිඒ ලයිෆ්, සොෆ්ට්ලොජික් ලයිෆ් සහ යූනියන් ලයිෆ් ලාභය ඉහළ යාමට ප්‍රධාන වශයෙන් දායක විමත් සමග දිගුකාලීන රක්ෂණ සමාගම් බහුතරයක් වසර තුළ ලාභදායී බව ඉහළ ගොස් ඇති බවට වාර්තා කළේය. 2021 අවසාන කාර්තු දෙක තුළ වූ ඉහළ කාර්ය සාධනය හේතුවෙන් පෙර වසරවල අත්විඳි පාඩුවලට වඩා වෙනස්ව 2021 වසර සඳහා සැලකිය යුතු ලාභයක් පෙන්නුම් කිරීමට එල්අයිසී හට ඉවහල් විය. සමස්තයක් ලෙස ගත් කල, දළ ලිඛිත වාරිකයෙහි වර්ධනය, වසර තුළ ජනනය කරන ලද හිතකර ශුද්ධ ආයෝජන ආදායම සහ බොහෝ දිගු කාලීන රක්ෂණකරුවන් විසින් අනුගමනය කරන ලද දැඩි පිරිවැය ප්‍රශස්තිකරණය සහ සීමා කිරීමේ ක්‍රියාමාර්ග ලාභදායී බව ඉහළ නැංවීමට මූලිකව දායක විය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් මරණ ප්‍රතිලාභ, කල්පිරීමේ දී සිදු කරන ගෙවීම් සහ පවාරණ ගෙවීම්වල වැඩිවීම හේතුවෙන් රක්ෂණ හිමියන්ට හිමිකම් සහ ප්‍රතිලාභ මධ්‍යස්ථ ඉහළ යාමක් දක්නට ලැබුණු අතර එය ලාභදායී බව කෙරෙහි අහිතකර අන්දමින් බලපෑවේය. පසුගිය වසරට සාපේක්ෂව ලාභයේ අඩුවීමක් දක්නට ලැබුණද 2021 වසරේදී රු.මි. 8,545 ක ලාභයක් වාර්තා කරමින් දිගුකාලීන රක්ෂණකරුවන් අතර ඉහළම ලාභදායී බව වාර්තා කිරීමට සෙලින්කෝ ලයිෆ් සමත් විය. සොෆ්ට්ලොජික් ලයිෆ්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, යූනියන් ලයිෆ් සහ ඒඅයිඒ ලයිෆ් විසින් පිළිවෙලින් පසුව ඉහළම ලාභය පෙන්නුම් කෙරිණි.

හිමිකම් පෑම් අඩු වීමේ ප්‍රතිඵලය සාමාන්‍ය රක්ෂණ සමාගම් සියල්ලේම පාහේ කාර්ය සාධනය වැඩි දියුණු කර ඇති බැවින් 2020 වර්ෂය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට ලාභදායී වසරක් ලෙස ඉස්මතු විය. කෙසේ වෙතත්, 2021 දී ෆෙයාෆස්ට් හැර අනෙකුත් සියලුම සාමාන්‍ය රක්ෂණ සමාගම් අඩු ලාභ ප්‍රදර්ශනය කර ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත ලාභය පසුගිය වසරට සාපේක්ෂව 18.48% කින් පහත වැටී ඇත. වර්ෂය තුළ සාමාන්‍ය රක්ෂණ හිමිකම් පෑම් 13.72% කින් ඉහළ ගොස් ඇති අතර එමගින් ආර්ථික ක්‍රියාකාරකම් සහ සංචලනය සාමාන්‍යකරණය වීම පිළිබිඹු කරයි. එසේ වුවද, 2021 දී අමතර කොටස්වල මිල විශාල ලෙස ඉහළ ගියද මෝටර් රථ හිමිකම් පෑම් අඩු විය. ජාතික රක්ෂණ භාර අරමුදල සමස්ත ලාභයේ විශාල ප්‍රතිශතයක් අඩුවීමට පාදක වී ඇත්තේ ප්‍රධාන වශයෙන් කොවිඩ්-19 ආශ්‍රිත හිමිකම් පෑම් පිළිබඳ දැනුම්දීම් ඉහළ යාමත් සමග අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළ සෞඛ්‍ය රක්ෂණ ඔප්පුවලට අදාළ හිමිකම් පෑම් ප්‍රමාණය සැලකිය යුතු ලෙස වැඩි වීම හේතුවෙනි. මෝටර් රථ සහ දේපලවලට අදාළව ව්‍යාපාර ප්‍රමාණය අඩුවීම සහ වසර තුළ හිමිකම් පෑම් ප්‍රමාණය ඉහළ යාම හේතුවෙන් අලියාන්ස් ජෙනරල් මගින් ද ලාභයේ කැපී පෙනෙන අඩුවීමක් වාර්තා කෙරිණි.

4 වගුව
රක්ෂණ සමාගම්වල ලාභදායී බව

රක්ෂණකරු	2020(අ)			2021(ආ)		
	දිගුකාලීන රක්ෂණය (රු.'000)	සාමාන්‍ය රක්ෂණය (රු.'000)	එකතුව (රු.'000)	දිගුකාලීන රක්ෂණය (රු.'000)	සාමාන්‍ය රක්ෂණය (රු.'000)	එකතුව (රු.'000)
ඒඅයිඒ ලයිෆ්	724,428		724,428	2,567,127		2,567,127
අලියාන්ස් ජෙනරල්		2,135,071	2,135,071		1,542,889	1,542,889
අලියාන්ස් ලයිෆ්	80,751		80,751	77,487		77,487
අමානා ජෙනරල්		38,763	38,763		23,762	23,762
අමානා ලයිෆ්	(34,712)		(34,712)	8,443		8,443
ආර්පිකෝ	278,595		278,595	337,563		337,563
සෙලින්කෝ ජෙනරල්		1,862,479	1,862,479		1,747,523	1,747,523

සංඛ්‍යානමය සමාලෝචනය

රක්ෂණකරු	2020(අ)			2021(ආ)		
	දිගුකාලීන රක්ෂණය (රු.'000)	සාමාන්‍ය රක්ෂණය (රු.'000)	එකතුව (රු.'000)	දිගුකාලීන රක්ෂණය (රු.'000)	සාමාන්‍ය රක්ෂණය (රු.'000)	එකතුව (රු.'000)
සෙලින්කෝ ලයිෆ්	8,766,512		8,766,512	8,545,374		8,545,374
කොන්ටිනෙන්ටල්		1,086,086	1,086,086		1,000,329	1,000,329
කෝපරේටිව් ජෙනරල්		870,078	870,078		748,541	748,541
කෝප් ලයිෆ්	69,805		69,805	71,516		71,516
ෆෙයාෆස්ට්		765,687	765,687		882,991	882,991
එච්එන්බී ලයිෆ්	999,363		999,363	1,452,211		1,452,211
එච්එන්බී ජෙනරල්		631,131	631,131		411,168	411,168
ජනශක්ති ලයිෆ්	1,020,903		1,020,903	661,673		661,673
එල්අයිසී	(371,145)		(371,145)	130,073		130,073
එල්ඕඑල්සී ජෙනරල්		1,537,397	1,537,397		1,271,403	1,271,403
එල්ඕඑල්සී ලයිෆ්	453,650		453,650	585,138		585,138
එම්බීඑස්එල්	36,696	(99,118)	(62,422)	33,595	(87,360)	(53,765)
එන්අයිටීඑෆ්		7,721,134	*8,865,905		5,342,569	*5,932,368
ඔරියන්ට්		185,814	185,814		183,938	183,938
පීපල්ස්		1,667,520	1,667,520		1,125,882	1,125,882
සණස ලයිෆ්	44,874		44,874	128,673		128,673
සණස ජෙනරල්		136,105	136,105		75,251	75,251
සොෆ්ට්ලොජික් ලයිෆ්	2,130,347		2,130,347	2,965,674		2,965,674
එස්එල්අයිසී	3,149,448	4,822,335	7,971,783	2,937,771	4,733,490	7,711,261
යූනියන් ලයිෆ්	1,793,841		1,793,841	2,627,307		2,627,307
එකතුව	**19,143,355**	**23,360,482**	**43,648,608**	**23,129,625**	**19,042,376**	**42,761,800**

* වගා රක්ෂණය සහ ප්‍රතිරක්ෂණය ව්‍යාපාරයට අදාළ බදු පෙර පෙර ලාභය පිළිවෙලින් රු.මි. 1,115 (2020: රු.මි. 86) සහ රු.මි. 545 (2020: රු.මි. 1,230) ඇතුළත් වේ.

සංඛ්‍යානමය සමාලෝචනය

රක්ෂණ සමාගම්හි කොටස් හිමිකරුවන්ගේ අරමුදල්

රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ගේ අරමුදල් වසර තුළ 9.45% ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ අතර 2021 අවසන් වන විට එය රු.මි. 259,360 (2020 : රු.මි. 236,971) දක්වා වූ වර්ධනයක් වාර්තා කළේය. කොටස් හිමියන්ගේ අරමුදල් වැඩි කිරීම සඳහා ප්‍රධාන වශයෙන් වසර තුළ ඉපැයූ ලාභය දායක වූ අතර සුළු වශයෙන් වැඩි වූ ගෙවා නිමි ප්‍රාග්ධනය ද ඉහත වර්ධනය සඳහා සුළු දායකත්වයක් සපයන ලදී. කෝපරේටිව් ජෙනරල්, කොන්ටිනෙන්ටල්, ඒල්අයිසී, සණස ලයිෆ්, ඒල්ඕඒල්සී ජෙනරල් සහ ඒල්ඕඒල්සී ලයිෆ් 2021 දී තමන්ගේ කොටස් ප්‍රාග්ධනය වැඩි කළ අතර ඒ අනුව මුළු ගෙවා නිමි ප්‍රාග්ධනය 3.60% කින් ඉහළ නංවාගෙන රු.මි. 45,248 (2020 : රු.මි. 43,696) ලෙස වාර්තා කර ඇත.

පහත 5 වගුවේ වාර්තා කර ඇති අනෙකුත් මුළු සංචිත ප්‍රමාණය ප්‍රධාන වශයෙන් රඳවා ගත් ඉපැයුම්, ප්‍රත්‍යාගණන කළ සංචිත සහ අනෙකුත් සාමාන්‍ය සංචිතවලින් සමන්විත වූ අතර ලාභාංශ බෙදාහැරීම් ඉහළ යාම හේතුවෙන් සමස්ත රඳවා ගත් ඉපැයුම් අඩු වුවද එය පෙර වසරට සාපේක්ෂව 11.76% ක වර්ධනයක් පෙන්නුම් කළේය. රක්ෂණ සමාගම්වල එක් වරක් පමණක් ලැබෙන අතිරික්තය රු.මි. 16,248 ක් වූ සීමිත නියාමන සංචිතයක් ලෙස පවත්වාගෙන යයි.

පෙර වසර මෙන්ම කර්මාන්තයේ ඉහළම කොටස් හිමියන්ගේ අරමුදල් ප්‍රමාණය වාර්තා කර ඇත්තේ සංයුක්ත රක්ෂකයෙකු වන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් වන අතර සෙලින්කෝ ලයිෆ් සහ ඒඅයිවී ලයිෆ් දෙවන සහ තෙවන ස්ථාන වාර්තා කර ඇත. වර්ජන, කැරළි, සිවිල් කැළඹීම් හා ත්‍රස්ත අරමුදල සහ බෝග රක්ෂණ යෝජනා ක්‍රමය මඟින් වසර තුළ උපයාගත් ලාභය හේතුවෙන් ජාතික රක්ෂණ භාර අරමුදල සාමාන්‍ය රක්ෂණකරුවන් අතර මුළු කොටස් හිමියන්ගේ අරමුදල් සඳහා ප්‍රමුඛතම දායකයා විය. ඒල්අයිසී කොටස් හිමියන්ගේ අරමුදල් සම්බන්ධයෙන් ධනාත්මක ප්‍රතිචාරයක් දැක්වීමට සමත් වූ අතර සමාගම සිය කොටස් ප්‍රාග්ධනය රු.මි. 189 කින් ඉහළ නැංවීමෙන් පසු 2021 අවසානය වන විට එය රු.මි. 61 සිට රු.මි. 325 දක්වා වර්ධනය විය. ඒල්අයිසී සහ අමානා ලයිෆ් සුළු දියුණුවක් අත්කර ගෙන තිබුණ ද පසුගිය මූල්‍ය වර්ෂවල ඇති වූ සමස්ථ පාඩුව හේතුවෙන් එම සමාගම් රක්ෂණ ක්ෂේත්‍රයේ අඩුම කොටස් හිමියන්ගේ අරමුදල් අඛණ්ඩව වාර්තා කර ඇත.

5 වගුව

රක්ෂණ සමාගම්හි මුළු කොටස්කරුවන්ගේ මුළු අරමුදල් ප්‍රමාණය

රක්ෂණකරු	2020(අ)		2021(ආ)				
	මුළු කොටස්කරුවන්ගේ අරමුදල් (රු.'000)	%	ප්‍රකාශිත ප්‍රාග්ධනය (රු.'000)	සීමිත නියාමක සංචිතය (රු.'000)	මුළු වෙනත් සංචිත (රු.'000)	මුළු කොටස්කරුවන්ගේ අරමුදල් (රු.'000)	%
ඒඅයිවී ලයිෆ්	20,579,684	8.68	511,922	6,080,848	13,156,326	19,749,096	7.93
අලියන්ස් ජෙනරල්	11,559,232	4.88	8,619,972		3,714,848	12,334,820	4.76
අලියන්ස් ලයිෆ්	2,079,140	0.88	739,624		584,901	1,324,525	0.51
අමානා ජෙනරල්	1,505,015	0.64	1,860,001		(308,625)	1,551,376	0.60
අමානා ලයිෆ්	459,612	0.19	500,000		(26,546)	473,454	0.18
ආර්පිකෝ	1,860,809	0.79	675,565		1,395,580	2,071,145	0.80
සෙලින්කෝ ජෙනරල්	12,972,646	5.47	500,200		13,967,904	14,468,104	5.58
සෙලින්කෝ ලයිෆ්	38,145,036	16.10	500,001	3,456,184	40,237,848	44,194,033	17.04
කොන්ටිනෙන්ටල්	2,843,804	1.20	1,250,000		2,214,469	3,464,469	1.34
කෝපරේටිව් ජෙනරල්	3,399,461	1.43	2,198,316		2,429,162	4,627,478	1.78

සංඛ්‍යානමය සමාලෝචනය

රක්ෂණකරු	2020(අ)		2021(ආ)				
	මුළු කොටස්කරුවන්ගේ අරමුදල් (රු.'000)	%	ප්‍රකාශිත ප්‍රාග්ධනය (රු.'000)	සීමිත නියාමක සංචිතය (රු.'000)	මුළු වෙනත් සංචිත (රු.'000)	මුළු කොටස්කරුවන්ගේ අරමුදල් (රු.'000)	%
කෝප් ලයිෆ්	1,077,740	0.45	544,260		420,438	964,698	0.37
ෆෙයාෆස්ට්	6,304,508	2.66	3,131,949		3,745,463	6,877,412	2.65
එච්එන්බී ලයිෆ්	7,260,988	3.06	1,171,875	381,156	5,479,354	7,032,385	2.71
එච්එන්බී ජෙනරල්	2,083,242	0.88	1,150,000		1,090,623	2,240,623	0.86
ජනශක්ති ලයිෆ්	10,067,149	4.25	4,853,752	1,795,829	3,556,867	10,206,448	3.94
එල්අයිසී	60,840	0.03	839,016		(513,860)	325,156	0.13
එල්ඕඑල්සී ජෙනරල්	3,063,539	1.29	800,000		3,204,018	4,004,018	1.54
එල්ඕඑල්සී ලයිෆ්	1,797,256	0.76	1,350,000	256,134	795,682	2,401,816	0.93
එම්බීඑස්එල්	1,029,668	0.43	2,280,022		(1,313,041)	966,981	0.37
එන්අයිටීඑෆ්	13,087,460	5.52			14,751,327	14,751,327	5.69
ඔරියන්ට්	1,016,320	0.43	825,000		329,136	1,154,136	0.44
පීපල්ස්	4,619,185	1.95	1,350,000		3,591,619	4,941,619	1.91
සණස ලයිෆ්	1,092,456	0.46	1,045,346		176,549	1,221,895	0.47
සණස ජෙනරල්	732,349	0.31	508,996		231,819	740,815	0.29
සොෆ්ට්ලොජික් ලයිෆ්	9,936,247	4.19	1,062,500	798,004	8,727,926	10,588,430	4.08
එස්එල්අයිසී	63,229,026	26.68	6,000,000	98,237	65,130,454	71,228,691	27.46
යූනියන් ලයිෆ්	15,108,489	6.38	1,000,000	3,381,934	11,073,159	15,455,093	5.96
එකතුව	**236,970,901**	**100.00**	**45,268,317**	**16,248,326**	**197,843,400**	**259,360,043**	**100**

සටහන : 2020 දී ප්‍රකාශයට පත් කරන ලද සංඛ්‍යා විගණන ගැලපුම්වලට අනුව සංශෝධනය කරන ලදී.

සංඛ්‍යානමය සමාලෝචනය

රක්ෂණකරුවන්ගේ ශාඛා, සේවකයින් සහ ඒජන්තවරුන් පිළිබඳ විශ්ලේෂණය

රක්ෂණ ක්ෂේත්‍රයේ මුළු ශාඛා ජාලය වසර තුළ දී 1,953 සිට 1,896 දක්වා අඩු වූයේ මූලික වශයෙන් මීන් පෙර තමන්ට සම්බන්ධ මූල්‍ය ආයතනවලට අයත් පරිශ්‍රයන්ගේ රැඳී සිටි රක්ෂණකරුවන් දෙදෙනකු තමන්ගේම පරිශ්‍රයට ගොස් තම ශාඛා ජාලය ප්‍රතිව්‍යුහගත කිරීම හේතුවෙනි. කෙසේ වෙතත්, අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයක් තුළ ව්‍යාපාර මෙහෙයුම් සංවර්ධනය සඳහා පහසුකම් සැලසීමට වැඩි ශාඛා ප්‍රමාණයක ආවරණයක් අත්‍යවශ්‍ය බැවින්, අනෙකුත් බොහෝ රක්ෂණ සමාගම් විසින් 2021 දී දිවයින පුරා නව ශාඛා විවෘත කරන ලදී. ඒ අනුව වසර අවසන් වන විට දිගුකාලීන රක්ෂණ සමාගම්හි ශාඛා 964ක්, සාමාන්‍ය රක්ෂණ සමාගම් ශාඛා 775ක් සහ සංයුක්ත රක්ෂණ සමාගම් ශාඛා 157ක් රට තුළ ක්‍රියාත්මක විය. ඒවායින් වැඩි ප්‍රමාණයක් බස්නාහිර පළාත තුළත් මීළඟට වැඩිම ශාඛා ප්‍රමාණය දකුණු පළාත සහ මධ්‍යම පළාත තුළත් පිහිටා ඇත.

2021 වසර අවසාන වන විට රක්ෂණ සමාගම්හි මුළු සේවක සංඛ්‍යාව 20,032 වූ අතර එය 2020 දී වාර්තා වූ 19,571 ට සාපේක්ෂව 2.36% ක සුළු වැඩිවීමකි. පෙර වසරවලට සමානව 60% කට වඩා වැඩි සේවකයින් සංඛ්‍යාවක් බස්නාහිර පළාත තුළ විය. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සේවක සංඛ්‍යාව 10,999 ක් වූ අතර දිගුකාලීන රක්ෂණ සමාගම් සහ සංයුක්ත රක්ෂණ සමාගම් තුළ පිළිවෙලින් සේවකයන් 6,212 ක් සහ සේවකයන් 2,821 ක් වූහ.

එල්අයිසී, එච්ඩීඑෆ්සී ලයිෆ්, සොෆ්ට්ලොජික් ලයිෆ්, ජනශක්ති ලයිෆ්, එල්ඕවිල්සී ලයිෆ් සහ සණස ලයිෆ් වැනි රක්ෂණකරුවන් කිහිප දෙනෙකු තම නියෝජිත ජාලයේ කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කිරීම හේතුවෙන් වසර තුළ සමස්ත නියෝජිත බලකායේ සුළු දියුණුවක් දක්නට ලැබිණි. කෙසේ වුවද, සාමාන්‍ය රක්ෂණ සමාගම් සහ සංයුක්ත රක්ෂණකරුවන්ගෙන් බහුතරයක් මූලික වශයෙන් සුදුසුකම් නොමැතිකම සහ දුර්වල ක්‍රියාකාරිත්වය මත නියෝජිතයින් සංඛ්‍යාව සීමා කර ඇත. බොහෝ සමාගම් නියෝජිත බලකාය ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති අතර ඒ අනුව ක්‍රියාකාරී නොවන නියෝජිතයින්ගේ සේවය අවසන් කර ඇති අතර වර්ෂය තුළ ඉල්ලා අස්වීම් යම් ප්‍රමාණයක් ද නිරීක්ෂණය කෙරේ. දිගුකාලීන රක්ෂණකරුවන් 2021 අවසානය වන විට මුළු නියෝජිත ආයතන සංඛ්‍යාවෙන් 61.42% කට හිමිකම් කියූ අතර සංයුක්ත රක්ෂණ සමාගම් සහ සාමාන්‍ය රක්ෂණකරුවන් මුළු නියෝජිතයින්ගෙන් පිළිවෙළින් 30.77% සහ 7.81% නියෝජනය කළහ.

6 වගුව

2020 සහ 2021 දෙසැම්බර් 31 දිනට ශාඛා, සේවකයන් සහ නියෝජිතයන් සංඛ්‍යාව

පළාත	ශාඛා සංඛ්‍යාව		සේවක සංඛ්‍යාව		නියෝජිතයන් සංඛ්‍යාව	
	2020	2021	2020	2021	2020	2021
මධ්‍යම පළාත	207	197	1,214	1,327	3,741	3,705
නැගෙනහිර පළාත	126	130	605	665	2,112	2,401
උතුරු මැද පළාත	137	134	663	736	2,520	2,472
වයඹ පළාත	221	207	1,244	1,221	4,676	4,414
උතුරු පළාත	133	130	615	689	2,683	3,513
සබරගමුව පළාත	148	145	835	907	3,088	3,527
දකුණු පළාත	242	238	1,527	1,599	5,124	5,162
ඌව පළාත	107	117	580	742	2,153	2,087
බස්නාහිර පළාත	632	598	12,288	12,146	16,622	16,539
එකතුව	**1,953**	**1,896**	**19,571**	**20,032**	**42,719**	**43,820**

සංඛ්‍යානමය සමාලෝචනය


රක්ෂණ සමාගම්වල බෙදාහැරීමේ මාර්ග

පවතින වසංගත තත්වය රක්ෂකයින් තම නිෂ්පාදන පාරිභෝගිකයින්ට විකිණීම සඳහා දැඩි ලෙස බලපෑ බැවින් බෙදාහැරීමේ මාර්ග විවිධාංගීකරණය රක්ෂකයන්ගේ අවධානය යොමු වූ ප්‍රධාන කරුණක් විය. වසංගතය පැතිරීමත් සමග රක්ෂණය පිළිබඳ දැනුවත්භාවය ඇති තරුණ පරම්පරාවේ ඉල්ලුමට ගැලපෙන බැවින් පුද්ගලයන් හමු වී විකිණීම වෙනුවට ඩිජිටල් මාර්ග භාවිතා කිරීමේ ප්‍රවණතාව වැඩි විය. පහත 5 වන ප්‍රස්තාරයෙහි සෘජු කාණ්ඩයෙන් නියෝජනය වන අන්තර්ජාලය, සමාජ මාධ්‍ය සහ ජංගම යෙදුම් හරහා ජනනය වන වාරිකවල ක්‍රමානුකූල වැඩි වීම මගින් මෙම තත්වය පිළිබිඹු වේ.

2021 වසර තුළදී, නියෝජිත නාලිකාව දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකය සඳහා 80.55% ක දායකත්වයක් සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකය සඳහා 23.89% ක දායකත්වයක් ලබා දෙමින් අඛණ්ඩව ශ්‍රී ලංකා රක්ෂණ වෙළෙඳපොළේ සමස්ත වාරික බෙදා හැරීමේ ප්‍රමුඛස්ථානය ලබාගෙන ඇත. දිගු කාලීන රක්ෂණ නිෂ්පාදන තවමත් ප්‍රධාන වශයෙන් නියෝජිත ආයතන ජාලය හරහා අලෙවි වන අතර, සාමාන්‍ය රක්ෂණ සමාගම් සෘජු නාලිකා, සුවිශේෂී විකුණුම් බළකාය, නියෝජිතයන් සහ තැරැව්කරුවන් ඔවුන්ගේ ප්‍රධාන බෙදාහැරීමේ ක්‍රම ලෙස යොදා ගෙන ඇත. එය 2021 සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු වාරික ආදායමෙන් 89.68% ක් විය. බොහෝ සමාගම් දැනට පවතින බැංකු රක්ෂණ හවුල්කාරිත්වයන් ශක්තිමත් කර ඇති අතර එහි ප්‍රවේශය පුළුල් කිරීම සඳහා තාක්ෂණය ප්‍රශස්ත කර ඇති බැවින් බැංකු රක්ෂණ නාලිකාව විශේෂයෙන් දිගු කාලීන රක්ෂණකරුවන් සඳහා තීරණාත්මකව පැවතිණි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත දළ ලිඛිත වාරිකය සඳහා ඉහළම දායකත්වයක් වාර්තා කළ වේලාවක් වෙන් කර නොගෙන පැමිණෙන ගණුදෙනුකරුවන්, ජංගම යෙදුම් අන්තර්ජාල සහ ජාතික රක්ෂණ

4 ප්‍රස්තාරය


2021 දෙසැම්බර් 31 දිනට ශාඛා, සේවකයන් සහ නියෝජිතයන් සංඛ්‍යාව



සංඛ්‍යානමය සමාලෝචනය

භාර අරමුදල හරහා ක්‍රියාත්මක වන රජයේ රක්ෂණ යෝජනා ක්‍රමවලින් ජනනය කෙරෙන වාරික ආදායම සෘජු නාලිකාවේ ප්‍රධාන සංරචක විය. අදාළ රක්ෂණකරු අයත් වන කණ්ඩායම තුළ පවතින ආයතනවලින් ජනනය කරන ලද දළ ලිඛිත වාරිකය අදාළ/සමූහ සමාගම් යටතේ වාර්තා කරන ලද අතර එය පෙර වසරට සාපේක්ෂව මුළු දළ ලිඛිත වාරිකය සඳහා වැම මට්ටමේම දායකත්වයක් පෙන්නුම් කළේය.

5 ප්‍රස්තාරය
රක්ෂණ සමාගම්වල බෙදාහැරීමේ මාර්ග



	දිගුකාලීන 2020	සාමාන්‍ය 2020	දිගුකාලීන 2021	සාමාන්‍ය 2021
නියෝජිතයින්	80.12	25.07	80.55	23.89
තැරැව්කරුවන්	1.27	18.82	1.98	18.40
විශේෂිත විකුණුම් බලකාය (රක්ෂණ නියෝජිතයින් නොවූ)	0.67	20.37	0.57	21.59
සෘජු	2.32	25.17	2.66	25.80
බැංකුරක්ෂණය	14.37	3.40	13.23	3.32
අදාළ/සමූහ සමාගම්	1.26	6.72	1.00	6.53
වෙනත්	0.00	0.45	0.01	0.46

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

දළ ලිඛිත වාරිකය

කොවිඩ්-19 වසංගතය මගින් 2021 දී අඛණ්ඩව ආර්ථික ක්‍රියාකාරකම්වලට බාධා ඒල්ල කෙරිණි. කෙසේ වෙතත්, වසර පුරා පැවති දැඩි අභියෝගාත්මක ව්‍යාපාරික තත්වය මධ්‍යයේ වුවද අඛණ්ඩ ආර්ථික ක්‍රියාකාරකම් ද සමග එන්නත් කිරීමේ ව්‍යාපාරය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම 21.12% (2020: 16.01%) වර්ධනයක් වාර්තා කරමින් දිගු කාලීන රක්ෂණකරුවන්ගේ වර්ධනය තවදුරටත් වේගවත් කර ඇත. 2021 දී සමස්ත දළ ලිඛිත වාරිකය වූ රු.මි. 124,752 (2020: රු.මි. 103,000) සමඟින් ව්‍යාපාර සහ මෙහෙයුම් ආකෘති ඩිජිටල්කරණය, නව්‍ය නිෂ්පාදන පිරිනැමීම්, බෙදාහැරීමේ නාලිකා ප්‍රශස්තකරණය යනාදිය ජීවිත රක්ෂණ අංශයේ මෙම ප්‍රශංසනීය වර්ධනයට දායක වී ඇත. තවද, මෙම වසංගතය අවිනිශ්චිතතාවයන්, රක්ෂණයේ වැදගත්කම සහ රක්ෂණ කර්මාන්තය පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවීම ජීවිත රක්ෂණ කෂේත්‍රයේ වර්ධනයට දායක වී ඇත. වසරේ මුල් භාගයේදී වෙළෙඳපොළ තුළ පැවති අඩු පොලී අනුපාතවල ප්‍රතිඵලයක් ලෙස සපයන ලද ආකර්ෂණීය සහතික කළ ප්‍රතිලාභ හේතුවෙන් කෙටි කාලීන ජීවිත ආවරණ වර්ධනය විය.

2020 දී පෙන්නුම් කරන ලද දළ ලිඛිත වාරික වර්ධන වේගය ඉහළ මට්ටමක පවත්වා ගනිමින් සමස්ත දළ ලිඛිත වාරික වර්ධන වේගය 2021 දී 21.12% දක්වා තවදුරටත් ඉහළ ගිය අතර පසුගිය වසර පහ තුළ ජීවිත රක්ෂණ අංශයේ ඉහළම වර්ධන වේගය වාර්තා කරමින් අභියෝග මධ්‍යයේ වුවද පවත්වා ගත් ජීවිත රක්ෂණකරුවන්ගේ ප්‍රත්‍යාස්ථ කාර්ය සාධනය පෙන්නුම් කරයි. අගය අනුව, 2017 සිට 2021 දක්වා දළ ලිඛිත වාරිකය 74.30% කින් වැඩි වර්ධනය වී ඇත.

ජීවිත රක්ෂණ වෙළෙඳපොළ ව්‍යාප්තිය ඉහළ යාමේ ප්‍රවණතාවක් තිබුණද අනෙකුත් රටවල් හා සසඳන විට එය තවමත් පහළ මට්ටමක පවතී.

සංඛ්‍යානමය සමාලෝචනය

වෙළඳපොලේ නැගී එන ප්‍රවණතා සම්බන්ධයෙන් කටයුතු කරන අතරම ප්‍රමාණවත් සේවාව නොසැපයෙන පාරිභෝගිකයා වෙත ළඟා වීම ඉදිරි වසරවල වර්ධනය පවත්වා ගැනීමට රක්ෂණකරුවන්ට ඉවහල් වනු ඇත. කෙසේ වෙතත්, ඉදිරි වසර කිහිපය තුළ අභියෝගාත්මක සාර්ව ආර්ථික පසුබිමක් තුළ ජීවිත රක්ෂණකරුවන්ට කැළඹීම්වලට මුහුණ දීමට සිදුවනු ඇත.

දිගු කාලීන රක්ෂණ සමාගම් 13කින් සහ සංයුක්ත රක්ෂණ සමාගම් 02 කින් සමන්විත ශ්‍රී ලංකාවේ දිගුකාලීන රක්ෂණ කර්මාන්තය ඉහළ තරඟකාරීත්වයකින් යුක්ත වේ. ඒඅයිඒ ලයිෆ්, අලියාන්ස් ලයිෆ්, එල්අයිසී සහ සොෆ්ට්ලොජික් ලයිෆ් යන සමාගම් හතරක් විදේශීය රක්ෂණ සමාගම් සමග සහයෝගයෙන් කටයුතු කර ඇත.

දිගුකාලීන රක්ෂණ සමාගම්වල සමාගම් අනුව දළ ලිඛිත වාරිකය සහ වෙළඳපල කොටස 7 වගුව මගින් නිරූපණය කරයි.

7 වගුව

සමාගම අනුව දළ ලිඛිත වාරිකය හා වෙළඳපළ කොටස - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

රක්ෂණකරු	2017		2018		2019		2020 (අ)		2021 (අ)	
	දළ ලිඛිත වාරිකය (රු.'000)	වෙළඳපළ කොටස (%)	දළ ලිඛිත වාරිකය (රු.'000)	වෙළඳපළ කොටස (%)	දළ ලිඛිත වාරිකය (රු.'000)	වෙළඳපළ කොටස (%)	දළ ලිඛිත වාරිකය (රු.'000)	වෙළඳපළ කොටස (%)	දළ ලිඛිත වාරිකය (රු.'000)	වෙළඳපළ කොටස (%)
ඒඅයිඒ ලයිෆ්	11,510,581	16.08	12,739,351	15.87	13,848,283	15.60	14,049,559	13.64	16,517,328	13.24
අලියාන්ස් ලයිෆ්	1,178,817	1.65	1,301,254	1.62	1,403,858	1.58	1,476,069	1.43	1,886,703	1.51
අමානා ලයිෆ්	792,174	1.11	827,948	1.03	851,293	0.96	767,232	0.74	929,830	0.75
ආර්පිකෝ	1,038,085	1.45	1,387,432	1.73	1,633,156	1.84	1,836,100	1.78	2,311,633	1.85
සෙලින්කෝ ලයිෆ්	15,765,484	22.03	17,812,774	22.18	18,718,553	21.08	22,076,250	21.43	25,565,050	20.49
කෝප් ලයිෆ්	626,972	0.88	619,881	0.77	772,782	0.87	775,410	0.75	840,604	0.67
එච්එන්බී ලයිෆ්	3,963,642	5.54	4,420,513	5.51	5,175,044	5.83	5,487,039	5.33	7,091,470	5.68
ජනශක්ති ලයිෆ්	2,902,873	4.06	3,008,842	3.75	3,511,660	3.96	3,819,817	3.71	5,460,929	4.38
එල්අයිසී	582,114	0.81	522,698	0.65	598,896	0.67	714,127	0.69	1,004,700	0.81
එල්ඕවල්සී ලයිෆ්	2,467,166	3.45	2,610,785	3.25	2,682,522	3.02	3,236,480	3.14	4,420,081	3.54
එම්බීඑස්එල්	123,732	0.17	65,839	0.08	54,757	0.06	40,996	0.04	40,370	0.03
සණස ලයිෆ්	454,056	0.62	521,193	0.65	537,171	0.61	694,430	0.67	1,247,855	1.00
එස්එල්අයිසී	12,517,119	17.49	13,205,802	16.45	14,820,025	16.69	19,257,997	18.70	21,975,988	17.62
සොෆ්ට්ලොජික් ලයිෆ්	7,530,935	10.52	10,005,733	12.46	12,531,283	14.11	15,660,116	15.20	20,053,302	16.07
යූනියන් ලයිෆ්	10,117,630	14.14	11,243,915	14.00	11,647,757	13.12	13,108,605	12.73	15,406,161	12.35
එකතුව	**71,571,380**	**100**	**80,293,960**	**100**	**88,787,041**	**100**	**103,000,228**	**100**	**124,752,003**	**100**
වර්ධන අනුපාතය (%)	**12.75**		**12.19**		**10.58**		**16.01**		**21.12**	

පෙර වසරවල මෙන්ම ප්‍රධාන වශයෙන් 2021 උපපාදන ඔප්පු මගින් ජනනය වූ වාරික වර්ධනය හේතුවෙන් සෙලින්කෝ ලයිෆ් 15.80% (2020: 17.94%) ක වර්ධන වේගයක් සමග රු.මි. 25,565 (2020: රු.මි. 22,076) දළ ලිඛිත වාරිකයක් ජනනය කරමින් රු.බි. 25 ක සීමාව පසු කරමින් දිගුකාලීන රක්ෂණ වෙළඳපොලේ ප්‍රමුඛස්ථානය හිමි කර ගෙන ඇත.

සෙලින්කෝ ලයිෆ් විසින් ජනනය කරන ලද ලිඛිත වාරිකය වෙළඳපල කොටසෙන් 20.49% ක් (2020: 21.43%) වූ අතර එය 2020 ට සාපේක්ෂව සුළු අඩු වීමකි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ සොෆ්ට්ලොජික් ලයිෆ් පිළිවෙලින් රු.මි. 21,976 (2020: රු.මි. 19,258) සහ රු.මි. 20,053 (2020: රු.මි. 15,660) දළ ලිඛිත වාරිකයක් සහ 17.62% (2020:18.70%) සහ 16.07% (2020: 15.20%) වෙළඳපළ කොටස් වාර්තා කරමින් වෙළඳපොලේ දෙවන සහ තෙවන ස්ථාන ලබා ගැනීමට සමත් විය. පෙර වසරට සාපේක්ෂව වෙළඳපල කොටස හැකිලී ඇතත්, එස්එල්අයිසී ලයිෆ් ආයෝජන සැලැස්මක් සහිත එක් සහභාග නොවන නිෂ්පාදනයක් සඳහා

සංඛ්‍යානමය සමාලෝචනය

නිකුත් කරන ලද නව රක්ෂණ ඔප්පු මගින් ප්‍රධාන වශයෙන් ඉහළ නැංවුණු එහි දළ ලිඛිත වාරිකය 14.11% කින් වර්ධනය කර ගැනීමට සමත් වී ඇත.

සොෆ්ට්ලොජික් ලයිෆ් පසුගිය වසර පහ තුළ 16.07% ක ඉහළම වෙළෙඳපොළ කොටස අත්පත් කර ගනිමින් එහි ශක්තිමත් වර්ධන වේගය තවදුරටත් ශක්තිමත් කළේය. තවද, බහු-නාලිකා උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම සහ සුවිශේෂී කාර්ය සාධනය සහ ඩිජිටල් බෙදාහැරීමේ නාලිකාවේ ව්‍යාප්තිය, අභ්‍යන්තර ක්‍රියාවලීන් සංඛ්‍යාංකකරණය හේතුවෙන් සමාගම 28.05% (2020: 24.97%) ක වර්ධන අනුපාතයක් වාර්තා කරමින් එහි ඉලක්කම් දෙකක වර්ධනය පවත්වා ගෙන ගියේය.

මෙම සමාගම් තුන එක්ව මුළු දිගුකාලීන කර්මාන්ත කොටසින් 54.18% (2020: 55.33%) අත්පත් කරගෙන ඇති අතර එය 2020 ට සාපේක්ෂව තරමක අඩු වීමකි.

ඒඅයිඒ සිය දළ ලිඛිත වාරිකය 17.56% කින් (2020: 1.45%) සැලකිය යුතු ලෙස ඉහළ නංවමින් රු.මි. 16,517 (2020: රු.මි. 14,050) වෙත ළඟා වෙමින් පෙර වසරට සමානව වෙළඳපොළේ සිව්වන ස්ථානයේ පසු විය. නියෝජිත ආයතනවල ශක්තිමත් කාර්ය සාධනය සහ බැංකු රක්ෂණ බෙදාහැරීමේ නාලිකා, ඩිජිටල් තාක්ෂණය යොදා ගැනීම යනාදිය හරහා නව ව්‍යාපාර සහ අලුත් කිරීමේ වාරික අංශ දෙකෙහි වර්ධනය මීට ප්‍රධාන වශයෙන් බලපා ඇත. සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ වෙළඳපල කොටස 13.24% (2020: 13.64%) ලෙස පැවති අතර එය තවදුරටත් හැකිලුණු නමුත් එය පෙර වසරට සාපේක්ෂව අඩු මට්ටමක පැවතිණි.

පෙර වසරවලට සමානව, යුනියන් ලයිෆ් සමාගම පළමු වසර සහ අලුත් කරන ලද වාරික යන දෙකෙහිම වර්ධනය, නියෝජිත ආයතන නාලිකාවෙහි සහ බැංකු රක්ෂණයෙහි කාර්යසාධනය ආදිය මගින් සිය දළ ලිඛිත වාරිකය 17.53% කින් (2020: 12.54%) සැලකිය යුතු ලෙස වර්ධනය කර ගත් අතර රු.මි. 15,406 (2020 : රු.මි. 13,109) දළ ලිඛිත වාරිකයක් වාර්තා කරමින් වෙළෙඳපොළේ පස්වන ස්ථානය ලබා ගත්තේය. සමාගම 12.35% ක (2020 : 12.73%) වෙළඳපල කොටසක් ලබා ගත්තේය.

පිළිවෙලින් 29.24% (2020: 6.03%), 42.96% (2020: 8.78%) සහ 36.57% ක (2020: 20.65%) වර්ධන අනුපාතය සමඟින් රු.මි. 7,091 (2020: රු.මි. 5,487), රු.මි. 5,461 (2020: රු.මි. 3,820) සහ රු.මි. 4,420 ක (2020: රු.මි. 3,236) දළ ලිඛිත වාරිකයක් වාර්තා කරමින් එච්චන්ඩී ඇෂුවරන්ස්, ජනශක්ති ලයිෆ් සහ එල්ඕඑල්සී ලයිෆ් වෙළඳපොළේ හයවන, හත්වන සහ අටවන ස්ථාන ලබා ඇත.


තවද, සණස ලයිෆ්, අලියාන්ස් ලයිෆ්, ආර්පිකෝ සහ අමානා ලයිෆ් වෙතින් සැලකිය යුතු දළ ලිඛිත වාරික වර්ධන අනුපාත දක්නට ලැබුණු අතර ඒවා පිළිවෙලින් 79.69% (2020 : 29.28%), 27.28% (2020 : 5.14%), 25.90% (2020 : 12.43%) සහ 21.19% (2020 : සෘණ 9.87%) විය.

එම්බීඑස්එල් හැර අනෙකුත් සියලුම ජීවිත රක්ෂණ සමාගම් 2020 ට සාපේක්ෂව තමන්ගේ ඉහළම අගයටළඟා වීමට සමත් වූ බව සැලකිය යුතුය. එම්බීඑස්එල් විසින් නව ව්‍යාපාර සඳහා ප්‍රතිරක්ෂණයකින් තොරව දැනට සිටින ගනුදෙනුකරුවන්ට සේවා සැපයීමෙන් පමණක් ආයෝජන කළඹ පැවරීමට සැලසුම් කර ඇත.

6 ප්‍රස්තාරය මගින් එක් එක් දිගු කාලීන රක්ෂණකරුගේ දළ ලිඛිත වාරිකය අනුව වෙළඳපල කොටස නිරූපණය කරයි.

6 ප්‍රස්තාරය

සමාගම් අනුව දළ ලිඛිත වාරිකයෙහි වෙළඳපළ කොටස - 2021 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය



සංඛ්‍යානමය සමාලෝචනය

දළ ලිඛිත වාරිකය කෙරෙහි ඉහළම දායකත්වයක් දක්වන රක්ෂණ ආයතන පහ සහ අනෙකුත් රක්ෂණකරුවන් - දිගුකාලීන රක්ෂණය ව්‍යාපාරය

2017 සිට 2021 දක්වා වූ කාල සීමාව තුළ දළ ලිඛිත වාරිකයට දායක වන ප්‍රමුඛතම සමාගම් පහෙහි සහ අනෙකුත් රක්ෂකයන්ගේ වෙළඳපළ කොටසට පිළිබඳ විස්තර 7 ප්‍රස්තාරය මඟින් දැක්වේ.

දළ ලිඛිත වාරිකය අනුව, මෙම රක්ෂණකරුවන් පස් දෙනා රු.මි. 99,518ක (2020 : රු.මි. 84,153) දළ ලිඛිත වාරිකයක් ජනනය කර සාමූහිකව 79.77% ක (2020 : 81.70%) වෙළඳපල කොටසක් අත්පත් කර ගත් අතර ඉතිරි රක්ෂණකරුවන් දස දෙනා සාමූහිකව රු.මි. 25,234ක (2020 : රු.මි. 18,848) දළ ලිඛිත වාරිකයක් සමඟ 20.23%ක (2020 : 18.30%) වෙළඳපල කොටසක් අත්පත් කරගෙන ඇත. සෙලින්කෝ ලයිෆ්, එස්ඒල්අයිසී ලයිෆ්, සොෆ්ට්ලොජික් ලයිෆ්, ඒඅයිඒ ලයිෆ් සහ යූනියන් ලයිෆ් විසින් වෙළඳපොළෙහි ඉහළම වෙළඳපොළ කොටස් පහ ළඟා කරගනු ලැබීය.

සෙලින්කෝ ලයිෆ්, සලකා බැලූ පසුගිය වසර පහේ දී මෙන්ම එහි සුවිශේෂී කාර්ය සාධනය සහතික කරමින් වෙළෙඳපොළේ ඉහළම ස්ථානයේ පසු වූ නමුත් වෙළෙඳපොළ කොටසෙහි සුළු පහත වැටීමක් පෙන්නුම් කර ඇත. එස්ඒල්අයිසී ලයිෆ් 14.11% ක ආදායම් වර්ධනයක් සමඟ වෙළඳපොළේ දෙවන ස්ථානය අත්පත් කරගෙන ඇත. කෙසේ වෙතත්, පසුගිය වසර කිහිපය තුළ වැඩිවන ප්‍රවණතාවයක් පෙන්නුම් කළ වෙළඳපල කොටස සුළු වශයෙන් හැකිලී ගියේය.


අඛණ්ඩව සාර්ථකත්වයක් පෙන්නුම් කරමින් සොෆ්ට්ලොජික් ලයිෆ් වෙළඳපොළේ තෙවැනියා බවට පත් වූ අතර එහි වෙළඳපොළ කොටස 16.07% දක්වා වැඩිකර ගනිමින්, 2021 දී පළමු පස්දෙනා අතර සිය දළ ලිඛිත වාරික වෙළඳපොළ කොටස ඉහල දැමූ එකම සමාගම බවට පත් විය. පසුගිය වසර මෙන්ම ඒඅයිඒ සහ යූනියන් ලයිෆ් දිගුකාලීන රක්ෂණ වෙළඳපොළේ සිව්වන සහ පස්වන ස්ථාන අත්පත් කර ගැනීමට සමත් විය.

ඉහළම රක්ෂණකරුවන් පස් දෙනාගේ දළ ලිඛිත වාරිකය 2021 දී 18.26% (2020 : 17.59%) කින් වැඩි වූ නමුත් සෙසු රක්ෂණකරුවන් දස දෙනා 33.88% ක (2020) වැඩි දළ ලිඛිත වාරික වර්ධන වේගයක් වාර්තා කළ බැවින් ඔවුන් සතුව තිබූ සාමූහික වෙළඳපොල කොටස 79.77% (2020 : 9.45%) දක්වා අඩු විය. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් 20.23% ට ළඟා වීමෙන් වෙළඳපොළ කොටස ඉහළ ගියේය.

පසුගිය වසර හතර තුළ ඉහළම රක්ෂණ සමාගම් පහේ 80%ක් වූ වෙළෙඳපොළ කොටස සමාලෝචිත වර්ෂයේදී 80% ට වඩා අඩු වූ අතර ඉතිරි රක්ෂණකරුවන් දස දෙනාගේ ඒකාබද්ධ වෙළෙඳපොළ කොටස් 2021 දී පළමු වරට 20% ඉක්මවූයේ නැගී එන තරඟකාරිත්වය පෙන්නුම් කරමිනි.

7 ප්‍රස්තාරය

2017 සිට 2021 දක්වා වූ කාල සීමාව සඳහා දළ ලිඛිත වාරිකයට අදාලව ප්‍රමුඛතම සමාගම් පහ සහ අනෙකුත් රක්ෂණකරුවන් - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය



	සෙලින්කෝ ලයිෆ්	එස්ඒල්අයිසී	සොෆ්ට්ලොජික් ලයිෆ්	ඒඅයිඒ ලයිෆ්	යූනියන් ලයිෆ්	වෙනත්
2017	22.03	17.49	10.52	16.08	14.14	19.74
2018	22.18	16.45	12.46	15.87	14.00	19.04
2019	21.08	16.69	14.11	15.60	13.12	19.40
2020 (අ)	21.43	18.70	15.20	13.64	12.73	18.30
2021 (ආ)	20.49	17.62	16.07	13.24	12.35	20.23

සංඛ්‍යානමය සමාලෝචනය

කාණ්ඩය අනුව දළ ලිඛිත වාරිකය, ප්‍රතිරක්ෂකයන් වෙත පවරන ලද වාරිකය හා රැඳවුම් අනුපාතය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

දිගුකාලීන රක්ෂණය ව්‍යාපාරයෙහි දළ ලිඛිත වාරිකය සහභාග ව්‍යාපාරයේ 19.52% (2020: 20.88%), සහභාග නොවන ව්‍යාපාරයේ 41.98% (2020: 41.57%) සහ යුනිවර්සල් ලයිෆ් 37.06% (2020: 35.93%) වූ සර්වත්‍ර ආයුකාල හා 1.43% (2020: 1.63%) දිගුකාලීන බැඳි ව්‍යාපාරය ආදියෙන් සමන්විත විය.

එස්විල්අයිසී ලයිෆ්, සෙලින්කෝ ලයිෆ් සහ සොෆ්ට්ලොජික් ලයිෆ් සමස්ත සහභාග ව්‍යාපාරයෙන් පිළිවෙලින් 50.56%, 24.23% සහ 18.11% සඳහා දායක වූ අතර කළඹෙහි 92.91%ක් සඳහා සාමූහිකව දායක විය. සොෆ්ට්ලොජික් ලයිෆ්, සෙලින්කෝ ලයිෆ් සහ එස්විල්අයිසී ලයිෆ් ව්‍යාපාර කළඹින් 71.74% ක් හිමි කර ගනිමින් සහභාග නොවන ව්‍යාපාරයෙන් 27.74%, 25.55% සහ 18.45% ක් හිමිකර ගත් අතර ඒඅයිඒ ලයිෆ්, යුනියන් ලයිෆ් සහ සෙලින්කෝ ලයිෆ් ව්‍යාපාරයෙන් පිළිවෙලින් 33.87%, 24.78% සහ 13.56% හිමි කර ගනිමින් යුනිවර්සල් ලයිෆ් නිෂ්පාදන කළඹේ ප්‍රමුඛස්ථානය ගත් අතර කළඹේ කොටසින් 72.21%ක් වාර්තා වාර්තා කර ඇත.

ප්‍රධාන වශයෙන් යුනිවර්සල් ලයිෆ් සහ සහභාග නොවන කාණ්ඩ හේතුවෙන් ප්‍රතිරක්ෂණකරුවන්ට ඉඩ දෙන ලද වාරිකය 6.79% කින් ඉහළ ගොස් රු.මි. 5,025 ට (2020: රු.මි. 4,705) ළඟා විය. දිගුකාලීන ව්‍යාපාරයේ සමස්ත රැඳවුම් අනුපාතය 95.97% ක් (2020: 95.43%) විය.

8 වගුව

කාණ්ඩය අනුව දළ ලිඛිත වාරිකය, ප්‍රතිරක්ෂකයන් වෙත පවරන ලද වාරිකය හා රැඳවුම් අනුපාතය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

පන්තිය	2019			2020(අ)			2021(ආ)		
	දළ ලිඛිත වාරිකය (රු. '000)	ප්‍රතිරක්ෂණකරුවන් වෙත පවරන ලද වාරිකය (රු. '000)	රැඳවා ගැනීමේ අනුපාතය (%)	දළ ලිඛිත වාරිකය (රු. '000)	ප්‍රතිරක්ෂණකරුවන් වෙත පවරන ලද වාරිකය (රු. '000)	රැඳවා ගැනීමේ අනුපාතය (%)	දළ ලිඛිත වාරිකය (රු. '000)	ප්‍රතිරක්ෂණකරුවන් වෙත පවරන ලද වාරිකය (රු. '000)	රැඳවා ගැනීමේ අනුපාතය (%)
සහභාගි	21,394,970	156,759	99.27	21,501,412	168,082	99.22	24,355,960	151,310	99.38
සහභාගි නොවන	32,370,493	2,977,659	90.80	42,817,109	3,994,124	90.67	52,374,038	4,107,457	92.16
සර්වත්‍ර ආයුකාලය	33,129,499	473,575	98.57	37,007,344	471,295	98.73	46,234,646	673,178	98.54
බැඳි දිගුකාලීන	1,892,079	84,245	95.55	1,674,363	71,743	95.72	1,787,359	92,843	94.81
එකතුව	**88,787,041**	**3,692,237**	**95.84**	**103,000,228**	**4,705,243**	**95.43**	**124,752,003**	**5,024,788**	**95.97**

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි වත්කම්

9 වගුවෙහි දක්වා ඇති පරිදි කාර්යක්ෂමව වත්කම් කළමනාකරණය කරමින් 12.43% (2020: 15.99%) ක වර්ධන වේගයක් පෙන්නුම් කරන අතරම රු.මි. 632,627 (2020: රු.මි. 562,706) ක අගයට ළඟා වීමෙන් දිගුකාලීන රක්ෂණකරුවන්ට තම මුළු වත්කම් වර්ධනය කර ගැනීමට හැකි විය.

සංඛ්‍යානමය සමාලෝචනය

9 වගුව

සමාගම් අනුව මුළු වත්කම් පිළිබඳ විශ්ලේෂණය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

රක්ෂණකරු	2020 (අ)		2021 (ආ)	
	(රු. '000)	%	(රු. '000)	%
ඒඅයිඒ ලයිෆ්	72,388,787	12.86	72,263,841	11.42
අලියාන්ස් ලයිෆ්	7,758,471	1.38	8,191,271	1.29
අමානා ලයිෆ්	3,099,222	0.55	3,337,501	0.53
ආර්පිකෝ	4,175,491	0.74	4,416,237	0.70
සෙලින්කෝ ලයිෆ්	150,801,386	26.80	173,762,954	27.47
කෝප් ලයිෆ්	3,510,426	0.62	3,719,827	0.59
එච්එන්බී ලයිෆ්	26,042,871	4.63	29,463,951	4.66
ජනශක්ති ලයිෆ්	24,613,500	4.37	26,045,536	4.12
එල්අයිසී	3,333,687	0.59	3,491,539	0.55
එල්ඕවිල්සී ලයිෆ්	7,752,075	1.38	9,622,145	1.52
එම්බීඑස්එල්	1,064,582	0.19	1,004,264	0.16
සණස ලයිෆ්	2,307,345	0.41	2,682,497	0.42
එස්එල්අයිසී	160,051,510	28.44	184,519,748	29.17
සොෆ්ට්ලොජික් ලයිෆ්	33,206,203	5.90	39,343,732	6.22
යූනියන් ලයිෆ්	62,600,408	11.12	70,761,636	11.19
එකතුව	**562,705,964**	**100**	**632,626,679**	**100**

පෙර වසර මෙන්ම එස්එල්අයිසී ලයිෆ් සමාගම දිගු කාලීන රක්ෂණ ක්ෂේත්‍රයේ ඉහළම වත්කම් කොටසට හිමිකම් කියූ අතර සෙලින්කෝ ලයිෆ් දෙවන ස්ථානය හිමිකර ගත්තේය. 2020ට සාපේක්ෂව සමාගම් දෙකේ ඒකාබද්ධ කොටස 56.63% (2020: 55.24%) ලෙස පැවති අතර එය සාපේක්ෂව තරමක් ඉහළ ගියේය.

ප්‍රධාන වශයෙන් රාජ්‍ය සුරැකුම් පත් ඉහළ යාම හේතුවෙන් එස්එල්අයිසී ලයිෆ්හි වත්කම් තවදුරටත් 15.29% කින් (2020 13.61%) වර්ධනය කර ගනිමින් රු.මි. 184,520 ක් (2020: රු.මි. 160,052) බවට පත් කර ගත් අතර 29.17% ක (2020: 28.44%) කොටසක් හිමි කර ගත්තේය. ප්‍රධාන වශයෙන් තැන්පතු සහ රාජ්‍ය සුරැකුම්පත්වල වර්ධනය හේතුවෙන් සෙලින්කෝ ලයිෆ්හි මුළු වත්කම් 15.23% කින් (2020: 13.20%) ක්‍රමයෙන් වර්ධනය වූ අතර එය රු.මි. 173,763 ක් (2020: රු. මි. 150,801) විය. එසේම 27.47% ක (2020: 26.80%) කොටසක් සමාගම සතු විය. 2021 දී දිගු කාලීන රක්ෂණ ක්ෂේත්‍රයේ ඇති මුළු වත්කම්වලින් තම වත්කම් කොටස වැඩි කර ගැනීමට සමාගම් දෙකම සමත් වී ඇත.

ඒඅයිඒ ලයිෆ් සහ යූනියන් ලයිෆ් කර්මාන්තයේ මුළු වත්කම්වලින් සැලකිය යුතු කොටස් හිමිකර ගනිමින් වෙළඳපොලේ තුන්වන සහ සිව්වන ස්ථාන හිමි කරගෙන ඇත. කෙසේ වෙතත්, ඒඅයිඒ ලයිෆ් පසුගිය වසර කිහිපය තුළ අඛණ්ඩව වර්ධනය වෙමින් පැවති වත්කම් වර්ධන අනුපාතයේ 0.17% ක අඩු වීමක් පෙන්නුම් කර ඇති අතර වත්කම් කොටස 11.42% (2020: 12.86%) විය.

ඒඅයිඒ ලයිෆ්හි මුළු වත්කම් රු.මි. 72,264 ක් (2020: රු.මි. 72,389) විය. යූනියන් ලයිෆ් 13.04% (2020: 13.31%) ක වර්ධන වේගයක් වාර්තා කරමින් සිය වත්කම් කළඹ අඛණ්ඩව පුළුල් කරගෙන ඇති අතර එය 2021 දී රු.මි. 70,762 ක් (2020: රු.මි. 62,600) විය.

ඒ අනුව, 2020 වසරට බොහෝ දුරට සමානව පැවති දිගුකාලීන රක්ෂණ ක්ෂේත්‍රයේ මුළු වත්කම්වලින් 79.24% (2020: 79.23%) ක් රක්ෂණකරුවන් සිව් දෙනාට සාමූහිකව හිමි විය.

දිගුකාලීන රක්ෂණ අංශයේ වත්කම් සම්බන්ධයෙන් ගත් කල, සොෆ්ට්ලොජික් ලයිෆ්, එච්එන්බී ලයිෆ් සහ ජනශක්ති ලයිෆ් පිළිවෙලින් මුළු වත්කම්


සංඛ්‍යානමය සමාලෝචනය

රු.මි. 39,344 (2020: රු.මි. 33,206), රු.මි. 29,464 සහ (2020: රු.මි. 26,043) සහ රු.මි. 26,046 (2020: රු.මි. 24,614) වාර්තා කරමින් වෙළඳපොලේ පස්වන, හයවන සහ හත්වන ස්ථාන ලබා ගැනීමට සමත් විය. මෙම සමාගම් සැලකිය යුතු වර්ධන අනුපාත සමග වැඩිවන වත්කම් කළඹ ද වාර්තා කර ඇත. මෙම සමාගම් හත එක්ව මුළු වෙළෙඳපොළෙන් 94.24% ක් (2020: 94.14%) හිමි කරගෙන ඇත.

අභියෝග මධ්‍යයේ වුවද සමාලෝචිත වර්ෂය තුළ සිය වත්කම් පදනමට තවදුරටත් වටිනාකමක් එක් කිරීමට ඒඅයිඒ ලයිෆ් සහ එම්බීඑස්එල් හැර ජීවිත රක්ෂණකරුවන් සමත් වී ඇති බව සඳහන් කළ යුතුය. පසුගිය වසරේ දී මෙන්ම එල්ඕඑල්සී ලයිෆ් 20% ට වඩා වත්කම් වර්ධන වේගයක් පෙන්නුම් කර ඇත. 8 ප්‍රස්තාර මඟින් සමාගම් අනුව මුළු වත්කම් පිළිබඳ විශ්ලේෂණය දක්වයි.

8 ප්‍රස්තාරය

2020 සහ 2021 දෙසැම්බර් 31 දිනට සමාගම් අනුව මුළු වත්කම් පිළිබඳ විශ්ලේෂණය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය



10 වගුව

2020 සහ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් සංකේන්ද්‍රණය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

වත්කම් වර්ගය	2020 (අ)		2021 (ආ)	
	(රු '000)	%	(රු '000)	%
රාජ්‍ය ණය සුරැකුම්පත්	230,273,823	40.92	262,410,756	41.48
ස්කන්ධයන්	38,681,100	6.87	49,049,129	7.75
සාංගමික ණය	121,703,471	21.63	139,619,921	22.07
ඉඩම් හා ගොඩනැගිලි	8,735,425	1.55	9,273,787	1.47
තැන්පතු	80,765,691	14.35	88,265,112	13.95
ඒකක භාර	9,991,047	1.78	13,426,656	2.12
රක්ෂණ ඔප්පු ණය	6,940,431	1.23	7,022,135	1.11
වෙනත් වත්කම්	46,944,802	8.34	48,448,721	7.66
මුදල් හා මුදල් සමාන දෑ	18,670,177	3.32	15,110,463	2.39
එකතුව	**562,705,967**	**100**	**632,626,679**	**100**

2020 සහ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් සංකේන්ද්‍රණය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

10 වගුව සහ 9 ප්‍රස්තාරය මඟින් 2020 සහ 2021 දෙසැම්බර් 31 දිනට විවිධ වත්කම් කාණ්ඩ අතර දිගුකාලීන රක්ෂණකරුවන්ගේ වත්කම් සංකේන්ද්‍රණය විස්තර කරයි.

සංඛ්‍යානමය සමාලෝචනය

10 වගුවේ දක්වා ඇති පරිදි, ද්‍රවශීලතාවය පවත්වා ගැනීම සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම සඳහා ප්‍රධාන වශයෙන් රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට රක්ෂණකරුවන් ප්‍රමුඛතාව ලබා දී ඇති අතර විශාලතම වත්කම් කාණ්ඩය වන රජයේ සුරැකුම්පත්වල ආයෝජනයන් 13.96% කින් (2020: 19.83%) වැඩි වී ඇත. එය රු.මි. 262,411(2020: රු.මි. 230,274) වූ අතර සමස්ත කර්මාන්ත වත්කම්වලින් 41.48% (2020: 40.92%) විය. ජීවිත රක්ෂණකරුවන් කිහිප දෙනෙකු හැර අනෙකුත් සියළුම ජීවිත රක්ෂණකරුවන් රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනයන් ඉහළ නංවා ඇති අතර ජීවිත රක්ෂණ සමාගම් හතරක් කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කර ඇත. එමගින් අඩු අවදානම් වත්කම් කළඹක් පවත්වා ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පෙන්නුම් කරයි.

2020 වසරට වඩා 14.72% ක වර්ධන වේගයක් පෙන්නුම් කරමින් දිගුකාලීන ව්‍යාපාරයේ සාංගමික ණය ආයෝජනය රු.මි. 139,620 (2020: රු.මි. 121,703) කරා ළඟා විය. සාංගමික ණය මුළු වත්කම් පදනමෙන් 22.07% ක් (2020: 21.63%) විය.

තුන්වන විශාලතම කාණ්ඩය නියෝජනය කරන තැන්පතු ප්‍රධාන වශයෙන් එක් ජීවිත රක්ෂණකරුවෙකු විසින් ඉහළ නංවන ලද 13.95% ක (2020: 14.35%) වත්කම් වෙන් කිරීමක් සමග රු.මි. 88,265 (2020: රු.මි. 80,766) දක්වා ඉහළ ගොස් ඇත. සමාලෝචිත වර්ෂය තුළ ජීවිත රක්ෂණකරුවන් පස් දෙනෙකු පමණක් ඔවුන්ගේ තැන්පතු වැඩි කර ඇති අතර එමගින් විශේෂයෙන් වසරේ මුල් භාගය තුළ පැවති අඩු පොලී අනුපාතවල බලපෑම පෙන්නුම් කෙරේ.

ජීවිතකරුවෙකු කොටස්වල ආයෝජන රු.මි. 49,049 ක් (2020: රු.මි. 38,681) දක්වා වැඩි වී ඇති අතර එය 26.80% (2020: 7.87%) ක වර්ධන අනුපාතයක් පෙන්නුම් කරයි. එය ප්‍රධාන වශයෙන් එක් ජීවිත රක්ෂණකරුවෙකු විසින් ඉහළ නංවා ඇත. ස්කන්ධ කොටස්වල ආයෝජනය කර ඇති සියළුම ජීවිත රක්ෂණකරුවන් 2021 දී තමන්ගේ ආයෝජන ඉහළ නංවාගෙන ඇති අතර එමගින් සමාලෝචිත වර්ෂය තුළ කොටස් වෙළෙඳපොළේ ආකර්ශනීය බව පෙන්නුම් කරයි. ස්කන්ධ කොටස් ආයෝජනය කර්මාන්තයේ මුළු වත්කම්වලින් 7.75% ක් (2020: 6.87%) විය.


මෙම ප්‍රධාන ආයෝජන කාණ්ඩ හතර වන රාජ්‍ය සුරැකුම්පත්, සාංගමික ණය, තැන්පතු සහ ස්කන්ධ කොටස්, දිගු කාලීන රක්ෂණ වෙළෙඳපොළේ මුළු වත්කම් කළඹෙන් 85.25% ක් (2020: 83.78%) විය.

ප්‍රධාන වශයෙන් විලම්බිත බදු වත්කම්, දේපළ පිරියත සහ උපකරණ, අස්පෘශ්‍ය වත්කම්, රක්ෂණ ඔප්පු හිමියන්ගෙන් ලැබිය යුතු වාරික, ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දේ යනාදියෙන් සමන්විත අනෙකුත් වත්කම් කොටස් 2021 දී 3.20% ක් (2020: 15.60%) සුළු වැඩි වීමක් පෙන්නුම් කළ අතර එය රු.මි. 48,449 ක් (2020: රු.මි. 46,945) විය.

ඒකක භාරවල ආයෝජනය සඳහා වූ ප්‍රවණතාවය 2021 දී අඛණ්ඩව ඉහළ ගිය අතර එය රු.මි. 13,427 ක් (2020: රු.මි. 9,991) ලෙස සැලකිය යුතු වර්ධනයක් ලැබීමෙන් පැහැදිලි වේ.

9 ප්‍රස්තාරය

2020 සහ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් සංකේන්ද්‍රණය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය



ආයෝජන ආදායම - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

විශේෂයෙන් වසරේ මුල් භාගය තුළදී පැවති අඩු පොලී අනුපාත මධ්‍යයේ වුවද දිගුකාලීන රක්ෂණකරුවන් විසින් 2021 දී ආයෝජන ආදායමේ 19.29% ක සැලකිය යුතු වර්ධන වේගයක් ප්‍රදර්ශනය කිරීමට සමත් වී ඇති අතර එය රු.මි. 55,871 (2020: රු.මි. 46,838) විය. 13.72% ක වර්ධන වේගයක් පෙන්නුම් කරමින් සාමාන්‍ය ආයෝජන රු.මි. 533,462 (2020: රු.මි. 469,097) කරා ළඟා විය.

සමස්ත ආයෝජන ආදායමේ ඉහළම කොටස වන 40.13% (2020: 46.09%) රාජ්‍ය සුරැකුම්පත් සතු වූ අතර එය රු.මි. 22,419 (2020: රු.මි. 21,590) වූ අතර 3.84% ක සාමාන්‍ය වර්ධන වේගයක් පෙන්නුම් කළ අතර ප්‍රධාන වශයෙන් ජීවිත රක්ෂණකරුවන් දෙදෙනෙකු නිසා REPO ආයෝජනවලින් ලද ආයෝජන ආදායමේ

සංඛ්‍යානමය සමාලෝචනය

වැඩි වීම හේතුවෙන් ඇති විය. රජයේ සුරැකුම්පත්වල සාමාන්‍ය ආයෝජනය 2021 දී රු.මි. 246,342 (2020: රු.මි. 211,219) දක්වා ඉහළ ගියේය. දිගු කාලීන රක්ෂණකරුවන් සාංගමික ණය සඳහා ආයෝජනය කර ඇති අතර ප්‍රධාන වශයෙන් එක් රක්ෂණකරුවෙකු විසින් වාර්තා කරන ලද ආයෝජන ආදායම හේතුවෙන් ණයකරවල සමස්ත ආයෝජන ආදායමෙන් 27.79% ක (2020: 27.89%) කොටසක් අත්පත් කර ගනිමින් 18.83% වර්ධන අනුපාතයක් සමඟ ආයෝජන ආදායම ලෙස රු.මි. 15,524 ක් (2020: රු.මි. 13,064) වාර්තා කර ඇත. 2021 දී සාංගමික ණයවල සාමාන්‍ය ආයෝජනය රු.මි. 130,662 (2020: රු.මි. 114,141) දක්වා ඉහළ ගියේය.

මෙම කාණ්ඩ දෙක සාමූහිකව සමස්ත ආයෝජන ආදායමෙන් 67.91% ක් (2020: 73.99%) සඳහා දායක වී ඇති අතර එහි සාමාන්‍ය ආයෝජන ඵලදායිතාව වසර දෙකේදීම පිළිවෙළින් 9% (2020: 10%) සහ 12% (2020: 11%) පමණ විය.

මූලික වශයෙන් එක් ජීවිත රක්ෂණකරුවෙකු විසින් වාර්තා කර ඇති අනුපලබ්ධි ලාභයක් හේතුවෙන් කොටස් ආයෝජන සාමාන්‍යය රු.මි. 43,865 (2020: රු.මි. 37,271) සහ ආයෝජන ආදායම රු.මි. 8,937 (2020: රු.මි. 2,824) විය. ඉහත ආයෝජන කාණ්ඩ තුන එක්ව දිගු කාලීන රක්ෂණකරුවන්ගේ මුළු ආයෝජන ආදායමෙන් 83.91% ක් (2020: 80.02%) හිමි කර ගත් අතර විය 2020 ට සාපේක්ෂව ඉහළ යාමකි.

2020 වසරේ තුන්වන විශාලතම සංරචකය වූ තැන්පතුවලින් ලද ආයෝජන ආදායම රු.මි. 7,619 (2020: රු.මි. 8,268) දක්වා අඩු වූ අතර විය 2021 රු.මි. 84,515 ක (2020: රු.මි. 78,419) සාමාන්‍ය ආයෝජනයට සාපේක්ෂව සිව්වන විශාලතම කාණ්ඩය විය. මෙය වෙළඳපොලෙහි පැවති අඩු පොළී අනුපාතය පෙන්නුම් කරයි.

2021 සඳහා සාමාන්‍ය ආයෝජන ඵලදායිතාව 10.47% (2020: 9.98%) වන අතර විය 2020 ට සාපේක්ෂව වැඩි වී ඇත.

II වගුව

ආයෝජන ආදායම හා ආයෝජන සාමාන්‍යය වෙන් කර දැක්වීම - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

කාණ්ඩය	2020 (අ)		2021 (ආ)	
	ආයෝජන ආදායම (රු '000)	ආයෝජන සාමාන්‍යය (රු '000)	ආයෝජන ආදායම (රු '000)	ආයෝජන සාමාන්‍යය (රු '000)
රාජ්‍ය ණය සුරැකුම්පත්	21,589,841	211,218,577	22,419,264	246,342,290
- භාණ්ඩාගාර බැඳුම්කර	20,101,585		20,097,959	
- භාණ්ඩාගාර බිල්පත්	68,130		271,457	
- වෙනත් (ප්‍රති මිලදීගැනීම් ගිවිසුම්)	1,420,126		2,049,848	
ස්කන්ධ	2,824,001	37,270,729	8,937,003	43,865,114
- ප්‍රාග්ධන ලාභ/ අලාභ	1,828,612		7,183,929	
- ලාභාංශ	995,389		1,753,074	
සාංගමික ණය	13,063,583	114,140,670	15,523,868	130,661,696
- සුරැකුම්පත් හා ණයකර	12,855,495		14,557,825	
- වාණිජ පත්‍රිකා	208,088		833,834	
- වත්කම් සුරක්ෂිත සුරකුම්පත්			115,957	
- වෙනත් සමාන මූල්‍ය උපකරණ			16,252	
ඉඩම් හා ගොඩනැගිලි	85,459	12,202,916	147,746	9,004,606
තැන්පතු	8,267,920	78,419,337	7,619,109	84,515,401
- බැංකු	6,568,859		6,143,646	
- මූල්‍ය සමාගම්	1,699,061		1,475,465	
ඒකක භාර	546,577	7,787,929	750,870	11,708,851
රක්ෂණ ඔප්පු ණය	383,897	6,881,616	400,419	6,981,283
වෙනත්	76,541	1,174,855	73,096	382,565
එකතුව	**46,837,820**	**469,096,629**	**55,871,375**	**533,461,806**
සාමාන්‍ය ආයෝජන ඵලදායීතාව	9.98%		10.47%	

සටහන: අනුබද්ධ සමාගම් සහ ආශ්‍රිත ආයතනවල ආයෝජනය සලකා බලනු ලැබීය. ඵලය ගණනය කිරීම සඳහා ඉහත කාණ්ඩ සියල්ල සලකා බලනු ලැබේ.

සංඛ්‍යානමය සමාලෝචනය

රක්ෂණ සමාගමිහි නුඹුන්වත්භාවය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

පෙර වසරවල දී මෙන්ම තිරසාර පදනමක් මත ක්‍රියා කරන, නිසි පරිදි කළමනාකරණය කරන ලද රක්ෂණ කර්මාන්තයක් හරහා රක්ෂණ ඔප්පු හිමියන්ගේ අවශ්‍යතා සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව කර්මාන්තයේ රක්ෂණකරුවන්ගේ අවදානම් පදනම් වූ ප්‍රාග්ධන මට්ටම් අඛණ්ඩව අධීක්ෂණය කළේය. නුඹුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධනය) රීති යටතේ නීතිරීතිවලට අනුකූල වීම සඳහා රක්ෂණකරුවන් විසින් අවම මුළු ප්‍රාග්ධනය රු.මි. 500ක් සහ ප්‍රාග්ධන ප්‍රාමාණ්‍ය අනුපාතය 120%ක් ලෙස පවත්වා ගත යුතු වේ. කෙසේ වෙතත්, රක්ෂණ ව්‍යාපාරයේ ස්වභාවය, ප්‍රාමාණය සහ සංකීර්ණත්වය සහ රක්ෂණකරුවන්ට නිරාවරණය වන අවදානම සැලකිල්ලට ගනිමින් ප්‍රාග්ධන ප්‍රමාණ්‍ය අනුපාතය සහ ප්‍රමාණවත් මුළු ප්‍රාග්ධනය ඥානාන්විතව පවත්වා ගත යුතුය. 2020 දෙසැම්බර් 31 සහ 2021 දෙසැම්බර් 31 වන විට දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ මුළු ප්‍රාග්ධනය, අවශ්‍ය අවදානම් පදනම් වූ ප්‍රාග්ධනය සහ ප්‍රාග්ධන ප්‍රාමාණ්‍ය අනුපාතය 12, 13 සහ 14 වගු වල විස්තර කර ඇත.

2021 වසර අවසානයේ දී අවශ්‍ය අවදානම් පදනම් වූ ප්‍රාග්ධනයට සහාය වීම සඳහා වන මුළු ප්‍රාග්ධනයේ ප්‍රමාණවත් බව මනින ප්‍රාග්ධන ප්‍රාමාණ්‍ය අනුපාතය සාමාන්‍යයෙන් 384%ක් (2020: 366%) විය. සියළුම ජීවිත රක්ෂණකරුවන් ප්‍රාග්ධන ප්‍රාමාණ්‍ය අනුපාතය 160% ක් වූ බලාත්මක කිරීමේ මට්ටම සහ 120% ක් වූ අවම මට්ටමට වඩා ඉහළින් වාර්තා කර ඇත. 2020 දෙසැම්බර් 2021 වන විට කර්මාන්තයේ මුළු ප්‍රාග්ධනය රු.මි. 286,309 ක් (2021: රු.මි. 250,025) වූ අතර වර්ධන අනුපාතය 14.51% විය.

ජීවිත රක්ෂණයන් සියල්ල එකවර පවාරණය කළහොත් ඇති වන බරපතල තත්වය සම්බන්ධයෙන් කටයුතු කරන පවාරණ වටිනාකම් ප්‍රාග්ධන ගාස්තු (SVCC) 2021 අවසානය වන විට සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරමින් රු.මි. 7,905 ක් (2020: රු.මි. 2,612) ලෙස පැවතිණි.

12 වගුව

සමාගම් අනුව නුඹුනුවත්භාවය පිළිබඳ විශ්ලේෂණය - 2020 සහ 2021 දෙසැම්බර් 31 දිනට දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

රක්ෂකයා	2020 දෙසැම්බර් ((31)) දිනට (අ)				2021 දෙසැම්බර් 31 දිනට (අ)			
	පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (රු.000)	නියමිත අවදානම් ප්‍රාග්ධනය (රු'000)	පවාරණ වටිනාකම් ප්‍රාග්ධන ගාස්තු (රු'000)	ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය (%)	පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (රු.000)	නියමිත අවදානම් ප්‍රාග්ධනය (රු'000)	පවාරණ වටිනාකම් ප්‍රාග්ධන ගාස්තු (රු'000)	ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය (%)
ඒඅයිඒ ලයිෆ්	27,361,515	5,601,570		488%	24,565,113	4,490,070		547%
අලියාන්ස් ලයිෆ්	2,028,498	216,924	286,007	709%	1,490,704	378,981	23,701	393%
අමානා ලයිෆ්	535,106	261,775		204%	535,349	275,187		195%
ආර්පිකෝ	1,908,450	459,409	97,174	415%	2,221,252	476,828	511,232	434%
සෙලින්කෝ ලයිෆ්	72,111,874	17,133,081	3,930	421%	71,664,622	18,048,010	3,238	397%
කෝප් ලයිෆ්	1,473,028	589,124		250%	1,497,623	509,721		294%
චිච්චින්බී ලයිෆ්	8,966,667	2,653,681		338%	11,139,698	4,023,288	694,632	277%
ජනශක්ති ලයිෆ්	10,132,233	3,331,694		304%	12,857,786	3,310,343	804,347	388%
චිල්අයිසී	485,940	338,702		143%	563,897	309,953		182%
චිල්ඕචිල්සී ලයිෆ්	2,326,985	1,258,533		185%	3,464,728	721,459		480%
චිම්බීචිස්චිල්	556,357	76,062		731%	515,391	58,536		880%
සණස ලයිෆ්	747,344	377,961		198%	820,062	468,187		175%
එස්චිල්අයිසී	79,654,571	17,370,300		459%	106,308,579	21,684,273		490%
සොෆ්ට්ලොජික් ලයිෆ්	19,940,660	6,610,593	2,203,854	302%	27,081,811	6,851,316	4,935,500	395%
යූනියන් ලයිෆ්	21,795,969	6,396,436	20,587	341%	21,582,364	9,468,422	932,135	228%
එකතුව/ සමස්තය	**250,025,198**	**62,675,846**	**2,611,551**	**366%**	**286,308,978**	**71,074,573**	**7,904,786**	**384%**

සංඛ්‍යානමය සමාලෝචනය

රක්ෂණය සමාගමිහි පවත්නා මුළු ප්‍රාග්ධන අවශ්‍යතාව - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

2015 නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධනය) රීතිවලට අනුව මුළු ප්‍රාග්ධනය යනු රක්ෂණකරුවකුගේ "පළමුවන ස්ථරයේ" හා "දෙවන ස්ථරයේ" ප්‍රාග්ධනය එකතු කර "අඩු කිරීම්" ලෙස දක්වා ඇති අයිතම අඩු කිරීමෙන් ලබා ගන්නා අගයයි. 2021 දෙසැම්බර් 31 දිනට දිගුකාලීන රක්ෂණකරුවගේ මුළු ප්‍රාග්ධන සැකැස්ම 13 වගුවෙන් දැක්වේ. 13 වගුවට අනුව, දිගුකාලීන කර්මාන්තයේ මුළු ප්‍රාග්ධනය රු.මි. 286,309 (2020: රු.මි. 250,025) දක්වා ඉහළ ගොස් 14.51% ක වර්ධනයක් ප්‍රධාන වශයෙන් ඇති වූයේ පළමු ස්ථරයේ ප්‍රාග්ධන එකතුව රු.මි. 299,251 (2020: රු.මි. 258,922) වූ බැවිණි. මෙයට ප්‍රධාන වශයෙන් දායක වී ඇත්තේ එස්එල්අයිසී ලයිෆ් සහ සොෆ්ට්ලොජික් ලයිෆ් සමාගම්ය. තවද, ප්‍රධාන වශයෙන් "පළමු වන ස්ථරයේ" ප්‍රාග්ධනය ඉහළ යාම හේතුවෙන් ජනශක්ති ලයිෆ්, එච්එන්බී ඇෂුවරන්ස් සහ එල්ඕඑල්සී ලයිෆ් සමාගම් 2020 ට සාපේක්ෂව 2021 දෙසැම්බර් අවසානයේ මුළු ප්‍රාග්ධනයෙහි කැපී පෙනෙන ඉහළ යාමක් පෙන්නුම් කරන ලදී. කෙසේ වෙතත්, ඒඅයිඒ ලයිෆ් සහ අලියාන්ස් ලයිෆ් විසින් පළමු වන ස්ථරයේ ප්‍රාග්ධනයේ සැලකිය යුතු පහත වැටීමක් වාර්තා කරන ලද අතර එය ඔවුන්ගේ මුළු ප්‍රාග්ධනයෙහි පහත වැටීමට හේතු විය.

නිකුත් කළ සහ පූර්ණ වශයෙන් ගෙවීම් සිදු කළ සාමාන්‍ය කොටස් සහ කොටස් අධිමිල, ප්‍රාග්ධන සංචිත, ගෙවීම් සිදු කළ අසමුච්ඡේය නිදහස් කළ නොහැකි සමුච්චිත වරණීය කොටස්, ගැලපුම් කළ රඳවාගත් ඉපැයුම්, දිගුකාලීන රක්ෂණ අරමුදල්වල වෙන් නොකළ තක්සේරු අතිරික්තය සහ සහභාග ව්‍යාපාර සඳහා වන අනාගත ප්‍රසාද දීමනා අතරින් 50%ක් යනාදියෙන් සමන්විත පළමු වන ස්ථරයේ ප්‍රාග්ධනය - රක්ෂණකරුවන්ගේ අලාභයන් ආවරණය කිරීම සඳහා පූර්ණ වශයෙන් පවතින ස්ථාවර ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ. පළමු වන ස්ථරයේ ප්‍රාග්ධනය රු.මි. 299,251 ක් (2020: රු.මි. 258,922) වූ අතර එය 15.58% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

නිදහස් කළ නොහැකි සමුච්චිත වරණීය කොටස්, නිදහස් කළ නොහැකි වරණීය කොටස්, අනිවාර්ය ප්‍රාග්ධන ණය තොග සහ වෙනත් සමාන ප්‍රාග්ධන උපකරණ, පුද්ගලිකව භාවිතා කරන දේපළ සඳහා ප්‍රත්‍යාගණනිත සංචිත සහ වෙනත් දේපළ ආයෝජන, රඳවා ගත් ඉපැයුම් හැර ආදායම් සංචිත, නිදහස් කළ නොහැකි අප්‍රධාන ණය ආදියෙන් සමන්විත 2 වන ස්ථරයේ ප්‍රාග්ධනයෙහි 1 වන ස්ථරයේ ප්‍රාග්ධනයට සාපේක්ෂව ඉහළ තත්වයේ ප්‍රාග්ධනයෙහි ඇතැම් ලක්ෂණ නොමැත. 2021 වසරේ දී 1.69% ක සුළු වර්ධන වේගයක් සහිත දිගුකාලීන රක්ෂණ කර්මාන්තයේ 2 වන ස්ථරයේ ප්‍රාග්ධනය රු.මි. 22,761 (2020: රු.මි. 22,382) විය.

2021 දී ප්‍රධාන වශයෙන් අස්පෘශ්‍ය හෝ අද්‍රවශීල වත්කම් ඇතුළත් අඩු කිරීම් 14.14% ක ඉහළ යාමක් පෙන්නුම් කර ඇති අතර එම අගය රු.මි. 35,702 ක් (2020: රු.මි. 31,279) විය. මෙම තත්වය ඇති වූයේ ප්‍රධාන වශයෙන් ජීවිත රක්ෂණකරුවන් දෙදෙනෙකු හේතුවෙනි.

13 වගුව

රක්ෂණය සමාගමිහි පවත්නා මුළු ප්‍රාග්ධන අවශ්‍යතාව - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

රක්ෂකයා	2020 දෙසැම්බර් 31 දිනට (අ) (රු. 000)	2021 දෙසැම්බර් 31 දිනට (අ)- (රු. 000)			
	පවත්නා මුළු ප්‍රාග්ධනය	I ස්ථරය	II ස්ථරය	අඩු කිරීම්	පවත්නා මුළු ප්‍රාග්ධනය
ඒඅයිඒ ලයිෆ්	27,361,515	22,025,225	6,309,264	3,769,377	24,565,113
අලියාන්ස් ලයිෆ්	2,028,498	2,112,045		621,341	1,490,704
අමානා ලයිෆ්	535,106	475,497	104,949	45,098	535,349
ආර්පිකෝ	1,908,450	2,480,289		259,038	2,221,252
සෙලින්කෝ ලයිෆ්	72,111,874	79,829,489	3,890,031	12,054,899	71,664,622
කෝප් ලයිෆ්	1,473,028	1,550,295	148,393	201,065	1,497,623
එච්එන්බී ලයිෆ්	8,966,667	13,314,033	381,156	2,555,492	11,139,698
ජනශක්ති ලයිෆ්	10,132,233	12,404,959	1,795,829	1,343,002	12,857,786
එල්අයිසී	485,940	507,282	111,899	55,283	563,897
එල්ඕඑල්සී ලයිෆ්	2,326,985	3,460,221	256,134	251,627	3,464,728
එම්බීඑස්එල්	556,357	523,814		8,423	515,391
සණස ලයිෆ්	747,344	1,388,894		568,832	820,062
එස්එල්අයිසී	79,654,571	112,671,772	169,909	6,533,102	106,308,579
සොෆ්ට්ලොජික් ලයිෆ්	19,940,660	24,830,945	3,938,987	1,688,121	27,081,811
යූනියන් ලයිෆ්	21,795,969	21,675,981	5,654,162	5,747,779	21,582,364
එකතුව	**250,025,198**	**299,250,742**	**22,760,714**	**35,702,477**	**286,308,979**

සංඛ්‍යානමය සමාලෝචනය

රක්ෂණ සමාගම් අනුව නියමිත අවදානම් පාදක ප්‍රාග්ධනය අවශ්‍යතාව (RCR) සැසඳීම - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

අවදානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතාව යනු ද්‍රව්‍යමය අවදානම් කාණ්ඩ වන ණය අවදානම, සංකේන්ද්‍රණ අවදානම, වෙළඳපල අවදානම, ප්‍රතිරක්ෂණ අවදානම, වගකීම් අවදානම සහ මෙහෙයුම් අවදානම යනාදිය සඳහා තීරණය කරන ලද ප්‍රාග්ධන ගාස්තුවල එකතුවයි. අවදානම් පාදක ප්‍රාග්ධන ඊතිය යටතේ ගණනය කළ ප්‍රධාන අවදානම් කාණ්ඩ සමඟින් අවදානම් ප්‍රාග්ධනයෙහි සමාගම් අනුව විශ්ලේෂණය 14 වගුව මඟින් දැක්වේ.

විවිධාංගීකරණයට පෙර නියමිත අවදානම් ප්‍රාග්ධන අයකිරීම් ප්‍රධාන වශයෙන් ජීවිත රක්ෂණකරුවන් දෙදෙනෙකු හේතුවෙන් පසුගිය වසරේ වාර්තා වූ රු.මි. 85,511 ට සාපේක්ෂව 2021 දී 10.47% ක වර්ධන අනුපාතයක් සහිතව රු.මි. 94,464 ක අගයක් ගෙන ඇත. විවිධාංගීකරණයට පසු නියමිත අවදානම් ප්‍රාග්ධන අයකිරීම් රු.මි. 71,075 ක් (2020: රු.මි. 62,676) වූ අතර 13.40% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. පෙර වසරවල මෙන්ම විවිධාංගීකරණයට පෙර මුළු නියමිත අවදානම් ප්‍රාග්ධන අයකිරීම්හි 54.66% ක කොටසක් සමඟින් දිගු කාලීන රක්ෂණකරුවන් දිගටම මුහුණ දුන් ප්‍රධාන අවදානම වෙළඳපොල අවදානම වූ අතර වගකීම් අවදානම සහ සංකේන්ද්‍රණ අවදානම පිළිවෙලින් 24.98% සහ 6.71% ක් විය. මෙම කාණ්ඩ තුන සාමූහිකව විවිධාංගීකරණයට පෙර මුළු නියමිත අවදානම් ප්‍රාග්ධන අයකිරීම්වලින් 86.65% (2020: 84.79%) ක් අත් කරගෙන ඇත.

14 වගුව

2020 සහ 2021 දෙසැම්බර් 31 දිනට සමාගම් අනුව නියමිත අවදානම් පිළිබඳ විශ්ලේෂණය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

රක්ෂකයා	2020 දෙසැම්බර් 31 දිනට (අ) (රු. (000)							
	ණය අවදානම	සංකේන්ද්‍රණ අවදානම	වෙළඳපළ අවදානම	ප්‍රතිරක්ෂණ අවදානම	වගකීම් අවදානම	මෙහෙයුම් අවදානම	විවිධාංගීකරණයට පෙර නියමිත අවදානම් ප්‍රාග්ධන අයකිරීම්	විවිධාංගීකරණයට පසු නියමිත අවදානම් ප්‍රාග්ධන අයකිරීම්
ඒ්අයිඒ් ලයිෆ්	405,929	837,779	3,083,121		3,484,467	717,372	8,528,668	5,601,570
අලියාන්ස් ලයිෆ්	3,780	4,965	38,894	1,357	201,431	63,885	314,311	216,924
අමානා ලයිෆ්	20,623	145,518	93,121	692		30,819	290,774	261,775
ආර්පිකෝ	43,003	24,935	268,971	48	309,600	40,799	687,356	459,409
සෙලින්කෝ ලයිෆ්	1,788,403	936,699	13,906,140	6,752	3,771,492	1,579,705	21,989,191	17,133,081
කෝප් ලයිෆ්	84,122	11,727	300,427	1,936	432,752	34,918	865,882	589,123
එච්එන්බී ලයිෆ්	453,841	300,384	1,697,310	806	980,410	258,531	3,691,283	2,653,681
ජනශක්ති ලයිෆ්	460,431	250,364	2,479,801	2,220	922,572	234,465	4,349,854	3,331,694
එල්අයිසී	40,735	65,364	206,213	43	126,036	35,598	473,991	338,702
එල්ඕවිල්සී ලයිෆ්	33,484	72,585	1,068,704	6,006	428,801	76,140	1,685,720	1,258,533
එම්බීවිස්එල්	8,245	25,398	38,938	22	20,022	10,646	103,271	76,062
සණස ලයිෆ්	26,138	181,540	157,429	17	95,106	22,215	482,445	377,961
එස්එල්අයිසී	1,722,707	2,410,946	12,072,062		6,011,473	1,721,707	23,938,896	17,370,300
සොෆ්ට්ලොජික් ලයිෆ්	305,146	920,645	3,508,957	2,067	4,599,898	321,649	9,658,363	6,610,593
යූනියන් ලයිෆ්	550,837	982,231	4,614,727	184	1,633,884	668,703	8,450,567	6,396,436
එකතුව	**5,947,425**	**7,171,081**	**43,534,817**	**22,150**	**23,017,944**	**5,817,151**	**85,510,570**	**62,675,845**

සංඛ්‍යානමය සමාලෝචනය

රක්ෂකයා	2021 දෙසැම්බර් 31 දිනට (අ) (රු. (000)							
	ණය අවදානම	සංකේන්ද්‍රණ අවදානම	වෙළඳපළ අවදානම	ප්‍රතිරක්ෂණ අවදානම	වගකීම් අවදානම	මෙහෙයුම් අවදානම	විවිධාංගීකරණයට පෙර නියමිත අවදානම් ප්‍රාග්ධන අයකිරීම්	විවිධාංගීකරණයට පසු නියමිත අවදානම් ප්‍රාග්ධන අයකිරීම්
ඒ්අයිඒ් ලයිෆ්	403,735	510,328	2,744,866		2,500,256	722,278	6,881,463	4,490,070
අලියාන්ස් ලයිෆ්	3,969	6,945	287,262	1,380	223,094	64,203	586,853	378,981
අමානා ලයිෆ්	20,272	142,869	107,436	416	34,414	33,257	338,665	275,187
ආර්පිකෝ	57,884	20,376	190,809	67	391,312	42,480	702,929	476,828
සෙලින්කෝ ලයිෆ්	2,023,077	811,405	14,630,734	6,683	4,176,320	1,738,317	23,386,536	18,048,010
කෝප් ලයිෆ්	108,421	15,266	303,239	2,158	272,764	36,080	737,928	509,721
එච්වින්බී ලයිෆ්	473,139	227,543	3,230,051		808,262	287,928	5,026,923	4,023,288
ජනශක්ති ලයිෆ්	480,563	267,471	2,352,740	2,290	1,125,374	250,797	4,479,235	3,310,343
එල්අයිසී	40,357	25,025	228,100	36	93,368	34,651	421,536	309,953
එල්ඕවිල්සී ලයිෆ්	77,563	123,120	439,121	560	318,412	95,129	1,053,905	721,459
එම්බීඑස්එල්	11,376	2,415	41,166	119	17,159	9,930	82,165	58,536
සණස ලයිෆ්	38,331	167,799	253,871		83,280	25,756	569,036	468,187
එස්එල්අයිසී	1,772,087	2,510,518	16,403,680		6,233,425	1,851,946	28,771,656	21,684,273
සොෆ්ට්ලොජික් ලයිෆ්	493,551	991,029	2,242,839	848	5,735,787	375,911	9,839,964	6,851,316
යූනියන් ලයිෆ්	618,464	516,349	8,174,153	140	1,586,154	689,689	11,584,949	9,468,422
එකතුව	**6,622,788**	**6,338,460**	**51,630,067**	**14,697**	**23,599,379**	**6,258,352**	**94,463,744**	**71,074,573**

නිකුත් කරන ලද හා බලාත්මකව පවතින රක්ෂණ ඔප්පු සංඛ්‍යාව - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය


2021 අවසානය වන විට බලාත්මක වූ මුළු ජීවිත රක්ෂණ ප්‍රතිපත්ති සංඛ්‍යාව 4,297,794 ක් (2020: 4,063,568) වූ අතර එය 2020 දී වාර්තා වූ 20.11% ක වර්ධනයට සාපේක්ෂව 5.76% ක සාමාන්‍ය වර්ධනයකි. 3.37% ක (2020: 23.04%) පහත වැටීමක් පෙන්නුම් කරමින් නිකුත් කරන ලද නව ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 873,762 (2020: 904,224) දක්වා වැඩි වී ඇත්තේ 2020 ට සාපේක්ෂව ජීවිත රක්ෂණකරුවන් දෙදෙනෙකු විසින් නිකුත් කරන ලද නව රක්ෂණ ඔප්පු ප්‍රමාණය අඩු වීම හේතුවෙනි.

බලාත්මකව පවතින ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස 19.40% ක් (2020: 18.54%) වූ අතර බලාත්මකව පවතින ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස 50.25% ක් (2020: 47.99%) විය. දිගු කාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා නිකුත් කරන ලද රක්ෂණ ඔප්පු සංඛ්‍යාව සහ බලාත්මක වන ප්‍රතිපත්ති ප්‍රස්තාර 10 මගින් දැක්වේ.

සංඛ්‍යානමය සමාලෝචනය

10 ප්‍රස්තාරය

නිකුත් කරන ලද හා බලාත්මකව පවතින රක්ෂණ ඔප්පු සංඛ්‍යාව - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය



* මූලාශ්‍රය: මධ්‍ය වාර්ෂික ශ්‍රම බලකාය හා ජනගහනය - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ මහ බැංකුව

	2017	2018	2019	2020 (අ)	2021 (අ)
නිකුත් කරන ලද ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව	643,483	711,126	734,896	904,224	873,762
බලාත්මකව පවතින ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව	3,068,866	3,199,354	3,383,290	4,063,568	4,297,794
බලාත්මකව පවතින ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස*	14.31	14.76	15.52	18.54	19.40
බලාත්මකව පවතින ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ශ්‍රම බලකායෙහි ප්‍රතිශතයක් ලෙස*	37.39	38.14	39.38	47.99	50.25

නිපැයුම් අනුව බලාත්මකව පවතින ඔප්පු හා රක්ෂිත මුදල - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

2021 සහ 2020 වසර සඳහා වන නිෂ්පාදනය අනුව බලාත්මකව පවතින ඔප්පු පිළිබඳ විස්තර 15 වගුවෙහි කාලීන රක්ෂණය, යුනිවර්සල් ලයිෆ්, පූර්ණ ජීවිත රක්ෂණය, උත්පාදන රක්ෂණ සහ වෙනත් යටතේ සැකෙවින් දැක්වේ. "වෙනත්" කාණ්ඩයට ප්‍රධාන වශයෙන් ඇතුළත් වන්නේ සෞඛ්‍ය රක්ෂණ සැලසුම්, සබැඳි ඒකක (unit linked), වාර්ෂිකයන් කණ්ඩායම් ජීවිත රක්ෂණය (group life), තනි වාරික නිපැයුම් ආදියයි. 5.76% ක වර්ධනයක් සමඟින් බලාත්මකව පවතින මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 4,297,794 (2020: 4,063,568) දක්වා ඉහළ ගිය අතර 2021 අවසාන වන විට මුළු රක්ෂිත මුදල රු.බි. 6,267 ක් (2020: රු.බි. 4,823) දක්වා ඉහළ ගොස් ඇත.

පෙර වසරට සමානව 2021 දී උත්පාදන රක්ෂණ ඔප්පු 0.28% ක සුළු වර්ධන අනුපාතයක් පෙන්නුම් කරමින් එම සංඛ්‍යාව 1,276,647 (2020: 1,273,095) ලෙස වාර්තා කිරීමෙන් බලාත්මක රක්ෂණ ඔප්පු සංඛ්‍යාවේ විශාලතම කාණ්ඩය නියෝජනය කළේය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් එක් ජීවිත රක්ෂණකරුවෙකු හේතුවෙන් එම කාණ්ඩයේම මුළු රක්ෂණ මුදල රු.බි. 501 (2020: රු.බි. 685) දක්වා පහත වැටීමක් සිදු වී ඇත. යුනිවර්සල් ලයිෆ් රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 1,057,060 (2020: 992,360) දක්වා වැඩි වූ අතර ජීවිත රක්ෂණකරුවන් සිව් දෙනෙකු හේතුවෙන් මුළු රක්ෂිත මුදල රු.බි. 620 (2020: රු.බි. 515) දක්වා ඉහළ ගියේය.

38.60% ක වර්ධනයක් පෙන්නුම් කරන "වෙනත්" කාණ්ඩයේ බලාත්මක රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 1,016,278 (2020: 733,250) දක්වා ඉහළ ගොස් ඇති අතර එම මුළු රක්ෂිත මුදල රු.බි. 3,422 ක් (2020: රු.බි. 2,066) විය. මෙය ප්‍රධාන වශයෙන් උකස් ආරක්ෂණ සැලැස්මේ - තනි වාරික සහ සෞඛ්‍ය ආරක්ෂණ සැලසුම්වල වාර්තා වූ වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස එක් ජීවිත රක්ෂණකරුවෙකු හේතුවෙන් ඇති විය. තවද, අමතර ආවරණ ප්‍රතිලාභය සඳහා රක්ෂිත මුදල මගින් ද එම ජීවිත රක්ෂණකරුගේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය.

කාලීන රක්ෂණය, 2021 දී රක්ෂණ ඔප්පු සංඛ්‍යාව අනුව 924,270 (2020: 1,041,132) වාර්තා කරමින් 11.22% ක පහත වැටීමක් පෙන්නුම් කර ඇත. කෙසේ වෙතත්, එම කාණ්ඩයේම මුළු රක්ෂිත මුදල රු.බි. 1,722 ක් (2020: රු.බි. 1,556) අතර 10.70% ක වර්ධන වේගයක් සමග වර්ධනය විය.

පූර්ණ ජීවිත රක්ෂණයට අදාළ රක්ෂණ ඔප්පු සංඛ්‍යාව සහ රක්ෂණ මුදල පිළිවෙලින් 23,539 (2020: 23,731) සහ රු.මි. 1,555 (2020: රු.මි. 1,555) කරා ළඟා වීමෙන් තවදුරටත් පහත වැටී ඇත.

සංඛ්‍යානමය සමාලෝචනය


15 වගුව

2020 සහ 2021 සඳහා නිපැයුම් අනුව බලාත්මකව පවතින ඔප්පු හා රක්ෂිත මුදල - දිගුකාලීන රක්ෂණය ව්‍යාපාරය

ජීවිත රක්ෂණ වර්ගය	2020		2021	
	බලාත්මකව පවතින රක්ෂණ ඔප්පු සංඛ්‍යාව	රක්ෂිත මුදල (රු. '000)	බලාත්මකව පවතින රක්ෂණ ඔප්පු සංඛ්‍යාව	රක්ෂිත මුදල (රු. '000)
කාලීන රක්ෂණය	1,041,132	1,556,004,122	924,270	1,722,498,648
සර්වත්‍ර ආයුකාලය	992,360	514,703,931	1,057,060	620,345,090
පූර්ණ ජීවිත රක්ෂණය	23,731	1,555,115	23,539	1,554,973
උත්පාදන/ දායාද	1,273,095	684,919,131	1,276,647	501,347,497
වෙනත්	733,250	2,065,977,502	1,016,278	3,421,566,810
එකතුව	**4,063,568**	**4,823,159,802**	**4,297,794**	**6,267,313,018**

11 ප්‍රස්තාරය

2020 සහ 2021 සඳහා නිපැයුම් අනුව බලාත්මකව පවතින රක්ෂණ ඔප්පු - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය



12 ප්‍රස්තාරය දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ රක්ෂණ ඔප්පු අවලංගු වීම් නිරූපණය කරයි.


රක්ෂණ ඔප්පු අවලංගු වීම් - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

වාරික නොගෙවීම සහ ගිවිසුම් සහන කාලය අවසන් වීම හේතුවෙන් අවසන් කරන ලද රක්ෂණ ඔප්පු ලෙස අර්ථ දැක්විය හැකි රක්ෂණ ඔප්පු අවලංගු වීම් 268,905 (2020: 273,879) දක්වා 1.82% පහත වැටීමක් වාර්තා කර ඇත. නව රක්ෂණ ප්‍රතිපත්ති අවලංගු වීම් 86,170 (2020: 70,152) දක්වා වැඩි වී ඇති අතර එය 2020 ට සාපේක්ෂව 22.83% ක වර්ධන අනුපාතයක් පෙන්නුම් කරයි. මෙයට සාම්ප්‍රදායික සහභාග නොවන සහ යුනිවර්සල් ලයිෆ් කාණ්ඩ හේතු වී ඇත. බලාත්මක මුළු රක්ෂණ ඔප්පුවල ප්‍රතිශතයක් ලෙස අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු 6.26% ක් (2020: 6.74%) වූ අතර එමගින් පහත වැටීමේ ප්‍රවණතාව දිගටම පැවතුණු බව පෙනී යයි. කෙසේ වුවද, පසුගිය වසර කිහිපය පුරාවටම පහත වැටීමක් පෙන්නුම් කළ අවලංගු වූ රක්ෂණ ඔප්පු ප්‍රමාණය නිකුත් කරන ලද නව රක්ෂණ ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතය 2021 දී 9.86% (2020: 7.76%) දක්වා වැඩි වීමක් පෙන්නුම් කරන ලදී.

සංඛ්‍යානමය සමාලෝචනය

12 ප්‍රස්තාරය

රක්ෂණ ඔප්පු අවලංගු වීම් - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය



	2017	2018	2019	2020 (අ)	2021 (ආ)
අවලංගු වූ නව රක්ෂණ ඔප්පු	90,350	86,484	83,547	70,152	86,170
අවලංගු වූ මුළු නව රක්ෂණ ඔප්පු	275,039	268,339	265,256	273,879	268,905
අවලංගු වූ රක්ෂණ ඔප්පු ප්‍රමාණය නිකුත් කරන ලද නව රක්ෂණ ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස	14.04	12.16	11.37	7.76	9.86
අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණය බලාත්මකව පවතින මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස	8.96	8.39	7.84	6.74	6.26

රක්ෂණ සමාගම් විසින් දරණ ලද හිමිකම් පෑම්- දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

සමාලෝචිත වර්ෂය තුළ දිගුකාලීන රක්ෂණකරුවන් විසින් දරන ලද හිමිකම් පෑම් රු.මි. 46,113 (2020: රු.මි. 37,909) දක්වා තවදුරටත් ඉහළ ගොස් 21.64% (2020: 7.88%) ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. දිගු කාලීන රක්ෂණකරුවන් විසින් ඔප්පු හිමියන් වෙත ලබා දෙන හිමිකම් අකර්නමයතා ප්‍රතිලාභ, මරණ, පවාරණයන්, කල්පිරීමේ ප්‍රතිලාභ සහ වෙනත් ප්‍රතිලාභ යන කාණ්ඩ යටතේ වෙන් කළ හැකි අතර පසුගිය වසර කිහිපය සඳහා ඊට අදාළ විස්තර ප්‍රස්තාර 13 හි විස්තරාත්මකව දක්වා ඇත.

3.34% ක සාමාන්‍ය වර්ධනයක් සමඟින් කල්පිරීමේ දී ලබා දෙන ප්‍රතිලාභ, 2021 වර්ෂය සඳහා දරන ලද මුළු හිමිකම්වලින් 48.64% (2020: 57.25%) ක සැලකිය යුතු කොටසක් හිමිකර ගනිමින් රු.මි. 22,428 ක් (2020: රු.මි. 21,703) විය. 17.73% ක (2020: 18.34%) කොටසක් හිමි වූ පවාරණයන් 17.58% ක වර්ධන අනුපාතයක් පෙන්නුම් කරමින් රු.මි. 8,174 (2020: රු.මි. 6,952) දක්වා වැඩි විය.


රෝහල්ගත වීමේ දී ලැබෙන ප්‍රතිලාභ, අත්තිකාරම් ගෙවීම්, මුදල් සහ පක්ෂපාතිත්ව ප්‍රසාද දීමනා යනාදිය ඇතුළත් අනෙකුත් ප්‍රතිලාභ කාණ්ඩ යටතේ දරණ ලද මුදල රු.මි. 8,390 (2020: රු.මි. 5,902) වූ අතර 42.14% ක තියුණු වර්ධනයක් පෙන්නුම් කරමින් දරණ ලද මුළු හිමිකම් පෑම් ප්‍රමාණයෙන් 18.19% ක් (2020: 15.57%) වාර්තා කර ඇත.

තවද, 2021 දී මරණ ප්‍රතිලාභ රු.මි. 6,196 ක් (2020: රු.මි. 2,647) සහ අකර්නමයතා ප්‍රතිලාභ රු.මි. 925 ක් (2020: රු.මි. 706) විය.

සංඛ්‍යානමය සමාලෝචනය

13 ප්‍රස්තාරය

රක්ෂණ සමාගම් විසින් දරණ ලද හිමිකම් පෑම් - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය



	2017	2018	2019	2020 (අ)	2021 (ආ)
අකර්මනාත්‍යතා ප්‍රතිලාභ	636,472	984,923	731,803	705,887	925,434
මරණ	2,106,087	2,842,975	2,991,518	2,646,832	6,195,906
පවාරණ	5,530,517	7,004,688	7,141,731	6,951,595	8,173,793
කල්පිරීමේ ප්‍රතිලාභ	14,393,605	18,343,285	18,485,420	21,702,673	22,428,031
වෙනත්	3,704,469	5,240,493	5,788,922	5,902,181	8,389,628

රක්ෂණ හිමිකම් පෑම් සංඛ්‍යාව - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

2021 දී 7.74% (2020: 15.82%) ක වර්ධන අනුපාතයක් පෙන්නුම් කරමින් දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ මුළු හිමිකම් ප්‍රමාණය 544,675 (2020: 505,533) දක්වා ඉහළ යාමක් වාර්තා කර ඇත. රෝහල්ගතවීම සහ අසාධ්‍ය රෝග සඳහා වන ප්‍රතිලාභ, මුදල් සහ පක්ෂපාතිත්ව ප්‍රසාද දීමනා, වාර්ෂිකයන් ආදිය ඇතුළු අනෙකුත් ප්‍රතිලාභ, හිමිකම් ප්‍රමාණය අනුව විශාලතම කාණ්ඩය නියෝජනය කරන අතර, දිගුකාලීන කර්මාන්තයේ හිමිකම් ප්‍රමාණය 232,373 ක් (2020: 173,183) ලෙස වාර්තා කර ඇත. කල්පිරීමේ දී ලැබෙන ප්‍රතිලාභ 2.40%ක සුළු වර්ධනයක් සමඟින් 157,176 ක් (2020: 153,491) විය.

පවාරණයන් 18.64% කින් අඩු වූ අතර එය 126,686 ක් (2020: 155,718) විය. වෙළඳපොලේ පොලී අනුපාත අඩුවීම හේතුවෙන් පවතින ණය නැවත සකස් කිරීමට පාරිභෝගිකයින්ට සිදු වූ බැවින් නව අඩු වන කාලීන සහතික රක්ෂණ ඔප්පුවල (DTA policies) ලබා ගැනීම සඳහා පවතින අඩු වන කාලීන සහතික රක්ෂණ ඔප්පු භාරදීම හේතුවෙන් 2020 වසරේදී පවාරණයන් රැසක හදිසි වැඩිවීමක් සිදුවූ බව සඳහන් කළ යුතුය.

2021 දී මරණ සහ අකර්නමාත්‍යතා ප්‍රතිලාභ පිළිවෙලින් 14,454 (2020: 12,105) සහ 13,986 (2020: 11,036) විය.

16 වගුව මගින් පසුගිය වසර පහ සඳහා දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයේ විවිධ කාණ්ඩ යටතේ රක්ෂණ වූ හිමිකම් පෑම් ප්‍රමාණය දැක්වේ.

16 වගුව

රක්ෂණ හිමිකම් පෑම් සංඛ්‍යාව - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

	2017	2018	2019	2020 (අ)	2021 (ආ)
අකර්මනාත්‍යතා ප්‍රතිලාභ	10,749	10,737	12,251	11,036	13,986
මරණ ප්‍රතිලාභ	11,247	11,935	12,958	12,105	14,454
පවාරණ	47,191	70,412	75,988	155,718	126,686
කල්පිරීම් මත ප්‍රතිලාභ	128,266	153,856	130,723	153,491	157,176
වෙනත් ප්‍රතිලාභ	145,452	166,745	204,564	173,183	232,373
එකතුව	**342,905**	**413,685**	**436,484**	**505,533**	**544,675**

සංඛ්‍යානමය සමාලෝචනය

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර

2021 වසර ආරම්භ වූයේ කොවිඩ්-19 වසංගතයේ දරුණුතම ස්වරූපයෙන් පවතින අතරතුර වන අතර ශ්‍රී ලංකාව පෙර පැවති සමාජ-ආර්ථික හා දේශපාලන අභියෝග රැසකින් වසර ගණනාවක් තිස්සේ බැට කමින් සහ එම අභියෝග ජය ගැනීමට දැඩි උත්සාහයක් දරමින් සිටින පසුබිමකය. 2021 දී ඩෙල්ටා ප්‍රභේදයේ මතුවීම අපේක්ෂා කළ පමණට වඩා දරුණු ප්‍රතිඵල ගෙන දුන් අතර රෝහල්ගතවීම් සහ මරණ සංඛ්‍යාව වැඩි වී ශ්‍රී ලංකාව වසර තුළ තෙවරක් අගුළු දැමීමට සිදු විය. ඉහත කරුණුවල ප්‍රතිවිපාකයක් ලෙස රට පුරා ව්‍යාපාරවලට සැලකිය යුතු බලපෑමට ලක් විය. අයහපත් ආර්ථික තත්වය හේතුවෙන් රක්ෂණ ක්ෂේත්‍රය ඇතුළු රටේ විවිධ ක්ෂේත්‍ර රැසකට අභියෝගවලට මුහුණ දීමට සිදු විය.

මෝටර් රථ ආනයනය සඳහා පනවා ඇති සීමාවන් පුළුල් කිරීම හේතුවෙන් 2021 වර්ෂයේදී මෝටර් රථ අලුතින් ලියාපදිංචි කිරීම අබණ්ඩව පහත වැටුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ 2021 වාර්ෂික වාර්තාවට අනුව 2020 වසරේ 44.8% ක පහත වැටීමට සාපේක්ෂව 2021 වසරේ මෝටර් රථ අලුතින් ලියාපදිංචි කිරීම 83.3% කින් කැපී පෙනෙන ලෙස අඩු වී ඇත. කැබ් රථ, මෝටර් රථ, යතුරුපැදි සහ ද්විත්ව කාර්ය වාහන ඇතුළු සියළුම ප්‍රධාන මෝටර් රථ කාණ්ඩවල නව ලියාපදිංචි කිරීම් පහත වැටී ඇත. එසේ වුවද, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ඉතිරි පන්තිවල ප්‍රශංසනීය කාර්ය සාධනය හේතුවෙන් සමස්ත සාමාන්‍ය රක්ෂණ කර්මාන්තය 2020 වසරේ වාර්තා වූ 2.25% අඩු වීමට සාපේක්ෂව 3.32% ක ප්‍රගතියක් ලබා පසුගිය වසර පහ තුළ ඉහළම දළ ලිඛිත වාරිකය ළඟා කරගෙන ඇත.

වත්කම් පදනම සහ සාමාන්‍ය රක්ෂණ අංශයේ ආයෝජන ආදායම ප්‍රමාණවත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා අවරෝධක සමග පිළිවෙලින් 9.92% සහ 9.72% වර්ධනයක් පෙන්නුම් කළේය.

පසුගිය වසර පහ සමග සසඳන විට සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරයේ හිමිකම් පෑම් පෙර වසරේ 27.80% ක අඩු වර්ධනයට සාපේක්ෂව 2021 වසර සඳහා 42.71% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2020 වසර තුළ සිදු වූ අගුලු දැමීම් කිහිපයක ප්‍රතිඵලයක් ලෙස, විශාල හිමිකම් ප්‍රමාණයක් ප්‍රමාද වීම සහ ඒවා නිෂ්කාශනය කිරීම 2021 වර්ෂයේදී සිදු වීම හේතුවෙන් සෞඛ්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ හිමිකම් පෑම් හදිසියේ ඉහළ ගියේය. මීට අමතරව, නව කොවිඩ්-19 ප්‍රභේදයන් සංසරණය වීම සහ රෝගීන් සංඛ්‍යාව ඉහළ යාම ඔවුන්ගේ වෛද්‍ය අවශ්‍යතා කෙරෙහි පුද්ගලයින්ගේ අවධානය වේගයෙන් ඉහළ නැංවූ අතර එය අවසානයේ සෞඛ්‍ය රක්ෂණ අංශයේ හිමිකම් ඉහළ නැංවීමට ඉවහල් විය. හිමිකම් පෑම් වැඩිවීම හේතුවෙන් සාමාන්‍ය රක්ෂණ කර්මාන්තය ලාභය සුළු වශයෙන් අඩු වීමක් පෙන්නුම් කළේය.

පුළුල්ව ක්‍රියාත්මක වූ චීන්නත් වැඩසටහන්වල සාර්ථකත්වය සහ 2021 අවසානය වන විට ගෝලීය සංචාරක සීමාවන් ලිහිල් කිරීම සමග යහපත් කාලයක් උදා විය. වසංගතය හේතුවෙන් ඇති වූ ව්‍යාපාරික බාධාවන් පරාජය කරමින් රක්ෂණ අංශය වඩාත් ධනාත්මක ඉදිරි දැක්මකින් 2021 වසරට පිවිසියේය. බොහෝ රක්ෂණකරුවන් ඩිජිටල් ක්‍රියාවලීන් වෙත වේගවත්ව හා බාධාවකින් තොරව මාරු වීම ඇති බැවින් පාරිභෝගික සබඳතාව පැය 24 පුරාම පවත්වාගෙන යයි. එම නිසා වසර පුරාවට පාරිභෝගිකයන්ට අබණ්ඩ සේවාවක් ලබාදීමට රක්ෂණකරුවෝ සමත් වූහ. වසංගතයෙන් චිල්ල වන බාධා ජයගැනීමේ ක්‍රමවේදයක් ලෙස ශ්‍රී ලංකාවේ රක්ෂණ සමාගම් වාරික එකතු කිරීම, හිමිකම් ගෙවීම ආදියට අදාළව රක්ෂණ ඔප්පු හිමියන්ට ප්‍රතිලාභ කිහිපයක් ලබා දී ඇත.

දළ ලිඛිත වාරිකය

පවතින කොවිඩ්-19 තත්වයන් සහ අභියෝගාත්මක ආර්ථික වටපිටාව මධ්‍යයේ වුවද සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රය පෙර වසරේ 2.25% ක අහිතකර ප්‍රවණතාවයට සාපේක්ෂව 3.32% ක සුළු ප්‍රගතියක් පෙන්නුම් කළ අතර එය රු.මි. 108,760 ක වාරික ආදායමක් (2020: රු.මි. 105,265) වාර්තා කළේය. පුළුල්ව ව්‍යාප්ත වූ චීන්නත් වැඩසටහන් සහ 2021 අග භාගයේ වසංගත ආශ්‍රිත සීමාවන් සමනය වීම මින් පෙර නවතා තිබූ වාණිජ ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීමට සහ ඉදිරියට යාමට පුද්ගලයින්ට සහ ව්‍යාපාරවලට උපකාරී විය. එහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථිකයේ බොහෝ අංශ බාධාවකින් තොරව ක්‍රියාත්මක වූ අතර එය 2021 දී 3.7% දළ දේශීය නිෂ්පාදන වර්ධනයක් අත්කර ගත් ශ්‍රී ලංකා ආර්ථිකයෙන් පිළිබිඹු විය. මෙම තත්වය මත බොහෝ රක්ෂණකරුවන් සැලකිය යුතු කාර්ය සාධනයක් පෙන්නුම් කළ අතර එම නිසා පසුගිය වසර පහ තුළ සාමාන්‍ය රක්ෂණ අංශයේ ප්‍රගතිය පෙන්නුම් කළේය.

එස්එල්අයිසී ජෙනරල්, 2020 වසරේ සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළට විශාලතම දායකත්වය සපයන්නා වූ අතර 2021 වර්ෂයේදී ද ප්‍රථම ස්ථානය හිමිකර ගැනීමට සමත් වූයේ 18.74% ක (2020: 18.40%) වෙළඳපොල කොටසක් හිමිකර ගැනීම සහ රු.මි. 20,382 ක (2020: රු.මි. 19,371) දළ ලිඛිත වාරිකයක් ජනනය කරමිනි. හිමිකම්, පුද්ගලික අනතුරු සහ මහජන වගකීම් වැනි විවිධ ව්‍යාපාරික පන්තියේ උපප්‍රවර්ග, එස්එල්අයිසී ජෙනරල්හි සමස්ත දළ ලිඛිත වාරිකය ඉහළ නංවමින් 2021 වසර තුළ එහි ධාරිතාව ඉහළ නංවා ඇත. විදේශ රැකියා අවස්ථා පුළුල් වීමෙන් පෙර වසරට සාපේක්ෂව වාරික එකතුව ඉහළ ගොස් ඇති අතර එමගින් සමාගමේ සමස්ත දළ ලිඛිත වාරිකය තවදුරටත් ඉහළ නංවා ඇත.

සමාලෝචිත වර්ෂයේදී, 17.01% ක (2020: 17.75%) වෙළඳපොල කොටස සමගින් සෙලින්කෝ ජෙනරල් සමාගම සාමාන්‍ය රක්ෂණ වෙළඳපොලේ දෙවන ස්ථානය අත්පත් කර ගත් අතර එය රු.මි. 18,499 ක් (2020: රු.මි. 18,681) වූ දළ ලිඛිත

සංඛ්‍යානමය සමාලෝචනය

වාරිකයක් ජනනය කළේය. මෝටර් රථ රක්ෂණ ව්‍යාපාරයේ පහත වැටීම සෙලින්කෝ ජෙනරල් සමාගමේ දළ ලිඛිත වාරිකයෙහි ඉහත දැක්වූ සුළු අඩු වීමට හේතු විය. ජාතික රක්ෂණ භාර අරමුදල රු.මි. 13,365 ක (2020: රු.මි. 12,052) දළ ලිඛිත වාරිකයක් සහ 12.29% ක (2020: 11.45%) වෙළඳපල කොටසක් වාර්තා කරමින් සාමාන්‍ය රක්ෂණ වෙළඳපොලේ තුන්වන ස්ථානය හිමිකර ගත්තේය.

මෝටර් රථ රක්ෂණ ව්‍යාපාරයේ කැපී පෙනෙන පහත වැටීම සියළුම සාමාන්‍ය රක්ෂණකරුවන්ට අහිතකර ලෙස බලපා ඇති බව පෙනී ගොස් ඇත. පෙර වසරේ වෙළඳපොල තුළ තුන්වන ස්ථානය හිමි කරගත් අලියාන්ස් ජෙනරල් සමාගම 11.48% ක (2020: 13.16%) වෙළඳපොල කොටස සමඟින් රු.මි. 12,490 (2020: රු.මි. 13,853) දළ ලිඛිත වාරිකයක් වාර්තා කරමින් මෙම වසරේ සිව්වන ස්ථානයට පත්ව ඇත.

10.95% ක (2020: 11.34%) වෙළඳපොල කොටසක් සහ රු.මි. 11,914 ක (2020: රු.මි. 11,937) දළ ලිඛිත වාරිකයක් සමග මෙම වසර සඳහා ද සාමාන්‍ය රක්ෂණ වෙළඳපොලේ පස්වන ස්ථානය හිමි කර ගැනීමට ෆෙයාෆස්ට් සමත් විය.

කොවිඩ්-19 වසංගතයේ බලපෑම් සහ ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ වුවද රක්ෂණකරුවන් හතර දෙනෙකු හැර අනෙකුත් සියළුම සාමාන්‍ය රක්ෂණකරුවන් දළ ලිඛිත වාරිකයෙහි ඉහළ යාමක් පෙන්නුම් කර ඇති අතර එය පෙර වසරේ සමස්ත දළ ලිඛිත වාරිකයෙහි පහත වැටීමට සාපේක්ෂව ප්‍රමාණවත් සහතිකයක් ලබා දුන්නේය.

සාමාන්‍ය රක්ෂණ සමාගම්වල සමාගම් අනුව දළ ලිඛිත වාරිකය සහ වෙළඳපල කොටස 17 වගුව සහ 14 ප්‍රස්තාරය මගින් නිරූපනය කරයි.

17 වගුව


සමාගම් අනුව දළ ලිඛිත වාරිකය සහ වෙළඳපල කොටස - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

රක්ෂකයා	2017		2018		2019		2020 (අ)		2021 (ආ)	
	දළ ලිඛිත වාරිකය (රු '000)	වෙළඳපල කොටස (%)	දළ ලිඛිත වාරිකය (රු '000)	වෙළඳපල කොටස (%)	දළ ලිඛිත වාරිකය (රු '000)	වෙළඳපල කොටස (%)	දළ ලිඛිත වාරිකය (රු '000)	වෙළඳපල කොටස (%)	දළ ලිඛිත වාරිකය (රු '000)	වෙළඳපල කොටස (%)
අලියාන්ස් ජෙනරල්	5,956,142	6.38	17,983,748	17.88	18,095,258	16.80	13,852,829	13.16	12,490,133	11.48
අමානා ජෙනරල්	1,686,270	1.81	1,841,067	1.83	1,621,461	1.51	1,631,666	1.55	2,173,073	2.00
සෙලින්කෝ ජෙනරල්	17,012,087	18.22	18,137,933	18.03	18,401,405	17.09	18,680,545	17.75	18,498,751	17.01
කොන්ටිනෙන්ටල්	3,892,780	4.17	4,545,405	4.52	5,002,548	4.65	4,808,964	4.57	4,888,930	4.50
කෝපරේටිව් ජෙනරල්	2,966,679	3.18	3,692,397	3.67	4,192,960	3.89	4,274,397	4.06	4,374,591	4.02
ෆෙයාෆස්ට්	9,610,990	10.29	10,980,850	10.92	11,247,669	10.44	11,937,482	11.34	11,914,064	10.95
එච්එන්බී ජෙනරල්	3,662,008	3.92	4,062,171	4.04	4,394,457	4.08	4,583,235	4.35	5,166,812	4.75
ජනශක්ති ජෙනරල්	11,740,185	12.57								
එල්ඕවිල්සී ජෙනරල්	3,795,106	4.06	4,318,721	4.29	4,954,896	4.60	5,612,894	5.33	6,562,651	6.03
එම්බීවිස්වල්	260,806	0.28	(512)	0.00	95,979	0.09	297,995	0.28	413,070	0.38
එන්ඉයිටිවිෆ්	8,114,412	8.69	9,644,901	9.59	13,358,203	12.40	12,051,863	11.45	13,365,348	12.29
ඔරියන්ට්	1,179,000	1.26	1,376,398	1.37	1,564,902	1.45	1,628,153	1.55	2,027,885	1.86
පීපල්ස්	4,587,432	4.91	5,354,368	5.32	5,694,164	5.29	5,686,758	5.40	5,634,586	5.18
සණස ජෙනරල්	569,509	0.61	732,379	0.73	898,079	0.83	847,117	0.80	868,306	0.80
එස්ඒල්ඉයිසී	18,355,361	19.65	17,916,274	17.81	18,162,766	16.87	19,370,895	18.40	20,382,188	18.74
එකතුව	**93,388,766**	**100**	**100,586,101**	**100**	**107,684,747**	**100**	**105,264,793**	**100**	**108,760,388**	**100**
වර්ධන අනුපාතය(%)	**17.34**		**7.71**		**7.06**		**-2.25**		**3.32**	

සංඛ්‍යානමය සමාලෝචනය

14 ප්‍රස්තාරය

2021 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා සමාගම් අනුව දළ ලිඛිත වාරිකවල වෙළඳපල කොටස - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය



දළ ලිඛිත වාරිකයට අදාළව ඉහළම දායකත්වයක් ලබා දුන් සමාගම් පහේ සහ අනෙකුත් රක්ෂණකරුවන්ගේ වෙළඳපල කොටස - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

එස්වල්අයිසී ජෙනරල්, සෙලින්කෝ ජෙනරල්, ජාතික රක්ෂණ භාර අරමුදල, අලියන්ස් ජෙනරල් සහ ෆෙයාෆස්ට් 2021 වසරේ සාමාන්‍ය රක්ෂණ වෙළඳපොලේ ඉහළම ස්ථාන පහ හිමිකර ගත් අතර එය 70.48% ක (2020: 72.10) වෙළඳපොල කොටසක් සමගින් රු.මි. 76,650 ක් (2020: රු.මි. 75,894) වටිනා මුළු දළ ලිඛිත වාරිකයක් නියෝජනය කරයි. ඉහිරි සමාගම් නවය රු.මි. 32,110 ක් (2020: රු.මි. 29,371) වටිනා දළ ලිඛිත වාරිකයක් ජනනය කරන ලද අතර එය සාමූහිකව 29.52% (2020: 27.90%) වෙළඳපොල කොටස නිරූපණය කරයි.

පෙර වසරට සමානව, එස්වල්අයිසී ජෙනරල් සහ සෙලින්කෝ ජෙනරල් 2021 වර්ෂයේදී ද සාමාන්‍ය රක්ෂණ වෙළඳපොලේ පළමු සහ දෙවන ස්ථාන හිමි කර ගෙන ඇත. කෙසේ වුවද, සෙලින්කෝ ජෙනරල් සමාගමේ කාර්ය සාධනය පෙර වසරට සාපේක්ෂව සුළු වශයෙන් පහත වැටී ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදල තුන්වන හිමි කර ගනිමින් පෙර වසරට සාපේක්ෂව වෙළඳපොල කොටසෙහි සුළු වැඩිවීමක් පෙන්නුම් කර ඇත. සාමාන්‍ය රක්ෂණ වෙළඳපොලේ සිව්වන දායකයා වන අලියන්ස් ජෙනරල් වෙළඳපොල කොටසෙහි 1.68% ක කැපී පෙනෙන අඩු වීමක් වාර්තා අතර පසුගිය වසර තුන තුළ මෙම ප්‍රවණතාව අපට දැකගත හැකි විය. මෝටර් රථ සහ දේපළ ව්‍යාපාරවල පහත වැටීම අලියන්ස් ජෙනරල් සමාගමේ වාරික එකතුවට බාධාවක් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සෘණාත්මක ප්‍රතිඵල ඇති විය. ෆෙයාෆස්ට් සමාගම ද පෙර වසරට සාපේක්ෂව වෙළඳපොල කොටසෙහි සුළු පහත වැටීමක් පෙන්නුම් කළේය.


ඉතිරි රක්ෂණකරුවන් 2020 වසරට සාපේක්ෂව 1.61% කින් තම වෙළඳපොල කොටස තවදුරටත් ඉහළ නංවාගෙන ඇති අතර එම සමාගම්වල සැලකිය යුතු දියුණුවක් දැකිය හැකිය. එබැවින්, ප්‍රධාන සමාගම් පහේ වෙළඳපොල කොටසෙහි පහත වැටීමක් පෙන්නුම් කරමින් ඉතිරි සමාගම්වලට සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළ තුළ තම බලපෑම වැඩි කර ගැනීමට ඉඩ සලසාදී ඇත.

2017 සිට 2021 දක්වා වූ කාල සීමාව තුළ දළ ලිඛිත වාරිකයට දායක වන ප්‍රමුඛතම සමාගම් පහෙහි සහ අනෙකුත් රක්ෂකයන්ගේ වෙළඳපොළ කොටස පිළිබඳ විස්තර 15 ප්‍රස්තාරය මගින් දැක්වේ.

සංඛ්‍යානමය සමාලෝචනය

15 ප්‍රස්තාරය

2017 සිට 2021 දක්වා වූ කාල සීමාව සඳහා දළ ලිඛිත වාරිකයට අදාළව ඉහළම දායකත්වයක් ලබා දුන් සමාගම් පහේ සහ අනෙකුත් රක්ෂකරුවන්ගේ වෙළඳපල කොටස - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය



	එස්එල්අයිසී	සෙලින්කෝ	එන්අයිටීඑෆ්	ජනශක්ති ජෙනරල්/ අලියාන්ස් ජෙනරල්	ෆෙයාෆස්ට්	වෙනත්
2017	19.65	18.22	8.69	12.57	10.29	30.58
2018	17.81	18.03	9.59	17.88	10.92	25.77
2019	16.87	17.09	12.40	16.80	10.44	26.39
2020 (අ)	18.40	17.75	11.45	13.16	11.34	27.90
2021 (ආ)	18.74	17.01	12.29	11.48	10.95	29.52

පන්තිය අනුව දළ ලිඛිත වාරික විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

මෝටර් රථ රක්ෂණ ව්‍යාපාරය අඛණ්ඩව සාමාන්‍ය රක්ෂණ කර්මාන්තයේ ප්‍රමුඛස්ථානය ලබා ගත් අතර එහි වාරික ඉපැයීම රු.මි. 59,734 ක් (2020: රු.මි. 61,276) ද මුළු දළ ලිඛිත වාරිකයෙහි වෙළඳපොල කොටස 54.92% ක් (2020: 58.21%) ද විය. කෙසේ වුවද, කණගාටුවට කරුණක් වන්නේ පසුගිය වසර හතරක කාලසීමාවට සාපේක්ෂව මෝටර් රථ රක්ෂණ ව්‍යාපාරය 2021 වසර තුළදී අඩුම වාරිකය වාර්තා කර ඇති අතර වසර සඳහා සෘණ වර්ධන වේගයක් සහිත එකම සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර පන්තිය බවට පත් වී ඇත. 2018 වසරේ සිට මෝටර් රථ රක්ෂණ ව්‍යාපාරයේ වෙළෙඳපොළ කොටස ක්‍රමක්‍රමයෙන් අඩු වෙමින් සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රය කෙරෙහි තැතිගන්වන සුළු ඉඟියක් ලබා දී තිබිණි.

2020 වසරට සාපේක්ෂව 2.52%ක සෘණ වර්ධන වේගයක් සමගින් මෝටර් රථ වාරිකය රු.මි. 1,542 ක් දක්වා අඩු වූ අතර මෝටර් රථ සඳහා දීර්ඝ කාලයක් තිස්සේ පැනවූ ආනයනය සීමා කිරීම් මෙන්ම විදේශ මුදල් ද්‍රවශීලතා අර්බුදය, අගුළු දැමීම් සහ සංචරණ සීමා හේතුවෙන් එය එක්තරා මට්ටමකට සාධාරණ බව කිව හැකිය. එබැවින්, අයහපත් ආර්ථික තත්ත්වයන්ගේ ප්‍රතිඵලයක් ලෙස විස්තීරණ රක්ෂණ ඔප්පුවලට සාපේක්ෂව අඩු වාරිකයක් සහිත මෝටර් රථ තෙවන පාර්ශවීය රක්ෂණ ඔප්පු සඳහා රක්ෂණ හිමියන්ගේ ඉල්ලුම ඉහළ ගියේය. අළුත් කිරීමේ දී මෝටර් රථ විස්තීරණ රක්ෂණ ඔප්පු මෝටර් රථ තෙවන පාර්ශවීය රක්ෂණ ඔප්පුවලට මාරු කිරීම දැකගත හැකි විය. එබැවින්, අලුත් කිරීම් සහ නව ව්‍යාපාරික රක්ෂණ ඔප්පු සංඛ්‍යාව ඉහළ යාමත් සමග මෝටර් රථ තෙවන පාර්ශවීය රක්ෂණ ඔප්පුවල කැපී පෙනෙන වැඩි දියුණුවක් දක්නට ලැබිණි.

මෑත කාලීන වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ අවිනිශ්චිතතාවයන් මගින් සෞඛ්‍ය රක්ෂණයක් තිබීමේ වැදගත්කම පිළිබඳ මිනිසුන්ට මතක් කර දී ඇත. එබැවින්, සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරයට රු.මි. 19,960 ක (2020: රු.මි. 18,878) දළ ලිඛිත වාරිකයක් අත්කර ගැනීමට හැකි වූ අතර එමගින් එහි වෙළඳපොල කොටස 18.35% ක් (2020: 17.93%) දක්වා සැලකිය යුතු ලෙස වැඩි කර ගැනීමට හැකි විය. සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ වාරිකයට දෙවැනි විශාලතම දායකයා ලෙස සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරය ක්‍රියාත්මක වුවද පෙර වසර දෙකට සාපේක්ෂව වර්ධන වේගයේ සැලකිය යුතු අඩු වීමක් පෙන්නුම් කෙරිණි. 2021 වසරේ

සංඛ්‍යානමය සමාලෝචනය

සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වර්ධන වේගය පෙර වසරේ වර්ධන වේගය වූ 13.76% ට සාපේක්ෂව 5.73% ක් විය.

ගිනි රක්ෂණ ව්‍යාපාරය 16.16% ක (2020: 7.48%) වර්ධන වේගයක් පෙන්නුම් කළ අතර එය පසුගිය වසර පහ තුළ ඉහළ ම වාර්කය වාර්තා කළ අතර එය රු.මි. 10,325 ක් (2020: රු.මි. 8,888) විය. ගිනි රක්ෂණ ව්‍යාපාරය අනෙකුත් සියළුම පන්ති අභිබවා ගිය අතර පසුගිය වසරට සාපේක්ෂව වාර්කයේ ඉහළම වැඩි වීම සනිටුහන් කිරීමට සමත් වී ඇති අතර එහි වටිනාකම රු.මි. 1,436 ක් වූ අතර 9.49% ක (2020: 8.44%) වෙළඳපොල කොටසක් පෙන්නුම් කර ඇත.

වසරේ අග භාගයේ සංචාරක කර්මාන්තයේ ඇති වූ තරමක පිබිදීම සහ සංචරණ සීමාවන් ඉවත් කිරීම මගින් රක්ෂණ ව්‍යාපාරයේ විවිධ පන්තිවල වැඩිවීමට සැලකිය යුතු බලපෑමක් එල්ල විය. මෙම රක්ෂණ කාණ්ඩය රු.මි. 8,913 ක (2020: රු.මි. 7,858) වාර්කය සහ 8.20% ක වෙළඳපොල කොටස (2020: 7.46%) සමගින් පසුගිය වසරේ 24.75% ක සෘණ වර්ධනයට සාපේක්ෂව 13.43% ක ආකර්ෂණීය වර්ධනයක් පෙන්නුම් කරමින් එහි කාර්ය සාධනය වැඩිදියුණු කරගෙන ඇත.

2021 දී සමුද්‍ර රකෂණ ව්‍යාපාරය රු.මි. 3,074 ක දළ ලිඛිත වාර්කයක් (2020: රු.මි. 2,276) ජනනය කළ අතර පෙර වසර දෙකේ වාර්තා වූ පහත වැටීමට සාපේක්ෂව 35.04% ක වර්ධනයක් පෙන්නුම් කළේය. තවද, සමුද්‍ර රක්ෂණ ව්‍යාපාරය 2020 වසරේ වාර්තා වූ 2.16% ට සාපේක්ෂව 2021 වර්ෂයේ දී 2.83% ක වෙළඳපොල කොටසක් වාර්තා කිරීමට සමත් විය.

පසුගිය වසර පහ සඳහා ඉහළම වාර්ක සහ වෙළඳපොල කොටස අත්පත් කර ගනිමින් සහ පසුගිය වසරේ 3.47% සෘණ වර්ධන අනුපාතයට සාපේක්ෂව 10.93% ක වර්ධන වේගයක් වාර්තා කරමින් ජාතික රක්ෂණ අරමුදලෙහි වර්ජන, කැරළි, කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් රක්ෂණාවරණයේ වාර්ක මුදල රු.මි. 6,754 (රු.මි. 6,088) සහ වෙළඳපොල කොටස 6.21% (2020: 5.78%) ලෙස හිමි කර ගත්තේය. මෝටර් රථ රක්ෂණ ව්‍යාපාරය හැර අනෙකුත් සියළුම පන්ති 2021 වර්ෂය තුළ වාර්කයේ ධනාත්මක වෙනසක් පෙන්නුම් කිරීමට සමත් විය.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන උප පන්තිවලින් උත්පාදනය කරන ලද දළ ලිඛිත වාර්කය සහ ජාතික රක්ෂණ භාර අරමුදල විසින් සපයන වර්ජන, කැරළි, කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් ආවරණයට අදාළ වාර්ක මෙන්ම ඒවායේ වර්ධන අනුපාත සහ 2017 සිට 2021 දක්වා කාල සීමාව සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ කොටස 18 වගුවෙන් සහ 16 ප්‍රස්තාරයෙන් දැක්වේ.

18 වගුව

පන්තිය අනුව දළ ලිඛිත වාර්ක විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

පන්තිය	දළ ලිඛිත වාර්කය (රු.000)				
	2017	2018	2019	2020 (අ)	2021 (ආ)
ගිනි	8,597,489	8,821,655	8,269,991	8,888,258	10,324,853
මුහුදු	2,191,654	2,403,366	2,385,566	2,276,474	3,074,111
මෝටර්	56,047,640	62,363,476	63,685,555	61,276,210	59,733,959
සෞඛ්‍ය	14,649,440	14,161,542	16,593,661	18,877,585	19,960,147
විවිධ	7,866,260	8,254,421	10,442,624	7,857,768	8,913,184
අනු එකතුව	**89,352,484**	**96,004,460**	**101,377,397**	**99,176,296**	**102,006,254**
වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම්	4,036,283	4,581,641	6,307,350	6,088,496	6,754,134
එකතුව	**93,388,766**	**100,586,101**	**107,684,747**	**105,264,792**	**108,760,388**


සංඛ්‍යානමය සමාලෝචනය

පන්තිය	වර්ධනය (%)				
	2017	2018	2019	2020 (අ)	2021 (ආ)
ගිනි	14.94	2.61	(6.25)	7.48	16.16
මුහුදු	5.05	9.66	(0.74)	(4.57)	35.04
මෝටර්	13.61	11.27	2.12	(3.78)	(2.52)
සෞඛ්‍ය	45.96	(3.33)	17.17	13.76	5.73
විවිධ	10.47	4.93	26.51	(24.75)	13.43
අනු එකතුව	**17.48**	**7.44**	**5.60**	**(2.17)**	**2.85**
වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම්	14.23	13.51	37.67	(3.47)	10.93
එකතුව	**17.34**	**7.71**	**7.06**	**(2.25)**	**3.32**

පන්තිය	ප්‍රතිශත කොටස (%)				
	2017	2018	2019	2020 (අ)	2021 (ආ)
ගිනි	9.21	8.77	7.68	8.44	9.49
මුහුදු	2.35	2.39	2.22	2.16	2.83
මෝටර්	60.02	62.00	59.14	58.21	54.92
සෞඛ්‍ය	15.69	14.08	15.41	17.93	18.35
විවිධ	8.42	8.21	9.70	7.46	8.20
අනු එකතුව	**95.68**	**95.45**	**94.14**	**94.22**	**93.79**
වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම්	4.32	4.55	5.86	5.78	6.21
එකතුව	**100.00**	**100.00**	**100.00**	**100.00**	**100.00**

16 ප්‍රස්තාරය

2017 සිට 2021 දක්වා පන්තිය අනුව දළ ලිඛිත වාරික විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය



	2017	2018	2019	2020 (අ)	2021 (ආ)
වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් සහ ත්‍රස්ත ක්‍රියාකාරකම්	4.32	4.55	5.86	5.78	6.21
විවිධ	8.42	8.21	9.70	7.46	8.20
සෞඛ්‍ය	15.69	14.08	15.41	17.93	18.35
මෝටර්	60.02	62.00	59.14	58.21	54.92
මුහුදු	2.35	2.39	2.22	2.16	2.83
ගිනි	9.21	8.77	7.68	8.44	9.49
සමස්ත කර්මාන්ත වර්ධනය	17.34	7.71	7.06	(2.25)	3.32

සංඛ්‍යානමය සමාලෝචනය

විවිධ රක්ෂණ ව්‍යාපාරයේ කටයුතුවල දළ ලිඛිත වාරික ආදායම කාණ්ඩ අනුව විශ්ලේෂණය

2021 සහ 2020 වසර සඳහා එහි උප පන්ති සමග විවිධ රක්ෂණ ව්‍යාපාරය පිළිබඳ විස්තර 19 වගුවේ දක්වා ඇත.

කොවිඩ්-19 වසංගතය සමස්ත කර්මාන්තයටම බලපෑ අතර ආර්ථිකයට බාධා එල්ල වීම සහ අස්ථාවරත්වය හේතුවෙන් විවිධ ව්‍යාපාරවලට විවිධ බලපෑම් එල්ල විය. 2021 වර්ෂයේදී, මුළු දළ ලිඛිත වාරික වටිනාකම රු.මි. 8,913 ක් (2020: රු.මි. 7,858) වාර්තා කරමින් වර්ජන, කැරලි, කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් ආවරණය හැර විවිධ රක්ෂණ ව්‍යාපාර පන්තිය පෙර වසරට සාපේක්ෂව වර්ධනය වී ඇත. පෙර වසරේ වාර්තා වූ පහත වැටීම මැඩපවත්වමින් ගුවන් යානා බඳ රක්ෂණය සහ පුද්ගලික අනතුරු වැනි උපකාණ්ඩ 2021 වසරේ හොඳින් ක්‍රියාත්මක වූ අතර දළ ලිඛිත වාරික ප්‍රමාණය පිළිවෙලින් රු.මි. 687 ක් (රු.මි. 467) සහ රු.මි. 1,445 ක් (2020: රු.මි. 1,298) වර්ධන අනුපාතය 47.05% ක් සහ 11.27% ක් විය.

රට තුළ සහ ඉන් පිටත සංචරණ සහ සංචාරක ක්ෂේත්‍ර සඳහා පසුගිය වසරේ පනවන ලද සීමා කිරීම් හේතුවෙන් විවිධ රක්ෂණ ව්‍යාපාර අතුරින් වඩාත් බලපෑමට ලක් වූ උප කාණ්ඩය වන සංචාරක රක්ෂණය, 2021 වර්ෂය තුළ දළ ලිඛිත වාරික ප්‍රමාණය රු.මි. 219 ක් (2020: රු.මි. 200) ලෙස වාර්තා කරමින් 9.38% ක සුළු ප්‍රගතියක් පෙන්නුම් කළේය.

විරැකියාව, කුඩා ව්‍යාපාර වසා දැමීම සහ බංකොලොත් වීම වැනි වසංගතයේ ප්‍රතිවිපාක නොවැළැක්විය හැකි වූ බැවින් විවිධ ව්‍යාපාර පන්තියේ කම්කරුවන්ගේ වන්දි කාණ්ඩයේ හදිසි පහත වැටීම නොවැළැක්විය හැකි විය.

පුද්ගලික අනතුරු, ගුවන් යානා බඳ, සංචාරක රක්ෂණය, වෘත්තීය වන්දි සහ හිමිකම් සැලකිය යුතු ප්‍රගතියක් අත් කරගෙන ඇත. ඒ අනුව, කාණ්ඩ කිහිපයක් හැර විවිධ රක්ෂණ ව්‍යාපාරය පෙර වසරට වඩා හොඳින් ක්‍රියාත්මක වී ඇති බව නිගමනය කළ හැකිය.

19 වගුව
2020 සහ 2021 වර්ෂ සඳහා විවිධ රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම කාණ්ඩ අනුව විශ්ලේෂණය

කාණ්ඩය	දළ ලිඛිත වාරිකය රු'000	
	2020 (අ)	2021 (ආ)
හිමිකම් අයිතිය	320,719	451,618
පුද්ගලික අනතුරු	1,298,399	1,444,673
කොන්ත්‍රාත්කරුවන්ගේ සියලු අවදානම්	684,871	774,805
වෘත්තීමය හානි රක්ෂණය	457,580	590,741
චාරිකා රක්ෂණය	200,359	219,156
විශ්වාසයතා ඇපය	85,470	86,145
සොර බිය	360,929	350,996
සේප්පුගත මුදල් අතුළු මාර්ගස්ථ මුදල්	429,854	402,520
මාර්ගස්ථ භාණ්ඩ	89,536	96,516
නිෂ්පාදන වගකීම	166,807	189,736
මහජන වගකීම	444,852	473,320
බැංකුකරුවන්ගේ හානි පූර්ණ රක්ෂණය	421,349	489,309
ගුවන් යානා බඳ	466,924	686,625
කම්කරු වන්දි රක්ෂණය	555,011	546,340
වෙනත්	2,555,699	3,218,280
අනු එකතුව	**8,538,359**	**10,020,780**
අඩු කළා: ජාතික රක්ෂණ භාර අරමුදල සඳහා වන වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් වාරික ආදායම	(610,936)	(1,015,369)
සහභාග - රක්ෂකයින්ගේ වාරික ආදායම	(69,649)	(92,227)
එකතුව	**7,857,774**	**8,913,184**

සංඛ්‍යානමය සමාලෝචනය

දළ ලිඛිත වාරික ආදායම ප්‍රතිරක්ෂණ වාරික සහ රක්ෂකයන් විසින් රඳවා ගැනීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

2017 සිට 2021 දක්වා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන උප පන්ති සඳහා ප්‍රතිරක්ෂකයන් වෙත පවරණ ලද වාරිකය සහ දළ ලිඛිත වාරිකයෙහි රැඳවුම් මට්ටම පිළිබඳ විස්තර 20 වගුව සහ 17 ප්‍රස්තාරය මගින් දැක්වේ.

දළ ලිඛිත වාරික ජනනය කිරීමේ රටාව අනුගමනය කරමින් 2021 වසර සඳහා ප්‍රතිරක්ෂකයන් වෙත පවරණ ලද වාරිකය (වර්ජන, කැරළි, කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් හැර) රු.මි. 20,478 ක් (2020: රු.මි. 18,511) විය.

අනෙකුත් පන්ති හා සසඳන විට 2021 වසරේ ඉහළම ප්‍රතිරක්ෂණ වාරිකය ගිනි හා විවිධ කාණ්ඩය සතු විය. සමුද්‍ර හා සෞඛ්‍ය රක්ෂණ පන්තිවල ප්‍රතිරක්ෂණ වාරිකය ද පෙර වසරට සාපේක්ෂව ඉහළ ගියේය. මෝටර් රථ පන්තියේ අඩුවීමක් පෙන්නුම් කළ අතර එය දළ ලිඛිත වාරිකයෙහි පන්ති අනුව වන ප්‍රක්ෂේපණවලින් ද දැකිය හැකිය.

2021 වර්ෂය සඳහා වර්ජන, කැරළි, කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් කාණ්ඩය යටතේ වාර්තා කරන ලද ප්‍රතිරක්ෂණ වාරිකය රු.මි. 78 (2020: රු.මි. 32) විය. කෙසේ වෙතත්, මෙය 2020 අගෝස්තු 01 සිට 2022 ජනවාරි 31 දක්වා ආරම්භ වූ වර්ජන, කැරළි, කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් ආවරණය සඳහා ලබා දුන් ප්‍රතිරක්ෂණ වාරිකයේ සැබෑ නිරාවරණය නියෝජනය කරයි.

සාමාන්‍ය රක්ෂණ අංශය පෙර වසරේ රැඳවුම් අනුපාතය වූ 81.33% ට අනුරූපව 79.92% ක (වර්ජන, කැරළි, කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් ආවරණය හැර) සමස්ත රැඳවුම් අනුපාතයක් පෙන්නුම් කළ අතර 1.41% ක අඩු වීමක් සහ රු.මි. 81,528 ක (රු.මි. 80,665) රැඳවුම් වාරික ප්‍රමාණයක් නිරීක්ෂණය කළ හැකිවිය. සමස්ත රැඳවුම් අනුපාතය 81.10% (2020: 82.38%) ලෙස පැවති අතර එය පසුගිය වසර පහ තුළ අවම රැඳවුම් අනුපාතය පිළිබිඹු කරයි.

මෝටර් රථ රක්ෂණ ව්‍යාපාරය 2021 වර්ෂය තුළ සෘණාත්මක වර්ධනයක් ජනනය කළ එකම සාමාන්‍ය රක්ෂණ උප පන්තිය වුව ද 93.93% ක (2020: 92.89%) රැඳවුම් අනුපාතයක් වාර්තා කරමින් පෙර වසරට සාපේක්ෂව තරමක වර්ධනයක් පෙන්නුම් කර ඇත. මෙම ප්‍රවණතාවයෙන් පසුව සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරය 91.67% ක (2020: 91.28%) දෙවන ඉහළම රැඳවුම් අනුපාතය නියෝජනය කළේය. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල අනෙකුත් පන්ති තුන වන ගිනි, නාවික සහ විවිධ යන පන්ති 2021 වර්ෂයේදී පිළිවෙලින් 22.54% , 38.66% සහ 40.47% රැඳවුම් අනුපාතයන් ප්‍රදර්ශනය කර ඇත.

20 වගුව
දළ ලිඛිත වාරික ප්‍රතිරක්ෂණ වාරික සහ රක්ෂකයන් විසින් රඳවා ගැනීම - සාමාන්‍ය රක්ෂණය ව්‍යාපාරය

පන්තිය	දළ ලිඛිත වාරිකය (රු'000)				
	2017	2018	2019	2020 (අ)	2021 (ආ)
ගිනි	8,597,489	8,821,655	8,269,991	8,888,258	10,324,853
මුහුදු	2,191,654	2,403,366	2,385,566	2,276,474	3,074,111
මෝටර්	56,047,640	62,363,476	63,685,555	61,276,210	59,733,959
සෞඛ්‍ය	14,649,440	14,161,542	16,593,661	18,877,585	19,960,147
විවිධ	7,866,260	8,254,421	10,442,624	7,857,768	8,913,184
අනු එකතුව	**89,352,484**	**96,004,460**	**101,377,397**	**99,176,296**	**102,006,254**
වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම්	4,036,283	4,581,641	6,307,350	6,088,496	6,754,134
එකතුව	**93,388,766**	**100,586,101**	**107,684,747**	**105,264,792**	**108,760,388**

සංඛ්‍යානමය සමාලෝචනය

පන්තිය	ප්‍රතිරක්ෂණ වාරිකය (රු'000)				
	2017	2018	2019	2020 (අ)	2021 (ආ)
ගිනි	6,947,675	6,103,609	6,061,855	6,609,886	7,997,992
මුහුදු	1,177,400	1,200,069	1,224,829	1,352,679	1,885,798
මෝටර්	2,152,508	4,296,451	4,229,915	4,356,260	3,625,979
සෞඛ්‍ය	2,682,617	1,771,091	1,480,482	1,645,816	1,662,947
විවිධ	3,840,459	4,462,894	4,813,310	4,546,844	5,305,779
අනු එකතුව	**16,800,660**	**17,834,113**	**17,810,391**	**18,511,486**	**20,478,495**
වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම්	108,750	81,656	55,564	32,283	77,523
එකතුව	**16,909,410**	**17,915,770**	**17,865,954**	**18,543,769**	**20,556,018**


පන්තිය	රඳවාගැනීම් (රු'000)				
	2017	2018	2019	2020 (අ)	2021 (ආ)
ගිනි	1,649,814	2,718,046	2,208,136	2,278,372	2,326,860
මුහුදු	1,014,254	1,203,297	1,160,737	923,795	1,188,314
මෝටර්	53,895,132	58,067,024	59,455,641	56,919,950	56,107,980
සෞඛ්‍ය	11,966,823	12,390,451	15,113,179	17,231,770	18,297,200
විවිධ	4,025,800	3,791,528	5,629,314	3,310,924	3,607,405
අනු එකතුව	**72,551,823**	**78,170,347**	**83,567,006**	**80,664,810**	**81,527,759**
වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම්	3,927,533	4,499,984	6,251,787	6,056,213	6,676,611
එකතුව	**76,479,356**	**82,670,331**	**89,818,793**	**86,721,023**	**88,204,370**

පන්තිය	රඳවා ගැනීම් දළ ලිඛිත වාරිකයේ ප්‍රතිශතයක් ලෙස (%)				
	2017	2018	2019	2020 (අ)	2021 (ආ)
ගිනි	19.19	30.81	26.70	25.63	22.54
මුහුදු	46.28	50.07	48.66	40.58	38.66
මෝටර්	96.16	93.11	93.36	92.89	93.93
සෞඛ්‍ය	81.69	87.49	91.08	91.28	91.67
විවිධ	51.18	45.93	53.91	42.14	40.47
අනු එකතුව	**81.20**	**81.42**	**82.43**	**81.33**	**79.92**
වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම්	97.31	98.22	99.12	99.47	98.85
එකතුව	**81.89**	**82.19**	**83.41**	**82.38**	**81.10**

සංඛ්‍යානමය සමාලෝචනය

17 ප්‍රස්තාරය

ප්‍රතිරක්ෂණ වාරික සහ රක්ෂකයන් විසින් රඳවා ගැනීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය



සමාගම් අනුව මුළු වත්කම් පිළිබඳ විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

සාමාන්‍ය රක්ෂණ අංශයේ මුළු වත්කම් රු.මි. 22,578 ක වර්ධනයක් පෙන්නුම් කළේ 9.92% ක සතුටුදායක වර්ධන වේගයක් සමගින් වන අතර එය අභියෝග නොතකා අත්කර ගත් ප්‍රගතිය පෙන්නුම් කරයි. සාමාන්‍ය රක්ෂණ අංශයේ මුළු වත්කම් 2021 දෙසැම්බර් 31 දිනට රු.මි. 250,217 (2020: රු.මි. 227,640) විය.

සාමාන්‍ය රක්ෂණ අංශයේ සමස්ත වත්කම් පිළිබඳ සලකා බලන විට පොළී අනුපාත සහ කොටස් වෙළෙඳපොළ උච්චාවචනයන්, ණය ගැටළු සහ ඒවාට අදාළ වෙළෙඳපොළ අවදානම් වැනි ආර්ථික පසුබෑම් මධ්‍යයේ වුවද ඉහත කී වර්ධනය දැක බලා ගැනීමට හැකි වීම සහනයක් වේ. එසේ වුවද, බොහෝ රක්ෂණකරුවන් එවැනි බාධක ජයගෙන තමන්ගේ තනි වත්කම්වල වර්ධනයක් පෙන්නුම් කර ඇත.

2021 සහ 2020 දෙසැම්බර් 31 දින වන විට සාමාන්‍ය රක්ෂණ සමාගම් අතර වත්කම් බෙදා හැරීම 21 වගුව මගින් නිරූපණය කෙරේ.

21 වගුව

සමාගම් අනුව මුළු වත්කම් පිළිබඳ විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

රක්ෂකයා	2020 (අ)		2021 (ආ)	
	(රු'000)	%	(රු'000)	%
අලියාන්ස් ජෙනරල්	28,024,882	12.31	27,968,687	11.18
අමානා ජෙනරල්	2,945,567	1.29	3,402,269	1.36
සෙලින්කෝ ජෙනරල්	32,061,287	14.08	36,648,668	14.65
කොන්ටිනෙන්ටල්	7,866,408	3.46	8,455,319	3.38
කෝපරේටිව් ජෙනරල්	7,935,838	3.49	9,806,005	3.92
ෆෙයාෆස්ට්	18,046,123	7.93	19,312,806	7.72
එච්එන්බී ජෙනරල්	6,855,077	3.01	7,568,781	3.02
එල්ඕවල්සී ජෙනරල්	9,891,278	4.35	11,999,920	4.80
එම්බීවිස්වල්	1,426,185	0.63	1,399,160	0.56
එන්ඇයිටිවෆ්	21,487,172	9.44	24,444,867	9.77
ඔරියන්ට්	2,612,380	1.15	3,194,603	1.28
පීපල්ස්	10,783,719	4.74	11,251,468	4.50
සණස ජෙනරල්	1,303,081	0.57	1,372,239	0.55
එස්එල්අයිසී	76,400,546	33.56	83,392,699	33.33
එකතුව	**227,639,542**	**100**	**250,217,491**	**100**

සංඛ්‍යානමය සමාලෝචනය

2020 දී ප්‍රගතිය අඛණ්ඩව ඉදිරියට ගෙන යමින් එස්විල්අයිසී ජෙනරල්, සෙලින්කෝ ජෙනරල් සහ අලියාන්ස් ජෙනරල් යන සමාගම් මුළු වත්කම්වලින් 33.33% , 14.65% සහ 11.18% ප්‍රතිශතයක් හිමිකර ගෙන පිළිවෙලින් රු.මි. 83,393 රු.මි. 36,649 සහ රු.මි. 27,969 වටිනාකමින් යුත් වත්කම් වාර්තා කර ඇත.

සාමාන්‍ය රක්ෂණ අංශයේ ප්‍රමුඛ වත්කම් හිමියා වන එස්විල්අයිසී ජෙනරල් සමාගම මුළු වත්කම් රු.මි. 83,393 (2020: රු.මි. 76,401) සමඟින් දෙවන ස්ථානය හිමි කර ගත් සෙලින්කෝ ජෙනරල් සමාගමට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් (ආසන්න වශයෙන් රු.මි. 46,774) ඉදිරියෙන් සිටියේය. කෙසේ වුවද, එස්විල්අයිසී ජෙනරල් සමාගම විසින් 9.15% ක සුළු වර්ධන වේගයක් පෙන්නුම් කළ අතර වත්කම් වර්ධනය රු.මි. 6,992 ක් ලෙස වාර්තා කර ඇත. එය ප්‍රධාන වශයෙන් මූල්‍ය ආයෝජනවල වටිනාකම අනුව වත්කම්වල ඉහළම වර්ධනයයි.


මීළඟ වත්කම් හිමියා වන සෙලින්කෝ ජෙනරල් රු.මි. 36,649 ක් (2020: රු.මි. 32,061) වටිනා වත්කම් සහ වටිනාකමින් රු.මි. 4,587 ක වර්ධනයක් වාර්තා කළේය. මූල්‍ය ආයෝජන, ප්‍රතිරක්ෂණ වන්දි සහ රක්ෂණ ඔප්පු හිමියන්ගෙන් ලැබිය යුතු වාරික එම වර්ධනය සඳහා ප්‍රධාන දායකත්වය සපයයි.

ජාතික රක්ෂණ භාර අරමුදල 2021 වසරේදී රු.මි. 24,445 ක වත්කම් ඉදිරිපත් කරමින් 13.76% කින් පමණක් වර්ධනයක් පෙන්නුම් කර ඇත. ජාතික රක්ෂණ භාර අරමුදලෙහි මුළු වත්කම්වලින් 96.21% ක් (රු.මි. 23,519) නියෝජනය කර තිබූ ජාතික රක්ෂණ භාර අරමුදලෙහි වඩාත්ම හොඳින් ක්‍රියාත්මක වූ කොටස ලෙස වර්ජන, කැරළි, කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් කාණ්ඩයේ වත්කම් හඳුනාගත හැකිය.

අලියාන්ස් ජෙනරල් සමස්ත වත්කම්වල සුළු පහත වැටීමක් සමග සෘණාත්මක වර්ධනයක් පෙන්නුම් කළ නමුත් සාමාන්‍ය රක්ෂණ අංශයේ මුළු වත්කම්වලින් තෙවැනි ස්ථානය හිමි කර ගැනීමට සමත් විය.

රක්ෂණ සමාගම් හයක් වටිනාකම අනුව වත්කම්වල රු.බි. 1 ක වර්ධනයක් ඉක්මවා යමින් වැඩි දියුණු කළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇති අතර රක්ෂණ සමාගම් දෙකක් පමණක් සෘණාත්මක වර්ධනයක් පෙන්නුම් කර ඇත. 18 ප්‍රස්තාර මඟින් 2021 සහ 2020 දෙසැම්බර් 31 වන විට සමාගම් අනුව මුළු වත්කම් විශ්ලේෂණය පෙන්නුම් කරයි.

18 ප්‍රස්තාරය
සමාගම් අනුව මුළු වත්කම් පිළිබඳ විශ්ලේෂණය – සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය



සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි වත්කම් සංකේන්ද්‍රණය

සාමාන්‍ය රක්ෂණ අංශයේ විවිධාංගීකරණය වූ වත්කම් අතර මූල්‍ය ආයෝජන වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. දළ වශයෙන්, මුළු වත්කම්වලින් 65.43% ක් රජයේ ණය සුරුකුම්පත් ප්‍රධාන ස්ථානයක් ගන්නා මූල්‍ය ආයෝජන නියෝජනය කරන අතර ස්කන්ධ, තැන්පතු, සාංගමික ණය සහ ඒකක භාර මීළඟට ප්‍රධාන ස්ථානයක් ගෙන ඇත.

2021 වර්ෂයේදී රජයේ ණය සුරුකුම්පත්වල ආයෝජන මුළු වත්කම්වලින් 30.59% ක් (2020: 28.99%) හිමිකර ගනිමින් රු.මි. 76,226 ක් (2020: රු.මි. 65,700) දක්වා වැඩි විය. රක්ෂණකරුවන් පස් දෙනෙකු 2021 වසර තුළ රජයේ ණය සුරුකුම්පත්වල තමන්ගේ ආයෝජන දළ වශයෙන් රු.බි. 1 බැගින් ශක්තිමත් කරගෙන ඇත. එබැවින් 16.02% ක වර්ධනයක් සහ මුළු රජයේ ණය සුරුකුම්පත්වල වත්කම් රු.මි. 10,526 ක් පෙන්නුම් කර ඇත. පරමාදර්ශී අවදානම් රහිත ආයෝජනයක් වීම සහ යහපත් ද්‍රවශීලතාවයක් සමග දිගුකාලීන ප්‍රතිලාභ ලබා දීම හේතුවෙන් රජයේ ණය සුරුකුම්පත් ලැයිස්තුවේ ප්‍රමුඛස්ථානයට පත්වීමට බලපා ඇත.

7.39% ක වර්ධනයක් පෙන්නුම් කරමින් ස්කන්ධ ආයෝජන රු.මි. 34,972 ක (2020: රු.මි. 32,567) වත්කම් සහ මුළු වත්කම්වලින් 14.03% ක කොටසක් නියෝජනය කරමින් දෙවන ස්ථානය අත්පත් කර ගෙන ඇත. 2021 වසර තුළදී අඩු පොලී අනුපාත අඛණ්ඩව පැවතීම හේතුවෙන් රක්ෂණකරුවන් ස්කන්ධ ආයෝජන වෙත ආකර්ෂණය වී ඇති අතර එමඟින් කොටස් වෙළෙඳපොළ වෙත නිරාවරණය පුළුල් විය.

රක්ෂණ ඔප්පු හිමියන්ගෙන් සහ අතරමැදියන්ගෙන් ලැබිය යුතු වාරිකය රු.මි. 28,674 (2020: රු.මි. 27,576)

සංඛ්‍යානමය සමාලෝචනය

සහ මුළු වත්කම්වලින් 11.51% (2020: 12.17%) පෙන්නුම් කර ඇත. කොවිඩ්-19 වසංගතයෙන් පසු මුහුණ දුන් දුෂ්කරතා සලකා බැලීමෙන් පසු වාරික චකිතු කිරීම සම්බන්ධයෙන් රක්ෂණ ඔප්පු හිමියන් සඳහා ලබා දී ඇති සහන අඛණ්ඩව ක්‍රියාත්මක වීම කැපී පෙනෙන වැඩිවීමක් සඳහා මූලික හේතුවක් ලෙස විස්තර කළ හැකිය.

2021 දී තැන්පතු සම්බන්ධයෙන් අඩු ජනප්‍රියත්වයක් පෙන්නුම් කළ අතර ප්‍රධාන සහ කැපී පෙනෙන ප්‍රතිලාභ ලබා දෙන වෙනත් අවස්ථා සොයා ගැනීමට රක්ෂණකරුවන් වැඩි උනන්දුවක් දක්වන බව පෙනී ගියේය. තැන්පතුවල ආයෝජන පෙර වසරේ වාර්තා වූ වර්ධනයට සාපේක්ෂව 8.55% ක සෘණ වර්ධනයක් වාර්තා කළේය. තැන්පතු මුළු වත්කම්වලින් 9.42% ක (2020: 11.32%) ප්‍රතිශතයක් වාර්තා කර ඇති අතර 2021 වසර අවසානයේ දී රු.මි. 23,471 ක් (2020: රු.මි. 25,664) විය.

සාංගමික ණය සහ ඒකකභාර ද පිළිවෙලින් රු.මි. 20,092 (2020: රු.මි. 17,812) සහ රු.මි. 7,357 (රු.මි. 6,549) වටිනා වත්කම් නියෝජනය කරමින් 12.80% සහ 12.33% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. ඒකකභාර පෙර වසරේ ඉහළ ම වර්ධන වේගය පෙන්නුම් කර ඇති ආයෝජන වර්ගය වන අතර 2021 වර්ෂයේදී මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කර ඇත.

දේපල, පිරියත හා උපකරණ, වෙනත් වත්කම්, ප්‍රතිරක්ෂණ වන්දි සහ ඉඩම් හා ගොඩනැගිලි වැනි ඉතිරි සියළුම ආයෝජන වර්ග ප්‍රගතියක් පෙන්නුම් කළ අතර මුදල් සහ මුදල් සමාන දෑ පෙර වසරට සාපේක්ෂව 26.47% ක ඉහළම වර්ධන වේගයක් පෙන්නුම් කළේය. ඒ අනුව, 2021 දී වර්ධනය වීමට අපොහොසත් වූ එකම ආයෝජන වර්ගය වන්නේ තැන්පතුවල ආයෝජන වන අතර එයට මූලික හේතුව තනි රක්ෂණකරුවෙකු විසින් තැන්පතුවල ආයෝජන අඩු කිරීමයි.

22 වගුව සහ 19 ප්‍රස්තාරය මගින් 2020 සහ 2021 දෙසැම්බර් 31 වන විට වත්කම් සංකේන්ද්‍රණය පිළිබඳ තොරතුරු සපයයි.

22 වගුව
2020 සහ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් සංකේන්ද්‍රණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

වත්කම් වර්ගය	2020 (අ)		2021 (ආ)	
	රු. '000	%	රු '000	%
රාජ්‍ය ණය සුරැකුම්පත්	65,700,091	28.99	76,226,076	30.59
ස්කන්ධ	32,566,853	14.37	34,972,269	14.03
සාංගමික ණය	17,812,377	7.86	20,092,438	8.06
ඉඩම් හා ගොඩනැගිලි	1,964,966	0.87	2,203,600	0.88
තැන්පතු	25,664,111	11.32	23,470,757	9.42
ඒකක භාර	6,549,296	2.89	7,356,946	2.95
ලැබිය යුතු ප්‍රතිරක්ෂණ	12,974,157	5.72	14,966,120	6.01
ඔප්පු හිමියන් සහ අතරමැදියන් වෙතින් ලැබිය යුතු වාරිකය	27,576,167	12.17	28,673,779	11.51
දේපළ පිරියත හා උපකරණ	18,628,155	8.22	20,783,833	8.34
වෙනත් වත්කම්	13,017,177	5.74	15,177,549	6.09
මුදල් හා මුදල් සමාන දෑ	4,186,189	1.85	5,294,128	2.12
එකතුව	**226,639,539**	**100**	**249,217,495**	**100**


සටහන: වත්කම පාවිච්චි කිරීමේ හිමිකම දේපළ, පිරියත හා උපකරණ වෙත චකිතු කරන ලදී.

ජාතික රක්ෂණ භාර අරමුදලෙහි අන්තර් ඛණ්ඩ ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන් නිසා වෙනස ඇති වේ.

සංඛ්‍යානමය සමාලෝචනය

19 ප්‍රස්තාරය

2020 සහ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් සංකේන්ද්‍රණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය



ආයෝජන ආදායම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

2020 වසරේ පළමු භාගයේ සිට 2021 මැද භාගය දක්වා වෙළෙඳපොළ පොළී අනුපාත සැලකිය යුතු ලෙස පහත වැටුණි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව සිය මූල්‍ය ප්‍රතිපත්තිය දැඩි කිරීම නිසා 2021 වසර අවසන් වන විට වෙළෙඳපොළ පොළී අනුපාත ක්‍රමයෙන් ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විශාල ලෙස පහළ මට්ටම් කරා පහත වැටුණු වෙළෙඳපොළ පොළී අනුපාත ක්‍රමයෙන් ඉහළට යාමට පටන් ගැනිණි. සාර්ව ආර්ථික බලපෑම් මධ්‍යයේ, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත ආයෝජන ආදායම 2020 දී රු.මි. 10,282 සිට 2021 දී රු.මි. 11,282 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර 2020 දී වාර්තා වූ 18.29% ක සෘණ වර්ධනය අභිබවා 9.72% ක වර්ධනයක් පෙන්නුම් කළේය. 2020 දී වාර්තා වූ රු.මි.316 ට සාපේක්ෂව 2021 දී ප්‍රධාන වශයෙන් තනි රක්ෂණකරුවෙකු රු.මි. 1,147 ක ප්‍රාග්ධන ලාභයක් ඉපැයීම හේතු කොට ගෙන, ආයෝජන ආදායමේ වර්ධනය බොහෝ දුරට ස්කන්ධ කාණ්ඩයේ බලපෑමෙන් සිදු විය.

රජයේ සුරැකුම්පත්වල සාමාන්‍ය ආයෝජනය 2021 දී 11.20% කින් රු.මි. 159,061 (2020: රු.මි. 143,034) දක්වා ඉහළ ගියේය. ඒ අනුව, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන ආයෝජන කාණ්ඩය වන රාජ්‍ය ණය සුරැකුම්පත්වල ආයෝජනය 2021 අවසන් වන විට 17.79% ක වර්ධනයක් වාර්තා කරමින් රු.මි. 70,963 ක් (2020: රු.මි. 60,248) විය.

දෙවන විශාලතම ආයෝජන කාණ්ඩය වූයේ 2020 වසරට සාපේක්ෂව 4.27% ක මන්දගාමී වර්ධනයක් පිළිබිඹු කරමින් රු.මි. 33,770 ක (2020: රු.මි. 32,387) සාමාන්‍ය ආයෝජනයක් වාර්තා කළ ස්කන්ධ ආයෝජනයයි.

බැංකු සහ මූල්‍ය සමාගම්වලින් ජනනය කරන ලද තැන්පතු ඊළඟ විශාලතම ආයෝජන කාණ්ඩය වූ අතර රු.මි. 24,567 ක සාමාන්‍ය ආයෝජනයක් වාර්තා කළේය. එය 2020 දී රු.මි. 24,807 ට සාපේක්ෂව සුළු අඩු වීමකි. එසේම, 2021 වර්ෂය පුරාවට පැවති අඩු බැංකු තැන්පතු පොළී අනුපාතවල ප්‍රතිඵලයක් ලෙස රජයේ සුරැකුම්පත්වල ආදායම කැපී පෙනෙන අඩුවීමක් වාර්තා කළ අතර ආයෝජන ආදායම 23.93% කින් එනම් රු.මි. 1,390 (2020: රු.මි. 1,917) දක්වා අඩු වීමක් පෙන්නුම් කළේය.

සාංගමික ණය රු.මි. 2,334 ක (2020: රු.මි. 2,080) ආයෝජන ආදායමක් උත්පාදනය කර ඇති අතර එය 12.21% කින් වර්ධනය වූ අතර වසර දෙක සඳහා වූ සියළු ම මූල්‍ය ආයෝජනවලින් 12% ක පමණ ඉහළම ආයෝජන ප්‍රතිලාභ අනුපාතය වාර්තා කළේය.

සාමාන්‍ය රක්ෂණකරුවන් වීකකහාරවල ආයෝජනය කිරීමට වැඩි නැඹුරුවක් දැක්වූ අතර රු.මි. 6,953 ක (2020: රු.මි. 4,256) සාමාන්‍ය ආයෝජනයක් වාර්තා කළේය. ආයෝජන ආදායම ද රු.මි. 178 ක් (2020: රු.මි. 161) දක්වා ඉහළ යාමක් පෙන්නුම් කළේය. සාමාන්‍ය ආයෝජන ඵලදායිතාව 2020 දී 7.19% සිට 2021 දී 7.09% දක්වා සුළු වශයෙන් අඩු විය.

සංඛ්‍යානමය සමාලෝචනය

23 වගුව

සවිස්තරාත්මක ආයෝජන ආදායම හා සාමාන්‍ය ආයෝජන - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

කාණ්ඩය	2020 (අ)		2021 (ආ)	
	ආයෝජන ආදායම (රු. 000)	ආයෝජන සාමාන්‍යය (රු. 000)	ආයෝජන ආදායම (රු. 000)	ආයෝජන සාමාන්‍යය (රු. 000)
රාජ්‍ය ණය සුරැකුම්පත්	4,404,110	60,247,654	4,648,430	70,963,084
- භාණ්ඩාගාර බැඳුම්කර	2,157,968		1,964,914	
- භාණ්ඩාගාර බිල්පත්	999,323		1,303,595	
- වෙනත් (ප්‍රති මිලදී ගැනීම් ගිවිසුම්)	1,246,819		1,379,921	
සම කොටස්	898,981	32,387,148	1,991,517	33,769,561
- ප්‍රාග්ධන ලාභ/ අලාභ	71,609		263,904	
- ලාභාංශ	26,057		64,052	
සාංගමික ණය	2,079,777	17,208,530	2,333,726	18,952,408
- ණයකර	1,991,480		2,220,056	
- වාණිජ පත්‍රිකා	88,297		100,632	
ඉඩම් හා ගොඩනැගිලි		2,937,537		2,084,283
තැන්පතු	2,411,947	24,806,714	1,834,701	24,567,434
- බැංකු	1,917,425		1,389,995	
- මූල්‍ය සමාගම්	494,521		431,673	
ඒකක භාර	160,778	4,255,684	177,610	6,953,121
වෙනත්	326,826	1,190,753	296,175	1,770,844
එකතුව	**10,282,419**	**143,034,019**	**11,282,159**	**159,060,733**
සාමාන්‍ය ආයෝජන ඵලදායීතාව	**7.19%**		**7.09%**	

රක්ෂණ සමාගම්හි නුබුන්වත්භාවය - සාමාන්‍ය රක්ෂණය ව්‍යාපාරය

වසර තුළ මුහුණ දුන් පෙර නොවූ විරූ අභියෝග මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සාමාන්‍ය රක්ෂණකරුවන්ගේ අවදානම් පාදක ප්‍රාග්ධන මට්ටම මැනීම සහ අධීක්ෂණය කිරීම අඛණ්ඩව සිදු කරන ලද අතර එමගින් නිසි ලෙස කළමනාකරණය කරන ලද රක්ෂණ අංශයක් හරහා රක්ෂණ ඔප්පු හිමියන්ගේ අභිරුචීන් ආරක්ෂා කර ඇත. අවදානම් පාදක ප්‍රාග්ධන රීති යටතේ ප්‍රාග්ධන අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා රක්ෂණකරුවන් විසින් අවම වශයෙන් රු.මි. 500ක සම්පූර්ණ ප්‍රාග්ධනයක් සහ 120%ක ප්‍රාග්ධන ප්‍රාමාණ්‍ය අනුපාතයක් පවත්වා ගැනීමට අවශ්‍ය වේ.

ඒ අනුව, ජාතික රක්ෂණ භාර අරමුදල හැර සාමාන්‍ය රක්ෂණකරුවන්ගේ මුළු ප්‍රාග්ධනය 2020 දී වාර්තා වූ රු.මි. 65,041 ට සාපේක්ෂව මෙම වසරේ දී රු.මි. 74,960 ක් වාර්තා වූ අතර 15.25% ක වර්ධනයක් පෙන්නුම් කළේය. පහත 24 වගුවෙහි දැක්වෙන පරිදි එස්විල්ඇයිසී ජෙනරල් 2021 වර්ෂයේ මුළු ප්‍රාග්ධනයෙන් 44.57% ක කොටසක් හිමිකර ගනිමින් ඉහළම ස්ථානය ලබා ගත් අතර 2020 වසරට සාපේක්ෂව එය රු.මි. 33,407 (රු.මි. 27,440) දක්වා 21.75% කින් ඉහළ යාමකි. රක්ෂණකරුවන් දෙදෙනකු හැර සෙසු සියළු රක්ෂණකරුවන් කැලඹිලි සහිත කාලපරිච්ඡේදය මධ්‍යයේ වුවද විටිනාකම අනුව ප්‍රාග්ධනයෙහි ඉහළ යාමක් පෙන්නුම් කර ඇත. තවද, එක් රක්ෂණකරුවෙකු හැර අනෙකුත් සියළුම සාමාන්‍ය රක්ෂණකරුවන් 2021 දෙසැම්බර් 31 වන දිනට රු.මි. 500 ක අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය සමඟ ස්ථාවරව සිටි අතර ඔවුන් අතරින් බොහෝ දෙනෙක් තම ප්‍රාග්ධනය යහපත් මට්ටමක පවත්වා ගෙන ගියහ.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සාමාන්‍ය ප්‍රාග්ධන ප්‍රාමාණ්‍ය අනුපාතය 2021 වසර සඳහා 250% (2020: 249%) ලෙස වාර්තා විය. සියළුම සාමාන්‍ය රක්ෂණ සමාගම් 2021 දෙසැම්බර් 31 දිනට අවම ප්‍රාග්ධන ප්‍රාමාණ්‍ය අනුපාත අවශ්‍යතාවය තෘප්තිමත් කර ඇති අතර ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අවදානම් පාදක ප්‍රාග්ධනය පිළිබඳ බලාත්මක කිරීමේ උපායමාර්ගයේ නියම කර ඇති පරිදි 160% බලාත්මක කිරීමේ මට්ටමට වඩා ඉහළින් වාර්තා කර ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රාග්ධන ප්‍රාමාණ්‍ය අනුපාතය සහ මුළු ප්‍රාග්ධනය 2021 වර්ෂය සඳහා පිළිවෙලින් 600% (2020: 562%) සහ රු.මි. 15,799 (2020: රු.මි. 13,010) ලෙස වාර්තා කර ඇති අතර එය 24 වගුවේ ඇතුළත් නොවේ.

සංඛ්‍යානමය සමාලෝචනය

24, 25 සහ 26 වගු මගින් 2020 සහ 2021 වසර සඳහා සාමාන්‍ය රක්ෂණකරුවන්ගේ අවදානම්-පාදක ප්‍රාග්ධනය (RBC) සම්බන්ධ විස්තර දැක්වේ.

24 වගුව

සමාගම් අනුව නුඹුන්වත්භාවය පිළිබඳ විශ්ලේෂණය - 2020 සහ 2021 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

රක්ෂකයා	2020 දෙසැම්බර් 31 දිනට (අ)			2021 දෙසැම්බර් 31 දිනට (ආ)		
	පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (රු.000)	නියමිත අවදානම් ප්‍රාග්ධනය (රු.000)	ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය (%)	පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (රු.000)	නියමිත අවදානම් ප්‍රාග්ධනය (රු.000)	ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය (%)
අලියාන්ස් ජෙනරල්	8,426,064	3,978,744	212	9,577,256	3,438,763	279
අමානා ජෙනරල්	525,369	279,610	188	677,630	369,517	183
සෙලින්කෝ ජෙනරල්	7,472,104	4,081,902	183	7,792,202	3,918,202	199
කොන්ටිනෙන්ටල්	2,629,220	904,617	291	2,729,200	861,759	317
කෝපරේටිව් ජෙනරල්	2,550,823	1,024,217	249	3,604,790	1,138,230	317
ෆෙයාෆස්ට්	5,055,284	2,692,148	188	5,244,163	2,510,774	209
එච්ඩීඑෆ්සී ජෙනරල්	1,840,729	722,199	255	1,903,450	732,013	260
එල්ඕවිල්සී ජෙනරල්	2,946,390	978,112	301	3,549,395	1,925,844	184
එම්බීඑස්එල්	422,154	135,852	311	317,546	157,521	202
ඔරියන්ට්	941,383	346,306	272	1,065,529	389,562	274
පීපල්ස්	4,162,922	1,369,045	304	4,471,464	1,432,832	312
සණස ජෙනරල්	628,444	247,000	254	620,364	231,398	268
එස්එල්අයිසී	27,440,331	12,307,698	223	33,407,280	13,898,660	240
එකතුව	**65,041,217**	**29,067,450**	**249**	**74,960,269**	**31,005,075**	**250**

රක්ෂණය සමාගමිහි පවත්නා මුළු ප්‍රාග්ධන අවශ්‍යතාව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

මුළු ප්‍රාග්ධනය මනිනු ලබන්නේ I ස්ථරයේ සහ II ස්ථරයේ ප්‍රාග්ධනය එකතු කර සහ පාඩු පියවා ගැනීමට සාමාන්‍යයෙන් ලබා ගත නොහැකි අස්පෘශ්‍ය සහ අද්‍රවශීලී වත්කම් වලින් සමන්විත අඩු කිරීම් අඩු කිරීම මගිනි. 25 වගුවේ දැක්වෙන පරිදි කර්මාන්තයේ මුළු ප්‍රාග්ධනය රු.මි. 74,960 ක් (2020: රු.මි. 65,041) වූ අතර පෙර වසරට සාපේක්ෂව 15.25% ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. කර්මාන්තයේ 1 වන ස්ථරයේ ප්‍රාග්ධනයේ සමස්ත වැඩි වීම බොහෝ දුරට මෙම වර්ධනයට හේතු විය. 1 වන ස්ථරයේ ප්‍රාග්ධනය 2021 දෙසැම්බර් 31 දිනට රු.මි. 99,878 ක් වූ අතර එය 2020 දෙසැම්බර් 31 දිනට වාර්තා වූ රු.මි. 90,870 සාපේක්ෂව 9.91% ක වර්ධනයකි. 1 වන ස්ථරයේ ප්‍රාග්ධනය නිදහස් කළ නොහැකි සමුච්චිත වරණීය කොටස් නිදහස් කළ හැකි සමුච්චිත වරණීය කොටස්, සින්නක්කර දේපල සඳහා ප්‍රත්‍යාගණන සංචිත ආදිය ආදියෙන් සමන්විත වන අතර එය 2020 වසරට සාපේක්ෂව 2021 දී 28.11% ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරමින් රු.මි. 11,069 ක් (2020: රු.මි. 8,640) විය. එස්එල්අයිසී ජෙනරල්හි මුළු ප්‍රාග්ධනය 2021 දී විශාල ලෙස ඉහළ ගිය අතර එය පිළිවෙළින් I සහ II ස්ථරයේ ප්‍රාග්ධනයේ රදවාගත් ඉපැයීම්' සහ 'සින්නක්කර දේපල සඳහා ප්‍රත්‍යාගණන සංචිත යනාදියෙහි වර්ධනය හේතුවෙන් සිදු විය.

එම්බීඑස්එල් සහ සණස ජෙනරල් යන සමාගම් දෙක හැර අනෙකුත් සියළු ම රක්ෂණ සමාගම් 2020 වසරට සාපේක්ෂව ප්‍රධාන වශයෙන් 1 ස්ථරයේ ප්‍රාග්ධනය මගින් මෙහෙයවනු ලබන ඔවුන්ගේ මුළු ප්‍රාග්ධනයෙහි වර්ධනයක් පෙන්නුම් කර ඇත. සාමාන්‍යයෙන් අස්පෘශ්‍ය හෝ අද්‍රවශීල වත්කම්වලින් සමන්විත අඩු කිරීම් රු.මි. 35,987 ක් (2020: රු.මි. 34,469) වූ අතර එය 2021 වර්ෂයේදී 4.40% කින් තරමක වැඩි වීමක් පෙන්නුම් කෙරේ.

සංඛ්‍යානමය සමාලෝචනය

25 වගුව

2020 සහ 2021 වර්ෂවල දෙසැම්බර් 31 දිනට සමාගම් අනුව පවතින මුළු ප්‍රාග්ධනය පිළිබඳ විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

රක්ෂකයා	2020 දෙසැම්බර් 31 දිනට පවතින මුළු ප්‍රාග්ධනය(අ) (රු. 000)	2021 දෙසැම්බර් 31 දිනට (අ)			
		I ස්ථරය (රු. 000)	II ස්ථරය (රු. 000)	අඩු කිරීම් (රු'000)	පවතින මුළු ප්‍රාග්ධනය (රු.000)
අලියන්ස් ජෙනරල්	8,426,064	12,218,928		2,641,672	9,577,256
අමානා ජෙනරල්	525,369	1,448,646	439,596	1,210,612	677,630
සෙලින්කෝ ජෙනරල්	7,472,104	12,722,935	468,226	5,398,959	7,792,202
කොන්ටිනෙන්ටල්	2,629,220	3,354,351		625,152	2,729,199
කෝපරේටිව් ජෙනරල්	2,550,823	4,013,499	734,928	1,143,638	3,604,789
ෆෙයාෆස්ට්	5,055,284	6,849,598		1,605,435	5,244,163
එච්එන්බී ජෙනරල්	1,840,729	2,189,999		286,549	1,903,450
එල්ඕඑල්සී ජෙනරල්	2,946,390	3,956,370		406,975	3,549,395
එම්බීඑස්එල්	422,154	431,171	4,192	117,817	317,546
ඔරියන්ට්	941,383	1,120,556		55,027	1,065,529
පීපල්ස්	4,162,922	4,944,181		472,718	4,471,464
සණස ජෙනරල්	628,444	730,759		110,396	620,363
එස්එල්ඇයිසී	27,440,331	45,897,050	9,422,000	21,911,770	33,407,280
එකතුව	**65,041,217**	**99,878,043**	**11,068,942**	**35,986,720**	**74,960,266**

රක්ෂණ සමාගම් අනුව නියමිත අවදානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතාව (RCR) සැසඳීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

අවශ්‍ය අවදානම් පාදක ප්‍රාග්ධනයට ප්‍රාග්ධන අවශ්‍යතා ගණනය කිරීමට භාවිතා කරන ණය අවදානම, සංකේන්ද්‍රණ අවදානම, වෙළඳපොල අවදානම, ප්‍රතිරක්ෂණ අවදානම, වගකීම් අවදානම සහ මෙහෙයුම් අවදානම වැනි සියළු ම අදාළ සහ ද්‍රව්‍යමය අවදානම් කාණ්ඩ ඇතුළත් වේ. අවදානම් පාදක ප්‍රාග්ධන රීතිය යටතේ ගණනය කළ ප්‍රධාන අවදානම් කාණ්ඩ සමඟින් අවදානම් පාදක ප්‍රාග්ධනයෙහි සමාගම් අනුව විශ්ලේෂණය 26 වගුව මඟින් නිරූපණය කෙරේ.

සාමාන්‍ය රක්ෂණ සමාගම් විසින් විවිධාංගීකරණය කිරීමට පෙර සහ පසු වාර්තා කරන ලද මුළු අවදානම් පාදක ප්‍රාග්ධන අගය රු.මි. 42,368 ක් (2020: රු.මි. 39,920) සහ රු.මි. 31,005 ක් (2020: රු.මි. 29,035) වූ අතර පිළිවෙලින් 6.13% සහ 6.78% ක වර්ධනයක් නියෝජනය කරයි. පෙර වසරට සමානව සාමාන්‍ය රක්ෂණ අංශයේ අවදානම් පාදක ප්‍රාග්ධනය සංකේන්ද්‍රණ අවදානම, වෙළඳපොළ අවදානම සහ වගකීම් අවදානම අඩියෙන් සමන්විත වූ අතර විවිධාංගීකරණයට පෙර මුළු අවදානම් පාදක ප්‍රාග්ධනයෙන් 89.82% ක් (2020: 90.14%) සඳහා සාමූහිකව දායක විය. තවද, ප්‍රතිපත්ති අස්ථාවරත්වය සහ දුර්වල සාර්ව ආර්ථික පරිසරය හේතුවෙන් ඇති වුණු වෙළඳපොළ තත්වයන් හේතුවෙන් වත්කම් හා වගකීම් කාලසීමාවේ නොගැළපීම නිසා පොළී අවදානම් ගාස්තු ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස කර්මාන්තයේ වෙළඳපොළ අවදානම 2020 දී රු.මි. 10,641 සාපේක්ෂව 2021 දී රු.මි. 12,632 දක්වා ඉහළ ගොස් ඇත.

26 වගුවෙහි ඇතුළත් නොවන ජාතික රක්ෂණ භාර අරමුදල විසින් 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා විවිධාංගීකරණයට පෙර සහ පසුව අවදානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතාව පිළිවෙලින් රු.මි. 3,939 (2020: රු.මි. 3,442) සහ රු.මි. 2,633 (2020: රු.මි. 2,316) ලෙස වාර්තා කර ඇත.

සංඛ්‍යානමය සමාලෝචනය

26 වගුව

2020 සහ 2021 වර්ෂවල දෙසැම්බර් 31 දිනට සමාගම් අනුව අවදානම් ප්‍රාග්ධන අවශ්‍යතාව පිළිබඳ විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

රක්ෂකයා	2020 දෙසැම්බර් 31 දිනට (අ) (රු. 000)							
	ණය අවදානම	සංකේන්ද්‍රණ අවදානම	වෙළඳපළ අවදානම	ප්‍රතිරක්ෂණ අවදානම	වගකීම් අවදානම	මෙහෙයුම් අවදානම	විවිධාංගීකරණයට පෙර නියමිත අවදානම් ප්‍රාග්ධන අයකිරීම්	විවිධාංගීකරණයට පසු නියමිත අවදානම් ප්‍රාග්ධන අයකිරීම්
අලියාන්ස් ජෙනරල්	102,501	2,665,343	502,633	32,584	2,202,872	259,886	5,765,820	3,978,744
අමානා ජෙනරල්	20,821	155,490	14,344	8,341	144,798	26,585	370,379	247,534
සෙලින්කෝ ජෙනරල්	262,027	2,240,028	943,650	221,688	1,770,939	275,549	5,713,881	4,081,902
කොන්ටිනෙන්ටල්	98,013	317,117	314,862	24,340	494,275	70,767	1,319,374	904,617
කෝපරේටිව් ජෙනරල්	156,866	173,732	493,406	14,530	583,482	73,693	1,495,709	1,024,217
ෆෙයාෆස්ට්	52,320	1,253,312	833,750	348,916	1,016,716	149,395	3,654,409	2,692,148
එච්එන්බී ජෙනරල්	78,508	224,018	168,735	24,755	521,326	61,308	1,078,650	722,199
එල්ඕවල්සී ජෙනරල්	27,268	229,491	393,645	38,397	689,523	82,542	1,460,866	978,112
එම්බීඑස්එල්	10,548	53,429	13,849	6,112	105,870	14,198	204,006	135,852
ඔරියන්ට්	26,681	238,859	2,319	4,153	213,025	23,620	508,657	346,306
පීපල්ස්	192,721	523,220	327,517	19,335	857,117	100,517	2,020,428	1,369,045
සණස ජෙනරල්	12,223	141,767	79,877	1,647	73,370	12,598	321,482	247,000
එස්එල්අයිසී	162,613	4,994,508	6,552,587	77,164	3,460,241	758,831	16,005,944	12,307,698
එකතුව	**1,203,110**	**13,210,314**	**10,641,174**	**821,962**	**12,133,554**	**1,909,489**	**39,919,605**	**29,035,374**

රක්ෂකයා	2021 දෙසැම්බර් 31 දිනට (ආ) (රු. 000)							
	ණය අවදානම	සංකේන්ද්‍රණ අවදානම	වෙළඳපළ අවදානම	ප්‍රතිරක්ෂණ අවදානම	වගකීම් අවදානම	මෙහෙයුම් අවදානම	විවිධාංගීකරණයට පෙර නියමිත අවදානම් ප්‍රාග්ධන අයකිරීම්	විවිධාංගීකරණයට පසු නියමිත අවදානම් ප්‍රාග්ධන අයකිරීම්
අලියාන්ස් ජෙනරල්	80,925	2,104,555	706,492	49,792	1,761,594	260,576	4,963,934	3,438,763
අමානා ජෙනරල්	26,175	243,938	38,540	9,347	185,514	31,665	535,179	369,517
සෙලින්කෝ ජෙනරල්	274,996	1,829,593	1,000,586	294,496	1,926,146	290,700	5,616,517	3,918,202
කොන්ටිනෙන්ටල්	109,191	209,470	392,901	28,551	434,697	76,815	1,251,625	861,759
කෝපරේටිව් ජෙනරල්	173,171	112,193	690,495	15,763	551,718	88,652	1,631,992	1,138,230
ෆෙයාෆස්ට්	62,557	984,517	815,478	361,452	1,154,715	156,293	3,535,012	2,510,774
එච්එන්බී ජෙනරල්	84,074	173,859	191,437	29,482	549,587	67,056	1,095,495	732,013
එල්ඕවල්සී ජෙනරල්	78,137	634,157	956,236	28,739	903,945	105,059	2,706,273	1,925,844
එම්බීඑස්එල්	7,119	99,289	6,530	4,373	104,223	13,728	235,262	157,521
ඔරියන්ට්	36,069	221,051	40,114	6,560	242,247	28,005	574,046	389,562
පීපල්ස්	155,016	587,246	380,411	30,565	844,042	103,158	2,100,438	1,432,832
සණස ජෙනරල්	13,490	106,951	96,935	2,466	71,094	12,641	303,577	231,398
එස්එල්අයිසී	173,616	5,793,956	7,316,338	117,270	3,591,404	826,414	17,818,998	13,898,660
එකතුව	**1,274,536**	**13,100,775**	**12,632,493**	**978,856**	**12,320,926**	**2,060,762**	**42,368,348**	**31,005,075**

සංඛ්‍යානමය සමාලෝචනය

ශුද්ධ ඉපැයූ වාරික ආදායම, දරන ලද ශුද්ධ හිමිකම් පෑම්, ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය, ශුද්ධ වියදම්, ශුද්ධ වියදම් අනුපාතය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

27 වගුව සහ 20 ප්‍රස්තාරයෙහි පෙන්වා ඇති පරිදි වර්ජන, කැරළි, කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් ඇතුළු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන උප කාණ්ඩවලින් ජනනය කරන ලද ශුද්ධ උපයාගත් වාරිකය රු.මි. 86,981 බලපෑමට ලක් නොවුණු අතර 2020 දී රු.මි. 86,490 ට සාපේක්ෂව සුළු වැඩිවීමක් පෙන්නුම් කර ඇත. දළ ලිඛිත වාරිකයේ මධ්‍යස්ථ වර්ධනය මෙන්ම 2021 වසර පුරාවට වසංගතය නිසා අබණ්ඩව අගුළු දැමීම, සංචරණය සීමා කිරීම සහ ව්‍යාපාරවලට බාධා එල්ල වීම යනාදී කරුණු හේතුවෙන් ශුද්ධ ඉපැයූ වාරික වර්ධනයට බාධාවක් විය.

පෙර වසරවලට සමානව, වර්ජන, කැරළි, කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් හැර සාමාන්‍ය රක්ෂණ වෙළෙඳපොළේ ගාමක බලවේගය ලෙස මෝටර් රථ රක්ෂණය ඉහළම ශුද්ධ ඉපැයූ වාරික මුදල වන රු.මි. 56,002 (2020: රු.මි. 57,930) වාර්තා කළ අතර මුළු ශුද්ධ ඉපැයූ වාරිකයෙන් 69.42% ක් (2020:72.12%) නියෝජනය කළ අතර 2021 දී 3.33% ක සෘණ වර්ධනයක් පෙන්නුම් කරයි. සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරය මුළු ශුද්ධ ඉපැයූ වාරිකයෙන් (වර්ජන, කැරළි, කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් හැර) 22.41% ක් (2020:18.67%) නියෝජනය කරමින් රු.මි. 18,078 ක (2020: රු.මි. 14,996) ශුද්ධ ඉපැයූ වාරිකයක් වාර්තා කර ඇත. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් පාදක වී ඇත්තේ එම වසරේ අවසාන භාගයේ දී ආරම්භ කරන ලද සුරක්ෂා රක්ෂණ යෝජනා ක්‍රමයයි.

තවද, 2019 සිට 2021 දක්වා වූ වසරක කාලය සලකා බැලීමේ දී විවිධ සහ ගිනි ව්‍යාපාර පන්තිවලට අනුබද්ධ ශුද්ධ ඉපැයූ වාරික ප්‍රමාණය පහත වැටීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කර ඇති අතර 2021 දී පිළිවෙලින් රු.මි. 3,307 (2020: රු.මි. 4,110) සහ රු.මි. 2,144 (2020: රු.මි. 2,321) වාර්තා කර ඇත. අනෙක් අතට, පසුගිය වසර පහ තුළ වර්ජන, කැරළි, කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් රක්ෂණයෙහි ශුද්ධ ඉපැයූ වාරිකය ක්‍රමයෙන් වැඩි වී ඇති අතර 2017 සිට 2021 දක්වා 69.09% ක වර්ධනයක් වාර්තා කර ඇත.

වර්ජන, කැරළි, කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් හැර සාමාන්‍ය රක්ෂණ අංශය විසින් දරන ලද මුළු ශුද්ධ හිමිකම් පෑම් ප්‍රමාණය 2021 දී රු.මි. 48,317 ක් වූ අතර එය 2020 දී රු.මි. 42,534 ට සාපේක්ෂව 13.60% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. දරන ලද ශුද්ධ හිමිකම්වල වර්ධනයට හේතු වූයේ සුරක්ෂා රක්ෂණ යෝජනා ක්‍රමයේ සහ සෞඛ්‍ය ව්‍යාපාර පන්තිය යටතේ වාර්තා කර ඇති අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයේ පළ කර ඇති හිමිකම් පෑම්ය. මේ අතර, 2021 වර්ෂය තුළ මෝටර් රථ ව්‍යාපාර පන්තිය යටතේ දැරූ ශුද්ධ හිමිකම් පෑම් ප්‍රමාණය 1.13% කින් පහත වැටී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස මෝටර් රථ සඳහා හිමිකම් පෑම් අඩු විය. තවද, ව්‍යාපාරයේ අනෙක් සෑම උප පන්තියක්ම 2021 වර්ෂය තුළ දැරූ ශුද්ධ හිමිකම් පෑම්වල අඩු වීමක් පෙන්නුම් කර තිබීම කැපී පෙනෙන තත්වයකි.

ශුද්ධ ඉපැයූ වාරිකයේ (වර්ජන, කැරළි, කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් හැර) ප්‍රතිශතයක් ලෙස දැරූ ශුද්ධ හිමිකම් ලෙස පැහැදිලි කළ හැකි ශුද්ධ හිමිකම් අනුපාතය 59.90% ක් (2020: 52.95%) විය. 2020 වසර තුළ ශුද්ධ හිමිකම් අනුපාතය 6.95% කින් වැඩි වීම, බොහෝ දුරට ගිනි රක්ෂණ ව්‍යාපාර යටතේ වර්ගීකරණය කර ඇති 2021 මැයි, ජූනි සහ නොවැම්බර් මාසවල ඇති වූ ගංවතුර සහ සුළි කුණාටු තත්ත්වයන් මගින් පැහැදිලි කළ හැකිය. ඒ අනුව, ගිනි රක්ෂණ ව්‍යාපාරය ඉහළම හිමිකම් අනුපාතය වන 113.40% ක් වාර්තා කර ඇති අතර එය 2020 වසරේ 87.87% ට සාපේක්ෂව විශාල වැඩි වීමකි.

2021 දී සෞඛ්‍ය ව්‍යාපාරයේ ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය 95.52% ක් (2020: 80.69%) ලෙස ඉහළ අගයක් ගත් අතර එම අංශයේ ඉහළ පිරිවැය සියළුම රක්ෂණ සමාගම් කෙරෙහි අභියෝගයක් විය. පෙර වසරවල සමුද්‍ර රක්ෂණ හා විවිධ රක්ෂණ ව්‍යාපාරවලට සමානව 2021 දී පිළිවෙලින් 45.71% සහ 45.68% ලෙස අඩු හිමිකම් පෑම් අනුපාත වාර්තා කර ඇත.

27 වගුවෙහි දැක්වෙන පරිදි, සාමාන්‍ය රක්ෂණකරුවන් විසින් දරන ලද වියදම් 2020 වසරේ සිට මන්දගාමී ලෙස වැනම් 2.08% කින් ඉහළ ගොස් ඇති අතර මෙය 2021 දී 1.34% දක්වා තවදුරටත් පහත වැටුණු අතර එය රු.මි. 34,419 ක් (2020: රු.මි. 33,961) විය. සාමාන්‍ය රක්ෂණ අංශයේ සමස්ත ශුද්ධ වියදම් අනුපාතය වසරකට පෙර 39.27% සිට 39.57% දක්වා ඉතා සුළු වර්ධනයක් පෙන්නුම් කර ඇත.

ඉහළ හිමිකම් පෑම් අනුපාතයේ බලපෑම 2020 දී 88.43% ට සාපේක්ෂව 2021 දී කර්මාන්තයේ ඒකාබද්ධ අනුපාතය 95.16% දක්වා නරක අතට හැරී ඇති අතර එය වර්ජන, කැරළි, කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් රක්ෂණය නොමැතිව තවදුරටත් නරක අතට හැරී 101.21% ක් (2020: 93.85%) වාර්තා කළේය. ඒ අනුව සාමාන්‍ය රක්ෂණ සමාගම්වල මූල්‍ය ක්‍රියාකාරිත්වයට පීඩනයක් එල්ල කර ඇති ඉහළ ඒකාබද්ධ අනුපාතයක් 2021 වසරේ ජනනය කරන ලද ආයෝජන ආදායම සමග යම් ප්‍රමාණයකට හොඳින් ක්‍රියාත්මක වීමට සමත් විය.

සංඛ්‍යානමය සමාලෝචනය

27 වගුව

ශුද්ධ ඉපැයූ වාරික ආදායම, දරන ලද ශුද්ධ හිමිකම් පෑම්, ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය, ශුද්ධ වියදම්, ශුද්ධ වියදම් අනුපාතය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

පන්තිය	ශුද්ධ ඉපැයූ වාරික (රු.000)				
	2017	2018	2019	2020 (අ)	2021 (ආ)
ගිනි	1,721,160	1,957,237	2,183,650	2,320,976	2,144,141
මුහුදු	991,573	1,104,376	1,175,289	973,261	1,135,974
මෝටර්	50,580,010	56,891,349	58,724,480	57,930,115	56,001,558
සෞඛ්‍ය	11,435,476	12,386,134	15,153,049	14,995,566	18,077,560
විවිධ	3,891,564	4,492,033	4,942,850	4,109,992	3,307,351
අනු එකතුව	**68,619,783**	**76,831,128**	**82,179,319**	**80,329,911**	**80,666,585**
වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම්	3,734,321	4,031,846	5,568,739	6,159,888	6,314,379
එකතුව	**72,354,104**	**80,862,975**	**87,748,058**	**86,489,799**	**86,980,964**

පන්තිය	දරණ ලද ශුද්ධ හිමිකම් පෑම් (රු.000)				
	2017	2018	2019	2020 (අ)	2021 (ආ)
ගිනි	1,640,062	1,696,698	2,546,301	2,039,484	2,431,448
මුහුදු	345,331	453,917	500,555	277,372	519,210
මෝටර්	31,134,209	34,681,762	34,501,309	26,891,271	26,587,890
සෞඛ්‍ය	10,511,212	12,148,224	16,759,694	12,099,917	17,267,200
විවිධ	4,186,860	3,457,623	3,148,570	1,225,842	1,510,957
අනු එකතුව	**47,817,674**	**52,438,224**	**57,456,428**	**42,533,886**	**48,316,704**
වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම්	(10,519)	76,068	692,927	(14,382)	36,899
එකතුව	**47,807,154**	**52,514,292**	**58,149,354**	**42,519,504**	**48,353,603**

පන්තිය	ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය (%)				
	2017	2018	2019	2020 (අ)	2021 (ආ)
ගිනි	95.29	86.69	116.61	87.87	113.40
මුහුදු	34.83	41.10	42.59	28.50	45.71
මෝටර්	61.55	60.96	58.75	46.42	47.48
සෞඛ්‍ය	91.92	98.08	110.60	80.69	95.52
විවිධ	107.59	76.97	63.70	29.83	45.68
අනු එකතුව	**69.68**	**68.25**	**69.92**	**52.95**	**59.90**
වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම්	(0.28)	1.89	12.44	(0.23)	0.58
එකතුව	**66.07**	**64.94**	**66.27**	**49.16**	**55.59**

සංඛ්‍යානමය සමාලෝචනය


විස්තරය	ශුද්ධ වියදම් (රු.000)				
	2017	2018	2019	2020 (අ)	2021 (ආ)
වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියළු පන්ති සඳහා ශුද්ධ වියදම්	24,491,746	29,490,544	31,855,625	32,858,828	33,327,292
වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම්	732,786	842,515	1,411,974	1,102,435	1,091,603
එකතුව	**25,224,532**	**30,333,059**	**33,267,599**	**33,961,263**	**34,418,895**

විස්තරය	ශුද්ධ වියදම් අනුපාතය (%)				
	2017	2018	2019	2020 (අ)	2021 (ආ)
වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියළු පන්ති සඳහා ශුද්ධ වියදම්	35.69	38.38	38.76	40.90	41.31
සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි ශුද්ධ වියදම් අනුපාතය	34.86	37.51	37.91	39.27	39.57

විස්තරය	ශුද්ධ ඒකාබද්ධ අනුපාතය (%)				
	2017	2018	2019	2020 (අ)	2021 (ආ)
වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියළු පන්ති සඳහා ශුද්ධ ඒකාබද්ධ අනුපාතය	105.38	106.63	108.68	93.85	101.21
සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි ශුද්ධ ඒකාබද්ධ අනුපාතය	100.94	102.45	104.18	88.43	95.16

20 ප්‍රස්තාරය

ශුද්ධ ඉපැයූ වාරික ආදායම, දරන ලද ශුද්ධ හිමිකම් පෑම්, ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය, ශුද්ධ වියදම්, ශුද්ධ වියදම් අනුපාතය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය



සංඛ්‍යානමය සමාලෝචනය

දළ ලිඛිත වාරිකය නියෝජනය කරන රක්ෂණ ඔප්පු සංඛ්‍යාව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

28 වගුවෙහි දැක්වෙන පරිදි, සාමාන්‍ය රක්ෂණ කර්මාන්තයේ විවිධ උප කාණ්ඩවලින් දළ ලිඛිත වාරිකයක් ජනනය කිරීමට දායක වූ මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2021 දී 6,620,274 ක් විය. 2020 ට සාපේක්ෂව මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 80,719 කින් වැඩි වී ඇත. තවද, පසුගිය වසර පහ තුළ මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාව සුළු වශයෙන් ඉහළ ගොස් 2017 ට සාපේක්ෂව 2021 දී 8.04%ක වර්ධනයක් වාර්තා කළේය. පෙර වසරවලට සමානව බහුතරයක් මෝටර් රථ උප පන්තිය නියෝජනය කළ අතර එය 3,285,221 ක (2020: 3,067,955) තෙවන පාර්ශ්ව රක්ෂණ ඔප්පු සහ 2,671,816 ක (2020: 2,849,393) විස්තීරණ ඔප්පුවලින් සමන්විත විය. කෙසේ වුවද, 2020 වර්ෂයේ දක්නට ලැබුණු පහත බැස්ම අඛණ්ඩව 6.23% කින් පහත වැටුණු අතර ඉහත සඳහන් කළ පරිදි විස්තීරණ ඔප්පු මෙන් නොව තෙවන පාර්ශ්ව රක්ෂණ ඔප්පු 7.08% ක ඉහළ යාමක් පෙන්නුම් කළේය.

එසේ වුවද, විවිධ ව්‍යාපාර පන්තිය හැර අනෙකුත් සියළුම ව්‍යාපාර උප කාණ්ඩ සඳහා දළ ලිඛිත වාරික නියෝජනය කරන රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2020 සහ 2019 යන දෙවසරෙහි ම වාර්තා වූ සංකෝචනයට සාපේක්ෂව 2021 දී වැඩි විය.

නව, අලුත් කළ සහ බලාත්මකව පවතින රක්ෂණ ඔප්පු පිළිබඳ විස්තර - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

2021 සහ 2020 යන දෙවසර සඳහා නව, අලුත් කරන ලද සහ බලාත්මක රක්ෂණ ඔප්පු පිළිබඳ විස්තර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන උප කාණ්ඩ

28 වගුව

දළ ලිඛිත වාරිකය නියෝජනය කරන රක්ෂණ ඔප්පු සංඛ්‍යාව (-) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

පන්තිය	රක්ෂණ ඔප්පු සංඛ්‍යාව				
	2017	2018	2019	2020 (අ)	2021 (ආ)
ගිනි	241,884	245,027	234,408	220,196	236,361
මුහුදු	172,733	187,338	179,001	137,093	160,258
මෝටර්	5,390,222	5,614,901	5,937,989	5,917,348	5,957,037
තෙවන පාර්ශව පමණි	2,784,920	2,821,529	2,919,884	3,067,955	3,285,221
විස්තීර්ණ	2,605,302	2,793,372	3,018,105	2,849,393	2,671,816
සෞඛ්‍ය	11,893	17,267	23,237	28,985	31,380
විවිධ	311,084	427,470	329,509	235,933	235,238
එකතුව	**6,127,816**	**6,492,003**	**6,704,144**	**6,539,555**	**6,620,274**

යටතේ 29 වගුවෙහි සහ 21 ප්‍රස්තාරයෙහි සංක්ෂිප්තව ඇත. වර්ධනයක් නොමැති වෙළඳපොල තත්ත්වයන් මධ්‍යයේ වුවද සාමාන්‍ය රක්ෂණ අංශයේ කාර්ය සාධනය 2021 වර්ෂය තුළ නිකුත් කරන ලද නව රක්ෂණ ඔප්පු සංඛ්‍යාව අඩුවීම සහ 3.69%ක වාර්තාගත සෘණ වර්ධනය තුළින් පිළිබිඹු වේ. විදේශ විනිමය පිටතට ගලායාම සීමා කිරීමේ පියවරක් ලෙස මෝටර් රථ ආනයනය කිරීම සඳහා රජය විසින් පනවා ඇති සීමාවන්, මෝටර් රථ රක්ෂණ ඔප්පු පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු විය. ඉහත සඳහන් කළ පරිදි, නව විස්තීරණ රක්ෂණ ඔප්පු අඩු වූ අතර තුන්වන පාර්ශවීය රක්ෂණ ඔප්පු වැඩි විය. මෝටර් රථ කාණ්ඩය යටතේ නිකුත් කරන ලද නව ප්‍රතිපත්ති සියල්ලෙහි එකතුව 2,364,055 ක් (2020: 2,471,051) විය.

මීට අමතරව, සෞඛ්‍ය සහ විවිධ රක්ෂණ ව්‍යාපාර යටතේ ඇති නව ප්‍රතිපත්ති 2021 දී පිළිවෙලින් 13.74% සහ 14.14%ක සෘණ වර්ධනයක් වාර්තා කළේය. ඊට පටහැනිව, ගිනි සහ සමුද්‍ර රක්ෂණ ව්‍යාපාර යටතේ නිකුත් කරන ලද නව ප්‍රතිපත්ති 2020 වසරට සාපේක්ෂව 15,179 සහ 11,525 ක වර්ධනයක් පෙන්නුම් කළේය.

2021 වර්ෂය තුළ සාමාන්‍ය රක්ෂණකරුවන් විසින් අලුත් කළ රක්ෂණ ඔප්පු 3,884,351 ක් (2020: 3,664,333) ප්‍රතිරක්ෂණය කර ඇති අතර ප්‍රධාන වශයෙන් මෝටර් රථ රක්ෂණ ඔප්පු හේතුවෙන් 6.00% ක සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කර ඇත. මීට අමතරව, සාමාන්‍ය රක්ෂණ අංශයේ ක්‍රියාත්මක වන රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2020 දී 6,478,167 ට සාපේක්ෂව 2021 දී 6,595,661 දක්වා වර්ධනය වී 1.81% ක මන්දගාමී වර්ධන වේගයක් වාර්තා කර ඇත.

සංඛ්‍යානමය සමාලෝචනය


29 වගුව

නව, අලුත් කළ සහ බලාත්මකව පවතින රක්ෂණ ඔප්පු පිළිබඳ විස්තර - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

පන්තිය	2020 (අ)			2021 (ආ)		
	නව රක්ෂණ ඔප්පු	අලුත් කළ රක්ෂණ ඔප්පු	වසර අවසානය වන විට බලාත්මකව පවතින රක්ෂණ ඔප්පු	නව රක්ෂණ ඔප්පු	අලුත් කළ රක්ෂණ ඔප්පු	වසර අවසානය වන විට බලාත්මකව පවතින රක්ෂණ ඔප්පු
ගිනි	71,135	149,084	216,847	86,314	152,071	234,193
මුහුදු	134,232	3,726	130,828	145,757	15,065	153,877
මෝටර්	2,471,051	3,424,277	5,863,856	2,364,055	3,602,840	5,935,088
තෙවන පාර්ශව පමණි	1,531,788	1,515,051	3,049,797	1,603,102	1,682,388	3,288,442
විස්තීර්ණ	939,263	1,909,226	2,814,059	760,953	1,920,452	2,646,646
සෞඛ්‍ය	19,146	9,829	29,670	16,515	14,796	32,465
විවිධ	157,610	77,417	236,966	135,320	99,579	240,038
එකතුව	**2,853,174**	**3,664,333**	**6,478,167**	**2,747,961**	**3,884,351**	**6,595,661**

21 ප්‍රස්තාරය

නව, අලුත් කළ සහ බලාත්මකව පවතින රක්ෂණ ඔප්පු පිළිබඳ විස්තර - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය



ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය

අංක 1791/4 දරන සහ 2012 දෙසැම්බර් 31 දිනැති රජයේ ගැසට් නිවේදනයට අනුව ජාතික රක්ෂණ භාර අරමුදල ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සියළුම ප්‍රාථමික රක්ෂණ සමාගම් සඳහා 'ජාතික ප්‍රතිරක්ෂණකරු' ලෙස ක්‍රියා කරයි. මන්ද යත් සියළු ම ප්‍රාථමික රක්ෂණකරුවන් සෑම සාමාන්‍ය ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයකම සම්පූර්ණ වගකීමෙන් සියයට තිහක් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත පැවරිය යුතු බැවිණි.

2021 වර්ෂය තුළ ජාතික රක්ෂණභාර අරමුදල ප්‍රතිරක්ෂණ වාරික ආදායම ලෙස රු.මි. 3,549 ක් වාර්තා කර ඇති අතර එය 2020 වසරේ වාර්තා වූ රු.මි. 3,235 හා සැසඳීමේ දී 9.68% ක වර්ධනයකි. ප්‍රතිපවරාදීමේ ආවරණය නොමැති වීම හේතුවෙන් 2020 මාර්තු 31 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රතිරක්ෂණ ප්‍රතිශතයන් පිළිනොගැනීම හේතුවෙන් 2020 වර්ෂයේ දී ප්‍රතිරක්ෂණ වාරික ආදායම අඩුවීමක් දක්නට ලැබිණි. කෙසේ වුවද, 2020 අගෝස්තු 1 වන දින සිට ප්‍රතිපවරා දීමේ ආවරණය නැවත ආරම්භ කිරීමත් සමග ජාතික රක්ෂණභාර අරමුදල විසින් ප්‍රතිරක්ෂණ ප්‍රතිශතයන් පිළිගැනීම නැවත ආරම්භ කර ඇති අතර ඒ අනුව ප්‍රතිරක්ෂණ වාරික ආදායම පෙර වසරට සාපේක්ෂව 2021 වර්ෂයේදී යථා තත්වයට පත් වීමට පටන් ගෙන වර්ධනයක් වාර්තා කළේය.

2020 වර්ෂයට අදාළ ප්‍රතිපවරා දීමේ ආවරණයෙහි අවම තැන්පතු වාරිකය නියෝජනය කරමින් 2020 දී ප්‍රතිරක්ෂණ වාරිකවල ශුද්ධ නිරාවරණය රු.මි. 275 ක් විය. 2021 දී පවාරණය කළ වාරිකවල ශුද්ධ නිරාවරණ ප්‍රමාණය රු.මි. 1,120 ක් වූ අතර වසර තුළ වාර්තා වූ ප්‍රතිපවරා ගැනීම රු.මි. 466 ක් වටිනා ගැලපුම් වාරිකය හේතුවෙන් පෙර වසරට සාපේක්ෂව වැඩි වීමක් පෙන්නුම් කරයි.

වර්ෂය තුළ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයට අදාළව ජාතික රක්ෂණභාර අරමුදල විසින් දරන ලද හිමිකම් රු.මි. 2,379 ක් වූ අතර එමගින් 2020 වර්ෂයේ වාර්තා වූ රු.මි. 1,505 ට සාපේක්ෂව 58%

සංඛ්‍යානමය සමාලෝචනය

ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2020 වර්ෂයේදී ක්‍රියාත්මක වූ සංචරණ සීමා කිරීම් සහ රට අගුළු දැමීම් සැලකිය යුතු ලෙස අඩු වූ හිමිකම් පෑම් කෙරෙහි ප්‍රධාන බලපෑමක් එල්ල කළේය. කෙසේ වෙතත්, වසරේ දෙවන භාගයේ පියවූ විශාල හිමිකම් පෑම් කිහිපයක් හේතුවෙන්, 2021 වර්ෂය තුළදී දැරීමට සිදු වූ හිමිකම් පෑම් සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වී ඇත. ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් සාමාන්‍යකරණය කිරීම සහ අගුළු දැමීමේ සීමාවන් ඉවත් කිරීම සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත හිමිකම් පෑම් ප්‍රමාණය 2021 දී ඉහළ යාමට බලපා ඇති අතර එය ජාතික රක්ෂණ භාර අරමුදල වෙත වාර්තා කරන ලද ප්‍රතිරක්ෂණ හිමිකම් පෑම් කෙරෙහි අහිතකර බලපෑමක් එල්ල කර ඇත. හිමිකම් පෑම් ඉහළ යාමට අනුරූපව ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය විසින් 2021 දී රු.මි. 774 ක ප්‍රතිරක්ෂණ අලාභයක් සහ රු.මි. 525 ක බදු පෙර අලාභයක් උත්පාදනය කරන ලදී.

වසර තුළ වාර්තා වූ විශාල ප්‍රමාණයේ හිමිකම් පියවීම් හේතුවෙන් ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම් කළඹ 2021 දී රු.මි. 6,066 සිට රු.මි. 5,533 දක්වා අඩු විය. 2021 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම්වලින් 37.73%, 28.75% සහ 19.56% නියෝජනය කරමින් මූල්‍ය ආයෝජන, ලැබිය යුතු වාරික සහ ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ, ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ සමස්ත වත්කම් සංයුතියේ ප්‍රධාන ස්ථානයක් ගෙන ඇත. ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ සම්පූර්ණ මූල්‍ය වත්කම් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති අතර එය 2021 අවසන් වන විට රු.මි. 2,088 ක් විය. කෙසේ වෙතත්, 2021 දෙසැම්බර් 31 වන දිනට ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයට සහාය වීමට ප්‍රමාණවත් මූල්‍ය වත්කම් නොතිබූ බැවින් ප්‍රතිරක්ෂණ වගකීමෙන් 63%ක් පමණක් අනුමත ආයෝජන හරහා ආවරණය කර ඇත.

රක්ෂණ තැරැව්කාර සමාගම්

රක්ෂණ තැරැව්කාර සමාගම් අතරමැදියන් ලෙස ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ නිශ්චිත අවශ්‍යතා අනුව සුදුසු රක්ෂණ ඔප්පු ලබා ගැනීමට උපකාර කරයි. මීට අමතරව, ඔවුන් එක් විශේෂිත රක්ෂණ විසඳුමක් කෙරෙහි අවධානය යොමු කළ හැකිය. නැතහොත් විවිධ වර්ගයේ රක්ෂණ විසඳුම් සඳහා උපදෙස් ලබා දිය හැකිය. රක්ෂණ නියෝජිතයන් ලෙස බොහෝ සමාන කාර්යයන් ඉටු කරන අතරම, ඔවුන් ඔප්පු හිමියන්ගේ අවශ්‍යතා සඳහා ක්‍රියා කරන බැවින් ඔවුන් නියෝජිතයින්ගෙන් වෙනස් වේ. රක්ෂණ තැරැව්කරුවන් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ 82 වගන්තිය මගින් බලාත්මක කර ඇති පරිදි ඔවුන් නියෝජනය කරන රක්ෂණ සමාගම් එකක් හෝ කිහිපයක් යටතේ ඔප්පු විකුණයි.

2021 අවසානය වන විට රක්ෂණ තැරැව්කාර සමාගම් 68 ක් වෙළඳපොලේ ක්‍රියාත්මක වූ අතර දළ ලිඛිත වාරිකය රු.මි. 30,286 (2020: රු.මි. 28,912) ජනනය කර ඇත. මෙම මුළු දළ ලිඛිත වාරිකය දිගු කාලීන රක්ෂණ ව්‍යාපාර සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර හරහා උත්පාදනය කරන ලද වාරික ආදායමින් සමන්විත වූ අතර එය පිළිවෙලින් රු.මි. 1,812 (2020: රු.මි. 1,422) සහ රු.මි. 28,474 (2020: රු.මි. 27,490) වේ. උත්පාදනය කරන ලද මුළු දළ ලිඛිත වාරිකයෙන් 94.02% ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකය නියෝජනය කළ අතර 5.98% ක් පමණක් දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකය නියෝජනය කළේය.

රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය හරහා ජනනය කරන ලද මුළු දළ ලිඛිත වාරිකය 2020 දී ජනනය කරන ලද රු.මි. 28,912 ට සාපේක්ෂව 2021 දී 4.75% ක වර්ධනයක් වාර්තා කළේය. වසර තුළ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකයෙහි 27.42% ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ අතර ඊට ප්‍රධාන වශයෙන් රටේ පවතින වසංගත තත්ත්වයත් සමග ජීවිත රක්ෂණ ඔප්පු සඳහා ඇති ඉල්ලුම ඉහළ යාම හේතු විය.

අතරමැදියන් ලෙස රක්ෂණ තැරැව්කාර සමාගම් වර්ජන, කැරළි, සිවිල් කැළඹීම් සහ ත්‍රස්ත ක්‍රියාකාරකම් වාරික ඇතුළු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ (රු.මි. 108,760) සැලකිය යුතු දළ ලිඛිත වාරිකයක් උත්පාදනය කිරීමට දායක වී ඇත. පෙර වසරවලට සමානව 2021 වසර තුළදී දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය සඳහා රක්ෂණ තැරැව්කාර සමාග මිවල දායකත්වය ඉතා සුළු මට්ටමක පැවතිණි. තැරැව්කාර සමාගම් විසින් සපයන ලද විස්තර වලට අනුව ඔවුන් හරහා උත්පාදනය කර ඇත්තේ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ මුළු දළ ලිඛිත වාරිකයෙන් (රු.මි. 124,752) 1.45% ක් පමණි.

2021 දී රක්ෂණ තැරැව්කාර සමාගම් 34 ක් අතිරින් එක් එක් සමාගම විසින් දළ ලිඛිත වාරිකය රු.මි. 100 ඉක්මවන ලෙස ලබා ගන්නා ලද අතර මෙම රක්ෂණ තැරැව්කාර සමාගම් සාමූහිකව උත්පාදනය කළ දළ ලිඛිත වාරිකය රු.මි. 28,801 ක් විය. 30 වගුවෙහි දැක්වෙන පරිදි ඉතිරි රක්ෂණ තැරැව්කාර සමාගම් තිස් හතර විසින් රු.මි. 1,485 ක් උපයන ලදී.

මීට අමතරව, රක්ෂණ තැරැව්කාර සමාගම් ප්‍රතිරක්ෂණ තැරැව්කාර සේවා සඳහා අතරමැදියන් ලෙස ක්‍රියා කර ඇති අතර ඒ අනුව තැරැව්කාර සමාගම් කිහිපයක් 2021 වර්ෂය තුළ සැලකිය යුතු වාරික සහ කොමිස් මුදලක් එනම් රු.මි. 1,409 දක්වා රැස් කර ඇත. (2020: රු.මි. 463)

සංඛ්‍යානමය සමාලෝචනය

30 වගුව


රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා උත්පාදනය වූ දළ ලිඛිත වාරිකය - 2021

අංකය	තැරැව්කරුවාගේ නම	දළ ලිඛිත වාරික					
		දිගුකාලීන රක්ෂණය ව්‍යාපාරය		සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු		එකතුව	
		රු. (000)	වෙළඳපළ කොටස (%)	රු. (000)	වෙළඳපළ කොටස (%)	රු. (000)	වෙළඳපළ කොටස (%)
1	ඒඩීඉසඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	54,989	3.03	1,707,105	6.00	1,762,094	5.82
2	එයිටිකන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.			911,379	3.20	911,379	3.01
3	ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	130	0.01	1,043,716	3.67	1,043,846	3.45
4	ඇලියෝන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	43,697	2.41	75,850	0.27	119,547	0.39
5	අසේකි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	35	0.00	2,256,371	7.92	2,256,406	7.45
6	ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	36,714	2.03	1,669,485	5.86	1,706,199	5.63
7	ඒ එක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.			112,368	0.39	112,368	0.37
8	බිමා ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	69,991	3.86	181,631	0.64	251,622	0.83
9	සිනර්පි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	57,919	3.20	116,285	0.41	174,204	0.58
10	සීවින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	231	0.01	2,602,795	9.14	2,603,026	8.59
11	කලම්බුරේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	6,008	0.33	330,547	1.16	336,555	1.11
12	කමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	43,538	2.40	1,795,924	6.31	1,839,462	6.07
13	ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	141,106	7.79	1,373,135	4.82	1,514,241	5.00
14	ඉක්විටි ඉන්ෂුවරන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.			112,937	0.40	112,937	0.37
15	එසාපි කරිම්පි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	24,697	1.36	633,877	2.23	658,574	2.17
16	ෆෝමෝස්ට් ඉන්ෂුවරන්ස් ඇන්ඩ් රීඉන්ෂුවරන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්. බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ්	2,204	0.12	100,850	0.35	103,054	0.34
17	ජෝර්ජ් ස්ටුව(ඊ)ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	28,380	1.57	1,994,783	7.01	2,023,163	6.68
18	ග්ලෝබල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	15,859	0.88	115,881	0.41	131,740	0.43
19	අයිඅයිආර්එම් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	67,989	3.75	1,055,616	3.71	1,123,605	3.71
20	ඉන්ෂුවර්මී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	50,213	2.77	1,047,764	3.68	1,097,977	3.63
21	ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සිලෝන් ඉන්ෂුවරන්ස් ප්‍රයිවට් ලිමිටඩ්	61,544	3.40	325,860	1.14	387,404	1.28
22	මර්කන්ටයිල් ෆෝර්චූන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	28,961	1.60	929,417	3.26	958,378	3.16
23	මර්කන්ටයිල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	41,087	2.27	523,210	1.84	564,297	1.86
24	මයි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.			109,372	0.38	109,372	0.36
25	ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	86,626	4.78	1,561,137	5.48	1,647,763	5.44
26	ප්‍රයෝරිටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	156,325	8.63	105,763	0.37	262,088	0.87
27	ප්‍රෝකෙයාර් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	55,433	3.06	328,907	1.16	384,340	1.27
28	ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් අෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	82,658	4.56	564,851	1.98	647,509	2.14
29	රිලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	134,684	7.43	982,482	3.45	1,117,166	3.69
30	සේනාරත්න ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	59,309	3.27	998,275	3.51	1,057,584	3.49
31	සෙන්කඩගල ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.			850,634	2.99	850,634	2.81
32	ස්ට්‍රැටජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	49,979	2.76	119,392	0.42	169,371	0.56
33	වොලංකා ඉන්ෂුවරන්ස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	168,312	9.29	124,143	0.44	292,455	0.97
34	සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	100,585	5.55	369,959	1.30	470,544	1.55
	වෙනත් රක්ෂණ තැරැව්කාර සමාගම් (34)	**142,704**	**7.88**	**1,341,810**	**4.71**	**1,484,514**	**4.90**
	මුළු එකතුව	**1,811,907**	**100.00**	**28,473,511**	**100.00**	**30,285,418**	**100.00**

සංඛ්‍යානමය සමාලෝචනය

22 ප්‍රස්තාරය

2012 සිට 2021 දක්වා රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා උත්පාදනය වූ දළ ලිඛිත වාරිකය



	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021
දිගු කාලීන රක්ෂණය ද.ලි.වා. (රු.මි.)	195	191	158	206	263	341	655	1,095	1,422	1,812
සාමාන්‍ය රක්ෂණය ද.ලි.වා. (රු.මි.)	12,532	14,189	14,559	16,124	17,518	22,083	24,408	28,222	27,490	28,474
තැරැව්කරුවන්ගේ දායකත්වය මුළු දළ ලිඛිත වාරිකය % ලෙස	14.0	14.3	13.9	13.2	12.4	13.5	15.1	16.1	13.8	12.9

මෙහෙයුම් සමාලෝචනය

අධීක්ෂණ සමාලෝචනය

රක්ෂණ සමාගම්

1. වාර්තා පිළිබඳ සමාලෝචනය

අ) වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන හා ජීවගණකඥ වාර්තා

2017 මාර්තු 13 දින සංශෝධනය කළ නිර්ණ අංක 14 සහ 15 ප්‍රකාරව රක්ෂණ සමාගම් විසින් තම වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, අදාළ මූල්‍ය වර්ෂය අවසන් වන දින සිට සිව් මසක් ඇතුලත ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. මීට අමතරව, දීර්ඝකාලීන රක්ෂණ සමාගම් විසින් තම ජීවගණකඥ වාර්තා සහ එහි සංක්ෂිප්තයන් වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා සමග ඉදිරිපත් කළ යුතුය.

රක්ෂණ සමාගම් විසින් ඉදිරිපත් කරන ලද වාර්තා නියමිත දිනට විධිවිධාන ප්‍රකාරව ඉදිරිපත් කර ඇති දැයි අධීක්ෂණය කර ඒවායේ නිරවද්‍යතාව සහ ඒවා අදාළ නීති රීතිවලට අනුකූල වන්නේ ද යන්න පරීක්ෂා කිරීම කොමිෂන් සභාව විසින් සිදු කරන ලදී. එම වාර්තා ව්‍යවස්ථානුකූල අවශ්‍යතාවන්ගෙන් බැහැර වන අවස්ථා වලදී ඒවා නියමිත කාලයන් තුල නිවැරදි කරන ලෙස රක්ෂණ සමාගම් වෙත උපදෙස් ලබා දෙන ලදී. අවශ්‍ය අවස්ථාවලදී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් පසු විපරම් කටයුතු ද සිදු කරන ලදී. එමෙන්ම ඉදිරිපත් කරන ලද වාර්තා සමාලෝචනය කිරීමේ දී නිරීක්ෂණය කරන ලද ඇතැම් කරුණු ක්ෂේත්‍රගත විමර්ශන අතරතුර දී අවධානයට ලක් කරන ලදී.

ආ) රක්ෂණ සමාගම් සහ සමූහයේ මූල්‍ය අවදානම තක්සේරු කිරීම

සෑම රක්ෂණ සමාගමක් ම තම සමාගමේ අවදානම් තක්සේරු කිරීමේ වාර්තා වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තාවන්හි කොටසක් ලෙස කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුවේ. ඒ අනුව අදාළ වර්ෂයේ දී එක් එක් සමාගමෙහි මෙහෙයුම් කටයුතුවල සමාලෝචනයන් ලබා ගැනීම උදෙසා ආයතනික ව්‍යුහය හා හිමිකාරත්වය, ව්‍යාපාර පැතිකඩ, ජ්‍යෙෂ්ඨ කළමනාකරණය, අලෙවිකරණය සහ බෙදාහැරීම් කටයුතු, හිමිකම් පරිපාලනය, අවදානම් කළමනාකරණය ආදී අංශ පිළිබඳ තොරතුරු පරීක්ෂා කර බලන ලදී.

ඇ) ප්‍රතිරක්ෂණ කටයුතු

පනතේ 31 (1) වගන්තිය ප්‍රකාරව අනුකූලතාව දැක්විය යුතු කොන්දේසි හා නියමයන් අනුව රක්ෂණ සමාගම් විසින් ඔවුන්ගේ ප්‍රතිරක්ෂණ ගිවිසුම් 2021 මාර්තු 15 හෝ එදිනට පෙර ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත භාර දිය යුතුය. කොවිඩ් 19 වසංගත තත්වය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යය හරහා එම වාර්තා ලබාගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත. තවද, සියළු රක්ෂණකරුවන් විසින් එළඹුණු අතිරේක (Facultative) ප්‍රතිරක්ෂණ ආවරණ පිළිබඳ තොරතුරු සෑම කාර්තුවක් සඳහා ම ඉදිරිපත් කළ යුතුවේ.

කොමිෂන් සභාව එම වාර්තා සමාලෝචනය කරන ලද අතර නියමිත කාල සීමාවන් තුළ නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම සඳහා, නිරීක්ෂණය කෙරෙන ව්‍යවස්ථානුකූල අවශ්‍යතාවන්ගෙන් බැහැර වන අවස්ථා අදාළ රක්ෂණ සමාගම් වෙත දැනුම් දෙනු ලැබිණි.

ඈ) කාර්තුමය වාර්තා

පනතේ විධිවිධාන ප්‍රකාරව සියළු රක්ෂණ සමාගම් එක් එක් කාර්තුව අවසන් වී දින 45ක් ඇතුළත සිය කාර්තුමය වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ.

2021 වර්ෂය තුළ ඉදිරිපත් කරන ලද කාර්තුමය වාර්තා එක් එක් සමාගමේ කාර්යසාධනය නිර්ණය කිරීම උදෙසාත් පනතේ අදාළ නීති රීති රෙගුලාසිවලට අනුකූල වන ලෙස ඉදිරිපත් කර ඇති ද යන්න පරීක්ෂා කර බැලීම සඳහාත් සමාලෝචනය කරන ලදී.

එක් එක් සමාගමෙහි මූල්‍ය තත්වයන් කාර්තුමය වාර්තා පදනම් කර ගනිමින් නිරන්තරව නිරීක්ෂණය කරනු ලැබූ අතර මෙහි දී වත්කම් හා බැරකම් තත්වය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය, ද්‍රවශීලීතාවය සහ අනෙකුත් අවදානම් සහිත අංශ පිළිබඳ විශේෂ අවධානය යොමු කරන ලදී. එකී කාර්තුමය වාර්තාවන් සමාලෝචනය කිරීමේ දී නිරීක්ෂණය කරන ලද විෂමතාවන් නීති රීති රෙගුලාසිවලින් බැහැරවීම් සහ අනෙකුත් වෙනස්කම් නියමිත කාලයන් තුළ නිවැරදි කිරීමට අදාළ සමාගම් වෙත උපදෙස් ලබා දුනි.

රක්ෂණ සමාගම් වල කාර්තුමය කාර්ය සාධනය ඇගයීම සඳහා කොමිෂන් සභාව විසින් දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය සඳහා වන වාරික ආදායම, දළ ලාභය සහ ශුද්ධ ලාභය පදනම් කරගන්නා ලදී. තවද, රක්ෂණකරුවන්ගේ සමාගම් වල කාර්යසාධනය ඇගයීම සඳහා ලාභදායීත්වය, වත්කම් හා හිමිකම් පදනම් කර ගනිමින් අනුපාත විශ්ලේෂණය ආදිය සිදු කරන ලදී. එක් එක් සමාගමෙහි අනුපාතයන් රක්ෂණ කර්මාන්තයේ සාමාන්‍යයන් සමග සැසඳීම පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශකයක් ලෙස යොදා ගන්නා ලදී.

සෑම රක්ෂණ සමාගමක්ම පනතේ විධිවිධාන සහ රීති සපුරාලන බවටත් 2006 අංක 06 දරණ මූල්‍ය ගනුදෙනු විධිවිධාන පනතට අනුකූල වී ඇති බවටත් සහතික කිරීම සඳහා වාර්තා දෙකක් සෑම කාර්තුවක ම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

ඉ) මාසික වාර්තා

2021 වර්ෂය තුලදී එක් සමාගමක විටින් විට වාර්තා වූ නියාමන අවශ්‍යතා වලින් බැහැරවීම මත පදනම්ව එම සමාගමේ ව්‍යවස්ථාමය වාර්තා, මූල්‍ය ප්‍රකාශන, අවදානම් පාදක ප්‍රාග්ධන තත්වය ආදිය ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදී. ඒ අනුව, මූල්‍ය තත්වය පනතේ විධිවිධාන සහ නීති හා රෙගුලාසිවලට අනුකූල වන්නේදැයි

අධීක්ෂණ සමාලෝචනය

තහවුරු කර ගැනීම සඳහා කොමිෂන් සභාව විසින් එම සමාගම ඉදිරිපත් කළ මාසික වාර්තා සමාලෝචනය කරන ලදී.

2. නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධන) රීති ප්‍රකාර අනුකූලතාවය අධීක්ෂණය කිරීම

2015 දී ප්‍රකාශිත නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධන) රීති නියමයන්ට අනුව සෑම සාමාන්‍ය සහ දිගුකාලීන රක්ෂණ සමාගමක් ම අවම ප්‍රාග්ධන ප්‍රමාණ්‍ය අනුපාතය සහ අවම පූර්ණ පවත්නා ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරාලිය යුතු අතර එම ගණනය කිරීම් මාසික, කාර්තුමය සහ වාර්ෂික වාර්තා සමග කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කරනු ලබන වාර්තා කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරනු ලබන අතර අවදානම් පාදක ප්‍රාග්ධන නියමයන්ට දක්වන අනුකූලතාවය විශ්ලේෂණය කරනු ලබයි. අවදානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සපුරා නොමැති අවස්ථාවල දී සහ ගණනය කිරීම් සාවද්‍ය වන අවස්ථාවල දී නියම කරන ලද කාලයක් ඇතුළත අනුකූලතාවයන් සපුරා ගන්නා ලෙස සහ නිවැරදි කර නැවත ඉදිරිපත් කරන ලෙස අදාළ රක්ෂණ සමාගම් වෙත කොමිෂන් සභාව විසින් උපදෙස් ලබා දෙනු ලැබේ.

3. ආයෝජන පිරිවිතරයන්ට අනුකූල වීම නිරීක්ෂණය කිරීම

අ) රජයේ සුරැකුම්පත්වල ආයෝජනය

සියළු ම රක්ෂණ සමාගම් තම රක්ෂණ අරමුදල්වලින් කොටසක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතුය. පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව තාක්ෂණික සංචිත වත්කම් වලින් 20% ට නොඅඩු ප්‍රමාණයක් සහ දිගුකාලීන රක්ෂණ අරමුදලේ වත්කම්වලින් 30% ට නොඅඩු ප්‍රමාණයක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතුය. රක්ෂණ සමාගම් විසින් එකී විධිවිධානවලට අනුකූලව කටයුතු කර ඇත්දැයි යන්න ඔවුන් විසින් සපයනු ලබන මාසික, කාර්තුමය සහ වාර්ෂික වාර්තා හා අදාළ ලේඛන මත පදනම්ව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අධීක්ෂණය කරනු ලබයි.

කොමිෂන් සභාව මගින් නිරීක්ෂණය කරනු ලබන ද දෝෂ සහ නියාමන අවශ්‍යතාවන්ගෙන් බැහැර වීම් නියම කරනු ලබන කාල සීමාවන් තුළ නිවැරදි කරන ලෙස අදාළ ආයතන වෙත දැනුම් දෙනු ලැබේ.

ආ) නිර්ණය අංක 1 අනුව කෙරෙන අනෙකුත් ආයෝජන

2011 මාර්තු 1 දින දරණ විධාන අංක 01 සහ පසුව කළ සංශෝධනවලට අදාළ වන පරිදි සියළු ම රක්ෂණ සමාගම් තමන්ගේ තාක්ෂණික සංචිතයන්හි ශේෂව පවතින වත්කම් හා දිගුකාලීන රක්ෂණ අරමුදලේ ශේෂව පවතින වත්කම් ආයෝජනය කළ යුතුය. රක්ෂණ සමාගම් නිර්ණය අංක 01ට අනුකූලව කටයුතු කරන්නේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා ඔවුන්ගේ තාක්ෂණික සංචිතයන්ගේ සහ දිගුකාලීන රක්ෂණ අරමුදලේ ආයෝජන විස්තර මාසික, කාර්තුමය සහ වාර්ෂික වාර්තා පදනම්න් කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරනු ලබයි.

වර්ෂය තුළ දී කොමිෂන් සභාව විසින් එක් රක්ෂණ සමාගමකට අදාලව නිර්ණය අංක 01 හි අවශ්‍යතාවන්ට අනුකූල නොවීම සහ ඉන් බැහැර වීම් නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව, නිර්ණය අංක 01ට අනුකූල වීම සඳහා වහාම අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කරන ලෙස එම සමාගම වෙත දැනුම් දෙන ලදී. පසුව එම සමාගම විසින් අදාළ නිවැරදි කිරීම් සිදු කර නිර්ණය අංක 01ට අනුකූල වන ලදී.

4. නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධන) රීති මත බලාත්මක උපාය මාර්ග

යම්කිසි රක්ෂණ සමාගමක් අවදානම් පාදක ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය පවත්වා ගැනීමට අපොහොසත් වුවහොත් කොමිෂන් සභාව එම සමාගමට අදාළ රීතිවලට අනුකූල වීම සඳහා අවශ්‍ය නිවැරදි ක්‍රියාමාර්ග, අවදානම් පාදක ප්‍රාග්ධනය මත බලාත්මක උපාය මාර්ග අනුව සම්පාදනය කරන ලෙස දැනුම් දෙනු ලැබේ. මෙහි අරමුණ වන්නේ ගැටළු සහගත රක්ෂණ සමාගම් මුල් අවධියේදී ම හඳුනාගැනීම සහ එම තත්වයන් පාලනය කිරීමට ප්‍රායෝගික හා ඵලදායී පිළියම් යෙදීමයි. මෙමගින් අදාළ රක්ෂණ සමාගම්වල මූල්‍ය තත්වය හෝ ණය ගෙවීමේ හැකියාව සැලකිය යුතු ලෙස පහළ යාමට පෙර තම අධීක්ෂණ මැදිහත් වීම් ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාවට ඉඩ සැලසෙන අතර ඇති විය හැකි අර්බුධකාරී තත්වයන් මගහරවා ගැනීමට හැකිවේ. වර්ෂය තුළ දී සමාගම් දෙකක් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය 120% සහ 160% අතර වාර්තා කළ අතර එම සමාගම් බලාත්මක උපාය මාර්ගය යටතේ වන අවශ්‍යතාවන්ට අනුකූල විය යුතු විය.

5. ක්ෂේත්‍රගත විමර්ශන

2021 වර්ෂය තුළ කොවිඩ් - 19 හේතුවෙන් ඵල්ල වූ කැපී පෙනෙන බාධාවන් නිසා අධීක්ෂණ අංශය විසින් රක්ෂණ සමාගම්හි ක්ෂේත්‍රගත විමර්ශන සිදු කිරීම තාවකාලිකව කල් දමන ලදී. කෙසේ වෙතත්, අංශය මගින් 2021 වර්ෂයේ මුල් භාගයේ දී දුරස්ථ පරීක්ෂණ දෙකක් සම්පූර්ණ කරන ලදී. මෙම විමර්ශනයේ අරමුණ වූයේ ආයෝජන, ව්‍යවසාය අවදානම් කළමනාකරණය, මූල්‍ය තත්වය ආදී සමාගම් හි ප්‍රධාන ක්ෂේත්‍ර ඇගයීමයි. ක්ෂේත්‍රගත විමර්ශනවල දී සිදු කරන ලද නිරීක්ෂණ, වැඩිදියුණු විය යුතු ක්ෂේත්‍ර සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නිර්දේශ ද සමග රක්ෂණ සමාගම් වෙත දන්වන ලදී.

6. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත තොරතුරු ඉදිරිපත් කිරීම

කොමිෂන් සභාව විසින් කාර්තුමය වාර්තා මගින් එක් රැස් කර ගත් සංඛ්‍යානමය සහ අනෙකුත් තොරතුරු

අධීක්ෂණ සමාලෝචනය

පදනම්ව, රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය පිළිබඳ මූල්‍ය තොරතුරු, කාර්තුමය පදනමකින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථායීතා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීය.

7. මුදල් අමාත්‍යාංශය වෙත ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම

අධීක්ෂණ අංශය විසින් අත්කර ගත් ප්‍රගතිය පිළිබඳ කාර්තුමය වාර්තාවක් සකස් කර මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කෙරිණි. මෙමගින් වසර තුළ අංශය මගින් සිදු කරන ලද අධීක්ෂණ කටයුතු ආවරණය කරනු ලැබේ.

8. රක්ෂණ කර්මාන්තයේ අත්පොත - 2020

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සකස් කිරීම සඳහා ඉදිරිපත් කරන විගණිත මූල්‍ය ප්‍රකාශන සහ සංඛ්‍යාලේඛන මත පදනම්ව අංශය විසින් රක්ෂණ කර්මාන්තයේ අත්පොත - 2020 සකස් කරන ලදී. ඒ අනුව, රක්ෂණ කර්මාන්තයේ අත්පොත, කර්මාන්තයට අදාළ සංඛ්‍යාලේඛන සහ සමාගම් අනුව ශේෂ පත්‍ර, ආදායම් ප්‍රකාශන, වත්කම් සංකේන්ද්‍රණය ආදියෙන් සමන්විත වේ. එය ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවියෙහි ද පළ කරන ලදී.

9. අවදානම් මෙවලම

වාර්ෂික හා කාර්තුමය වාර්තා හරහා රක්ෂණ සමාගම් විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය හා වෙනත් තොරතුරු මත පදනම්ව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් පූර්ව අනතුරු හැඟවීමේ යාන්ත්‍රණයක් ලෙස, එක් එක් සමාගමේ ප්‍රධාන අවදානම් හඳුනා ගැනීම සඳහා අභ්‍යන්තර අවදානම් මෙවලමක් සකස් කරන ලදී. අවදානම් ප්‍රරේඛනය ප්‍රධාන වශයෙන් මූල්‍ය තත්වය සහ අනුකූලතා දෘෂ්ඨිකෝණය මත පදනම්ව ජීවිත හා සාමාන්‍ය රක්ෂණ සමාගම් සඳහා වෙන වෙනම බාණ්ඩගත කළ අතර පසුව එක් එක් සමාගමේ අවදානම් තක්සේරු කිරීමේ වාර්තාවන් මූලික කරගනිමින් එය තවදුරටත් යාවත්කාලීන කරන ලදී. සලකා බලන ලද ප්‍රධාන මූල්‍ය නිර්ණායකයට ප්‍රාග්ධනය, වත්කම්, ලාභදායීතාව, වෙළඳපළ කොටස ආදිය ඇතුළත් වන අතර අනුකූලතා දෘෂ්ඨිකෝණයට, නුබුන්වත් අවශ්‍යතාවන්ට, ප්‍රතිරක්ෂණ නියමයන් හා කොන්දේසි, නිර්ණය 1 ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් ආදියට අනුකූල වීම ඇතුළත් වේ.

ඒ අනුව, ලබා ගන්නා ලකුණු මත පදනම්ව රක්ෂණ සමාගම් "ඉහළ", "මධ්‍යම" හා "පහළ" අවදානම් සමාගම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මින් පෙර සඳහන් කළ අවදානම් බාණ්ඩ අනුව අදාළ රක්ෂණ සමාගම් වර්ගීකරණය කිරීම සඳහා අංශය විසින් වාර්ෂික කාර්යසාධනය යොදා ගනු ලැබේ. අංශය විසින් "ඉහළ අවදානම්" සමාගම් ලෙස වර්ගීකරණය කෙරෙන රක්ෂණ සමාගම්වල කාර්යසාධනය දැඩිව අධීක්ෂණය කරනු ලැබේ. අවදානම් පාදක ප්‍රවේශය සැලකීමේ දී සමාගම්වලට නිශ්චිත වූ නියාමන අවශ්‍යතාවන් සහ අධීක්ෂණයේ මැදිහත්වීම රක්ෂණකරුගේ අවදානම් ලකුණු ප්‍රමාණය අනුව වෙනස් වනු ඇත.

10. මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී ක්‍රියා සඳහා මුදල් සැපයීම වැළැක්වීම (AML/CEP)

අ) ක්ෂේත්‍රගත විමර්ශන

2006 අංක 6 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 18 වන වගන්තිය සමග කියවන 15(1) (ඉ) වගන්තියේ දක්වා ඇති නෛතික හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව රක්ෂණ සමාගම් විසින් ගනුදෙනුකරුවන්ගේ යථායෝගී ඊති ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්නේ ද යන්න අධීක්ෂණය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය (FIU) සමග එක්ව දුරස්ථ විමර්ශන තුනක් පවත්වන ලදී. නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා විමර්ශනවලදී සිදු කළ නිරීක්ෂණයන් පිළිබඳ අදාළ රක්ෂණකරුවන් දැනුවත් කෙරිණි.

ආ) අවදානම් මෙවලම

2006 අංක 6 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයේ සහය ඇතිව සියළු ජීවිත රක්ෂණ සමාගම් මුදල් විශුද්ධිකරණයට ලක් වීමේ අවදානම් ඇගයීම ආරම්භ කර ඇති අතර මුදල් විශුද්ධිකරණ විරෝධී/ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීමේ අවදානම නිර්ණය කිරීම සඳහා මෙවලමක් ද සකස් කර ඇත.

ඒ අනුව, රක්ෂණ ඔප්පු වර්ග, රක්ෂණ ඔප්පු හිමියන්, PEPs, බෙදා හැරීමේ මාර්ග, ඒකාබද්ධ පාලනය, ප්‍රතිපත්ති සහ ක්‍රියාපරිපාටීන්, අවදානම් කළමනාකරණය, සේවක යථායෝගී බව, අනුකූලභාවය සහ අභ්‍යන්තර පාලනයන් ආදී කරුණු පිළිබඳ එක් එක් සමාගමට අදාළ තොරතුරු රැස් කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ජීවිත රක්ෂණ සමාගම් අතර ප්‍රශ්නාවලියක් බෙදා හරින ලදී. මෙම තොරතුරු මත පදනම්ව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ජීවිත රක්ෂණ සමාගම්හි මුදල් විශුද්ධිකරණ විරෝධී/ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීමේ අවදානම නිර්ණය කිරීම සඳහා වන මෙවලම යාවත්කාලීන කර 2022 වසර සඳහා සමීපව අධීක්ෂණය කරන ලදී.

ඇ) මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම පිළිබඳ ජාතික අවදානම් තක්සේරු කිරීම

2021 වර්ෂය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි අංශය (FIU) මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම පිළිබඳ ජාතික අවදානම් තක්සේරුව යාවත්කාලීන කිරීමට අදාළ කටයුතු ආරම්භ කරන ලදී. මේ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව,

අධීක්ෂණ සමාලෝචනය

මූල්‍ය බුද්ධි අංශය සහ රක්ෂණ අංශයේ සාමාජිකයින් නියෝජනය කරන ක්‍රියාකාරී කණ්ඩායම රක්ෂණ අංශයට අදාළව මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම අවදානම තක්සේරු කිරීමට අවදානම් තක්සේරු කිරීමේ මොඩියුලයට අනුකූලව ප්‍රශ්නාවලියක් සකස් කරන ලදී. ඒ අනුව, එය සියළුම රක්ෂණ සමාගම් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු රැස් කර, අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා මූල්‍ය බුද්ධි අංශය වෙත යොමු කරන ලදී.

11. රක්ෂණ කර්මාන්තයේ ක්‍රියාකාරිත්වයට සහ ව්‍යාපාර අඛණ්ඩව සිදු කරගෙන යාම කෙරෙහි කොවිඩ් - 19 වසංගතයේ බලපෑම

බොහෝමයක් රක්ෂණ අධීක්ෂකවරුන් මෙන්ම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ද කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ඇති වූ මහත් අවිනිශ්චිතතාවන් මධ්‍යයේ ව්‍යාපාර කරගෙන යාමට සහ රක්ෂණ ඔප්පු හිමියන්ට නම්‍යශීලව කටයුතු කිරීම සඳහා නියාමන ක්‍රියාමාර්ග ගන්නා ලදී.

ශ්‍රී ලංකා රක්ෂණ කොමිසම විසින් සියලුම රක්ෂණ සමාගම් වලට පහත වාර්තා මාසිකව කොමිසම වෙත යොමු කරන ලෙස නියෝග කරනු ලැබිණි.

(අ) ප්‍රාග්ධන ප්‍රමාණ්‍ය අවශ්‍යතාවල තත්වය. උදා: පූර්ණ පවත්නා ප්‍රාග්ධනය, නියමිත අවදානම් ප්‍රාග්ධනය, පවාරණ වටිනාකම් ප්‍රාග්ධනය සහ ප්‍රාග්ධන ප්‍රමාණ්‍ය අනුපාතය.

(ආ) නිර්ණය අංක 1 හි අවශ්‍යතාවයන්ට අනුකූල වන බවට ප්‍රධාන නිලධාරියා සහතික වීම සහ එසේ නොමැති නම් සමාගමේ ප්‍රධාන නිලධාරියා විසින් අදාළ විස්තර ලබා දිය යුතු වීම.

ඒ අනුව, 2021 වර්ෂය තුළ ඉදිරිපත් කරන ලද මාසික තත්වයන් පිළිබඳ වාර්තා අදාළ අවශ්‍යතාවයන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරන ලදී. තවද, අවදානම් පාදක ප්‍රාග්ධන රීති සහ නිර්ණය අංක 1 ට අනුව කටයුතු කිරීමේ දුෂ්කරතා ඇති සමාගම් සඳහා බලාත්මක කිරීමේ උපාය මාර්ග යට අදාළව අංශය විසින් අදාල ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇත.

12. යෝජිත ලාභාංශ බෙදාහැරීම

2021 මාර්තු 10 සහ 2021 අගෝස්තු 30 දිනැති තීරණ (සංශෝධිත) "ලාභාංශ ප්‍රකාශනය සහ බෙදාහැරීම" ප්‍රකාරව, සියලුම රක්ෂණ සමාගම් විසින් 1 වන යොමුව මගින් නියම කර ඇති නියමයන් සහ කොන්දේසි මත පදනම්ව ලාභාංශ ප්‍රකාශ කිරීමට අවශ්‍ය වේ. තවද කොටස්කරුවන් සඳහා ලාභාංශ ප්‍රකාශයට පත් කිරීමට අවම වශයෙන් සති 2 කට පෙර රක්ෂණ සමාගම්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දක්වා ඇති සියලුම නියමයන් සහ කොන්දේසි සලකා බලා ඇති බවට තහවුරුවක් ඉදිරිපත් කළ යුතු අතර යෝජිත ලාභාංශ අගය සඳහන් කරමින් අත්සන් කළ යුතුය.

රක්ෂණ තැරැව්කාර සමාගම්

1. කාර්තුමය වාර්තා, අතුරු මූල්‍ය ප්‍රකාශන සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම

2010 පෙබරවාරි 25 දින අංක 1642/16 දරණ ගැසට් නිවේදනයේ (පළමු උපලේඛනය) ප්‍රකාරව සියළු රක්ෂණ තැරැව්කාර සමාගම් ඔවුන්ගේ කාර්තුමය වාර්තා එක් එක් කාර්තුව අවසන් වී දින හතළිස් පහක් ඇතුළත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ.

2021 වර්ෂය තුළ දී රක්ෂණ තැරැව්කාර සමාගම් බහුතරයක් විසින් නියමිත දිනට තම කාර්තුමය වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. සමාගම් විසින් ඉදිරිපත් කරන ලද කාර්තුමය වාර්තා වීම සමාගම්වල මූල්‍ය තත්වය, කාර්යසාධනය සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූල වීම ආදිය ඇගයීම සඳහා කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරන ලදී. එහි දී කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලද දෝෂ හෝ නියාමන අවශ්‍යතාවයන්ගෙන් බැහැර වීම් පැහැදිලි කිරීම් සහ නිවැරදි කිරීම් සඳහා අදාළ තැරැව්කාර සමාගම් වෙත සන්නිවේදනය කෙරිණි.

රක්ෂණ තැරැව්කාර සමාගම් සිය විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 86 (2) වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 06ක් ඇතුළත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුවේ. ඉදිරිපත් කරන ලද විගණිත මූල්‍ය ප්‍රකාශන කොමිෂන් සභාව විසින් සමාලෝචනය කළ අතර මූල්‍ය ප්‍රකාශන රෙගුලාසිම අවශ්‍යතාවයන්ගෙන් බැහැරව තිබූ අවස්ථාවලදී, ඒවා පැහැදිලි කිරීම් හා නිවැරදි කිරීම් සඳහා අදාළ රක්ෂණ තැරැව්කාර සමාගම් වෙත උපදෙස් දෙන ලදී.

2. ලියාපදිංචිය අළුත් කිරීම

2022 වර්ෂය සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලියාපදිංචිය අළුත් කිරීම සඳහා අයදුම්පත් ලැබිණි. බලපත්‍ර අලුත් කිරීමට පෙර ඔවුන්ගේ මූල්‍ය තත්වය අවබෝධ කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් එම සමාගම් වල විගණිත මූල්‍ය ප්‍රකාශන හා කාර්තුමය වාර්තා විශ්ලේෂණය කරන ලදී.

3. නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචි කිරීම

වසර තුළ දී රක්ෂණ තැරැව්කාර සමාගම් ලෙස ලියාපදිංචිය ලබා ගැනීමට යෝජිත රක්ෂණ තැරැව්කාර සමාගම් වෙතින් අයදුම්පත් ලැබිණි. ලියාපදිංචිය සඳහා නිර්දේශ කිරීමට පෙර ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් විකුණුම් හා මූල්‍ය පුරෝකථනයන්, සංවිධාන සටහන, පවතින යටිතල පහසුකම් හා බාහිර විගණකගේ සහතිකය ඇතුළුව අයදුම්කරුගේ ව්‍යාපාර සැලැස්ම විශ්ලේෂණය කරන ලදී.

නියාමන සමාලෝචනය

රක්ෂණ සමාගම් ලියාපදිංචි කිරීම

මෙම වසර තුළ කොමිෂන් සභාව විසින් නව ලියාපදිංචි කිරීම් ප්‍රදානය කර නොමැත. ඒ අනුව, ලියාපදිංචි රක්ෂණ සමාගම් ගණන 28ක් වන අතර ඒ අතරින් එක් රක්ෂණ සමාගමක් රක්ෂණ ව්‍යාපාර කටයුතු නවතා දැමීම සඳහා ඈවර කිරීමේ ක්‍රියාවලියෙහි නිරත වී සිටියි.

පරිශිෂ්ඨය I: කොමිෂන් සභාවේ ලියාපදිංචි වී සිටින සියළු රක්ෂණ සමාග මිවල නාම ලේඛණය සහ ඒ රක්ෂණ සමාගම් සඳහා අවසර ලබා දී ඇති රක්ෂණ ව්‍යාපාර පන්තිය/ පන්ති දැක්වේ.

බලාත්මක කිරීමේ ක්‍රියාවලිය

රක්ෂණ සමාගම්

අත්හිටුවීම්

2009 වසරේ දී සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් සම්බන්ධයෙන් පනවන ලද අත්හිටුවීම 2021 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් විසින් නීතිමය කටයුතුවලට අදාළ හිමිකම් පෑම් කිහිපයක් හැර සියළු හිමිකම් පෑම් නිරවුල් කර තිබුණ ද සමාග මට එරෙහිව තවමත් විභාග වෙමින් පවතින නඩුකරයන් නිසා අදාළ හිමිකම් නිරවුල් කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට නොලැබිණි.

පනතේ 18 (1) වගන්තිය ප්‍රකාරව රක්ෂණකරුවකුගේ ලියාපදිංචි කිරීම, වෙනත් කරුණු අතර කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන ණය ගෙවීමේ හැකියාව පිළිබඳ සීමාව පවත්වා ගෙන යාමට අසමත් වීම සහ පනතේ යම් විධිවිධානයක් හෝ එය යටතේ කොමිෂන් සභාව විසින් පනවන ලද යම් කොන්දේසියක් හෝ දෙන ලද යම් විධානයක් කඩ කර තිබීම හේතුවෙන් සම්පූර්ණයෙන් ම හෝ රක්ෂණ ව්‍යාපාරයේ එක්තරා පන්තියක් හෝ උප පන්තියක් සම්බන්ධයෙන් අවලංගු කරනු ලැබිය හැකිය.

විධානයන්

1. රක්ෂණකරුවෙකුගේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අතුරු ලාභාංශ ඇතුළුව ලාභාංශ ප්‍රකාශ කිරීමේදී සහ බෙදා හැරීමේදී සලකා බැලිය යුතු නියමයන් සහ කොන්දේසි නියම කරමින් කොමිෂන් සභාව විධානයක් නිකුත් කර ඇත. තවද, ලාභාංශ ප්‍රකාශ කිරීමට සති දෙකකට පෙර රක්ෂණකරුගේ අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන නිලධාරියා විසින් සහතික කරන ලද අනුකූලතා තහවුරු කිරීමක් ඉදිරිපත් කිරීමට එකී විධානය පරිදි අවශ්‍ය වේ.

   එකී විධානයේ 1 (ආ) අයිතමයට අනුව ලාභාංශ ප්‍රකාශ කිරීමට සැලසුම් කරන සියලුම රක්ෂණකරුවන් විසින් සියලු අවිනිශ්චිත වගකීම් සම්පූර්ණයෙන් සපයා ඇති බව උපකල්පනය කරමින් මූල්‍ය තත්වය හා නුබුන්වත් බව කෙරෙහි වන බලපෑම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත පෙන්වීමට අවශ්‍ය වේ. එසේම කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි කොටස් හිමියන්ට ලාභාංශ ගෙවන ලද බවද පෙන්වීමට අවශ්‍ය වේ.

   කෙසේ වෙතත්, විධානයේ 1 (ආ) අයිතමයේ ප්‍රධාන වශයෙන් "සියලු අවිනිශ්චිත වගකීම් සම්පූර්ණයෙන්ම ප්‍රතිපාදන කර ඇත" යන්න රක්ෂණ කර්මාන්තය තුළින් මතු වූ ඉල්ලීම් සැලකිල්ලට ගෙන පහත සඳහන් අයිතමය ආදේශ කිරීම මගින් සංශෝධනය කිරීමට කොමිෂන් සභාව විසින් විධානයක් නිකුත් කර ඇත.

   i. සමාගම විසින් අසම්භාව්‍ය බැරකම් පිළිබඳ තීරණ ගනු ලැබ ඇත්තේ පුළුල් රාමුවක් මත පදනම් වූ නිසි පරීක්ෂාවකින් පසුව සහ සමාගමේ මූල්‍යමය සහ වගකීම් තත්ත්වයෙහි තිරසාරභාවයට අදාළව ඒ හා සම්බන්ධ අවදානම තක්සේරු කිරීමෙනි.

   ii. කොටස් හිමියන්ට ගෙවීමට යෝජිත ගෙවීම් සලකා බැලීමේදී මූල්‍ය සහ නුබුන්වත් තත්ත්වය කෙරෙහි බලපෑම. අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීමට රක්ෂණකරුවන් යටත් වේ.

2. කොමිෂන් සභාව විසින් සියලුම රක්ෂණකරුවන්ට සහ තැරැව්කරුවන්ට කේත ලබාදීම සහ කේත වෙනස් කිරීම කෙරෙහි සීමාවක් පනවමින් විධානයක් නිකුත් කර ඇත. එකී විධානයට අනුව රක්ෂණ තැරැව්කරුවන්ට සහ රක්ෂණ නියෝජිතයින්ට පමණක් කේත සැපයීමට රක්ෂණකරුවන්ට අවසර දී ඇති අතර තැරැව්කරුවන් කේත ලබා දීම කළ යුත්තේ රක්ෂණ නියෝජිතයින්ට පමණි. බැංකු, මූල්‍ය සහ ලීසිං සමාගම් වෙත කේත ලබාදීමේ දී සමාගම් වෙත තවදුරටත් සීමා පනවා ඇත. තවද, තැරැව්කරුගේ හෝ රක්ෂණ නියෝජිතයාගේ ලිඛිත අවසරයකින් තොරව පවතින කේත වෙනස් කිරීමේදී රක්ෂණකරුවන් වෙත සීමා පනවා ඇත. කෙසේ වෙතත්, ඔප්පු හිමියා වර්තමාන නියෝජිතයා හෝ තැරැව්කරු වෙනස් කිරීමට කැමති නම් එහිදී ලිඛිත අනුමැතිය අදාළ නොවේ.

3. රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී ඇති පුද්ගලයින්ට (රක්ෂණකරුවන්, තැරැව්කරුවන් සහ අලාභ ගැලපුම්කරුවන්) මූල්‍ය අවභාවිතය හෝ වංචාව යන පදනම මත සේවය අවසන් කර ඇති යම් පුද්ගලයෙකුට රැකියාව ලබාදීමෙන් වැළකී සිටින ලෙස දක්වමින් මෙතෙක් පැවති විධානයක් කොමිෂන් සභාව විසින් වර්ෂය තුළ විධානයක් සංශෝධනය කර ඇත. කෙසේ වෙතත්, පුද්ගලයෙකු සේවයෙන් පහ කිරීම රක්ෂණකරුවෙකු, තැරැව්කරුවෙකු, අලාභ ගැලපුම්කරුවෙකු විසින් සිදු කරනු ලබන අවස්ථාවක, එවැනි පුද්ගලයින් විසින් නියමිත ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීම අවශ්‍ය වේ. විශේෂයෙන් එසේ සේවයෙන් පහ කිරීම සඳහා තීරණය කිරීමට පෙර ස්වභාවික යුක්තිය පිළිබඳ මූලධර්ම පිළිපැදිය යුතුයි.

4. විදුලි සංදේශ සේවා සපයන්නන්ගේ සේවා ජාල (ජංගම දුරකථන රක්ෂණය) භාවිතය අවසන් කිරීම සහ ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් සියලුම රක්ෂණකරුවන් වෙත විධානයක් නිකුත් කිරීමට කොමිෂන් සභාව තීරණය කර ඇත.

   ජංගම සහ ස්ථාවර දුරකථන මාර්ග වැනි විදුලි සංදේශ සේවා සපයන්නන්ගේ සේවා ජාල භාවිතා කරමින් අනාගත රක්ෂණ හිමියන්ට සහ සාමාන්‍ය ජනතාවට රක්ෂණ නිෂ්පාදන විකිණීම ඉහත සඳහන් විධානය මගින් තහනම් කර ඇත. රක්ෂණකරුවන්ට තමන්ගෙ

නියාමන සමාලෝචනය

අලෙවිකරණ ශිල්පීය ක්‍රම සහ උපාය මාර්ග හරහා තම නිෂ්පාදන අලෙවි කරන ලෙස එමඟින් තවදුරටත් උපදෙස් දී ඇත. රක්ෂණ නිෂ්පාදන පිරිනැමීමට අවසර ඇත්තේ අදාළ රක්ෂණකරුවන්ගේ, තැරැව්කරුවන්ගේ හෝ රක්ෂණ නියෝජිතයින්ගේ පුහුණු නිලධාරීන්ට සහ කාර්ය මණ්ඩලයට පමණි. රක්ෂණ සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වන වගකීමක් ඇති අවස්ථාවක, විදුලි සංදේශ සේවා සපයන්නන්ගේ සේවා ජාල භාවිතයෙන් අලෙවි කර ඇති රක්ෂණ ඔප්පු අදාළ රක්ෂණ සමාගම් විසින් දරනු ලැබේ.

5. රක්ෂණකරුගේ හෝ රක්ෂණ තැරැව්කරුවකුගේ ප්‍රධාන නිලධාරියාට ප්‍රධාන විධායක නිලධාරි/කළමනාකාර අධ්‍යක්ෂ ලෙස කටයුතු කිරීම සහ සමාගමේ ව්‍යාපාරික කටයුතුවල දී සාමාන්‍ය පාලනය, මග පෙන්වීම සහ අධීක්ෂණය සම්බන්ධයෙන් ඔහු/ඇය වගකිව යුතුය යන අවශ්‍යතාවන් ඇතුළත් කරමින් වර්ෂයේදී 2016 මැයි 13 දිනැති විධාන අංක 9 සංශෝධනය කර ඇත. එම අවශ්‍යතාවය 2022 නොවැම්බර් සිට ක්‍රියාත්මක විය යුතු විය.

6. රක්ෂණකරුවෙකු වෙත නිකුත් කරන හේතුව දැක්වීමේ ලිපි පරීක්ෂා කිරීමෙන් පසු කොමිෂන් සභාවේ ස්ථිර අදහස වූයේ, රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 57 වගන්තිය ප්‍රකාරව ඔහුට චිල්ල වී ඇති චෝදනා මත පදනම්ව එම රක්ෂණකරුගේ ප්‍රධාන විධායක නිලධාරියා ඔහුගේ වත්මන් තනතුරෙන් ඉවත් නොකළ යුත්තේ මන්දැයි සතුටුදායක ලෙස සාධාරණීකරණය කිරීමට/හේතු දැක්වීමට එම රක්ෂණකරු අපොහොසත් වී ඇති බවයි. ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, එම ප්‍රධාන විධායක නිලධාරියා එම තනතුරෙන් වහාම ඉවත් කරන ලෙස කොමිෂන් සභාව රක්ෂණකරුට විසින් විධානය කරන ලදී.

7. එවැනිම තත්වයක් තුළ, රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 94 සහ 32 වගන්ති ප්‍රකාරව නිශ්චිතව නිලධාරියා ලෙස තම ව්‍යවස්ථාපිත කාර්යභාරය ඉටු කිරීමට අපොහොසත් වූ එකී නිශ්චිත නිලධාරියෙකු ඉවත් කරන ලෙසත් රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 57 වගන්තිය අනුව වහාම ක්‍රියාත්මක වන පරිදි එම තනතුරෙන් ඉවත් කරන ලෙස කොමිෂන් සභාව තවත් රක්ෂණකරුවෙකු වෙත උපදෙස් දී ඇත.

නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචි කිරීම සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලියාපදිංචිය අළුත් කිරීම

මෙම වසර තුළ රක්ෂණ තැරැව්කරුවන් ලෙස ලියාපදිංචි වීම සඳහා නව ව්‍යාපාර යෝජනා දහයක් කොමිෂන් සභාව වෙත ලැබී ඇත. කොමිෂන් සභාව විසින් වසර තුළ සමාගම් සංස්ථාගත කිරීම සඳහා පුද්ගලයන් 10 දෙනෙකු වෙත නම් සඳහා අනුමැතිය ලබා දී ඇත. කොමිෂන් සභාව විසින් මෙම වසර තුළ සමාගම් තුනකට රක්ෂණ තැරැව්කරුවන් ලෙස කටයුතු කිරීම සඳහා ලියාපදිංචිය ලබා දෙන ලදී. දැනට පවතින සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර කරගෙන යන තවත් සමාගම් දෙකකට දිගු කාලීන රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර කරගෙන යාමට ලියාපදිංචිය ලබා දෙන ලදී.

2022 වසර සඳහා ලියාපදිංචිය අළුත් කිරීමේ අපේක්ෂාවෙන් රක්ෂණ තැරැව්කාර සමාගම් 67 කින් ඉල්ලුම්පත්‍ර කොමිෂන් සභාව වෙත ලැබී තිබෙන අතර එම සමාගම් සමාගම් සියල්ල පනත යටතේ දක්වා ඇති අවශ්‍යතාවන් සම්පූර්ණ කර ඇති බැවින් ලියාපදිංචිය අළුත් කිරීම ප්‍රදානය කර ඇත.

පරිශිෂ්ඨය II: කොමිෂන් සභාවේ ලියාපදිංචි වී සිටින සියළු රක්ෂණ තැරැව්කාර සමාගම්වල නාම ලේඛණය, ඒ සඳහා අවසර ලබා දී ඇති රක්ෂණ ව්‍යාපාර පන්තිය/ පන්ති සහ ලියාපදිංචි කාල සීමාව දැක්වේ.

බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ගය

රක්ෂණ තැරැව්කාර සමාගම්

අවවාද කිරීම්

වර්ෂය තුළ සමාගම්වලට හෝ ප්‍රධාන නිලධාරීන්ට අවවාද ලිපි නිකුත් කර නොමැත.

අත්හිටුවීම්

වසර තුළ කිසිදු තහනමක් පනවා නැත.

අවලංගු කිරීම්

වසර තුළ කිසිදු අවලංගු කිරීමක් සිදු කර නැත.

අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචි කිරීම සහ අලාභ ගැලපුම්කරුවන්ගේ ලියාපදිංචිය අළුත් කිරීම

කොමිෂන් සභාව විසින් වසර තුළ දී අලාභ ගැලපුම්කරුවන් ලෙස ලියාපදිංචි වීම සඳහා පුද්ගලයන් 4 දෙනෙකුහට ලියාපදිංචිය ලබා දී ඇත. කොමිෂන් සභාව විසින් වසර තුළ දී අලාභ ගැලපුම්කරුවන් ලෙස ලියාපදිංචිය වී සිටි පුද්ගලයන් 25 දෙනෙකුගේ ලියාපදිංචිය අළුත් කරන ලදී.

පනතේ 114 (1) වගන්තිය ප්‍රකාරව "අලාභ ගැලපුම්කරු" යන්නෙන් රක්ෂණ හිමිකම් පෑමක දී උද්ගත වන අලාභ විමර්ශනය කිරීමේ සහ තක්සේරු කිරීමේ විශේෂිත දැනුමක් ඇති සහ මේ පනතේ විධිවිධාන යටතේ අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි වී ඇති තැනැත්තකු අදහස් වේ.

පරිශිෂ්ඨය III: කොමිෂන් සභාව සමඟ ලියාපදිංචි වී සිටින අලාභ ගැලපුම්කරුවන්ගේ නාම ලේඛණය සහ ලියාපදිංචිය බලාත්මක වන දිනය දැක්වේ.

නියාමන/ උපදේශන ක්‍රියාමාර්ග

1. සංශෝධිත පනත මඟින් හඳුන්වා දෙන ලද නව විධිවිධාන ප්‍රකාරව අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා රක්ෂණ සමාගම් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් ගණනාවක් සඳහා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදී. කෙසේ වුවද, යහපාලන රාමුව පිළිබඳ විධාන අංක 17ට අනුකූල නොවීම හේතුවෙන් ඉල්ලීම් කිහිපයක් අනුමත නොකරන ලදී.

2. පනතේ විධිවිධාන ප්‍රකාරව ප්‍රධාන නිලධාරීන් පත් කිරීම සඳහා රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් ගණනාවක් සඳහා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදී.

3. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව (NCRS) විසින් ප්‍රවාහන

නියාමන සමාලෝචනය

අමාත්‍යවරයාගේ ලේකම් හරහා මාර්ග ආරක්ෂණ අරමුදලට තුන්වන පාර්ශ්ව ආවරණයේ වාර්කයේ 1% ක දායකත්වය 2% දක්වා වැඩි කරන ලෙස කළ ඉල්ලීමට කොමිෂන් සභාව එකඟ වී ඇත. ඉහත වෙනස ඇතුළත් කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සහයෝගීතාවයෙන්, 2004 අංක 01 දරන මාර්ග ආරක්ෂණ අරමුදල් රෙගුලාසිය, සංශෝධනය කරන ලදී.

4. 2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා ආදායම් ප්‍රකාශයේ "අනෙකුත් මෙහෙයුම් ආදායම්" හි "ඉකුත් වූ ප්‍රතිපත්ති" යටතේ එක් රක්ෂණකරුවෙකු රුපියල් මිලියන 14 ක් වාර්තා කර ඇති අතර ඒවා රුපියල් මිලියන 2.6 ක් ඉදිරිපත් නොකළ චෙක්පත් (දිගු කාලීන හිඟ) සහ රුපියල් මිලියන 12 ක හඳුනා නොගත් තැන්පතුවලින් සමන්විත විය. මෙය 2020 ජනවාරි 08 දිනැති ලිපිය හරහා නිකුත් කරන ලද කොමිෂන් සභා අවශ්‍යතාවයට පටහැනි වී ඇති අතර රක්ෂණ සමාගම් විසින් අතිරික්ත, අත්තිකාරම්, හඳුනා නොගත් යෝජනාවක් සහ කල් ඉකුත් වූ රක්ෂණ ඔප්පු වාරික වැනි විවිධ ආකාරවලින් දළ ලිඛිත වාරික වෙත වගකීම් ශේෂයන් ලෙස හඳුනා නොගත් රක්ෂණ ඔප්පු හිමියන්ගෙන් / යෝජකයින්ගෙන් ලැබුණු වාරික තැන්පතු 2019 මූල්‍ය වර්ෂයේ සිට ආදායම් ප්‍රකාශයට ආපසු ඇතුළත් කිරීම / මාරු කිරීම තහනම් කර ඇත.

එබැවින්, රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 57 වැනි වගන්තිය ප්‍රකාරව 2020 ජනවාරි 8 වැනි දින ලිපිය මගින් දන්වා ඇති පරිදි කොමිෂන් සභා අවශ්‍යතාවයට අනුකූල වන ලෙසත් හඳුනා නොගත් තැන්පතු ශේෂ පත්‍රයෙහි දිගුකාලීන රක්ෂණ අරමුදල යටතේ වගකීමක් ලෙස ආපසු හරවා පවත්වාගෙන යාමටත් කොමිෂන් සභාව විසින් එම රක්ෂණකරුට විධානය කර ඇත.

5. කොමිෂන් සභාව විසින් රක්ෂණ තැරැව්කාර සමාගම්වල කාර්තුමය ප්‍රතිලාභ ආකෘතිය සංශෝධනය කරන ලද අතර සංශෝධිත ආකෘතිය 2021 මාර්තු 31 දිනෙන් අවසන් වන කාර්තුවේ සිට බලාත්මක විය.

6. එක් රක්ෂණකරුවෙකු විසින් කරන ලද ඉල්ලීම සලකා බැලූ කොමිෂන් සභාව කොන්දේසිවලට යටත්ව සෙලාන් බැංකුව වෙතින් රුපියල් මිලියන 200 ක ණය පහසුකමක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමට එකඟ වීමට තීරණය කළේය.

7. 2015 ඔක්තෝබර් 13 දිනැති ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ලිපියේ අංක 1 අයිතමය සමග කියවන කාණ්ඩයට අනුමැතිය ලබා දුන් 2019 පෙබරවාරි 28 දිනැති ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ලිපියේ අංක VI කොන්දේසිය සමාලෝචනය කළ කොමිෂන් සභාව විසින් එක් රක්ෂණකරුවෙකු විසින් රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත සහ එහි අනු නීති යටතේ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නියම කර ඇති සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතා සපුරාලීමට යටත්ව, රෙපෝ (REPO) ඉල්ලීම කල්පිරීමේ සිට එහි ඒකාබද්ධ වෙළඳ සමාගමේ ණයකරවල මිලියන 90ක් ආයෝජනය කිරීම සඳහා වන ඉල්ලීම අනුමත කරන ලදී.

8. චක්‍රලේඛ අංක 36 ප්‍රකාරව විදේශීය සෞඛ්‍ය රක්ෂණයන් අළුත් කිරීම සඳහා වන රක්ෂණ තැරැව්කරුවන් ගණනාවකගේ ඉල්ලීම් සමාලෝචනය කරන ලදුව කොමිෂන් සභාව විසින් ඔවුන්ට බලය හිමිවන කාල සීමාව තවත් වසරක් සඳහා අළුත් කරන ලදී.

විදේශ සෞඛ්‍ය රක්ෂණාවරණයක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන ඕනෑම රක්ෂණ තැරැව්කාර සමාගමක් තමන් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන රක්ෂණය සඳහා කොමිෂන් සභාව වෙතින් අනුමැතිය ලබා ගත යුතු බවට චක්‍රලේඛ අංක 36 මගින් දක්වා ඇත.

9. 2010 ඔක්තෝබර් 5 වැනි දින අංක 1674/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත 2002 සැප්තැම්බර් 23 දිනැති අංක 1255/3 දරන ගැසට් පත්‍රයේ 2(ඇ)(ii) ඊතිය ප්‍රකාරව දිල්ලියේ මධ්‍යම ද්විතීයික අධ්‍යාපන මණ්ඩලය (Central Board of Secondary Education, Delhi) විසින් නිකුත් කරන ද්විතීයික පාසල් විභාග සහතිකය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන අ.පො.ස. (සා. පෙළ) විභාග සහතිකයට සමාන වන බව කොමිෂන් සභාව පිළිගෙන ඇත.

10. සීමාසහිත ශ්‍රී ලංකා නැව් සමාගමේ (SLSCL) නැව් බඳ, යන්ත්‍රෝපකරණ සහ යුද අවදානම් රක්ෂණ ආවරණය 2021 මැයි 31 දිනෙන් කල් ඉකුත් වූ බැවින් ඉදිරි වසර 5 සඳහා රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 101 වගන්තිය ප්‍රකාරව විදේශීය රක්ෂණකරුවන් සමග එම රක්ෂණාවරණය අලුත් කරන ලෙස කොමිෂන් සභාව වෙතින් ඉල්ලා ඇත. කෙසේ වෙතත්, ජාතික අවශ්‍යතාව සලකා බ්‍රිටිෂ් මැරයින් හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි නොවූ වෙනත් රක්ෂණ සමාගමක් සමග එකී රක්ෂණය අලුත් කරන ලෙස ශ්‍රී ලංකා නැව් සමාගම විසින් කරන ලද ඉල්ලීමට එකඟ නොවීමට කොමිෂන් සභාව තීරණය කළේය.

11. 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ 53 වැනි වගන්තියේ දක්වා ඇති සංයුක්ත රක්ෂණ සමාගම් දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ලෙස වෙනම සමාගම් දෙකකට වෙන් කිරීමේ අවශ්‍යතාවයට අනුකූල වන බව සහතික කිරීම සඳහා කොමිෂන් සභාව රජය සතු රක්ෂණ සමාගමකට කාලය දීර්ඝ කිරීම් කිහිපයක් ලබා දී ඇත. කෙසේ වෙතත්, කොමිෂන් සභාව විසින් කාලය දීර්ඝ කිරීම් කිහිපයක් ලබා දී තිබියදීත් එම සමාගම එයට අනුකූල වීමට අපොහොසත් වී ඇත. එබැවින් කොමිෂන් සභාව විසින් බෙදා වෙන් කිරීමේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමක් කොමිෂන් සභාව විසින් සලකා නොබලන බවත් අනිවාර්ය ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයට අනුකූල වීම සඳහා රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ දක්වා ඇති නීතිමය අවශ්‍යතාවයට අනුකූල වීමට ඉහත කී රක්ෂණකරු වහාම පියවර ගත යුතු බවත් කොමිසම තීරණය කළේය.

12. එක් රක්ෂණකරුවෙකු විසින් කරන ලද ඉල්ලීම සලකා බැලූ කොමිෂන් සභාව කොන්දේසිවලට යටත්ව තම සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ඔවුන්ගේ ඉල්ලීමට එකඟ වීමට තීරණය කළේය.

විමර්ශන සමාලෝචනය

රක්ෂණ ඔප්පු හිමියන්ගේ සුභසිද්ධිය තහවුරු කිරීමේ සමස්ථ පරමාර්ථය පෙරදැරිව කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන රක්ෂණ වන්දි ගෙවීම් සම්බන්ධයෙන් රක්ෂකයන් හා හිමිකම් පාන්නන් අතර හටගන්නා ආරවුල් විමර්ශනය කිරීමට කොමිෂන් සභාවට බලතල ඇත. එමෙන්ම කිසියම් රක්ෂකයෙකු, තැරැව්කරුවකු හෝ නියෝජිතයකුගේ වෙළඳපළ හැසිරීම පිළිබඳ ලැබෙන පැමිණිලි ද කොමිෂන් සභාව විසින් විමර්ශනය කරනු ලැබේ.


යම් ආරවුලක් හෝ පැමිණිල්ලක් (රක්ෂකයකු, තැරැව්කරුවකු හෝ නියෝජිතයෙකුට එරෙහිව) කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබූ අවස්ථාවක දී කොමිෂන් සභාව විසින් තීරණයක් ගැනීමට පෙර අදාළ සියළු පාර්ශවයන්ට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දෙනු ලැබේ. රක්ෂකයන් විසින් රක්ෂණ හිමිකම් සම්බන්ධයෙන් ගනු ලැබූ තීරණයට පදනම් වූ කරුණු අදාළ ලිපිලේඛන හා තොරතුරු මගින් තහවුරු කළ යුතු වේ. කොමිෂන් සභාව විසින් තීරණයන්ට එළැඹීමට පෙර අවශ්‍ය අවස්ථාවලදී තෙවන පාර්ශවයන් වෙතින් කරුණු තහවුරු කරගැනීම හා විශේෂඥ මතයන් ලබාගැනීම ද සිදු කරනු ලැබේ.

සමස්ථ පැමිණිලි පිළිබඳ සමාලෝචනය

සමාලෝචනයට පාත්‍ර වන කාල සීමාව තුළ නව පැමිණිලි 410ක් කොමිෂන් සභාව වෙත යොමු වූ අතර එම කාලය තුළ පැමිණිලි 446ක් (පෙර වසරින් ඉදිරියට ගෙන ආ පැමිණිලි ද ඇතුළුව) සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කෙරුණි. කොමිෂන් සභාවේ මැදිහත් වීම මත රක්ෂණ වන්දි ආරවුල් 118ක් රක්ෂණ හිමිකම් පාන්නන්ට වාසිදායක ලෙස නිරාකරණය වූ අතර එම හිමිකම් පෑම්වල එකතුව රු.මි. 68.35 ක් විය.


රූප සටහන 1 මගින් දක්වා ඇති ආකාරයට පසුගිය වසර පහ (5) තුළ කොමිෂන් සභාවට ලැබුණු මුළු පැමිණිලිවල එකතුව 1,766කි. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ දී ලැබුණු පැමිණිලි සංඛ්‍යාව (410) පසුගිය වසරට (446) සාපේක්ෂව මද වශයෙන් අඩු වී ඇත. වසර තුළ යොමු කිරීම් සංඛ්‍යාව අඩුවීමට කොවිඩ්-19 හි කාලය තුළ රට අගුළු දමා තිබීම සහ තැපැල් ප්‍රමාදය හේතුව විය හැකිය.

2 රූප සටහන: 2021 වසර තුළ ලැබුණු පැමිණිලිවල මාසික විශ්ලේෂණය




සමාලෝචිත වර්ෂය තුළ කොමිෂන් සභාව වෙත මාසිකව ලැබුණු පැමිණිලි සංඛ්‍යාව පිළිබඳ විස්තරයක් 2 රූප සටහන මගින් දැක්වේ. පෙබරවාරි මාසයේ දී වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් (67) ලැබී ඇති අතර අඩුම පැමිණිලි සංඛ්‍යාවක් (15) වාර්තා වී ඇත්තේ ජූනි මාසයේ දීය. සමාලෝචිත වසර තුළ කොමිෂන් සභාව වෙත මාසිකව ලැබුණු පැමිණිලිවල සාමාන්‍ය අගය 34ක් විය. පෙබරවාරි, මාර්තු, අප්‍රේල්, ඔක්තෝම්බර්, නොවැම්බර් හා දෙසැම්බර් මාසවලදී එම සාමාන්‍ය අගය ඉක්මවා පැමිණිලි ලැබී ඇත.

රූප සටහන 3 - 2021 වසරේ දී ලැබුණු පැමිණිලි වර්ගීකරණය



3 රූප සටහන මගින් 2021 වර්ෂය තුළ ලැබුණු සමස්ථ පැමිණිලිවල වර්ගීකරණයක් දක්වා ඇත. සමස්ථ පැමිණිලිවලින් බහුතරය, එනම් 299 (72.93%) ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ආශ්‍රිතව ද, පැමිණිලි 81 (19.75%)ක් දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය ආශ්‍රිතව ද වේ. විශේෂිත වූ රක්ෂණ ව්‍යාපාරයකට වර්ගීකරණය කළ නොහැකි වෙනත් පැමිණිලි 30 (7.32%) ක් ද වේ. පසුගිය සමාලෝචිත වර්ෂය හා සැසඳීමේ දී රක්ෂණ ව්‍යාපාරය ආශ්‍රිත පැමිණිලිවල ප්‍රතිශතය 68% (2020 වසරේ දී) සිට 72.93% දක්වා කැපී පෙනෙන වැඩි වීමක් පෙන්නුම් කළ අතර දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර ආශ්‍රිත පැමිණිලිවල ප්‍රතිශතය 24% (2020 වසරේ දී) සිට 19.75% දක්වා සුළු අඩු වීමක් පෙන්නුම් කළේය. වෙනත් පැමිණිලි ඊට සමානුපාතිකව 8% (2020 වසරේ දී) සිට 7.32% දක්වා සුළු වශයෙන් අඩු වී ඇත.

1 රූප සටහන: පසුගිය වසර පහ (5) තුළ වාර්ෂිකව ලැබුණු පැමිණිලි



විමර්ශන සමාලෝචනය

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළ පැමිණිලි විශ්ලේෂණය

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළව කොමිෂන් සභාවට ලැබුණු පැමිණිලි ගැටළුවේ ස්වභාවය අනුව වර්ග කර 1 වන වගුවේ දක්වා ඇත.

1 වගුව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළ පැමිණිලි: ගැටළුව අනුව

ගැටළුව	සංඛ්‍යාව	ප්‍රතිශතය
රක්ෂණ වන්දි ආරවුල්	268	89.63
වගකීම පිළිනොගැනීම	102	34.11
ගෙවන ලද/ යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීම	16	5.35
හිමිකම් ගෙවීම ප්‍රමාද වීම	150	50.17
වෙනත් පැමිණිලි	31	10.37
එකතුව	**299**	**100.0**

1 වන වගුවෙහි දැක්වෙන පරිදි සමස්ථ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර පැමිණිලි අතුරින් (299) රක්ෂණ වන්දි ආරවුල් 268 (89.63%) ක් වන අතර ඉතිරි පැමිණිලි 31 (10.37%) අර්ධකාලීනව රක්ෂණ ඔප්පු අවලංගු කිරීම්, අසන ලද ප්‍රශ්නවලට ප්‍රතිචාර නොදැක්වීම්, වාරික නැවත ලබා ගැනීම පිළිබඳ ඉල්ලීම් හා රක්ෂණ ඔප්පු නොලැබීම ආදී වෙනත් පැමිණිලි වේ.

රක්ෂණ වන්දි ආරවුල් යටතේ වූ පැමිණිලි වලින් 34.11% ක් වගකීම පිළිනොගැනීම සම්බන්ධයෙන් වූ පැමිණිලි වූ අතර ඒවායේ මූලසාධකය විශ්ලේෂණය කිරීමේ දී මෝටර් රථ වාහන හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ ප්‍රධාන හේතු ලෙසට අනාවරණය වන්නේ අනතුර සම්බන්ධයෙන් වන වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හෝ කරුණු වරදවා දැක්වීම (රක්ෂණය ලබාගත් අරමුණට පරිබාහිර අරමුණු සඳහා වාහනය භාවිතා කිරීම, රියදුරු බීමත්ව සිටීම, වලංගු රියදුරු බලපත්‍රයක් නොමැති අයෙක් රිය පැදවීම හෝ හිමිකම් පාන්නාට වාහනය කෙරෙහි විය විකිණීමෙන් පසුව රක්ෂණීය බැඳියාවක් නොමැති වීම මෙම කරුණු ඉදිරිපත් නොකිරීමට හේතු විය හැක). රියදුරු/ රක්ෂිතයා විසින් අනතුර පිළිබඳ ලබා දුන් විස්තරය සමග අනතුරෙන් සිදු වූ අලාභහානි නොසැසඳීම හෝ අනතුර සිදුවන දිනය වන විට මුළු රක්ෂණ වාරික මුදල නොගෙවීම මත රක්ෂණ ඔප්පුව අවලංගු වීමයි. රක්ෂණ හිමිකම් සම්බන්ධ පැමිණිලි විභාග කිරීමේ දී අවශ්‍ය අවස්ථාවන්හි දී රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, පොලිස් ස්ථාන, රෝහල් හා සිද්ධිය පිළිබඳ ප්‍රකාශ ලබාදුන් අය වෙතින් අදාළ තොරතුරු කැඳවීමෙන් හිමිකම් ගෙවීම් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් සවිස්තරාත්මක පරීක්ෂණය පවත්වන ලදී. හිමිකම් උද්ගත වීමට හේතු වූ අලාභය රක්ෂණ ඔප්පුව යටතේ ආවරණය වන සහ කිසිදු ආකාරයක වංචාවක් හෝ හිතාමතා කරුණු වරදවා දැක්වීමක් සිදුව නොමැති අවස්ථාවලදී හිමිකම් පාන්නන්ට සහාය වීමට කොමිෂන් සභාවට හැකි විය.

වන්දි ආරවුල් යටතේ වූ යොමු කිරීම් බහුතරය (50.17%) වන්දි ලබා දීමේ ප්‍රමාදය පිළිබඳව විය. මෙම ප්‍රමාදයන් අතුරින් බොහෝමයක් උද්ගත වී ඇත්තේ හිමිකම් පිළිබඳ වැඩිදුර විමර්ශන පැවැත්වීම බව නිරීක්ෂණය විය. මීට අමතරව, රක්ෂිතයාගේ හෝ අළුත්වැඩියාකරුවන්ගේ පාර්ශවයෙන් හිමිකම් නිරාකරණය කිරීමට අවශ්‍ය තොරතුරු හා ලේඛන ඉදිරිපත් කිරීමේ දී සිදුවන ප්‍රමාදයන් ද නිරීක්ෂණය විය. කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කෙරුණු ඉතිරි පැමිණිලි දහසය (16) ගෙවන ලද/ යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීමට අදාළ විය. මෙම පැමිණිලිවලට මූලික හේතූන් වූයේ රක්ෂණ ඔප්පුවෙහි කරුණු වරදවා වටහා ගැනීම සහ රක්ෂකයන් විසින් ගෙවන ලද අලාභ ගැලපුම්/ අඩු කිරීම් පිළිබඳව ප්‍රමාණවත් පැහැදිලි කිරීම් ලබා නොදීමයි. ලිඛිත කරුණු පැහැදිලි කිරීම් තුළින් හෝ කොමිෂන් සභාවේ දී පවත්වනු ලබන සාකච්ඡාවලදී හිමිකම් පාන්නන්ට අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා දීම මගින් මෙවැනි බොහෝමයක් ආරවුල් විසඳාගත හැකි විය.

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාළ පැමිණිලි විශ්ලේෂණය

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාළව ලැබුණු පැමිණිලි ගැටළුවේ ස්වභාවය අනුව විශ්ලේෂණය කර දෙවන වගුවේ දක්වා ඇත.

2 වගුව - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාළ පැමිණිලි: ගැටළුව අනුව

ගැටළුව	සංඛ්‍යාව	ප්‍රතිශතය
රක්ෂණ වන්දි ආරවුල්	21	26
වගකීම පිළිනොගැනීම	8	39
පූර්ණත්වය සහ පවාරණ ප්‍රතිලාභ	10	47
යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීම	3	14
වෙනත් පැමිණිලි	60	74
ගෙවන ලද වාරික මුදල ආපසු ලබාගැනීම/ ඔප්පු අවලංගු කිරීම හෝ පුනස්ථාපනය සඳහා වන ඉල්ලීම්	24	40
තොරතුරු ලබා දීම	4	6.67
වාරික ගෙවීම/ සාවද්‍ය පරිහරණය	1	1.67
වෙනත්	31	51.66
එකතුව	**81**	**100.0**

විමර්ශන සමාලෝචනය

2 වන වගුවට අනුව සමස්ථ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය යටතේ ලැබුණු පැමිණිලි (81) අතරින් 26% ක් වන්දි ආරවුල් සම්බන්ධයෙන් වන අතර 74%ක් වෙනත් පැමිණිලි වේ.

රක්ෂණ වන්දි ආරවුල් (47%) සඳහා මූලික හේතුව වන්නේ කල්පිරීමේ දී ලබන ප්‍රතිලාභ සහ පවාරණ ප්‍රතිලාභ ලබා ගැනීමට අදාළව වේ. එවැනි ආරවුල් ඇති වීමට ප්‍රධාන හේතුව වන්නේ රක්ෂණ ඔප්පුවේ ඇති කරුණු පිළිබඳ අවබෝධය මද බව සහ රක්ෂකයන් විසින් ප්‍රමාණවත් පැහැදිලි කිරීම් සිදු නොකිරීමයි. ලිඛිත කරුණු පැහැදිලි කිරීම් තුළින් හෝ කොමිෂන් සභාවේ දී පවත්වනු ලබන සාකච්ඡාවලදී හිමිකම් පාන්නන්ට අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා දීම මගින් මෙවැනි බොහෝමයක් ආරවුල් විසඳාගත හැකි විය.

රක්ෂණ වන්දි ආරවුල්වලින් තවත් 39% ක් වගකීම පිළිනොගැනීමට අදාළව විය. බොහෝමයක් හිමිකම් ගෙවීම් ප්‍රතික්ෂේප වීමට පාදක වී ඇත්තේ රක්ෂණ ඔප්පුව ලබා ගැනීමේ දී හෝ පුනස්ථාපනය කිරීමේ දී වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හෝ වරදවා දැක්වීමයි. රක්ෂණ ගිවිසුමක පදනම වන "උපරිම සද්භාවය" (utmost goodfaith) නම් මූලික නෛතික මූලධර්මය ගිවිසුමේ දෙපාර්ශවය වනම් රක්ෂකයා මෙන්ම රක්ෂිතයාට එකසේ ක්‍රියා කරයි. යෝජකයා විසින් රක්ෂණ යෝජනා පත්‍රය මගින් හෙළිදරව් කරන තොරතුරු මත පදනම්ව රක්ෂණ යෝජකයාගේ ජීවිතය පිළිබඳ අවදානම පිළිගන්නේ ද යන වග සහ ඊට අදාළ කොන්දේසි හා නියමයන් රක්ෂකයා විසින් තීරණය කරනු ලබයි. එවන් අවස්ථාවක රක්ෂිතයා විසින් කිසියම් වැදගත් කරුණක් හෙළිදරව් නොකළහොත් හෝ වරදවා දැක්වීමක් සිදු කළහොත් උපරිම සද්භාවය මූලධර්මය උල්ලංඝණය වේ.

ඇතැම් අවස්ථාවල දී යෝජකයා විසින් වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හා වරදවා දැක්වීමට හේතු වී ඇත්තේ අදාළ රක්ෂණ මූලධර්ම හා වැදගත් තොරතුරු හෙළිදරව් කිරීමේ වගකීම පිළිබඳ නොදැනුවත්භාවය බවට නිරීක්ෂණය විය. එබැවින්, රක්ෂණ ඔප්පුහිමි වෙත පැවරෙන වැදගත් කරුණු හෙළිදරව් කිරීමේ වගකීම හා එසේ කිරීමට අපොහොසත් වීමෙන් සිදුවන අහිතකර ප්‍රතිවිපාක පිළිබඳ ඔවුන්ව නිසි පරිදි දැනුවත් කළ බව තහවුරු කර ගැනීමට අවශ්‍ය පියවර රක්ෂකයා විසින් ගත යුතුය. වැදගත් කරුණු වරදවා දැක්වීම හිතාමතා හෝ නොසැලකිල්ලෙන් නොවන අවස්ථාවන් කිහිපයක දී පමණක් අදාළ රක්ෂණ හිමිකම් පාන්නන්ට සහාය වීමට කොමිෂන් සභාවට හැකි විය.

රක්ෂණ ඔප්පුවේ දක්වා ඇති කාල වකවානුව තුළ හා නියමිත පරිදි වාරික ගෙවීම රක්ෂණ ඔප්පු හිමියාගේ ගිවිසුම්ගත යුතුකමක් වේ. අලාභය සිදුවන විට වාරික නොගෙවීම හේතුවෙන් රක්ෂණ ඔප්පුව අප්‍රාණිකව පැවති අවස්ථාවලදී රක්ෂණ වන්දි ප්‍රතික්ෂේප වී ඇත. නියමිත වේලාවට රක්ෂණ වාරික ගෙවා රක්ෂණ ඔප්පුව පවත්වාගෙන යාම රක්ෂණ ඔප්පු හිමියාගේ වගකීමක් වන අතර ආරවුලක දී ඉදිරිපත් කිරීමට සිදු වුවහොත් ගෙවීම් තහවුරු කිරීමට සාක්ෂි ඔවුන් සතුවීම අවශ්‍ය වේ. ඒ අනුව, නියමිත කාල සීමාව තුළ වාරික ගෙවන ලද බව තහවුරු කළ හැකි හෝ ගෙවීමේ දී සිදු වූ ප්‍රමාදය සාධාරණීකරණය කළ හැකි අවස්ථාවලදී පමණක් කොමිෂන් සභාවට සහාය විය හැකිය. හිමිකම් පාන්නන්ට තමන්ගේ යෝජිත මුදල දැනුම් දීමේ දී ප්‍රමාණවත් පැහැදිලි කිරීම් හෝ විස්තර ලබා නොදීම් මෙවැනි යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවූ ආරවුල් සියල්ලෙහිම පාහේ (14%) හේතුව බවට නිරීක්ෂණය විය.

වෙනත් පැමිණිලි බහුතරයක් (51.66%) යොමු කරන ලද්දේ අනෙක් කරුණු යටතේය. අවලංගු කිරීමේ කාල සීමාව (එනම් රක්ෂණ ඔප්පුව ලද දින සිට දින 21 ක් ඇතුළත) ඉකුත් වීමෙන් අනතුරුව රක්ෂණ ඔප්පු හිමියාට එවැනි අයිතියක් නොමැති වීම නිසා රක්ෂණ ඔප්පු අවලංගු කිරීම සහ ගෙවන ලද වාරික මුදල් ආපසු ලබා ගැනීම සම්බන්ධයෙන් වන පැමිණිලි සඳහා සහාය වීමට හැකියාවක් නොලැබුණි. කෙසේ වුවද, ඇතැම් අවස්ථාවල හිමිකම් පාන්නන්ගේ දුර්වල මූල්‍ය තත්වය සැලකිල්ලට ගෙන රක්ෂණකරුවන් සහන සලසා ඇත. රක්ෂණ ඔප්පුව පුනස්ථාපනය කිරීමට පියවර ගැනීමට ප්‍රමාද වූ කරුණු සාධාරණීකරණය කළ හැකි විටදී පමණක් නියමිත කාලය ඉකුත් වීමෙන් පසුව සිදු කරන ලද පුනස්ථාපනය සඳහා වන ඉල්ලීම්වලට රක්ෂණ ඔප්පු හිමියන්ට සහාය වීමට හැකි විය. ගෙවූ රක්ෂණ වාරික මුදල් ආපසු ගෙවන ලෙස වන ඉල්ලීම්වලට මූලික හේතුව වන්නේ රක්ෂණ ඔප්පු හිමියන් තුළ ජීවිත රක්ෂණයේ වැදගත්කම පිළිබඳ අවබෝධය මද බව සහ අඛණ්ඩව වාරික ගෙවා රක්ෂණ ඔප්පුව පවත්වාගෙන යාමේ දී මුහුණ පාන්නට වන ආර්ථික දුෂ්කරතායි.

වෙනත් පැමිණිලි

කොමිෂන් සභාව වෙත යොමු කරන ලද පැමිණිලි 30 ක් ප්‍රධාන වශයෙන් අසාධාරණ අයුරින් රක්ෂණාවරණය අවසන් කිරීම සහ නියෝජිතයන්ගේ අධ්‍යාපනයයි. හැකි සෑම අවස්ථාවක දී ම පනතේ විධිවිධාන යටතේ කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කර ඇත.

වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා සමාලෝචනය

රක්ෂණ ඔප්පුහිමියන්ගේ අභිලාෂයන් ආරක්ෂා කිරීම සහ රක්ෂණ ක්ෂේත්‍රයේ වර්ධනය කෙරෙහි බලපාන ප්‍රධාන අංගයක් ලෙස දැනුවත් කිරීම සැලකේ. රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රධාන පාර්ශවකරුවන් වන වර්තමාන සහ අනාගත රක්ෂණ ඔප්පුහිමියන් ආරක්ෂා කර ගැනීමට සහ රක්ෂණ ගිවිසුමකට එළඹීමේදී අවබෝධයෙන් යුතු තීරණ ගැනීමට හැකි වන පරිදි දැනුමෙන් සවිබල ගැන්වීම අවශ්‍ය වේ.

කොවිඩ් 19 වෛරස ව්‍යාප්තිය හේතුවෙන් 2021 වසරට නියමිත දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ ඒ හා සම්බන්ධ ක්‍රියාකාරකම් සිදු කිරීම අභියෝගයක් විය. එබැවින්, 2021 වර්ෂයේදී කොමිෂන් සභාව වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සබඳතා ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මුද්‍රිත, විද්‍යුත් සහ සමාජ මාධ්‍ය වැනි මාධ්‍ය හරහා දැනුවත් කිරීමේ කටයුතු කිරීම කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළේය. කොමිෂන් සභාව මගින් එවැනි දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ අරමුණ වන්නේ රක්ෂණය, රක්ෂණයේ වැදගත්කම, රක්ෂණ කර්මාන්තය සහ එහි නවතම වර්ධනයන්, සුදුසු රක්ෂණාවරණ තෝරාගැනීම, රක්ෂණ ඔප්පුහිමියන්ගේ දුක්ගැනවිලි සම්බන්ධයෙන් විසඳුම් ලබා ගැනීම සඳහා වන යාන්ත්‍රණයන් යනාදිය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම මගින් වර්තමාන සහ අනාගත රක්ෂණ ඔප්පුහිමියන්ගේ අභිලාෂයන් ආරක්ෂා කිරීමයි. මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා ඉලක්කගත පිරිස් වෙත ළඟා වීමට කොමිෂන් සභාව විවිධ සන්නිවේදන ක්‍රම භාවිතා කළේය. සමාලෝචිත වර්ෂය තුළ භාවිතා කරන ලද සන්නිවේදන මාර්ග සහ සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර පහත පරිදි වේ:

මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය හරහා දැනුවත් කිරීම

මුද්‍රිත මාධ්‍ය

සමාලෝචිත කාල සීමාව තුළ කොමිෂන් සභාව විසින් පුවත්පත් දැන්වීම් සහ පුවත්පත් නිවේදන කිහිපයක් ප්‍රකාශයට පත් කරන ලදී.

පුවත්පත් දැන්වීම්

ජනතාව දැනුවත් කිරීම සඳහා "ඔබ ජීවිත රක්ෂණය ගැන දැනුවත්ද", "සෞඛ්‍ය රක්ෂණය ගැන ඔබ දැනුවත්ද", "මනා අවබෝධයකින් යුක්තව මෝටර් රථ රක්ෂණයක් ලබා ගන්න" සහ "ලියාපදිංචි රක්ෂණ සමාගම්, රක්ෂණ තැරැව්කාර සමාගම් සහ අලාභ ගැලපුම්කරුවන්" යන මැයෙන් පුවත්පත් දැන්වීම් 2021 වර්ෂය තුළ පළ කරන ලදී.

පුවත්පත් නිවේදන

වර්ෂය තුළ පහත සඳහන් පුවත්පත් නිවේදන ප්‍රකාශයට පත් කරන ලදී.

- රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය 2020 වසරේ 03 වෙනි කාර්තුව
- රක්ෂණ නියාමන ආයතනය 20 වැනි සංවත්සරය සනිටුහන් කරයි
- 2020 වර්ෂය තුළ රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය
- රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය 2021 වසරේ 01 වෙනි කාර්තුව
- 2021 වසරේ පළමු භාගයේ රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය

විද්‍යුත් මාධ්‍ය

ගුවන් විදුලි වැඩසටහන්

2021 වසර තුළ ගුවන් විදුලි වැඩසටහන් දෙකක් පවත්වන ලදී. රක්ෂණය, රක්ෂණ ඔප්පුහිමියන්ගේ අයිතිවාසිකම් ආදිය පිළිබඳ පටිගත කරන ලද සංක්ෂිප්ත පණිවුඩ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ City FM නාලිකාවේ සිංහල භාෂාවෙන් විකාශය විය. දෙවන වැඩසටහන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවයේ විකාශය වූ සංවාදයකි.

- 2021 සජීවී වැඩසටහන/සාකච්ඡාව.
- මාස 02 ක් පුරා විකාශය වූ දැනුවත් කිරීමේ වැඩසටහන

ඩිජිටල් මාධ්‍ය හරහා දැනුවත් කිරීම

සමාජ මාධ්‍ය

කොමිෂන් සභාව සිය නිල සමාජ මාධ්‍ය නාලිකා හරහා රක්ෂණයේ විවිධ වැදගත් අංශ සහ රක්ෂණ ඔප්පුහිමියාගේ අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් කිරීම් ද සිදු කළේය. මෙවැනි වැදගත් අන්තර්ගතයන් අඛණ්ඩව පළ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස LinkedIn හා Facebook පිටු හා සම්බන්ධ වූ පිරිස වැඩිවීමද සිදුවිය. එවැනි ඇතැම් අන්තර්ගතයන්හි රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය පිළිබඳ පුවත්පත් නිවේදන, පුවත්පත් සම්මුඛ සාකච්ඡා සහ ජාතික රක්ෂණ දිනය/මාසයට අදාළ පණිවිඩද ඇතුළත් විය.

වෙබ් අඩවිය නවීකරණය කිරීම

කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවෙහි වත්මන් වෙබ් අඩවිය සමාලෝචනය කළ අතර එය වඩාත් පරිශීලක-හිතකාමී බවට පත් කිරීම සහ වැඩි තොරතුරු සැපයීම සඳහා වැඩිදියුණු කිරීම් යෝජනා කෙරිණි. නව මුහුණුවරකින් යුත් වෙබ් අඩවිය 2021 වසරෙහි මාර්තු මාසයේ කොමිෂන් සභාවේ 20 වැනි සංවත්සරය මූලික කරගෙන නැවත දියත් කරන ලදී.

ඊ-පුවත් ලිපි

රක්ෂණය, රක්ෂණ ඔප්පුහිමියෙකුගේ අයිතිවාසිකම්, රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රධාන පාර්ශවකරුවන්ගේ වගකීම් සහ රක්ෂණ ක්ෂේත්‍රයේ සංඛ්‍යාලේඛන ආශ්‍රිත සිත්ගන්නාසුළු කරුණු මත පදනම්ව විද්‍යුත් පුවත් ලිපි දෙකක් සකස් කරන ලදි. එකී විද්‍යුත් පුවත් ලිපි දෙකම 2021 වර්ෂය තුළ විද්‍යුත් තැපැල් ලිපිනයන් 500,000 ක් හරහා බෙදා හැර ඇත.

කෙටි පණිවිඩ (SMS) මගින් දැනුවත් කිරීම

කොමිෂන් සභාව "IRCSL" යන නාමය (name tag) යටතේ කෙටි පණිවිඩ වැඩසටහනක් මෙහෙයවූ අතර, වසර තුළ රක්ෂණය, ජීවිත රක්ෂණය, මෝටර් රථ රක්ෂණය, සෞඛ්‍ය රක්ෂණය පිළිබඳව කෙටි පණිවිඩ, දුරකථන අංක සමුදායක් අතර සංසරණය කරන ලදී.

ADB TA - 9213 SRI ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වැඩසටහන - රක්ෂණ අධ්‍යාපන සංරචකය

රක්ෂණ සාක්ෂරතාව ඉහළ නැංවීම තුලින් පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා දැනට පවතින වෙබ් අඩවිය ශක්තිමත් කිරීම සහ ප්‍රචාරණ වැඩසටහන් පුළුල් කිරීම උදෙසා නිල YouTube නාලිකාවක් ආරම්භ කිරීම.

රක්ෂණයේ වැදගත්කම සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි කාර්යභාරය, සෞඛ්‍ය රක්ෂණය, ජීවිත රක්ෂණය, මෝටර් රථ රක්ෂණය, දේපළ රක්ෂණය සහ සංචාරක රක්ෂණය පිළිබඳ පණිවිඩ රැගත් වීඩියෝ හයක් (06) YouTube නාලිකාවට එක් කරන ලදී.

වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා සමාලෝචනය

අඩු පහසුකම් සහිත අවදානමට ලක්විය හැකි පවුල් සඳහා රක්ෂණ සාක්ෂරතාවය ලබා දීමට රක්ෂණ ආයතන/සමාගම් වලට උපදෙස් ලබා දීම.

පාරිභෝගික අධ්‍යාපන උපායමාර්ගයේ බෙදාහැරීමේ රාමුව යටතේ අවශ්‍ය වන පරිදි, වසර තුළ, අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් හයක් (06) පැවැත්වීමට සහ 2021 වසරේ දෙවැනි කාර්තුවේදී වැඩසටහන් ආරම්භ කිරීමට කොමිෂන් සභාව අදහස් කළ අතර දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා සියලු කටයුතු සූදානම් කර තිබිණ. කෙසේ වෙතත්, රටේ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් එම වැඩසටහන් කල් දැමීමට සිදුවිය.

තෝරාගත් පශ්චාත් පාසල් අධ්‍යාපන/පුහුණු ආයතනවල සිසුන් සඳහා රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා පහසුකම් සැලසීම

පාරිභෝගික අධ්‍යාපන උපායමාර්ගයේ බෙදාහැරීමේ රාමුව යටතේ අවශ්‍ය වන පරිදි, 2021 වසර තුළ ජාතික අධ්‍යාපන ආයතනය සමග එක්ව ගුරුවරුන් සහ පුහුණු ගුරුවරු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් හතරක් (04) පැවැත්වීමට කොමිෂන් සභාව විසින් මූලික කටයුතු සිදු කරන ලදි. නමුත් රටේ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් කොමිෂන් සභාව විසින් අපේක්ෂිත වැඩසටහන් නොපවත්වන ලදී.

වෙළඳපොළ පර්යේෂණ හරහා රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය වැඩි කරන විවිධ සාධක හඳුනාගැනීම සහ රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම

සමීක්ෂණය - රක්ෂණය පිළිබඳ විශ්වාසය මැන බැලීම

රක්ෂණය පිළිබඳ විශ්වාසය මැනබැලීම හා සම්බන්ධ සමීක්ෂණය සිදු කිරීමේ කාර්යය කොළඹ විශ්ව විද්‍යාලය වෙත පවරනු ලැබිණ. තාක්ෂණික අනුකමිටුවේ නිර්දේශය මත කොමිෂන් සභාව, කොළඹ විශ්වවිද්‍යාලය (UoC) විසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණ යෝජනාව අනුමත කර ඇත. ඒ අනුව සමීක්ෂණය 2022 වසරේ දී සිදු කරනු ඇත.

ප්‍රකාශන සහ සිදු කරන ලද ක්‍රියාකාරකම්වල පින්තූර

20 වැනි සංවත්සර සැමරුම - නවීකරණය කරන ලද වෙබ් අඩවිය, Facebook සහ LinkedIn පිටු හා YouTube නාලිකාව එළිදැක්වීම.







පුවත්පත් නිවේදන සහ දැන්වීම්


"Education key towards increasing awareness on Insurance Industry"



GWP increases by Rs 11,778 mn with 5.99% growth
Performance of the Insurance Industry – 2020





වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා සමාලෝචනය

ඊ-පුවත්පිපි





වෙළඳපොළ පර්යේෂණය

'රක්ෂණාවරණ බෙදාහැරීමේ මාර්ග', 'නව රක්ෂණාවරණ' සහ 'හිමිකම් පියවීම්' සම්බන්ධ කරුණු පිළිබඳ පුළුල් සමීක්ෂණයක් සැලසුම් කර පර්යේෂණ ආයතනය සඳහා කාර්ය නිර්දේශය (ToR) සකස් කරන ලදී. රක්ෂණ ඔප්පු හිමියන්ගේ අදහස් දැනගැනීමේ අරමුණින් මෙම වෙළඳපොළ පර්යේෂණය 2022 වසරේදී ආරම්භ කිරීමට සැලසුම් කෙරේ.

වෙනත් රටවල රක්ෂණ නියාමකයින් විසින් අනුගමනය කරන ලද ප්‍රශස්ථ ක්‍රියාමාර්ග හඳුනා ගැනීම

අනෙකුත් රක්ෂණ නියාමකයින්ගේ විශිෂ්ඨ භාවිතයන්/ක්‍රියාමාර්ග දේශීය රක්ෂණ ක්ෂේත්‍රයට අනුගත කිරීමේ අරමුණින් කොමිෂන් සභාව විසින් රක්ෂණ සමාගම්වල ප්‍රචාරණ/වෙළඳ දැන්වීම් සඳහා මාර්ගෝපදේශ මාලාවක් සකස් කරන ලදී. රක්ෂණ වෙළඳ දැන්වීම් නියාමනය කිරීම මගින් රක්ෂණකරුවන් සහ අතරමැදියන් (රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ තැරැව්කාර සමාගම් සහ බලයලත් රක්ෂණ නියෝජිතයින්) විසින් සාධාරණ, අවංක සහ විනිවිදභාවයක් සහිත පරිචයන් අනුගමනය කිරීම සහ මහජන විශ්වාසය පළුදු කිරීමට නැඹුරු වන භාවිතයන් වළක්වා ගැනීමට වගබලා ගැනීමේ අරමුණින් මෙම මාර්ගෝපදේශය 2022 වර්ෂයේ දී ක්‍රියාත්මක කෙරේ.

මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය (FSMP)

කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන පරිදි වෙළඳපොළ සංවර්ධනය සහ බාහිර සම්බන්ධතා පිළිබඳ කටයුතු යටතේ වෙන් කර ඇති සංරචක වලට අදාළව පීවිගණක උපදේශකවරයා සමග වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

- සංරචක අංක 11 (අ) - මරණ සහ රෝගාබාධ දත්ත වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු රැස් කිරීමේ මධ්‍යගත දත්ත රාමුවක් සංවර්ධනය කිරීම
- සංරචක අංක 13 - මෝටර්, ගිනි සහ සෞඛ්‍ය රක්ෂණ ඔප්පුවලට අදාළ පරතර විශ්ලේෂණ වාර්තාවල අඩංගු නිර්දේශ සමාලෝචනය කර ඒවා ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම

ජාතික මූල්‍ය ඇතුළත් කිරීමේ උපාය මාර්ගය (NFIS)

කොමිෂන් සභාවේ නිලධාරීහු මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් දෙකකට සහභාගි වූහ. ජාතික මූල්‍ය ඇතුළත් කිරීමේ උපායමාර්ග ව්‍යාපෘතිය යටතේ වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශයේ ප්‍රධාන කාර්යයන් වන්නේ;

- මූල්‍ය අධ්‍යාපනය වඩාත් නව්‍ය සහ ප්‍රායෝගික ආකාරයෙන් අධ්‍යාපන විෂය මාලාවට ඇතුළත් කිරීම
- මූල්‍ය අධ්‍යාපන මුලපිරීම් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ මූලධර්ම, මාර්ගෝපදේශ සහ තත්ව ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම.
- පාර්ශවකරුවන් සමග සාකච්ඡා කර, මූල්‍ය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුමක් සකස් කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවට සහාය වන ද්විතීයික ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස මූල්‍ය සාක්ෂරතා ප්‍රයත්නයන් සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීමේ අදහසින් කොමිෂන් සභාව වැඩ කටයුතු ආරම්භ කර ඇත.

වෙනත් කටයුතු

මහජන විමසුම් සඳහා වන ප්‍රතිචාර

සමාලෝචිත වර්ෂය තුළ, රක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තොරතුරු ලබාදීම මගින් ජනතාව, රක්ෂණ ඔප්පු හිමියන් සහ වෙනත් විවිධ පාර්ශ්වකරුවන් රාශියකට කොමිෂන් සභාව මගපෙන්වීම් ලබා දී ඇත.

පරිපාලනමය සමාලෝචනය

කාර්ය මණ්ඩලය

ඕනෑම සංවිධානයක සාර්ථකත්වය විශාල වශයෙන් රඳා පවතින්නේ එහි ක්‍රියාකාරීත්වයට හවුල් වන්නා වූ පුද්ගලයින්ගේ විශේෂඥ ඥානය මතය. කොමිෂන් සභාවේ සාර්ථක උපක්‍රමවල කශේරුව වන්නේ අපගේ මානව සම්පත් බැව් අප විශ්වාස කරන්නේ එබැවිනි. ආයතනික හා ආංශික ව්‍යුහය, ක්‍රියාපටිපාටි සහ කුසලතාවන්හි කාර්යක්ෂමතාවය හා සඵලතාවය ශක්තිමත් කිරීම හා මානව සම්පත් හා පද්ධතීන් සම්බන්ධව ජාත්‍යන්තරයේ හොඳම භාවිතයන්ට අනුකූලව මානව සම්පත් කාර්යයන් ශක්තිමත් කිරීම සඳහා සහ ලෝක බැංකුවේ මූල්‍ය අංශ නවීකරන ව්‍යාපෘතිය යටතේ 2021 ඔක්තෝම්බර් මාසයේදී මානව සම්පත් උපදේශකයකු පත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය, වර්තමාන රක්ෂණ ඔප්පු හිමියන්ගේ හා අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන ආකාරයෙන් කරගෙන යනු ලබන බවට වගබලා ගැනීම සඳහා අවශ්‍ය මූලික කාර්යයන් හඳුනා ගනිමින් කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය සකස් කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ මානව සම්පත් ශක්තිමත් කිරීම සඳහා නිසි කලට අවශ්‍ය වෘත්තිකයන් බඳවා ගැනීම මගින් කොමිෂන් සභාව ප්‍රධාන මූලාරම්භයන් කිහිපයක් ගෙන ඇත. එම කටයුතු සාර්ථක කරගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ සහකාර ආයුගණකවරයෙක් සහ විධායක නිලධාරියෙක් බඳවා ගනු ලැබීය. 2021 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය 49ක් විය.

කාර්ය මණ්ඩලයේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පහත වගුවෙන් දැක්වේ.

සේවක සංඛ්‍යාව	අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් සහිත සේවකයන් සංඛ්‍යාව					
	පශ්චාත් උපාධිය, ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම්	පශ්චාත් උපාධිය හා වෘත්තීය සුදුසුකම්	පශ්චාත් උපාධිය හා ප්‍රථම උපාධිය	ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම්	ප්‍රථම උපාධිය	වෘත්තීය සුදුසුකම්
49	11	04	06	05	08	03

පුහුණු කිරීම

ආයතනික අරමුණු ළඟා කර ගැනීම සඳහා පුහුණුව සහ සංවර්ධන කෙරෙහි අවධානය යොමු කිරීම මගින් දැනුම සහ රැකියා ආශ්‍රිත කුසලතා වැඩි දියුණු කිරීම සඳහා වූ පුළුල් ප්‍රතිපත්තිය ආවරණය කරයි. කොවිඩ් - 19 වසංගත තත්වය හේතුවෙන් වසර තුළ කාර්ය මණ්ඩලය සඳහා මාර්ගගත පුහුණු අවස්ථා පමණක් සපයන ලදී.

කාර්ය මණ්ඩල සුභසාධනය

කාර්ය මණ්ඩලයේ අභිප්‍රේරණය සහ ධෛර්යය වර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ සුභසාධනය වැදගත් සාධකයකි. එබැවින් කොමිෂන් සභාව විසින් නේවාසික සහ බාහිර වෛද්‍ය පහසුකම්, හදිසි අනතුරු රක්ෂණාවරණ, වාහන ණය, ආපදා ණය හා උත්සව අත්තිකාරම් වැනි සිත් ගන්නා සුළු සුභසාධනයන් ලබා දෙන ලදී. තවද, කොවිඩ් - 19 වසංගතයෙන් කාර්ය මණ්ඩලය ආරක්ෂා කර ගැනීම සඳහා කොමිෂන් සභාව විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී.

මූල්‍ය සමාලෝචනය

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල (PPF)


කොමිෂන් සභාව විසින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල(PPF) වෙනුවෙන් එකතු වන මුදල (සෙස්) විචක්ෂණශීලීව ආයෝජනය කළ ද 2021 දී පොළී අනුපාත කැපී පෙනෙන අන්දමින් පහත වැටීම හේතුවෙන් සමස්ථ පොළී ආදායම අඩු විය. 1 ප්‍රස්තාරය මගින් 2017 සිට 2021 දක්වා රැස් කළ සෙස් බදු මුදල සහ ආයෝජන ආදායම පෙන්නුම් කෙරේ. කොවිඩ් - 19 වසංගත තත්වය තිබියදී වුවද සෙස් බදු ආදායම තරමක් ඉහළ ගොස් ඇත.

1 වන ප්‍රස්තාරයෙන් පසුගිය වසර පහ තුළ සෙස් ආදායම වර්ධනය වූ ආකාරය නිරූපණය වේ. වාසිදායක වෙළඳපොළ තත්වයන්ගේ බලපෑම හේතුවෙන් 2017 සිට 2019 දක්වා ආයෝජන ආදායමේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ නමුත් 2021 වසරේ දී පොළී අනුපාතය කැපී පෙනෙන අන්දමින් පහත වැටුණු අතර එම වසරේ වැඩි කාලයක් වලෙස අඩු මට්ටමක පැවතිණි.

පසුගිය වසර පහ තුළ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ අගය ඉහළ ගිය අතර 2 ප්‍රස්තාරය මගින් එය පෙන්නුම් කරයි. දිගුකාලීන ආයෝජන සඳහා ලැබුනු වැඩි පොළී අනුපාත සහ 2020 දක්වා කොමිෂන් සභාව වෙතින් වන ශුද්ධ අතිරික්ත මාරු කිරීම් අරමුදලේ ස්ථාවර වර්ධනයට දායක විය.

2 ප්‍රස්තාරය


2017 - 2021 දක්වා කාල පරිච්ඡේදය තුළ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වටිනාකම



	2017	2018	2019	2020	2021
අරමුදලේ වටිනාකම (රු. මිලියන)	4,110	5,043	6,253	7,469	8,444

1 ප්‍රස්තාරය

2017 - 2021 කාල පරිච්ඡේදය සඳහා සෙස් බදු ආදායම සහ ආයෝජන ආදායම




	2017	2018	2019	2020	2021
සෙස් ආදායම (රු. මිලියන)	418	479	493	506	546
ආයෝජන ආදායම (රු. මිලියන)	372	455	574	622	516

2020 දෙසැම්බර් 31 දිනට අරමුදලේ වත්කම් සංයුතිය පහතින් දැක්වේ:

3 ප්‍රස්තාරය

2021 දෙසැම්බර් 31 දිනට රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වත්කම් සංයුතිය



මූල්‍ය සමාලෝචනය

කොමිෂන් සභාවේ ආදායම

කොමිෂන් සභාවේ ආදායම පහත මූලාශ්‍රවලින් ජනනය වේ:

- රක්ෂකයින්, රක්ෂණ තැරැව්කාර සමාගම් සහ අලාභ ගලපන්නන් ලියාපදිංචිය සඳහා අය කරන ලියාපදිංචි කිරීමේ ගාස්තු
- රක්ෂණ සමාගම්වලින් අය කරන වාර්ෂික ගාස්තුව
- වාර්ෂිකව ලියාපදිංචිය අළුත් කිරීම සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම්වලින් අය කරන ගාස්තුව
- අතිරික්ත අරමුදල් ආයෝජනයෙන් ලැබෙන පොළී ආදායම
- මූල්‍ය අංශ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ලැබෙන අරමුදල්

2017 සිට 2021 දක්වා කාල පරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ සමස්ත ආදායම බෙදී ඇති ආකාරය 4 වැනි රූප සටහන මගින් දැක්වේ.


කොමිෂන් සභාවේ වියදම

ප්‍රධාන වශයෙන් කාර්ය මණ්ඩල පිරිවැය සහ මෙහෙයුම් පිරිවැය ඉහළ යාම හේතුවෙන් මුළු වියදම 12% කින් ඉහළ ගියේය. නව බඳවා ගැනීම් සහ උසස් කිරීම් හේතුවෙන් කාර්ය මණ්ඩල පිරිවැය ඉහළ ගිය අතර ප්‍රත්‍යාගණනයෙන් පසු ඇති වූ ක්ෂය වීම හේතුවෙන් මෙහෙයුම් පිරිවැය ඉහළ ගියේය.

2017 සිට 2021 දක්වා කාල පරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ මුළු වියදම 5 වැනි ප්‍රස්තාරය මගින් දැක්වේ.

4 ප්‍රස්තාරය


2017 - 2021 කාල පරිච්ඡේදය සඳහා කොමිෂන් සභවේ ආදායම



	2017	2018	2019	2020	2021
වාර්ෂික ගාස්තු (රු. මිලියන)	142	168	224	245	258
ලියාපදිංචි හා ලියාපදිංචි අලුත් කිරීමේ ගාස්තු (රු. මිලියන)	9	8	14	14	15
වෙනත් ආදායම (රු. මිලියන)	3	8	16	13	13
ප්‍රදාන හඳුනාගැනීම (රු. මිලියන)	1	2	84	16	0
මුළු ආදායම (රු. මිලියන)	155	186	339	288	286

5 ප්‍රස්තාරය

2017 - 2021 කාල පරිච්ඡේදය සඳහා කොමිෂන් සභවේ මුළු වියදම



	2017	2018	2019	2020	2021
මුළු වියදම (රු. මිලියන)	125	143	188	178	200


මූල්‍ය තොරතුරු

විගණකාධිපති වාර්තාව


ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. INS/A/02/IRCSL/AR/2021
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date 30 November 2022

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම්/ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා සටහන් යනාදියෙන් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ("කොමිෂන් සභාව") මූල්‍ය ප්‍රකාශනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියේ විධිවිධාන අනුව විගණනය කරන ලදී. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව යතා කාලයේ දී මාගේ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ මතය අනුව මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන මගින් 2021 දෙසැම්බර් 31 දිනට ආයතනයේ මූල්‍ය තත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් ලබා දෙන අතර එහි කාර්ය සාධනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල වේ.

1.2 මතය සඳහා වන පදනම

මම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLAuSs) අනුව මාගේ විගණනය සිදු කළෙමි. එම ප්‍රමිතීන් යටතේ වන මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා වන විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීමට මා ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ සුදුසු බව මම විශ්වාස කරමි.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.3 කොමිෂන් සභාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

අනෙකුත් තොරතුරුවලට කොමිෂන් සභාවේ 2021 වාර්ෂික වාර්තාවේ අඩංගු තොරතුරු ඇතුළත් වන නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳ මාගේ විගණන වාර්තාව ඇතුළත් නොවන අතර, මෙම විගණන වාර්තාවේ දිනයෙන් පසුව එය මා වෙත ලබා දීමට අපේක්ෂා කෙරේ. අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතය අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳව කිසිදු ආකාරයක නිගමනයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගෙන ඇති අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේ දී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන හෝ විගණනයේ දී ලබා ගත් මාගේ දැනුමට ප්‍රමාණාත්මකව නොගැළපේ ද යන්න හෝ ප්‍රමාණාත්මකව සාවද්‍ය ලෙස ප්‍රකාශ කර ඇත්ද යන්න සලකා බැලීමයි.

මම කොමිෂන් සභාවේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන ඇති බව මා නිගමනය කරන්නේ නම්, එය නිවැරදි කිරීම සඳහා මා පාලනය සම්බන්ධයෙන් වගකීම දරණ පුද්ගලයන්ට එම කාරණය දැනුම් දිය යුතුය. තව දුරටත් නිවැරදි නොකළ ප්‍රමාණාත්මකව සාවද්‍ය ප්‍රකාශන තිබේ නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධාන අනුව ඒවා මාගේ වාර්තාවට ඇතුළත් කළ යුතු අතර එය නියමිත වේලාවට පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ සහ පාලනයට සම්බන්ධ පුද්ගලයන්ගේ වගකීම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්වයක් පිළිඹිබු කරන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ වංචාවක් හෝ දෝෂයක් හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනවලින් තොර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අවශ්‍ය යැයි කළමනාකාරිත්වය තීරණය කරන අභ්‍යන්තර පාලනය සඳහා කළමනාකාරිත්වය වගකිව යුතු වේ.

කොමිෂන් සභාව ඈවර කිරීමට හෝ එහි ක්‍රියාකාරිත්වය නැවැත්වීමට කළමනාකාරිත්වය අපේක්ෂා කළහොත් හෝ එසේ කිරීම හැර වෙනත් යථාර්ථවාදී විකල්පයක් නොමැති නම් මිස මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීමට කොමිෂන් සභාව සතු හැකියාව ඇගයීම, අඛණ්ඩ පැවැත්මට සම්බන්ධ කරුණු අදාළ පරිදි අනාවරණය කිරීම සහ ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම යන පදනම භාවිතා කිරීම සම්බන්ධයෙන් කළමනාකාරිත්වය වගකිව යුතුය.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ වගකීම පාලනය සම්බන්ධයෙන් වගකීම දරණ පුද්ගලයන් සතුය.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තියට අනුව, වාර්ෂික හා කාලානුරූපී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට හැකිවන පරිදි, කොමිෂන් සභාව සිය සියලු ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් පිළිබඳ නිසි පොත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

සමස්ථයක් ලෙස වංචාවක් හෝ දෝෂයක් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයෙන් තොර ද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබා ගැනීම සහ මගේ මතය ඇතුළත් විගණන වාර්තාවක් නිකුත් කිරීම මගේ අරමුණයි. සාධාරණ තහවුරුවක් යනු ඉහළ මට්ටමේ සහතිකයක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරනු ලබන විගණනයක දී ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් පවතින විට එය සැමවිටම අනාවරණය වන බවට සහතිකයක් නොවේ.

සාවද්‍ය ප්‍රකාශයන් වංචාවකින් හෝ දෝෂයකින් මතු විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන ගනු ලබන පරිශීලකයන්ගේ ආර්ථික තීරණවලට තනි තනිව හෝ සමස්තයක් වශයෙන් ඒවා බලපානු ඇතැයි සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම් ඒවා ප්‍රමාණාත්මක ලෙස සලකනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණනයක කොටසක් ලෙස මම වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කරන අතර විගණනය පුරාවටම වෘත්තීය සංශයවාදය පවත්වාගෙන යන්නෙමි. එසේ ම මම පහත දැක්වෙන අයුරින් කටයුතු කරමි: එසේ ම මම පහත දැක්වෙන අයුරින් කටයුතු කරමි.

- වංචා හෝ දෝෂ හේතුවෙන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන ඇති වීමේ අවදානම හඳුනා ගැනීම සහ ඇගයීම, එම අවදානම්වලට විසඳුම් ලෙස විගණන ක්‍රියාපරිපාටීන් සැලසුම් කිරීම හා ක්‍රියාවට නැංවීම සහ මාගේ මතය සඳහා පදනමක් ලෙස ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම. වංචා හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනය හඳුනා නොගැනීමේ අවදානම දෝෂ හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනය ඇති වීමේ අවදානමට වඩා වැඩිය. මන්දයත්, වංචාවට ඊට හවුල් වීම, ව්‍යාජ ලේඛන සකස් කිරීම, හිතාමතා බැහැර කිරීම්, වැරදිසහගත නියෝජනය, හෝ අභ්‍යන්තර පාලනය ප්‍රතික්ෂේප කිරීම ඇතුළත් විය හැකි බැවිනි.

- කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීතාව පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් නොව, අවස්ථාවන්ට සුදුසු විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සඳහා විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
- භාවිතා කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ කළමනාකාරිත්වය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තු සහ අදාළ හෙළිදරව් කිරීම්වල සාධාරණ බව ඇගයීම.

- කළමනාකාරිත්වය විසින් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම භාවිතා කිරීමේ යෝග්‍යතාවය සහ ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීමේ හැකියාව කෙරෙහි සැලකිය යුතු සැකයක් ඇති කරන සිදුවීම් හෝ තත්වයන්ට අදාළව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් පවතින්නේ ද යන්න පිළිබඳ නිගමනයකට එළඹීම. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බව මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල අදාළ අනාවරණයන් හෝ එවැනි අනාවරණයන් ප්‍රමාණවත් නොවේ නම්, මාගේ මතය වෙනස් කිරීමට මාගේ විගණන වාර්තාව තුළ අවධානය යොමු කළ යුතුය. මගේ නිගමන පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මතය. කෙසේ වෙතත්, අනාගත සිදුවීම් හෝ තත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට බාධා වැල්ල විය හැකිය.

- අනාවරණයන් ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සහ මූල්‍ය ප්‍රකාශන සාධාරණ ඉදිරිපත් කිරීමක් සිදු වන ආකාරයෙන් පවතින ගණුදෙනු සහ සිදුවීම් නියෝජනය කරන්නේද යන්න ඇගයීම.

මාගේ විගණනයේ දී මා හඳුනා ගත් අභ්‍යන්තර පාලනයේ කිසියම් සැලකිය යුතු අඩුපාඩුවක් ඇතුළුව, වෙනත් කාරණා අතර, සැලකිය යුතු විගණන සොයා ගැනීම් පිළිබඳ මම පාලනය සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් දැනුවත් කරමි.

2. වෙනත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතට පහත අවශ්‍යතා සඳහා නිශ්චිත විධිවිධාන ඇතුළත් වේ.

2.1.1 විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මාගේ අධ්‍යයනය තුළින් හැකි පමණ මා ලබාගෙන ඇති අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12(අ) වගන්තියේ අවශ්‍යතාව අනුව කොමිෂන් සභාව විසින් නිසි ගිණුම්කරණ වාර්තා තබා ගෙන ඇත.

2.1.2 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ අවශ්‍යතාවය අනුව පෙර වසරට අනුකූල වේ.

2.1.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට පෙර වසරේ මා විසින් කරන ලද සියලුම නිර්දේශ ඇතුළත් වේ.

2.2. ක්‍රියාවට නංවන ලද ක්‍රියා පරිපාටි මත පදනම් වූ බැවින් සහ ලබාගත් සාක්ෂි ප්‍රමාණාත්මක කරුණුවලට පමණක් සීමා වූ බැවින් මාගේ අවධානයට කිසිවක් ලක් වී නැත;

2.2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ අවශ්‍යතාවය ප්‍රකාරව සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලින් බැහැර වන කොමිෂන් සභාව විසින් ඇති කර ගන්නා ලද ඕනෑම කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර උනන්දුවක් ඇති බව ප්‍රකාශ කිරීම.

අවධානයට යොමු වන කාරණාවේ ස්වභාවය	**අදහස**
වෛද්‍ය රක්ෂණාවරණය	මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 02 දෙනෙකු සඳහා රක්ෂණාවරණයක් ලබාගෙන තිබුණි. මෙම ආවරණය සඳහා 2021 වසරට අදාළව රු. 111,830 ක වාරිකය කොමිෂන් සභාව විසින් ගෙවා තිබුණි.

2.2.2.කොමිෂන් සභාව විසින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියට අනුව පහත කරුණු හැර කොමිෂන් සභාවේ පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද අදාළ ලිඛිත නීතිය, සාමාන්‍ය සහ විශේෂ විධාන කිසිවක් අනුගමනය කර නොමැති බව ප්‍රකාශ කිරීම;

නීතිය/විධානය වෙත වන යොමුව	**විස්තරය**
(අ) අංක PS/GPA/චක්‍රලේඛය /36/2020 හා 2020 දෙසැම්බර් 10 දිනැති ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය, අංක 07/2019 හා 2019 දෙසැම්බර් 04 දිනැති අයවැය චක්‍රලේඛය සහ අංක 4/2019 හා 2019 ජූනි 17 දිනැති අයවැය චක්‍රලේඛය	චක්‍රලේඛ උපදෙස් වලට අනුව, කිසියම් නිලධාරියෙකු/ රාජකාරියකට විශේෂිත වූ සහභාගීත්වයක් අත්‍යවශ්‍ය නොවේ නම්, දේශීය අරමුදල් වියදම් කරමින් නිලධාරීන් සම්මන්ත්‍රණ/වැඩමුළු ආදියට සහභාගි නොවිය යුතුය. කෙසේ වෙතත්, කොමිෂන් සභාව සිය 20 වැනි සංවත්සරය රු. 411,454 ක් වැය කරමින් 2021 මාර්තු 29 වන දින හෝටලයක දී පැවැත්වීය. කොමිෂන් සභාවේ 20 වැනි සංවත්සර උත්සවයේ දී කොමිෂන් සභා අරමුදල්වලින් රු. 952,600 ක් වැය කරමින් කාර්ය මණ්ඩල සාමාජිකයින් 16 දෙනෙකු සඳහා රන් කාසි ප්‍රධානය කරන ලදී.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ) අංක PED 01/2020 හා 2020 ජනවාරි 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 1.3 වගන්තිය	චක්‍රලේඛ උපදෙස් අනුව, මාසිකව පවත්වනු ලබන කමිටු රැස්වීම් සංඛ්‍යාව කුමක් වුවත්, සහභාගිවන්නන්ට ගෙවිය යුතු උපරිම මාසික සහභාගීත්ව දීමනාව මසකට රු. 25,000 කි. කෙසේ වෙතත්, රු. 245,460 ක් වූ අතිරික්ත මුදලක් 2021 ඔක්තෝම්බර් මාසයේදී කොමිෂන් සභා සාමාජිකයින් පස් දෙනෙකුට (05) සහ 2021 දෙසැම්බර් මාසයේදී සාමාජිකයින් හතර දෙනෙකුට (04) මණ්ඩලයේ සහභාගීත්වය වෙනුවෙන් ගෙවා ඇත.
(ඇ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 චක්‍රලේඛය මගින් හඳුන්වා දුන් යහපාලන මාර්ගෝපදේශවල 9.14.2 ඡේදය	මාර්ගෝපදේශයන්ට අනුව සකස් කරන ලද අත්පොත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතු අතර ඉන් අනතුරුව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව හරහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ එකඟතාව ලබා ගත යුතුය. කෙසේ වෙතත්, කොමිෂන් සභාව විසින් සකස් කරන ලද පරිපාලන අත්පොත සඳහා එවැනි අවසරයක් ලබාගෙන නොතිබුණි. එබැවින් මේ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ. කෙසේ වෙතත්, අනුමත නොකළ පරිපාලන අත්පොත මත පදනම්ව, කොමිෂන් සභාව විසින් අංක 14/99 2008 දෙසැම්බර් 31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව අනුමත උපරිම සීමාව වන රු. 250,000 ඉක්මවා සේවකයින් පස් දෙනෙකු සඳහා රු. 325,000 සිට රු. 500,000 දක්වා ආපදා ණය ලබා දී ඇත. ඒ අනුව සමාලෝචිත වසර සඳහා වැඩිපුර ලබා දී ඇති ආපදා ණය මුදල රු. 662,500 කි.
(ඈ) ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 7 වන වගන්තිය	විධායක කාණ්ඩයේ සේවකයින් සඳහා වාහන මිලදී ගැනීම සඳහා බැංකු හරහා ණය ලබාදීමට විධිවිධාන සලසා තිබුණ ද එම සේවකයන් තිදෙනාට වසර තුළ වාහන ණය රු. 1,200,000ක් කොමිෂන් සභාවේ අරමුදලින් වසර තුළ ලබා දී තිබුණි.
(ඉ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (3) වගන්තිය සහ මු.රෙ. 134 (1)	නිශ්චිත විධිවිධානවලට අනුව, අභ්‍යන්තර විගණකාධිපතිවරයා ප්‍රධානියා හෝ පාලක මණ්ඩලයට සෘජුවම වාර්තා කළ යුතුය. කෙසේ වෙතත්, අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව වගකීම් වාර්තා කිරීම සඳහා කාර්ය නිර්දේශය මගින් විධිවිධාන සලසා නොතිබුණි. ඉහත විධිවිධානවලට පටහැනිව 2019 වසර සඳහා අභ්‍යන්තර විගණන වාර්තා 2021 ජූලි 06 වැනි දින අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර තිබුණි.
(ඊ) අංක 03/2018 හා 2018 ජූලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය	මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව සේවකයින් බඳවා ගැනීම් සහ වැටුප් හා සේවක සංඛ්‍යාව වැඩි කිරීමෙන් සියලු අමාත්‍යාංශ සහ අනෙකුත් අදාළ බලධාරීන් වැළකී සිටිය යුතු බවට චක්‍රලේඛයෙන් උපදෙස් ලබාදී ඇත. කෙසේ වෙතත්, අධ්‍යක්ෂ තනතුරු එකක් (01), කළමනාකාර/ සහකාර කළමනාකාර තනතුරු දහතුනක් (13) සහ එක් (01) ලේකම් තනතුරක් මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණි.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(උ) අංක 01/2021 හා 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය	විගණන කමිටුවේ කැඳවුම්කරු වන්නේ අධ්‍යක්ෂ - මුදල් හා පරිපාලන වේ. රජය සතු ව්‍යාපාර සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 4.2 හි විධිවිධානවලට අනුව විගණකාධිපතිවරයාගේ නියෝජිතයෙකුට විගණන කමිටුව සඳහා නිතිපතා ආරාධනා කර නොතිබුණි

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තිය අනුව කොමිෂන් සභාව පහත දෑ හැර කිසිවක් එහි බලතල, කාර්යයන් සහ රාජකාරි අනුව ඉටු කර නොමැති බව ප්‍රකාශ කිරීමට;

(අ) 2010 වසරේ කාර්ය සාධන දිරි දීමනාවක් මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

(ආ) මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2019 වසරේ සිට මාස එකක (01) මූලික වැටුපක් වූ යෝජනා ක්‍රමය, දිරි දීමනා ගෙවීමේ පදනම මාස එකහමාරක (1 1 2) දළ වැටුප ලෙස වෙනස් කර ඇත. මේ හේතුවෙන් මුළු දිරි දීමනාව රු. 4,605,381 කින් ඉහළ ගොස් ඇති අතර එය පෙර වසරට සාපේක්ෂව 105% වැඩි වීමකි. තවද, අවසාන ඇගයීම සඳහා සියලුම සේවකයින් 100% ලකුණු ලබා ගෙන තිබුණි. එබැවින් කොමිෂන් සභාව මගින් යථාර්ථවාදී කාර්යසාධන ඇගයීමක් සිදු කර ඇති බවක් නොපෙනේ.

(ඇ) අංක PED/12 හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 9.14.2 වගන්තියට අනුව සකස් කරන ලද ක්‍රියා පටිපාටි අත්පොත මණ්ඩලය විසින් අනුමත කළ යුතු අතර ඉන් අනතුරුව මහා භාණ්ඩාගාරයෙහි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හරහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ එකඟතාව ලබා ගත යුතුය. කෙසේ වෙතත්, කොමිෂන් සභාවේ පරිපාලන අත්පොත මහා භාණ්ඩාගාරයෙන් අනුමත කර නොතිබුණි. එබැවින් නිවාඩු සඳහා වන ගෙවීමටනිසි බලතල නොමැතිව රු. 1,639,753 ක් වැය කර ඇත.

2.2.4 පහත කටයුතු හැර අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තිය ප්‍රකාරව අදාළ නීතිවලට අනුකූලව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් සහිතව, කාර්යක්ෂම හා ඵලදායී ලෙස ලබාගෙන ඒවා භාවිතා කර නොමැති බව ප්‍රකාශ කිරීම;

(අ) කොමිෂන් සභාවේ නිල කටයුතු සඳහා ආර්ථික වශයෙන් වාසිදායක ස්ථානයක් තෝරා ගැනීමෙන් තොරව බාහිර ගොඩනැගිල්ලක එම සිදු කරන ලද අතර 2021 වර්ෂයේ දී ඒ සඳහා ගෙවන ලද බදු කුලිය ලෙස රු.48,109,101 ක් ගෙවා ඇත.

(ආ) කොමිෂන් සභාව 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතේ දක්වා ඇති එහි කාර්යභාරය ඉටු කිරීමේ දී මහජනතාව සමග සමීපව කටයුතු කළ යුතු ආයතනයක් විය යුතුය. කෙසේ වෙතත්, එහි වත්මන් පිහිටීම, සංස්කෘතිය සහ ඇතුල්වීමේ දොරටු දැඩි ආරක්ෂකව මධ්‍යයේ පැවතීම සාමාන්‍ය ජනතාවට ප්‍රවේශ වීමේ දුෂ්කරතා ඇති කරයි. තවද, මහජනතාවට කොමිෂන් සභා පරිශ්‍රයට ඇතුළු වීමට සහාය වීම සඳහා පෙරටු කාර්යාලයේ කිසිඳු නිලධාරියෙකු නොසිටීමද බොහෝ අවස්ථා වල නිරීක්ෂණය විය. තවද, වෙබ් අඩවියේ සියලුම තොරතුරු ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් දක්වා ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කළමනාකරණ විසඳුම ලබාදීම.

(i) නිසි පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණයකින් තොරව කොමිෂන් සභාව විසින් 2019 දී අධ්‍යක්ෂ මණ්ඩල විසඳුමක් මිල දී ගෙන ඇති අතර එහිදී මෘදුකාංගය සඳහා රු.1,013,000 ක් ද වැය කර මෘදුකාංගය සහ වාර්ෂික ග්‍රාහකත්වය සඳහා රු. 923,000 ක් ද වැය කර ඇත. විගණනය මගින් සිදු කරන ලද පිරිවැය විශ්ලේෂණයට අනුව, 2020 සහ 2021 වසරවල

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 01 සඳහා මෘදුකාංග සඳහා වන පිරිවැය රු. 63,533 කි. මීට අමතරව, මණ්ඩල පත්‍රිකා සන්නිවේදනය කිරීමට රැස්වීමක් සඳහා වන සාමාන්‍ය පිරිවැය රු. 92,995 කි. එබැවින් මෙම විසඳුම ලාභදායී ක්‍රමයක් දැයි සැකයක් පවතී.

(ii) ඉහත තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් 6,044,647ක් බව නිරීක්ෂණය වේ. කෙසේ වෙතත්, අංක 03/2020 හා 2020 සැප්තැම්බර් 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.5 ඡේදයට අනුව කොමිෂන් සභාව මෙම ප්‍රසම්පාදනයෙහි තාක්ෂණික කරුණු සහ ව්‍යාකූලත්වයන්ට අදාළව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ උපදෙස් ලබාගෙන ඇති බව නිරීක්ෂණය වී නොමැත.

(iii) කොමිෂන් සභාවේ සාමාජිකයින් පත්කිරීමේ දී සහ ඉන් ඉවත් වීමේ දී iPad සහ ඊට අදාළ උපකරණ නිකුත් කිරීම සහ ලබා ගැනීම සඳහා කොමිෂන් සභාව සතුව නිසි ලිඛිත ක්‍රියාවලියක් නොමැති බව නිරීක්ෂණය වේ.

(iv) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කළමනාකරණ විසඳුම ප්‍රසම්පාදනය කිරීමේ සංශෝධිත ප්‍රසම්පාදන කාලසටහන සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන තිබේද යන්න සම්බන්ධයෙන් විගණනය සඳහා සාක්ෂි සපයා නොතිබුණි.

(v) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.7.5 මාර්ගෝපදේශයට අනුව රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (DPC) පත් කළ යුතුය. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව එවැනි කමිටුවක් පත් කර තිබුණේ ද යන්න සම්බන්ධයෙන් විගණනය සඳහා සාක්ෂි නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) අභ්‍යන්තර විගණන සේවා සැපයීම

(i) 2019 සැප්තැම්බර් 19 වැනි දින ප්‍රධාන ගිණුම් නිලධාරී (CAO) විසින් පත් කරන ලද පංච පුද්ගල දෙපාර්තමේන්තු උපදේශක ප්‍රසම්පාදන කමිටුව (CPCD) විසින් උපදේශකයින් තෝරා ගැනීම සහ සේවයේ නියුක්ත කිරීම සඳහා වන මාර්ගෝපදේශයට අනුකූලව විගණන ආයතනයෙන් අභ්‍යන්තර විගණන සේවාව සපයා ඇත. 2007 අගෝස්තු. දෙපාර්තමේන්තු උපදේශක ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් සිව්දෙනා අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ - මූල්‍ය හා පරිපාලන ඇතුළු කොමිෂන් සභාවේ ප්‍රධාන සේවකයින් වූ බැවින් ඔවුන්ගේ කටයුතු සහ ක්‍රියාවන් අභ්‍යන්තර විගණකගේ විෂය පථය යටතේ පැවතුණි. එබැවින් ඔවුන් පත්කිරීමේ ස්වාධීනත්වය ගැටළුසහගතය. එබැවින්, කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කිරීමේදී විනිවිදභාවයෙන් යුතු ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. එබැවින් අභ්‍යන්තර විගණකයාගේ ස්වාධීනත්වය සහ වාස්තවිකත්වය අඩාල විය හැක.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමේදී අභ්‍යන්තර විගණක සඳහා වාර්තා කරන වාර ගණන සහ වාර්තා කිරීමේ කාලයට අදාළ ඉලක්ක නිර්වචනය කර නොතිබුණි.

(iii) කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන උපදේශකවරයෙකු තෝරා ගැනීමට යෝජනා සමග අභ්‍යන්තර විගණන වැඩ සැලැස්මක් ලබාගෙන නොතිබුණි. අනතුරුව, උපදේශකයින් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ඇගයීම සඳහා ඇගයීම් අදියරේදී වැඩ සැලැස්මක් නැවත කැඳවා තිබුණි.

(iv) අභ්‍යන්තර විගණන සේවා සැපයීම පිළිබඳ ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාවට අනුව, ලංසු විවෘත කර තිබුණේ 2019 දෙසැම්බර් 18 වැනිදාය. කෙසේ වෙතත්, ලංසු ඇගයීම 2021 ජූනි 16 දින සිදු කර ඇත. උපදේශකයින් තෝරා ගැනීම සහ සේවයේ නියුක්ත කිරීම පිළිබඳ මාර්ගෝපදේශවල 8.4.1 වගන්තියට අනුව යෝජනා ඇගයීම සඳහා අවශ්‍ය සියලුම විධිමත් අනුමැතීන් ලබා ගැනීමට ප්‍රමාණවත් කාලයක් ඉතිරි වන පරිදි කඩිනමින් සිදු කළ යුතුය. එබැවින්, ප්‍රසම්පාදන කාල සටහනේ දක්වා ඇති කාල සීමාව තුළ යෝජනා ඇගයීමට ලක් කළ යුතුය. කෙසේ වෙතත්, ලංසු විවෘත කිරීමේ දින සිට මාස හයක ප්‍රමාදයකින් යෝජනා ඇගයීම් සිදු කර ඇති බව නිරීක්ෂණය වේ.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(v) උපදේශකයින් තෝරා ගැනීම සහ සේවයේ නියුක්ත කිරීම පිළිබඳ මාර්ගෝපදේශවල 6.5.9 වගන්තියට අනුව, යෝජනා ඉල්ලීමට පෙර ඇගයීමේ නිර්ණායක සහ උප නිර්ණායක තීරණය කරනු ලැබේ. ලංසු විවෘත කිරීමෙන් පසු අභ්‍යන්තර විගණකවරයා තෝරා ගැනීම සඳහා කෙටි ලැයිස්තුගත කිරීම් සහ ඇගයීම් නිර්ණායක සහිත ලකුණු ලබා දීමේ ක්‍රමය නිර්වචනය කර ඇත. එම නිර්ණායක 2020 ජූනි 16 දින ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරන ලදී.

(ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්ය සාධනය ඇගයීම සභාපතිවරයා විසින් සිදු කර තිබුණි. මෙමගින් කොමිෂන් සභාවේ ප්‍රබල තනතුරු දෙකක් අතර ගැටුමක් ඇති විය හැකි අතර අහිතකර තීරණ ගැනීමටද හේතු විය හැක. හොඳම භාවිතය වන්නේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්ය සාධනය කොමිෂන් සභාව විසින් ඇගයීමට ලක් කිරීමයි. තවද, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්ය සාධන ඇගයීම් ආකෘති පත්‍රය විගණනය සඳහා නොතිබුණි.

(ඇ) රක්ෂණයේ ප්‍රධාන මූලධර්ම (ICPs) යනු ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන්ගේ සංගමය (IAIS) විසින් සකස් කරන ලද ගෝලීය වශයෙන් පිළිගත් මූලධර්ම රාමුවකි. රක්ෂණ නියාමකයින්ගේ නියාමන සහ අධීක්ෂණ කාර්යයේ ගුණාත්මක භාවය තක්සේරු කිරීමට සහ රට තුළ රක්ෂණ ක්ෂේත්‍රය සඳහා රෙගුලාසි හඳුන්වා දීමේ රාමුවක් ලෙස භාවිතා කිරීමට එම මූලධර්ම වැදගත් වේ. ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන්ගේ සංගමයෙහි සාමාජිකයෙකු ලෙස කොමිෂන් සභාව විසින් 2020 වසර සඳහා සාමාජික ගාස්තු ලෙස රු. 4,124,500 ගෙවා ඇත. කොමිෂන් සභාව විසින් රක්ෂණයේ ප්‍රධාන මූලධර්මවලට අනුකූල වන ආකාරය හඳුනා ගැනීම සඳහා තොරතුරු ඉල්ලා තිබුණි. කෙසේ වුවද, ඉල්ලා සිටි තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) කොමිෂන් සභාව විසින් 2020 දක්වා අදාළ වර්ෂ සඳහා කොමිෂන් සභාවේ අරමුදල්වල අතිරික්තය රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට බැර කර ඇත. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී මෙම ප්‍රතිපත්තිය හඳිසියේ වෙනස් කර ඇති අතර කොමිෂන් සභාවේ අරමුදල් අතිරික්තය සමුච්චිත අරමුදල ලෙස ඉදිරියට ගෙන ගොස් ඇත. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. වෙනත් ආකාරයකින් මෙම අරමුදල නිසි ලෙස අධීක්ෂණය නොකළහොත්, මෙම අරමුදල අවභාවිත කිරීමට ඉඩ ඇත.

(ඉ) මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය

(i) මූල්‍ය අංශයේ නවීකරණ ව්‍යාපෘතියේ (FSMP) ගිවිසුමට අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක වන කාල සීමාව පුරාවට විය ක්‍රියාත්මක කරන ආයතනය විසින් ඉන් පසු එළඹෙන එක් එක් මූල්‍ය වසරක නොවැම්බර් 30 දිනට පෙර අනුමැතිය සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) වෙත වාර්ෂික වැඩ සැලැස්මක් සහ ව්‍යාපෘතියේ 2(ඇ) සංරචකය යටතේ ක්‍රියාකාරකම් සඳහා අයවැයක් ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, 2020 සහ 2021 වසර සඳහා වන වාර්ෂික වැඩ සැලසුම් විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර එම ලේඛන ජාත්‍යන්තර සංවර්ධන සංගමය වෙත ඉදිරිපත් කර තිබේද යන්න පිළිබඳ තොරතුරු ලබාගෙන නොතිබුණි.

(ii) මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි අධීක්ෂණය මත ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ව්‍යාපාර වෙන් කිරීම සඳහා ඇ.ඩො. 945,450 (රු.මි. 0.67) වෙන් කර තිබුණි. නමුත් මෙම මුදල් මේ සඳහා යොදවා තිබුණේ නැත.

(iii) මෙම ව්‍යාපෘතිය යටතේ කොමිෂන් සභාවේ අධීක්ෂණ සහ නියාමන ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා වූ සවිස්තරාත්මක වැඩ සැලැස්ම විගණනයට ලබා ගත නොහැකි විය.

(iv) ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විශේෂඥයින්ගේ සහ උපදේශකයින්ගේ වැඩ කටයුතු එකිනෙකට සම්බන්ධ විය යුතුය. කෙසේ වුවද, මෙම ව්‍යාපෘතිය සඳහා උපදේශකයින් වරින් වර බඳවා ගෙන තිබූ අතර ව්‍යාපෘතියේ පොදු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එම උපදේශකයින් අතර දැඩි අන්තර් සම්බන්ධතාවක්

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

දක්නට නොලැබුණු බව නිරීක්ෂණය විය. මෙම දුර්වල ව්‍යාපෘති කළමනාකරණය හේතුවෙන් අපේක්ෂිත ව්‍යාපෘති අරමුණු සහ ප්‍රතිඵල සාක්ෂාත් කර ගෙන නොතිබුණි.

(v) ආයුගණක උපදේශකවරයා 2022 මාර්තු 29 දින සිට බලපැවැත්වෙන පරිදි ඔහුගේ කොන්ත්‍රාත්තුව අවසන් කර ඇත. 2022 ජනවාරි 24 දිනට ආයුගණක උපදේශකවරයාගේ "රක්ෂණ (ආයුගණක) ව්‍යාපෘතියේ උපදේශක ඇගයීම" නම් වූ වාර්තාවට අනුව කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට හේතු වූයේ තම නිර්දේශ සඳහා කළමනාකාරිත්වය විසින් ලබා දුන් අදහස් ඉදිරිපත් නොකිරීම, ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමට සහ පසු විපරම් කිරීමට කිසිදු පියවරක් නොගැනීම, සංරචක නියාමකයන් සාධාරණ තර්කයන් සමගින් තම යෝජනාවලට ප්‍රතිචාර නොදැක්වීම, මෙම ව්‍යාපෘතිය යටතේ බඳවා ගත යුතු වූ රක්ෂණ විශේෂඥයින්ගෙන් කිසිදු සහායක් නොලබා කටයුතු කිරීමට ආයුගණකවරයාට සිදු වීම, රක්ෂණ සහ තොරතුරු තාක්ෂණ විශේෂඥයින් සැපයීමට කොමිෂන් සභාව බැඳී සිටියද නිසි පැහැදිලි කිරීමකින් තොරව කොමිෂන් සභාව එම සහාය ලබා දීම මග හැරීම යනාදියයි. ඉහත නිරීක්ෂණ මත පදනම්ව, ආයුගණක උපදේශකවරයා සඳහා ඇ.ඩො.168,000 ගෙවීම ආර්ථික වශයෙන් වාසිදායක නොවන ගනුදෙනුවක් බව නිරීක්ෂණය වේ.

(vi) විගණනය සඳහා පවතින තොරතුරුවලට අනුව ආයුගණක උපදේශකවරයා විසින් ලබා දී ඇති වැඩ සැලැස්මට අනුව කිසිදු වාර්තාවක් හෝ සංරචක 3 කට අදාළ කාර්යයන් පිළිබඳ වාර්තාකර නොතිබුණි. එබැවින් සංරචක 17 න් සංරචක 14 ක් සඳහා අවසන් සහ කෙටුම්පත් වාර්තා ඉදිරිපත් කර තිබුණි. විගණනය සඳහා පවතින විස්තර අනුව එම වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර නොතිබූ අතර නියාමකයන් ලෙස අදහස් දැක්වීම, සංවර්ධනය කිරීම සහ ප්‍රතිපත්ති සැකසීම සම්බන්ධයෙන් වගකිව යුතු අදාළ පාර්ශව සමග එම වාර්තා පිළිබඳ සාකච්ඡා කර ඇති බවට කිසිදු සාක්ෂියක් නොමැත.

(vii) වැඩ සැලැස්මට අනුව ආයුගණක උපදේශකවරයා රක්ෂණ උපදේශකවරයා සහ තොරතුරු තාක්ෂණ උපදේශකවරයා වැනි වෙනත් උපදේශකයින් සමග සම්බන්ධ වී කටයුතු කළ යුතුව තිබිණි. එබැවින් එම උපදේශකයින් අතර සම්බන්ධීකරණය කිරීමට කොමිෂන් සභාව ඔවුන්ට පහසුකම් සපයා නොමැති බව අපට නිරීක්ෂණය විය.

(viii) මානව සම්පත් උපදේශක වෙත පැවරී ඇති කාර්යයට අනුව, අවසාන කාර්යය වන්නේ උපදේශකවරයාගේ කාර්යය ඉටු කිරීමේදී සේවාලාභියාගේ අනාගත වර්ධනයන් පිළිබඳ අදහස් ලබා ගැනීම සඳහා ව්‍යාපෘතිය යටතේ කුලියට ගත් අනෙකුත් උපදේශකයින් සමග සම්බන්ධව කටයුතු කිරීමයි. ව්‍යාපෘති ප්‍රගතිය අනුව පත් කර තිබුණේ ආයුගණක උපදේශකවරයන් පමණි. මානව සම්පත් උපදේශක හට මෙම ව්‍යාපෘතියේ අනෙකුත් උපදේශකයින් සම්බන්ධ කර ගැනීමට සහ සාකච්ඡා කිරීමට හැකි වූ බවට කිසිදු සාක්ෂියක් නොමැත. එබැවින් උපදේශකවරයන් අතර නිසි සම්බන්ධීකරණයක් සහ සන්නිවේදනයක් නොමැතිකම හේතුවෙන් ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීමට නොහැකි වනු ඇත.

(ix) 2021 දෙසැම්බර් සඳහා වන ප්‍රගති වාර්තාව සහ 2021 නොවැම්බර් 29 දින ලෝක බැංකු නියෝජිතයාගෙන් ලැබුණු විද්‍යුත් තැපෑල අනුව මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය 2022 ජූනි 30 දිනෙන් අවසන් වන බව දන්වා ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය අවසන් කිරීමට ගත් තීරණයේ දිනය, ව්‍යාපෘතිය අවසන් කිරීමට තීරණය කරන අධිකාරිය, ව්‍යාපෘතිය අවසන් කිරීමට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) 2020 සහ 2021 වසර සඳහා වන අභ්‍යන්තර විගණන වාර්තා 2022 ඔක්තෝම්බර් 20 දින වන විට නොතිබුණි. එබැවින්, හඳුනාගත් ගැටළු සඳහා නිසි කලට විසඳුම් ලබා දීමට කොමිෂන් සභාවට නොහැකි විය හැකිය. තවද, බාහිර විගණකගේ කාර්යයන් සැලසුම් කිරීමේදී සහ ඒවා සිදු කිරීමේදී අභ්‍යන්තර විගණකගේ කාර්යයන්ට අදාළ ලේඛන භාවිතා කිරීමට බාහිර විගණකවරයාට නොහැකි විය.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(උ) නීතිපතිවරයාගේ මතය මත කොමිෂන් සභාව ඔවුන්ගේ සේවක සංඛ්‍යාව සහ වැටුප් ක්‍රමය තීරණය කර තිබිණි. 2019 මැයි 31 දිනැති සංදේශය මගින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සඳහා 2018 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් ගැලපීම, සේවක සංඛ්‍යා සංශෝධනය, රු. 7800 ක ජීවන වියදම් දීමනාව, මූලික වැටුපෙන් 15% ක් වන නිපුණතා දීමනාව ගෙවීම සහ රු. 12,500 ක් වූ විශේෂ ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා සභාපතිවරයාගේ අනුමැතිය ඉල්ලා සිටින ලදී. කොමිෂන් සභාව මුදල් අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන ආයතනයක් වුවද තම සේවක සංඛ්‍යාව තීරණය කිරීමට සහ වැටුප් හා දීමනා ඉහළ නැංවීමට කොමිෂන් සභාව මහා භාණ්ඩාගාරයෙන් නිෂ්කාශනය හෝ එකඟතාව ලබාගෙන නොතිබුණි.

(ඌ) අංක 03/2018 හා 2018 ජූලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියක් ලබා නොගෙන නීතිපතිවරයාගේ මතය මත පදනම්ව 2019 වර්ෂයේදී කොමිෂන් සභාවේ වැටුප් 12.98% සිට 59.73% දක්වා ඉහළ ගොස් ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිතයා මේ සම්බන්ධයෙන් තම ස්වාධීන මතය අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර මහජන යහපත සුරක්ෂිත කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(එ) තම සේවකයන් සඳහා ස්වයං දායක රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමට කොමිෂන් සභාව අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. සේවකයින්ගේ දායකත්වයකින් තොරව රක්ෂණ ආවරණයක් ලබා ගැනීම සඳහා 2021 වසරේ දී කොමිෂන් සභාව සිය අරමුදල්වලින් රු.මි. 6.2 ක් වැය කර ඇත. කෙසේ වුවද, 2017 වර්ෂයේ දී ජාතික රක්ෂණ භාර අරමුදල අර්ධ රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා ද මසකට රු. 1000 ක දායකත්වයක් අය කරමින් ස්වයං දායක රක්ෂණ ක්‍රමය දීර්ඝ කර ඇති බව නිරීක්ෂණය විය.

(ඒ) 2021 වසර සඳහා ඇස්තමේන්තු කරන ලද සුභසාධන වියදම රු. 3,036,000 ක් වන නමුත් සැබෑ පිරිවැය රු. 3,477,654 කි. ඒ අනුව, ඇස්තමේන්තු කරන ලද වියදමට වඩා රු. 441,654 ක් (12.7%) වියදම් කර තිබුණි. තවද, කොමිෂන් සභාවේ ප්‍රවාහනය සඳහා වන සුභසාධන වියදම් හැර අනෙකුත් සුභසාධන වියදම් සලකා බැලීමේ දී සමාලෝචිත වර්ෂය සඳහා එක් සේවකයෙකුට කොමිෂන් සභා අරමුදල් මගින් දරනු ලබන වාර්ෂික සුභසාධන වියදම රු. 36,640 ක් වේ.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

2021 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
2.2.1	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ අවශ්‍යතාවය ප්‍රකාරව සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලින් බැහැර වන කොමිෂන් සභාව විසින් ඇති කර ගන්නා ලද ඕනෑම කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර උනන්දුවක් ඇති බව ප්‍රකාශ කිරීම. වෛද්‍ය රක්ෂණාවරණය මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 02 දෙනෙකු සඳහා රක්ෂණාවරණයක් ලබාගෙන තිබුණි. මෙම ආවරණය සඳහා 2021 වසරට අදාළව රු. 111,830 ක වාරිකය කොමිෂන් සභාව විසින් ගෙවා තිබුණි.	2021 වසරේ ඇති වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කොමිෂන් සභා රැස්වීම්වලට සහභාගි වීමේදී තමන් අවදානමට ලක් වූ බැවින්,එම අවදානම අවම කිරීම සඳහා අවශ්‍ය තත්වයන් යටතේ ඔවුන් සඳහා රක්ෂණ ආවරණය දීර්ඝ කරන ලෙස කොමිෂන් සභාවේ ඇතැම් සාමාජිකයන් විසින් ඉල්ලීම් කරන ලදී. රක්ෂණාවරණය ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දෙන ලද ඉහළ ප්‍රමුඛතාව හේතුවෙන් එය ලබා දෙන ලද්දේ කොමිෂන් සභාවේ අනුමැතිය සහ සාමාජිකයන් හට රක්ෂණාවරණය ලබා දීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවල කිසිවක් සඳහන් නොවන බවට වන කොමිෂන් සභාවේ සභාපති විසින් දක්වන ලද අදහස මතයි. සභාපතිවරයා සහ නිල බලයෙන් පත් වූ සාමාජිකයන් තිදෙනා එම පහසුකම ලබා ගත්තේ නැත.
2.2.2	කොමිෂන් සභාව විසින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියට අනුව පහත චක්‍රලේඛ හැර කොමිෂන් සභාවේ පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද අදාළ ලිඛිත නීති, සාමාන්‍ය සහ විශේෂ විධාන කිසිවක් අනුගමනය කර නොමැති බව ප්‍රකාශ කිරීම;	
(අ)	අංක PS/GPA/චක්‍රලේඛ/36/2020 හා 2020 දෙසැම්බර් 10 දිනැති ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය, අංක 07/2019 හා 2019 දෙසැම්බර් 04 දිනැති අයවැය චක්‍රලේඛය සහ අංක 4/2019 හා 2019 ජූනි 17 දිනැති අයවැය චක්‍රලේඛය චක්‍රලේඛ උපදෙස් වලට අනුව, කිසියම් නිලධාරියෙකු/රාජකාරියකට විශේෂිත වූ සහභාගීත්වයක් අත්‍යවශ්‍ය නොවේ නම්, දේශීය අරමුදල් වියදම් කරමින් නිලධාරීන් සම්මන්ත්‍රණ/වැඩමුළු ආදියට සහභාගි නොවිය යුතුය. කෙසේ වෙතත්, කොමිෂන් සභාව සිය 20 වැනි සංවත්සරය රු. 411,454 ක් වැය කරමින් 2021 මාර්තු 29 වන දින හෝටලයක දී පැවැත්වීය. කොමිෂන් සභාවේ 20 වැනි සංවත්සර උත්සවයේදී කොමිෂන් සභා අරමුදල්වලින් රුපියල් 952,600ක් වැය කරමින් කාර්ය මණ්ඩල සාමාජිකයින් 16 දෙනෙකු සඳහා රන් කාසි ප්‍රදානය කරන ලදී.	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සංවත්සර සැමරුම එහි 20 වැනි වසර තුළ ප්‍රථම වතාවට පවත්වන ලදී. එය ආයතනයට තම උපරිම දායකත්වය ලබා දීමට අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයින් පොළඹවයි. ප්‍රථම වරට පවත්වනු ලබන මෙවැනි සංවිධානාත්මක උත්සවයකට ඔවුන්ගේ සහභාගීත්වය අත්‍යාවශ්‍ය වූ බැවින් සමස්ත කාර්ය මණ්ඩලයට මෙම අවස්ථාවට සහභාගී වන ලෙස ආරාධනා කරන ලදී. තවද, එය ලිපියේ සඳහන් පරිදි සම්මන්ත්‍රණයක්/වැඩමුළුවක් නොවීය. සේවය සඳහා වන සම්මානයක් යනු සේවකයෙකු යම් කාලයක් පුරාවට ව්‍යාපාරය වෙනුවෙන් කරන ලද සේවයට ස්තූතිය පිරිනැමීමකි. සේවකයින් ආයතනයේ වටිනා සාමාජිකයන් බවත් ඔවුන්ගේ කැපවීම හඳුනා ගෙන ඇති බවත් ඔවුන්ගේ සේවය ඇගයීමට ලක්වන බවත් සම්මානයක් ලබා දීම මගින් පෙන්නුම් කෙරේ. ආයතනය තුළ දීර්ඝ කාලයක් රැඳී සිටීමට සේවකයන් දිරිමත් කිරීම මෙහි අරමුණයි. නව සේවකයින් බඳවා ගැනීම සහ පුහුණු කිරීම සඳහා සැලකිය යුතු කාලයක් ගත වන අතර ම ඉහළ පිරිවැයක් දැරීමට ද සිදු වන බවත් කාර්ය මණ්ඩල පිරිවැටුම සංවිධානයේ ප්‍රතිඵල කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කළ හැකි බවත් සෑම කෙනෙක් ම හොඳින් දන්නා කරුණකි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් පසු ස්ථානය තෝරා ගත් අතර රජය සතු හිල්ටන් හෝටලය රු. 280,000/- ක් සාධාරණ මුදලකට තෝරා ගන්නා ලදී.

2021 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
(ආ)	අංක PED 01/2020 හා 2020 ජනවාරි 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 1.3 වගන්තිය චක්‍රලේඛ උපදෙස් අනුව, මාසිකව පවත්වනු ලබන කමිටු රැස්වීම් සංඛ්‍යාව කුමක් වුවත් සහභාගිවන්නන්ට ගෙවිය යුතු උපරිම මාසික සහභාගීත්ව දීමනාව මසකට රු. 25,000 කි. කෙසේ වෙතත්, රු. 245,460 ක් වූ අතිරික්ත මුදලක් 2021 ඔක්තෝම්බර් මාසයේදී කොමිෂන් සභා සාමාජිකයින් පස් දෙනෙකුට (05) සහ 2021 දෙසැම්බර් මාසයේදී සාමාජිකයින් හතර දෙනෙකුට (04) අනු කමිටු රැස්වීම් සඳහා සහභාගිවීම වෙනුවෙන් ගෙවා ඇත.	PED 01/2020 හි 1.3 වගන්තියට අනුව, සභාපතිවරුන්ට, විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට සහ නිරීක්ෂකයින්ට දීමනා ගෙවීම රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක: PED 3/2015 හි දක්වා ඇති කොන්දේසි මත පදනම් විය යුතුය. කෙසේ වුවද, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු හෝ නිරීක්ෂකයෙකු මාසයක් තුළ සහභාගී වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව කුමක් වුවත්, මාසයක් තුළ පවත්වනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා වන මුළු රැස්වීම් දීමනාව මසකට රු. 25,000/-ට වැඩි නොවිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා වන ගෙවීම් මසකට රු. 25,000/- ඉක්මවා නොගියේය. අනෙකුත් සියළු ම ගෙවීම් සිදු කර ඇත්තේ අනු කමිටු රැස්වීම් සඳහා වන අතර ඒ සම්බන්ධයෙන් චක්‍රලේඛයෙහි කිසිදු සීමාවක් දක්වා නැත. එබැවින්, ඔබගේ ලිපියේ සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සඳහා සිදු කරන ලද ගෙවීම් නියමාකරයෙන් සිදු කර ඇත.
(ඇ)	2003 ජූනි 02 දිනැති අංක PED/12 චක්‍රලේඛය මගින් හඳුන්වා දුන් යහපාලන මාර්ගෝපදේශවල 9.14.2 ඡේදය මාර්ගෝපදේශයන්ට අනුව සකස් කරන ලද අත්පොත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතු අතර ඉන් අනතුරුව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව හරහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ එකඟතාව ලබා ගත යුතුය. කෙසේ වෙතත්, කොමිෂන් සභාව විසින් සකස් කරන ලද පරිපාලන අත්පොත සඳහා එවැනි අවසරයක් ලබාගෙන නොතිබුණි. එබැවින් මේ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ. කෙසේ වෙතත්, අනුමත නොකළ පරිපාලන අත්පොත මත පදනම්ව, කොමිෂන් සභාව විසින් අංක 14/99 හා 2008 දෙසැම්බර් 31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව අනුමත උපරිම සීමාව වන රු. 250,000 ඉක්මවා සේවකයින් පස් දෙනෙකු සඳහා රු. 325,000 සිට රු. 500,000 දක්වා ආපදා ණය ලබා දී ඇත. ඒ අනුව සමාලෝචිත වසර සඳහා වැඩිපුර ලබා දී ඇති ආපදා ණය මුදල රු. 662,500 කි.	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ පරිපාලන අත්පොත බොහෝ කලකට පෙර සකස් කරන ලදී. එය ප්‍රධාන වශයෙන් පදනම් වූයේ ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභා පරිපාලන අත්පොත මත වන අතර එම ආයතනය සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (එවකට IBSL) එකම සභාපතිත්වය යටතේ ක්‍රියාත්මක විය. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ආරම්භයේ සිට එය යොදා ගන්නා ලදී. අවශ්‍යතාවය මත, අධ්‍යක්ෂ මණ්ඩලයේ/කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව එකී අත්පොතට වරින් වර වෙනස්කම් ඇතුළත් කර ඇත. යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ මත පදනම්ව පරිපාලන අත්පොත මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අනුමැතියට යොමු කරන ලද අතර මුල් අත්පොත 2012 ඔක්තෝම්බර් 23 වැනි දින අමාත්‍යාංශය වෙත යවා වරින් වර සිහි කැඳවීම් යවන ලදී. ඉන් අනතුරුව අත්පොතෙහි සිදු කරන ලද වෙනස්කම් ද දැනුම් දෙන ලදී.

2021 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
(ඈ)	ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය විධායක කාණ්ඩයේ සේවකයින් සඳහා වාහන මිලදී ගැනීමට බැංකු හරහා ණය ලබාදීමේ ප්‍රතිපාදන සලසා තිබුණද වසර තුළ එම සේවකයන් තිදෙනාට කොමිෂන් සභා අරමුදල්වලින් රු. 1,200,000 ක වාහන ණය ලබා දී තිබුණි.	2018 අප්‍රේල් 05 වැනි දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් කොමිෂන් සභාවට දන්වා සිටිනු ලැබුවේ පරිපාලන අත්පොත සඳහා අනුමැතිය ලබාදීමේ ක්‍රියාවලියේදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටියේ ඇති සංකූලතා හේතුවෙන් ප්‍රමාදයක් පවතින බවයි. තවද, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අත්පොත අනුමත කිරීමට සලකා බලන තුරු එම අත්පොතෙහි ඇති ක්ෂේත්‍ර සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ අදාළ කර ගන්නා ලෙස අපෙන් ඉල්ලා සිටින බව ඔවුහු ප්‍රකාශ කළහ. ඒ ආනුව, කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි කාර්ය මණ්ඩලයට ලබා දී ඇති පහසුකම් සහ රජයේ රෙගුලාසි / චක්‍රලේඛ අතර සැසඳීමක් සිදු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස පහසුකම් සැලකිය යුතු අන්දමින් වෙනස් බව නිරීක්ෂණය විය. රජයේ චක්‍රලේඛ අදාළ කර ගැනීමට අපට ඇති නොහැකියාව පැහැදිලි කිරීම නුවණට හුරු බව කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී. දැඩි වෙනස්කම් මගින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ කටයුතු නිසි ලෙස ඉටු කිරීම සහ කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති පරිපාලන අත්පොත අනුව කටයුතු කරගෙන යාම කෙරෙහි දැඩි බාධාවන් එල්ල කරනු ලැබේ. කාර්ය මණ්ඩලයේ වැටුප් හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් තීරණ ගැනීමේ පූර්ණ බලය නීතිපතිවරයා විසින් තහවුරු කරන ලද පරිදි පනත මගින් කොමිෂන් සභාව වෙත පවරා ඇති බව සඳහන් කළ යුතුය. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට සමාන මූල්‍ය අංශයේ වෙනත් නියාමකයින් කොමිෂන් සභාව සිය කාර්ය මණ්ඩලයට සපයනු ලබන පහසුකම්වලට වඩා වැඩි පහසුකම් තම කාර්ය මණ්ඩලය සඳහා සපයයි.
(ඉ)	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (3) වගන්තිය සහ මු.රෙ. 134 (1) නිශ්චිත විධිවිධානවලට අනුව, අභ්‍යන්තර විගණකාධිපතිවරයා ප්‍රධානියා හෝ පාලක මණ්ඩලයට සෘජුවම වාර්තා කළ යුතුය. කෙසේ වෙතත්, අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව වගකීම් වාර්තා කිරීම සඳහා කාර්ය නිර්දේශය මගින් විධිවිධාන සලසා නොතිබුණි. ඉහත විධිවිධානවලට පටහැනිව 2019 වසර සඳහා අභ්‍යන්තර විගණන වාර්තා 2021 ජූලි 06 වැනි දින අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර තිබුණි.	2020 සහ 2021 සඳහා වන වාර්තාව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සභාපති වෙත යොමු කරන ලෙස අපි අභ්‍යන්තර විගණකවරයාගෙන් ඉල්ලා සිටින්නෙමු.
(ඊ)	අංක 03/2018 හා 2018 ජූලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව සේවකයින් බඳවා ගැනීම් සහ වැටුප් හා සේවක සංඛ්‍යාව වැඩි කිරීමෙන් සියලු අමාත්‍යාංශ සහ අනෙකුත් අදාළ බලධාරීන් වැළකී සිටිය යුතු බවට චක්‍රලේඛයෙන් උපදෙස් ලබාදී ඇත. කෙසේ වෙතත්, අධ්‍යක්ෂ තනතුරු එකක් (01), කළමනාකාර/ සහකාර කළමනාකාර තනතුරු දහතුනක් (13) සහ එක් (01) ලේකම් තනතුරක් මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණි.	ව්‍යවස්ථාදායකය විසින් ලබා දී ඇති අදාළ නෛතික ප්‍රතිපාදන සහ අධිකාරිය අනුව කොමිෂන් සභාව කටයුතු කර ඇත.

2021 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
(උ)	අංක 01/2021 හා 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. විගණන කමිටුවේ කැඳවුම්කරු වන්නේ අධ්‍යක්ෂ - මුදල් හා පරිපාලන මෙම චක්‍රලේඛය යටතේ නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 4.2 විධිවිධානවලට අනුව විගණකාධිපතිවරයාගේ නියෝජිතයෙකුට විගණන කමිටුව සඳහා නිතිපතා ආරාධනා කර නොතිබුණි.	විගණන කමිටුවේ නව කැඳවුම්කරු (සහකාර අධ්‍යක්ෂ, නීති) මීළඟ විගණන කමිටු රැස්වීමේ සිට වැඩ ආරම්භ කරන බැවින් මේ අවස්ථාවේ සෑහීමට පත්වන බව සඳහන් කෙරිණි.
2.2.3 (අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තිය අනුව කොමිෂන් සභාව පහත දෑ හැර කිසිවක් එහි බලතල, කාර්යයන් සහ රාජකාරි අනුව ඉටු කර නොමැති බව ප්‍රකාශ කිරීමට; 2010 වසරේ මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව කාර්ය සාධන දිරි දීමනාවක් ගෙවා තිබුණි	 මෙම යෝජනා ක්‍රමය බොහෝ වාරයක් භාණ්ඩාගාරය වෙත යොමු කර ඇත.
(ආ)	2019 වසරේ සිට මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව දිරි දීමනා ව ගෙවීමේ පදනම වූ මාස එකක (01) මූලික වැටුප මාස එකහමාරක (1 ½) දළ වැටුප ලෙස වෙනස් කර ඇත. මේ හේතුවෙන් මුළු දිරි දීමනාව රු. 4,605,381 කින් ඉහළ ගොස් ඇති අතර එය පෙර වසරට සාපේක්ෂව 105% වැඩි වීමකි. තවද, අවසාන ඇගයීම සඳහා සියලුම සේවකයින් 100% ලකුණු ලබා ගෙන තිබුණි. එබැවින් කොමිෂන් සභාව මගින් යථාර්ථවාදී කාර්යසාධන ඇගයීමක් සිදු කර ඇති බවක් නොපෙනේ.	සේවකයින් යම් කාර්යසාධන ප්‍රතිශතයකට ළඟා වී ඇත්නම් දිරි දීමනා ගෙවීම මෙම යෝජනා ක්‍රමය මගින් සිදු කෙරේ.
(ඇ)	අංක PED/12 හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 9.14.2 වගන්තියට අනුව සකස් කරන ලද ක්‍රියා පටිපාටි අත්පොත මණ්ඩලය විසින් අනුමත කළ යුතු අතර ඉන් අනතුරුව මහා භාණ්ඩාගාරයෙහි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හරහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ එකඟතාව ලබා ගත යුතුය. කෙසේ වෙතත්, කොමිෂන් සභාවේ පරිපාලන අත්පොත මහා භාණ්ඩාගාරයෙන් අනුමත කර නොතිබුණි. එබැවින් නිවාඩු සඳහා වන ගෙවීමට නිසි බලතල නොමැතිව රු. 1,639,753 ක් වැය කර ඇත.	යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ මත පදනම්ව නිවාඩු සඳහා මුදල් ගෙවීම ඇතුළත් පරිපාලන අත්පොත මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කර ඇත. මූලික අත්පොත 2012 ඔක්තෝම්බර් 23 වන දින අමාත්‍යාංශය වෙත යොමු කරන ලද අතර වරින් වර සිහි කැඳවීම් යවන ලදී. ඉන් අනතුරුව අත්පොතෙහි සිදු කරන ලද වෙනස්කම් ද දැනුම් දෙන ලදී. 2018 අප්‍රේල් 05 වැනි දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් කොමිෂන් සභාවට දන්වා සිටිනු ලැබුවේ පරිපාලන අත්පොත සඳහා අනුමැතිය ලබාදීමේ ක්‍රියාවලියේදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටියේ ඇති සංකූලතා හේතුවෙන් ප්‍රමාදයක් පවතින බවයි. එබැවින්, කොමිෂන් සභාව පරිපාලන අත්පොතෙහි විධිවිධාන අදාළ කරගෙන ඇත.

2021 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
2.2.4	පහත කටයුතු හැර අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තිය ප්‍රකාරව අදාළ නීතිවලට අනුකූලව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් සහිතව, කාර්යක්ෂම හා ඵලදායී ලෙස ලබාගෙන ඒවා භාවිතා කර නොමැති බව ප්‍රකාශ කිරීම;	
(අ)	කොමිෂන් සභාවේ නිල කටයුතු සඳහා ආර්ථික වශයෙන් වාසිදායක ස්ථානයක් තෝරා ගැනීමෙන් තොරව බාහිර ගොඩනැගිල්ලක එම සිදු කරන ලද අතර 2021 වර්ෂයේ දී ඒ සඳහා ගෙවන ලද බදු කුලිය ලෙස රු.48,109,101 ක් ගෙවා ඇත.	2024 සැප්තැම්බර් මාසයේ වත්මන් කල්බදු කාලය අවසන් වන තෙක් Overseas Realty (Ceylon) PLC හි පිරිනැමීම පිළිගැනීමට කොමිෂන් සභාව එහි 224 වැනි රැස්වීමේදී තීරණය කළේය. කෙසේ වෙතත්, වසර දෙක අවසන් වන විට තමන්ගේම ඉඩමක් මිලදී ගැනීමේ හැකියාව සොයා බලන ලෙස කළමනාකාරිත්වයෙන් ඉල්ලා සිටියේය.
(ආ)	කොමිෂන් සභාව 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතේ දක්වා ඇති එහි කාර්යභාරය ඉටු කිරීමේ දී මහජනතාව සමග සමීපව කටයුතු කළ යුතු ආයතනයක් විය යුතුය. කෙසේ වෙතත්, එහි වත්මන් පිහිටීම, සංස්කෘතිය සහ ඇතුල්වීමේ දොරටු දැඩි ආරක්ෂාව මධ්‍යයේ පැවතීම සාමාන්‍ය ජනතාවට ප්‍රවේශ වීමේ දුෂ්කරතා ඇති කරයි. තවද, මහජනතාවට කොමිෂන් සභා පරිශ්‍රයට ඇතුළු වීමට සහාය වීම සඳහා පෙරටු කාර්යාලයේ කිසිදු නිලධාරියෙකු නොසිටීමද බොහෝ අවස්ථා වල නිරීක්ෂණය විය. තවද, වෙබ් අඩවියේ සියලුම තොරතුරු ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් දක්වා ඇති බව නිරීක්ෂණය විය.	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවියේ අන්තර්ගතය ඉංග්‍රීසියෙන් සිංහල සහ දෙමළ භාෂාවලට පරිවර්තනය කිරීමට දැනටමත් පියවර ගෙන ඇත. තවද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි නිලධාරීන් ලිපි, දුරකථන හරහා සන්නිවේදනය කරන විට හෝ නිල කටයුතු සඳහා කාර්යාලයට පැමිණෙන විට ඔවුන්ට පහසු භාෂාවෙන් (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) සාමාන්‍ය ජනතාවට සේවය කරයි. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව අවදානමට ලක්විය හැකි කණ්ඩායම ඇතුළුව මහජනතාවට ළඟා වීමට සහ සේවාවන් ලබා ගැනීමට සියලු පහසුකම් සපයා ඇත.
(ඇ)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කළමනාකරණ විසඳුම ලබා දීම	

2021 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
(i)	නිසි පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණයකින් තොරව කොමිෂන් සභාව විසින් 2019 දී අධ්‍යක්ෂ මණ්ඩල විසඳුමක් මිල දී ගෙන ඇති අතර එහිදී මෘදුකාංගය සඳහා රු.1,013,000 ක් ද වැය කර මෘදුකාංගය සහ වාර්ෂික ග්‍රාහකත්වය සඳහා රු. 923,000 ක් ද වැය කර ඇත. විගණනය මගින් සිදු කරන ලද පිරිවැය විශ්ලේෂණයට අනුව 2020 සහ 2021 වසරවල පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා මෘදුකාංග වෙනුවෙන් දැරීමට සිදු වූ පිරිවැය රු. 63,533 කි. මීට අමතරව, මෙම රැස්වීම් විසඳුම හරහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සන්නිවේදනය කිරීමට එක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහා වන සාමාන්‍ය පිරිවැය රු. 92,995 කි. එබැවින් මෙම විසඳුම ලාභදායී ක්‍රමයක් දැයි සැකයක් පවතී.	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කළමනාකරණ විසඳුම විශේෂයෙන් පහත සඳහන් ප්‍රතිලාභ සඳහා නිර්මාණය කර ඇත • ඉක්මන් ප්‍රවේශය • අදහස් ලබා ගැනීමට සහ බෙදා ගැනීමට සහාය වීම • දුරස්ථ ප්‍රවේශය • අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගිත්වය වැඩි කිරීම • පෙර රැස්වීම් වාර්තා ආදිය වෙත ඉක්මන් ප්‍රවේශය කෙසේ වුවද, රු. 2,859,000/- ක් ලෙස සලකන ලද එක් රැස්වීමක් පරිගණකගත කිරීම සඳහා වන මෘදුකාංග පිරිවැය රු. 38,120 ලෙස සංශෝධනය විය යුතුය යන්න කෙරෙහි ඔබේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමු. අධ්‍යක්ෂ මණ්ඩල කළමනාකරණ විසඳුම ලෙස විශාල කඩදාසි ප්‍රමාණයක්, ටෝනර්, පත්‍රිකා ඡායා පිටපත් කිරීමේ දී සහ න්‍යාය පත්‍රය බෙදා හැරීමේ දී වැය වන කාලය යනාදිය ඇතුළත් රැස්වීම් න්‍යාය පත්‍රය මුද්‍රණය කිරීම සඳහා දැරීමට සිදු වන පිරිවැය අඩු කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට හැකි විය. තවද, පද්ධතිය හරහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ තීරණ ස්වයංක්‍රීයව ලේඛණකරණය කිරීම සිදු විය. ඉහත දැක්වූ හේතූන් මත අනෙකුත් රාජ්‍ය ආයතනවල ද මේ ආකාරයේ විසඳුමේ භාවිතා කරනු ලැබේ. ඒ අනුව, අනෙකුත් පිරිවැය සමග සැසඳීමේ දී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මෙම විසඳුමෙන් උපරිම ප්‍රතිලාභ හිමි කරගෙන ඇත.
(ii)	ඉහත තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් 6,044,647ක් බව නිරීක්ෂණය වේ. කෙසේ වෙතත්, අංක 03/2020 හා 2020 සැප්තැම්බර් 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.5 ඡේදයට අනුව කොමිෂන් සභාව මෙම ප්‍රසම්පාදනයෙහි තාක්ෂණික කරුණු සහ ව්‍යාකූලත්වයන්ට අදාළව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ උපදෙස් ලබාගෙන ඇති බව නිරීක්ෂණය වී නොමැත.	එකී චක්‍රලේඛය 2020 සැප්තැම්බර් මාසයේදී නිකුත් කර ඇති අතර අවශ්‍යතාවය ඇතිවීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කළමනාකරණ විසඳුම 2019 දී ප්‍රසම්පාදනය කර ඇත.
(iii)	කොමිෂන් සභාවේ සාමාජිකයින් පත්කිරීමේ දී සහ ඉන් ඉවත්වීමේ දී iPad සහ ඊට අදාළ උපකරණ නිකුත් කිරීම සහ ලබා ගැනීම සඳහා කොමිෂන් සභාව සතුව නිසි ලිඛිත ක්‍රියාවලියක් නොමැති බව නිරීක්ෂණය වේ.	කොමිෂන් සභා සාමාජිකයින්ට ipad සහ අදාළ උපකරණ නිකුත් කිරීම සඳහා නිසි ලියකියවිලි තිබේ.
(iv)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කළමනාකරණ විසඳුම ප්‍රසම්පාදනය කිරීමේ සංශෝධිත ප්‍රසම්පාදන කාලසටහන සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන තිබේද යන්න සම්බන්ධයෙන් විගණනය සඳහා සාක්ෂි සපයා නොතිබුණි.	ප්‍රසම්පාදන සැලැස්මට දෘඩාංග සහ මෘදුකාංගවලින් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කළමනාකරණ විසඳුම් ඇතුළත් විය.

2021 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
(v)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.7.5 මාර්ගෝපදේශයට අනුව රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (DPC) පත් කළ යුතුය. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව එවැනි කමිටුවක් පත් කර තිබුණේ ද යන්න සම්බන්ධයෙන් විගණනය සඳහා සාක්ෂි නොතිබුණි.	2019 වර්ෂය සඳහා රේඛීය අමාත්‍යාංශය විසින් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව පත් කරන ලදී.
2.3	වෙනත් කරුණු	
අ)	අභ්‍යන්තර විගණන සේවා සැපයීම	
(i)	2019 සැප්තැම්බර් 19 වැනි දින ප්‍රධාන ගිණුම් නිලධාරී (CAO) විසින් පත් කරන ලද පංච පුද්ගල දෙපාර්තමේන්තු උපදේශක ප්‍රසම්පාදන කමිටුව (CPCD) විසින් 2007 අගෝස්තු උපදේශකයින් තෝරා ගැනීම සහ සේවයේ නියුක්ත කිරීම සඳහා වන මාර්ගෝපදේශයට අනුකූලව විගණන ආයතනයෙන් අභ්‍යන්තර විගණන සේවාව ප්‍රසම්පාදනය කර ඇත. දෙපාර්තමේන්තු උපදේශක ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් සිව්දෙනා අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ - මූල්‍ය හා පරිපාලන ඇතුළු කොමිෂන් සභාවේ ප්‍රධාන සේවකයින් වූ බැවින් ඔවුන්ගේ කටයුතු සහ ක්‍රියාවන් අභ්‍යන්තර විගණකගේ විෂය පථය යටතේ පැවතුණි. එබැවින් ඔවුන් පත්කිරීමේ ස්වාධීනත්වය ගැටළු සහගතය. එබැවින්, කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කිරීමේදී විනිවිදභාවයෙන් යුතු ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. එබැවින් අභ්‍යන්තර විගණකයාගේ ස්වාධීනත්වය සහ වාස්තවිකත්වය අඩාල විය හැක.	දෙපාර්තමේන්තු උපදේශක ප්‍රසම්පාදන කමිටුව පත් කර ඇත්තේ මාර්ගෝපදේශයන්ට අනුකූලව ය. කෙසේ වෙතත්, විගණනය මගින් ලබා දී ඇති අදහස් සැලකිල්ලට ගනිමින් විගණනයේ හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ සහ කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන 2022 සිට 2024 දක්වා වසර සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව කටයුතු කරනු ඇත.
(ii)	සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමේදී අභ්‍යන්තර විගණක සඳහා වාර්තා කරන වාර ගණන සහ වාර්තා කිරීමේ කාලයට අදාළ ඉලක්ක නිර්වචනය කර නොතිබුණි.	කාර්ය නිර්දේශය මගින් විගණන සැලැස්ම/වැඩ කාල සටහන ඉල්ලා ඇත. Tech 8 හි විස්තර දැක්වේ.
(iii)	කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන උපදේශකවරයෙකු තෝරා ගැනීමට යෝජනා සමග අභ්‍යන්තර විගණන වැඩ සැලැස්මක් ලබාගෙන නොතිබුණි. අනතුරුව, උපදේශකයින් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ඇගයීම සඳහා ඇගයීම් අදියරේදී වැඩ සැලැස්මක් නැවත කැඳවා තිබුණි.	සියලුම යෝජකයින් විසින් යෝජනා සමග විගණන වැඩ සැලැස්ම ඉදිරිපත් කිරීමට කළ යුතු විය. M/s Barker Tilly විසින් ඔවුන්ගේ යෝජනාව එවන අවස්ථාවේ ක්‍රමවේදය සහ වැඩ සැලැස්ම ඉදිරිපත් කර ඇත.
(iv)	අභ්‍යන්තර විගණන සේවා සැපයීම පිළිබඳ ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාවට අනුව, ලංසු විවෘත කර තිබුණේ 2019 දෙසැම්බර් 18 වැනිදාය. කෙසේ වෙතත්, ලංසු ඇගයීම 2021 ජූනි 16 දින සිදු කර ඇත. උපදේශකයින් තෝරා ගැනීම සහ සේවයේ යෙදවීම පිළිබඳ මාර්ගෝපදේශවල 8.4.1 වගන්තියට අනුව අවශ්‍ය සියලුම විධිමත් අනුමැතීන් ලබා ගැනීමට ප්‍රමාණවත් කාලයක් ඉතිරි කරමින් යෝජනා ඇගයීම කඩිනමින් සිදු කළ යුතුය. එබැවින්, ප්‍රසම්පාදන කාල සටහනේ දක්වා ඇති කාල සීමාව තුළ යෝජනා ඇගයීමට ලක් කළ යුතුය. කෙසේ වෙතත්, ලංසු විවෘත කිරීමේ දින සිට මාස හයක ප්‍රමාදයකින් යෝජනා ඇගයීම් සිදු කර ඇති බව නිරීක්ෂණය වේ.	කොවිඩ් - 19 පැතිරීම හේතුවෙන් කාර්යාලීය කටයුතු බොහොමයක් සිදු කෙරුනේ නිවසේ සිට වැඩ කිරීමේ සංකල්පය මතය. එබැවින්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය සාමාන්‍ය තත්වය යටතේ සිදු කිරීමට සාපේක්ෂව වඩා දිගු කාලයක් ගත වී ඇත.

2021 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
(v)	උපදේශකයින් තෝරා ගැනීම සහ සේවයේ යෙදවීම පිළිබඳ මාර්ගෝපදේශ 6.5.9 වගන්තියට අනුව යෝජනා සඳහා ඉල්ලීම් ලබා ගැනීමට පෙර ඇගයීමේ නිර්ණායක සහ උප නිර්ණායක තීරණය කරනු ලැබේ. ලංසු විවෘත කිරීමෙන් පසු අභ්‍යන්තර විගණකවරයා තෝරා ගැනීම සඳහා කෙටි ලැයිස්තුගත කිරීම සහ ඇගයීම් නිර්ණායක සහිත ලකුණු ලබා දීමේ ක්‍රමය නිර්වචනය කර ඇත. එම නිර්ණායක 2020 ජුනි 16 දින ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරන ලදී.	කාර්ය නිර්දේශය (ToR) යටතේ ඇගයීම් නිර්ණායක සහ ලකුණු ලබා දීමේ ක්‍රමය පැහැදිලිව සඳහන් කර ඇත. තවද, උපදේශකයින් වෙත යෝජනා සඳහා ඉල්ලීම (RFP) යවන අවස්ථාවේ ඒ සම්බන්ධයෙන් ඔවුන් වෙත දන්වා ඇති අතර වැඩිදුර දැනගැනීම සඳහා පිටපතක් අමුණා ඇත. එම ක්‍රමයට අනුව ඇගයීම සිදු කර ඇත.
(vi)	අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්ය සාධනය ඇගයීම සභාපතිවරයා විසින් සිදු කර තිබුණි. මෙමගින් කොමිෂන් සභාවේ ප්‍රබල තනතුරු දෙකක් අතර ගැටුමක් ඇති විය හැකි අතර අහිතකර තීරණ ගැනීමටද හේතු විය හැක. හොඳම භාවිතය වන්නේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්ය සාධනය කොමිෂන් සභාව විසින් ඇගයීමට ලක් කිරීමයි. තවද, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්ය සාධන ඇගයීම් ආකෘති පත්‍රය විගණනය සඳහා නොතිබුණි.	අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ආසන්නතම අධීක්ෂක වන සභාපතිවරයා ඇගයුම්කරු ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යය සෘජුවම ඇගයීමට ලක් කරනු ලැබේ. මානව සම්පත් පිළිබඳ උපදේශකවරයා ද ඇගයුම්කරු සහ ඇගයුම්ලාභියා අතර මුහුණට මුහුණ ඇගයීම නිර්දේශ කළේය. කාර්ය සාධන ඇගයුම් ආකෘති පත්‍ර පුද්ගලික ලිපිගොනුවල ගොනු කර ඇති අතර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිගොනුව සභාපතිවරයා භාරයේ තබා ඇත. විගණනය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පුද්ගලික ලිපිගොනුව සහ කාර්ය සාධන ඇගයීම් නොලැබීම DFA හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කර නොතිබූ අතර එසේ දැනුවත් කර තිබුණි නම් විගණනයට ඒවා ලබා දීමට ඉඩ තිබුණි. එය නොලැබුණු බව දැනගත්තේ ලිපියෙන් පමණි.
(vii)	රක්ෂණයේ ප්‍රධාන මූලධර්ම (ICPs) යනු ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන්ගේ සංගමය (IAIS) විසින් සකස් කරන ලද ගෝලීය වශයෙන් පිළිගත් මූලධර්ම රාමුවකි. රක්ෂණ නියාමකයින්ගේ නියාමන සහ අධීක්ෂණ කාර්යයේ ගුණාත්මක භාවය තක්සේරු කිරීමට සහ රට තුළ රක්ෂණ ක්ෂේත්‍රය සඳහා රෙගුලාසි හඳුන්වාදීමේ රාමුවක් ලෙස භාවිතා කිරීමට එම මූලධර්ම වැදගත්වේ. ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන්ගේ සංගමයෙහි සාමාජිකයෙකු ලෙස කොමිෂන් සභාව විසින් 2020 වසර සඳහා සාමාජික ගාස්තු ලෙස රු. 4,124,500 ගෙවා ඇත. කොමිෂන් සභාව විසින් රක්ෂණයේ ප්‍රධාන මූලධර්මවලට අනුකූල වන ආකාරය හඳුනා ගැනීම සඳහා තොරතුරු ඉල්ලා තිබුණි. කෙසේ වුවද, ඉල්ලා සිටි තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව රක්ෂණ ප්‍රධාන මූලධර්ම පිළිබඳ සම සමාලෝචන කිහිපයකට සහභාගි විය. ඒවා නම් ඇගයීම බොහෝ දුරට නිරීක්ෂණය වූ රක්ෂණ ප්‍රධාන මූලධර්ම 1,2,9,10 වේ. දැනට ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකයන්ගේ සංගමයේ 2019 වසර තුළ සිදු කෙරුණු රක්ෂණ ප්‍රධාන මූලධර්ම මගින් අනුමත කරන ලද සම සමාලෝචන 25 ක් වේ. රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනතෙහි සහ අනෙකුත් නීතිවල විධිවිධාන පැනවීම/ සංශෝධනය කිරීම සඳහා රක්ෂණ ප්‍රධාන මූලධර්ම ක්‍රියාත්මක කරනු ඇත.

2021 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
(ඈ)	කොමිෂන් සභාව විසින් 2020 දක්වා අදාළ වර්ෂ සඳහා කොමිෂන් සභාවේ අරමුදල්වල අතිරික්තය රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට බැර කර ඇත. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී මෙම ප්‍රතිපත්තිය හදිසියේ වෙනස් කර ඇති අතර කොමිෂන් සභාවේ අරමුදල් අතිරික්තය සමුච්චිත අරමුදල ලෙස ඉදිරියට ගෙන ගොස් ඇත. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. වෙනත් ආකාරයකින් මෙම අරමුදල නිසි ලෙස අධීක්ෂණය නොකළහොත්, මෙම අරමුදල අවභාවිත කිරීමට ඉඩ ඇත.	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සතුව කොමිෂන් සභා අරමුදල සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල ලෙස අරමුදල් දෙකක් ඇත. අරමුදල් දෙකම 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනතේ 6 වන සහ 103 වන වගන්ති ප්‍රකාරව ස්ථාපිත කර ඇත. කොමිෂන් සභාව එහි බලය ක්‍රියාත්මක කිරීමේදී, එහි කාර්යයන් ඉටු කිරීමේදී සහ එහි රාජකාරි ඉටු කිරීමේදී දරන ලද වියදම් පියවා ගැනීමට කොමිෂන් සභා අරමුදල භාවිතා කරයි. රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල ස්ථාපිත කර ඇත්තේ වර්තමාන රක්ෂණ ඔප්පු හිමියන්ගේ සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ හිමිකම් සුරක්ෂිත කිරීමේ අරමුණ ඇතිවයි. රක්ෂණකරුවන්ගෙන් සෙස් බද්ද සහ ආයෝජනවලින් ලැබෙන ප්‍රතිලාභ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල වෙත බැර කෙරේ. රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල පිහිටුවීමේ අරමුණ කොමිෂන් සභා අරමුදල පිහිටුවීමේ අරමුණට වඩා වෙනස් වන බැවිණි. යම් වර්ෂයක අතිරික්තයක් ඇති විට, මණ්ඩලයේ හිණුමේ ඇති අතිරික්තයක් ඉවත් කර එම අතිරික්තය රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල වෙත මාරු කිරීමටත් ඉදිරි වසරවල මණ්ඩලයේ වියදම් පියවා ගැනීම සඳහා අවශ්‍ය වූ විට රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙහි වාර්ෂික පොලී ආදායමෙන් 20% කට යටත්ව එය නැවත මාරු කිරීමටත් 153 වැනි සහ 160 වැනි කොමිෂන් සභා රැස්වීම්වල දී තීරණය කරන ලදී. ප්‍රාග්ධන වියදම් පියවා ගැනීම සඳහා රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල වෙතින් අරමුදල් මාරු කිරීම ද පෙර භාවිතාව ලෙස සිදු කෙරේ. මෙම භාවිතාව 2021 වසර සඳහා 3 වන විගණන කමිටු රැස්වීමේදී සාකච්ඡා කර අරමුදල් දෙකක් වෙන වෙනම පවත්වාගෙන යාමට යෝජනා කර ඇත. රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල පිළිබඳ සවිස්තරාත්මක පත්‍රිකාවක් මීළඟ විගණන කමිටුවට ඉදිරිපත් කරනු ලැබේ.
(ඉ)	මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය	
(i)	මූල්‍ය අංශයේ නවීකරණ ව්‍යාපෘතියේ (FSMP) ගිවිසුමට අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක වන කාල සීමාව පුරාවට එය ක්‍රියාත්මක කරන ආයතනය විසින් ඉන් පසු එළඹෙන එක් එක් මූල්‍ය වසරක නොවැම්බර් 30 දිනට පෙර අනුමැතිය සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) වෙත වාර්ෂික වැඩ සැලැස්මක් සහ ව්‍යාපෘතියේ 2(ඇ) සංරචකය යටතේ ක්‍රියාකාරකම් සඳහා අයවැයක් ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, 2020 සහ 2021 වසර සඳහා වන වාර්ෂික වැඩ සැලසුම් විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර එම ලේඛන ජාත්‍යන්තර සංවර්ධන සංගමය වෙත ඉදිරිපත් කර තිබේද යන්න පිළිබඳ තොරතුරු ලබාගෙන නොතිබුණි.	අවශ්‍යතාවයට අනුව එක් එක් වර්ෂයේ නොවැම්බර් 30 දිනට පෙර වාර්ෂික වැඩ සැලැස්ම සහ අයවැය මධ්‍යම ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය (CPCU) වෙත යවා ඇත. අයවැය සමඟ සිදුවෙමින් පවතින ප්‍රසම්පාදනයන් අවශ්‍යතාවලට අනුකූලව වරින් වර ලෝක බැංකුවේ ප්‍රසම්පාදනවල හුවමාරු ක්‍රමානුකූල ලුහුබැඳීමේ (STEP) පද්ධතියට උඩුගත කර ඇත.

2021 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
(ii)	මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි අධීක්ෂණය මත ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ව්‍යාපාර වෙන් කිරීම සඳහා ඇ.ඩො. 945,450 (රු.මි. 0.67) වෙන් කර තිබුණි. නමුත් මෙම මුදල් මේ සඳහා යොදවා තිබුණේ නැත.	ලෝක බැංකුව, මධ්‍යම ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය අතර පැවති ව්‍යාපෘති සමාලෝචන රැස්වීම්වලදී ජාතික රක්ෂණ භාර අරමුදලේ මණ්ඩලය අවසානයේ සිය රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ව්‍යාපාර වෙන් නොකිරීමට තීරණය කර ඇති බවත් එබැවින් ඔවුන් ලෝක බැංකුවෙන් තාක්ෂණික සහාය ලබා ගැනීමට අකමැති බවත් ලිපියේ සඳහන් කර ඇත. ජාතික රක්ෂණ භාර අරමුදල විසින් වෙන් කිරීම සඳහා වන සිය යෝජනාව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ පසු DLI සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි වගකීම ආරම්භ වන්නට ඉඩ තිබිණි. ජාතික රක්ෂණ භාර අරමුදල විසින් යෝජනාව ඉදිරිපත් කළේ නම්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යෝජනාව සමාලෝචනය කිරීමට අවශ්‍ය වනු ඇති අතර DLI සාක්ෂාත් කර ගැනීම සඳහා කිසිදු විරෝධතාවක් නොපෙන්වන්නට ඉඩ තිබිණි. කෙසේ වෙතත්, ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට සිය කාර්යය ඉටු කිරීම සඳහා වෙන්කිරීමේ යෝජනාව එහි ඉදිරිපත් නොකළේය. වෙන් කිරීම අත්හැරීමට ජාතික රක්ෂණ භාර අරමුදල ගත් තීරණය තහවුරු කරන ලෙස අපි ඉල්ලා ඇත. ජාතික රක්ෂණ භාර අරමුදලේ පිළිතුර අපේක්ෂා වෙන් සිටිමු. කෙසේ වෙතත්, දැන් එම ව්‍යාපෘතිය අවලංගු කර ඇත.
(iii)	මෙම ව්‍යාපෘතිය යටතේ කොමිෂන් සභාවේ අධීක්ෂණ සහ නියාමන ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා වූ සවිස්තරාත්මක වැඩ සැලැස්ම විගණනයට ලබා ගත නොහැකි විය.	අවශ්‍යතාවයට අනුව එක් එක් වර්ෂයේ නොවැම්බර් 30 දිනට පෙර වාර්ෂික වැඩ සැලැස්ම සහ අයවැය මධ්‍යම ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය (CPCU) වෙත යවා ඇත. අයවැය සමඟ සිදුවෙමින් පවතින ප්‍රසම්පාදනයන් අවශ්‍යතාවලට අනුකූලව වරින් වර ලෝක බැංකුවේ ප්‍රසම්පාදනවල හුවමාරු ක්‍රමානුකූල ලුහුබැඳීමේ (STEP) පද්ධතියට උඩුගත කර ඇත.

2021 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
(iv)	ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විශේෂඥයින් සහ උපදේශකයින්ගේ වැඩ කටයුතු එකිනෙකට සම්බන්ධ විය යුතුය. කෙසේ වුවද, මෙම ව්‍යාපෘතිය සඳහා උපදේශකයින් වරින් වර බඳවා ගෙන තිබූ අතර ව්‍යාපෘතියේ පොදු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එම උපදේශකයින් අතර දැඩි අන්තර් සම්බන්ධතාවක් දක්නට නොලැබුණු බව නිරීක්ෂණය විය. මෙම දුර්වල ව්‍යාපෘති කළමනාකරණය හේතුවෙන් අපේක්ෂිත ව්‍යාපෘති අරමුණු සහ ප්‍රතිඵල සාක්ෂාත් කර ගෙන නොතිබුණි.	ගිවිසුමේ/ප්‍රසම්පාදන සැලැස්මේ විධිවිධානවලට අනුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් උපදේශන සේවා සඳහා ආදායමෙන් කොටසක් යෙදවීමට අදහස් කළේය. උපදේශන සේවා වූයේ: I. ආයුගණක විශේෂඥතාව II. රක්ෂණ විශේෂඥතාව III. තොරතුරු තාක්ෂණ විශේෂඥතාව IV. මානව සම්පත් පිළිබඳ විශේෂඥතාව V. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නියාමන සහ අධීක්ෂණ රාමුව නවීකරණය කිරීම සඳහා උපදේශන සමාගම. ක්‍රියාකාරකමෙහි ස්වභාවය හේතුවෙන් උපදේශන ආයතනවලට යම් දුරකට අන්තර් සබඳතාවයක් තිබුණි. ඉහත සඳහන් උපදේශන ආයතනවල කාර්ය නිර්දේශ මගින් අරමුණ සපුරාලීමේ සැලැස්ම පිළිබිඹු වේ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට උපදේශකයන් දෙදෙනෙකුගේ සේවය ලබා ගැනීමට හැකි වූ නමුත් ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ඇති වූ යම් යම් බාධාවන් හේතුවෙන් ඉතිරි උපදේශකයන් තිදෙනාහට ප්‍රදානය කිරීමට නොහැකි විය.
(v)	ආයුගණක උපදේශකවරයා 2022 මාර්තු 29 දින සිට බලපැවැත්වෙන පරිදි ඔහුගේ කොන්ත්‍රාත්තුව අවසන් කර ඇත. 2022 ජනවාරි 24 දිනට ආයුගණක උපදේශකවරයාගේ “රක්ෂණ (ආයුගණක) ව්‍යාපෘතියේ උපදේශක ඇගයීම” නම් වූ වාර්තාවට අනුව කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට හේතු වූයේ තම නිර්දේශ සඳහා කළමනාකාරිත්වය විසින් ලබා දුන් අදහස් ඉදිරිපත් නොකිරීම, ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමට සහ පසු විපරම් කිරීමට කිසිඳු පියවරක් නොගැනීම, සංරචක නියාමකයන් සාධාරණ තර්කයන් සමගින් තම යෝජනාවලට ප්‍රතිචාර නොදැක්වීම, මෙම ව්‍යාපෘතිය යටතේ බඳවා ගත යුතු වූ රක්ෂණ විශේෂඥයින්ගෙන් කිසිඳු සහායක් නොලබා කටයුතු කිරීමට ආයුගණකවරයාට සිදු වීම, රක්ෂණ සහ තොරතුරු තාක්ෂණ විශේෂඥයින් සැපයීමට කොමිෂන් සභාව බැඳී සිටියද නිසි පැහැදිලි කිරීමකින් තොරව කොමිෂන් සභාව එම සහාය ලබා දීම මග හැරීම යනාදියයි. ඉහත නිරීක්ෂණ මත පදනම්ව, ආයුගණක උපදේශකවරයා සඳහා ඇ.ඩො.168,000 ගෙවීම ආර්ථික වශයෙන් වාසිදායක නොවන ගනුදෙනුවක් බව නිරීක්ෂණය වේ.	එකඟ වෙමින් උපදේශකවරයා තම යෝජනාව ඉදිරිපත් කළේය. කෙසේ වෙතත්, ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව, විවිධ හේතු පවසමින් ඇතැම් කාර්යයන් ඉටු කිරීමට ඔහු එකඟ නොවීය, එය පිළිගත නොහැකිය. යොමු කරන ලද ඇගයීම් වාර්තාව උපදේශකයා විසින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර නැත. එබැවින්, අපි ඒ සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වා නැත. එමෙන්ම එම අවස්ථාවේ ඔහුට ඇගයීම් වාර්තාවක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවක් නොතිබුණි. ඔහු භාණ්ඩාගාර ලේකම්වරයාට සහ ජනාධිපති ලේකම්වරයාට පැමිණිලි කර තිබුණු බැවින් ඔහුගේ වාර්තාවේ පිටපතක් මුදල් අමාත්‍යාංශය හරහා අපට ලැබුණි. ඒ අනුව, මෙම කාරණය කොමිෂන් සභා මට්ටමින් සාකච්ඡා කර, වැඩිදුර සමාලෝචනය සඳහා විගණන කමිටුව වෙත යොමු කරන ලදී. ඔහුගේ අසාධාරණ චෝදනා සම්බන්ධයෙන් සියලුම ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයන් විසින් විගණන කමිටු මට්ටමින් සවිස්තරාත්මක සාකච්ඡා පවත්වන ලදී. සම්මුතියක් ලෙස ඔහු ලබාදුන් ඇතැම් වාර්තාවලට සමානුපාතික ගාස්තු ගෙවීමට විගණන කමිටුවේදී තීරණය විය. වාර්තාවේ සඳහන් කරුණු සමග ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට එකඟ විය නොහැක. තවද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ඔහුගේ උපදෙස් නොසලකා හැර නැත. අදාළ පාර්ශ්ව සමග සාකච්ඡා කිරීම සඳහා ඔහුට බොහෝ අංශ පිළිබඳ උපදෙස් පත්‍රිකා ලබා දිය යුතු වුවත් ඔහු විසින් ඒවා ඉදිරිපත් නොකරන ලදී. ඔහු රක්ෂණ විශේෂඥයෙකුගේ කාර්යයන් ඉටු කිරීමට සුදුසුකම් ඇති බවට තර්ක කරමින් රක්ෂණ විශේෂඥයෙකු නොමැතිව කාර්යයන් ඉටු සිදු කිරීම සඳහා අමතර මුදලක් ඉල්ලා සිටියේය. කෙසේ වෙතත්, ඔහුගේ ඉල්ලීමට අපට එකඟ විය නොහැකි විය. ගිවිසුමේ කොන්දේසි අනුව එක් වරක්වත් ලංකාවට පැමිණීමටද ඔහු අපොහොසත් විය. ඔහු තම වීසා බලපත්‍රය ගැන තර්ක කරමින් කාලය හා සම්පත් නාස්ති කළේය. ඔහුගේ වාර්තා බොහෝමයක් අවසන් කර කොමිසමට ඉදිරිපත් කිරීමට පෙර සාකච්ඡාවට තවත්

2021 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
		කරුණු තිබුණි. නමුත් ඇතැම් වාර්තා ඉදිරිපත් කර ක්‍රියාත්මක කර ඇත. 15(ආ) සංරචකය තොරතුරු තාක්ෂණ ආයතනය යටතේ වන කාර්යයක් වූ අතර එහි ආයුගණක උපදේශකවරයාට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත සහාය සේවා සහ උපදෙස් සැපයීමට සිදු විය. කලින් සඳහන් කළ පරිදි, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි පාලනයෙන් බැහැර වූ කරුණු හේතුවෙන් තොරතුරු තාක්ෂණ ප්‍රසම්පාදනය ප්‍රදානය කළ නොහැකි විය. එබැවින්, ආයුගණක උපදේශකවරයා වෙත ගෙවීම ආර්ථිකමය වශයෙන් වාසිදායක නොවන ගනුදෙනුවක් ලෙස සැලකිය නොහැක. වාර්තා යනු ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සතු දේපළවන අතර සියලුම පිළිගත් වාර්තාවල උපදෙස් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ආයුගණකවරයෙකුගේ සේවය ලබා ගන්නා විට සැලකිල්ලට ගනු ඇත. වත්මන් කොමිෂන් සභාව පවා ආයුගණකවරයෙකු බඳවා ගැනීමට සෘජුව මැදිහත් වී ඇති නමුත් අඩු වැටුප් ව්‍යුහයන් හේතුවෙන් එය සාර්ථක වී නොමැති බැවින් මෙය වෙනම සාකච්ඡාවට බඳුන් කළ යුතු කරුණකි.
(vi)	විගණනය සඳහා පවතින තොරතුරුවලට අනුව ආයුගණක උපදේශකවරයා විසින් ලබා දී ඇති වැඩ සැලැස්මට අනුව කිසිදු වාර්තාවක් හෝ සංරචක 3 කට අදාළ කාර්යයන් පිළිබඳ වාර්තා කර නොතිබුණි. එබැවින් සංරචක 17 න් සංරචක 14 ක් සඳහා අවසන් සහ කෙටුම්පත් වාර්තා ඉදිරිපත් කර තිබුණි. විගණනය සඳහා පවතින විස්තර අනුව එම වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර නොතිබූ අතර නියාමකයන් ලෙස අදහස් දැක්වීම්, සංවර්ධනය කිරීම සහ ප්‍රතිපත්ති සැකසීම සම්බන්ධයෙන් වගකිව යුතු අදාළ පාර්ශ්ව සමග එම වාර්තා පිළිබඳ සාකච්ඡා කර ඇති බවට කිසිදු සාක්ෂියක් නොමැත.	වාර්තා යනු ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සතු දේපළවන අතර සියලුම පිළිගත් වාර්තාවල උපදෙස් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ආයුගණකවරයෙකුගේ සේවය ලබා ගන්නා විට සැලකිල්ලට ගනු ඇති අතර ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව දැනට ආයුගණකවරයෙකුගේ සේවය ලබා ගැනීම සඳහා කටයුතු කරමින් සිටියි.
(vii)	වැඩ සැලැස්මට අනුව ආයුගණක උපදේශකවරයා රක්ෂණ උපදේශකවරයා සහ තොරතුරු තාක්ෂණ උපදේශකවරයා වැනි වෙනත් උපදේශකයින් සමග සම්බන්ධ වී කටයුතු කළ යුතුව තිබිණි. එබැවින් එම උපදේශකයින් අතර සම්බන්ධීකරණය කිරීමට කොමිෂන් සභාව ඔවුන්ට පහසුකම් සපයා නොමැති බව අපට නිරීක්ෂණය විය.	ගිවිසුමේ/ප්‍රසම්පාදන සැලැස්මේ විධිවිධානවලට අනුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව උපදේශන සේවා සඳහා ආදායමෙන් කොටසක් යෙදවීමට අපේක්ෂා කළේය. උපදේශන සේවා වන් වූයේ: I. ආයුගණක විශේෂඥතාව II. රක්ෂණ විශේෂඥතාව III. තොරතුරු තාක්ෂණ විශේෂඥතාව IV. මානව සම්පත් පිළිබඳ විශේෂඥතාව V. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නියාමන සහ අධීක්ෂණ රාමුව නවීකරණය කිරීම සඳහා උපදේශන සමාගම. ක්‍රියාකාරකමෙහි ස්වභාවය හේතුවෙන් උපදේශන ආයතනවලට යම් දුරකට අන්තර් සබඳතාවයක් පවත්වා ගැනීමට සිදු විය. කෙසේ වෙතත්, මානව සම්පත් පිළිබඳ විශේෂඥයා සහ ආයුගණක විශේෂඥයා යන දෙදෙනාම එකම කාලසීමාව තුළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වෙහි සේවය කළ බැවින් ඒ දෙදෙනා අතර සාකච්ඡා පැවැත්විණි.

2021 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
(viii)	මානව සම්පත් උපදේශක වෙත පැවරී ඇති කාර්යයට අනුව, අවසාන කාර්යය වන්නේ උපදේශකයාගේ කාර්යය ඉටු කිරීමේදී සේවාලාභියාගේ අනාගත වර්ධනයන් පිළිබඳ අදහස් ලබා ගැනීම සඳහා ව්‍යාපෘතිය යටතේ කුලියට ගත් අනෙකුත් උපදේශකයින් සමග සම්බන්ධව කටයුතු කිරීමයි. ව්‍යාපෘති ප්‍රගතිය අනුව පත් කර තිබුණේ ආයුගණක උපදේශකවරයන් පමණි. මානව සම්පත් උපදේශක හට මෙම ව්‍යාපෘතියේ අනෙකුත් උපදේශකයින් සම්බන්ධ කර ගැනීමට සහ සාකච්ඡා කිරීමට හැකි වූ බවට කිසිදු සාක්ෂියක් නොමැත. එබැවින් උපදේශකයන් අතර නිසි සම්බන්ධීකරණයක් සහ සන්නිවේදනයක් නොතිබූ බැවින් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කරගත නොහැකි වනු ඇත.	මානව සම්පත් විශේෂඥයාගේ අපේක්ෂිත සේවාවන් ඔහුගේ කොන්ත්‍රාත් කාලය තුළ නිසි ලෙස ලබා දී ඇත. ඔහුගේ සියලු වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර ඔහු සියලුම කොමිෂන් සභා සාමාජිකයින් සමග සාමූහිකව සහ තනි තනිව බොහෝ සාකච්ඡා වන් පවත්වා ඇත. ඇතැම් වාර්තා ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර අනෙක් ඒවා කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට පෙර මානව සම්පත් අනු කමිටුවේ දී සාකච්ඡා වට බඳුන් කිරීමට නියමිතය.
(ix)	2021 දෙසැම්බර් සඳහා වන ප්‍රගති වාර්තාව සහ 2021 නොවැම්බර් 29 දින ලෝක බැංකු නියෝජිතයාගෙන් ලැබුණු විද්‍යුත් තැපෑල අනුව මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය 2022 ජූනි 30 දිනෙන් අවසන් වන බව දන්වා කෙසේ වෙතත්, ව්‍යාපෘතිය අවසන් කිරීමට ගත් තීරණයේ දිනය, ව්‍යාපෘතිය අවසන් කිරීමට තීරණය කරන අධිකාරිය, ව්‍යාපෘතිය අවසන් කිරීමට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	ඔහු සාකච්ඡා කළ ආයුගණක විශේෂඥයන් හැර වෙනත් උපදේශකයින් නොමැති වීම හේතුවෙනි. තවද අනෙකුත් සියලුම විශේෂඥයන්ගේ කාර්ය නිර්දේශයන් අනුව මානව සම්පත් පැවරුමෙන් අවශ්‍ය කරන දේ ඔහු අවබෝධ කර ගත්තේය. ව්‍යාපෘතිය අවසන් කිරීමට තීරණය කළ දිනය - 26/01/2022. මුදල් අමාත්‍යාංශයේ තීරණය අනුව රජයේ ප්‍රමුඛතා සඳහා ඉතිරි මුදල් වෙන් කිරීමට ව්‍යාපෘතිය අවලංගු කර ඇත.
(ඡ)	2020 සහ 2021 වසර සඳහා වන අභ්‍යන්තර විගණන වාර්තා 2022 ඔක්තෝම්බර් 20 දින වන විට නොතිබුණි. එබැවින්, හඳුනාගත් ගැටළු සඳහා නිසි කලට විසඳුම් ලබා දීමට කොමිෂන් සභාවට නොහැකි විය හැකිය. තවද, බාහිර විගණකගේ කාර්යයන් සැලසුම් කිරීමේදී සහ ඒවා සිදු කිරීමේදී අභ්‍යන්තර විගණකගේ කාර්යයන්ට අදාළ ලේඛන භාවිතා කිරීමට බාහිර විගණකවරයාට නොහැකි විය.	2020 වසරේ වාර්තාව 2022 පෙබරවාරි මාසයේදී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ලැබී ඇත. 2021 වර්ෂයේ වාර්තාව අද දක්වා ලැබී නැත. 2021.07.30 දින පැවති විගණන කමිටු රැස්වීමේ දී 2019 අභ්‍යන්තර විගණන වාර්තාව පිළිබඳ සාකච්ඡා කර ඇත. 2021.11.10 දින පැවති රැස්වීමේදී පසු විපරම් ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡා කර ඇත. විගණන කමිටුවේ නිර්දේශ සහිත වාර්තා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. තවද, එවැනි අභ්‍යන්තර විගණන වාර්තා විගණන කමිටුවේදී සාකච්ඡා කරන විට බාහිර විගණකවරයාට ආරාධනා කර තිබූ අතර ඔහු එම අවස්ථාවට පැමිණ සිටියේය.

2021 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
(උ)	නීතිපතිවරයාගේ මතය මත කොමිෂන් සභාව ඔවුන්ගේ සේවක සංඛ්‍යාව සහ වැටුප් ක්‍රමය තීරණය කර තිබිණි. 2019 මැයි 31 දිනැති සංදේශය මගින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සඳහා 2018 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් ගැලපීම, සේවක සංඛ්‍යා සංශෝධනය, රු. 7800 ක ජීවන වියදම් දීමනාව, මූලික වැටුපෙන් 15% ක් වන නිපුණතා දීමනාව ගෙවීම සහ රු. 12,500 ක් වූ විශේෂ ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා සභාපතිවරයාගේ අනුමැතිය ඉල්ලා සිටින ලදී. කොමිෂන් සභාව මුදල් අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන ආයතනයක් වුවද තම සේවක සංඛ්‍යාව තීරණය කිරීමට සහ වැටුප් හා දීමනා ඉහළ නැංවීමට කොමිෂන් සභාව මහා භාණ්ඩාගාරයෙන් නිෂ්කාශනය හෝ එකඟතාව ලබාගෙන නොතිබුණි.	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි වැටුප් පිළිබඳ කොමිෂන් සභාව විසින් පත් කරන ලද කමිටුව, පසුගිය වසර 13 තුළ එක් අවස්ථාවක දී පමණක් එනම් 2012 දී එක් වැටුප් සංශෝධනයක් පමණක් ලබා දී ඇති බවත් එබැවින් කාර්ය මණ්ඩල වැටුප් වෙළඳපල අගයන්, විශේෂයෙන් අනෙකුත් මූල්‍ය අංශයේ නියාමකයින් විසින් පිරිනමනු ලබන වේතන සමග සැසඳිය නොහැකි බවත් සඳහන් කළේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, විමර්ශන, ඒකාබද්ධ කිරීම් සහ පවරා ගැනීම් ආදියට අදාළව රක්ෂණ ක්ෂේත්‍රයේ දිනෙන් දින ඉහළ යන සංකීර්ණ අභියෝගවලට මුහුණ දීම සඳහා සුදුසුකම් ලත් සහ පළපුරුදු කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමටත් දැනට සිටින සුදුසුකම් ලත් සහ පළපුරුදු කාර්ය මණ්ඩලය රඳවා තබා ගැනීමටත් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට නොහැකි වනු ඇත. නියාමකයාගේ ඵලදායීතාව, කාර්යක්ෂමතාව සහ අදාළත්වය ඉහළ නැංවීම සඳහා ජාත්‍යන්තර රක්ෂණ භාවිතාවන්ට අනුකූල වීම සඳහා වත්මන් රාමුව වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය ද පවතී. තවද, අනෙකුත් නියාමකයින් මෙන් මනා ප්‍රතිලාභ සහිත වන්දි පැකේජයක් තිබීම සම්බන්ධ පහත කරුණු ඉස්මතු කිරීමට අපි කැමැත්තෙමු. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි සෑම තනතුරක් සඳහාම බඳවා ගැනීම් සිදු කරනු ලබන්නේ පිළිගත් ආයතනවල සහ සියලුම විධායක උසස් කළමනාකරණ වැඩසටහනට අදාළ පළපුරුද්ද සහිත පුද්ගලයන් වේ; ඉහත කාර්ය මණ්ඩලයට අදාළ සුදුසුකම් තිබිය යුතුය. පනතේ විධිවිධානවලට අනුව එමගින් ස්ථාපිත කරන ලද ආයතනයට යම් ස්වයං පාලන බලතල ලබා දී ඇත. වැටුප් සංරචකය කොමිෂන් සභාවේ මුළු ආදායමෙන් 24% ක් පමණ වේ. PED 01/2021 ප්‍රකාරව මුදල් අමාත්‍යාංශයට ලියනු ඇත.
(ඌ)	අංක 03/2018 හා 2018 ජූලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියක් ලබා නොගෙන නීතිපතිවරයාගේ මතය මත පදනම්ව 2019 වර්ෂයේදී කොමිෂන් සභාවේ වැටුප් 12.98% සිට 59.73% දක්වා ඉහළ ගොස් ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිතයා මේ සම්බන්ධයෙන් තම ස්වාධීන මතය අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර මහජන යහපත සුරක්ෂිත කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නො.තිබුණි.	වේතන කමිටුව විසින් කරන ලද අධ්‍යයනයක් මත සහ කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව ඔවුන්ගේ නිර්දේශ මත වැටුප් සංශෝධනය කර ඇත. කොමිෂන් සභාව ගෙන ඇති නෛතික ස්ථාවරය නීතිපතිවරයාගේ මතය මගින් සනාථ කෙරිණි. වැටුප් ව්‍යුහය සංශෝධනය කිරීමේ තීරණයට කොමිෂන් සභාව ඒකමතිකව එකඟ වී තිබේ. වැටුප් සංරචකය කොමිෂන් සභාවේ මුළු ආදායමෙන් 24% ක් පමණ වේ. PED 01/2021 ප්‍රකාරව මුදල් අමාත්‍යාංශයට ලියනු ඇත.

2021 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
(ඒ)	තම සේවකයන් සඳහා ස්වයං දායක රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමට කොමිෂන් සභාව අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. සේවකයින්ගේ දායකත්වයකින් තොරව රක්ෂණ ආවරණයක් ලබා ගැනීම සඳහා 2021 වසරේ දී කොමිෂන් සභාව සිය අරමුදල්වලින් රු.මි. 6.2 ක් වැය කර ඇත. කෙසේ වුවද, 2017 වර්ෂයේ දී ජාතික රක්ෂණ භාර අරමුදල අර්ධ රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා ද මසකට රු. 1000 ක දායකත්වයක් අය කරමින් ස්වයං දායක රක්ෂණ ක්‍රමය දීර්ඝ කර ඇති බව නිරීක්ෂණය විය.	ආරම්භයේ සිටම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වේ සේවකයින් සඳහා කොමිෂන් සභා ව විසින් රක්ෂණාවරණ ලබා දී ඇත. මෙය සේවක වේතන පැකේජයේ කොටසකි සෑම අවස්ථාවකදීම ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි අනුගමනය කර ඇත. PED 6/2019 මගින් අදාළ පිරිවැය, ආවරණය කළ යුතු අවදානමේ ස්වභාවය සහ සේවාවන්හි ගුණාත්මකභාවය මෙන්ම මෙම සේවාවන් ආයතන වෙත ලබා ගැනීමේ පහසුව සලකා බැලීමට ආයතනවලට උපදෙස් දෙනු ලැබේ. 2019 සැප්තැම්බර් 12 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 06/2019 (ස) හි නියම කර ඇති අවශ්‍යතාවයට අනුකූල වීම සඳහා (සඟල පිටුව 51), දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් වෙළඳපල කොටස මත පදනම්ව ඉහළම සමාගම් 5 සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි වී ඇති රජය සතු රක්ෂණ සමාගම් වෙතින් මිල ගණන් කැඳවීමට තීරණය කරන ලදී. ජාතික රක්ෂණ භාර අරමුදල මිල ගණන් අමුණා තිබුණේ නැත. දීර්ඝ කාලයක් තිස්සේ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සඳහා සෞඛ්‍ය රක්ෂණය සපයනු ලබන අයතනය ලෙස විස්වල්අයිසී විසින් අදාළ ස්ථානයේදීම හිමිකම් පියවීමේ සේවාව, කොවිඩ් 19 සඳහා පරිපූර්ණ ආවරණයක් ඇතුළු ගුණාත්මක සේවාවක් සපයනු ලැබේ. තවද, පෙර අත්දැකීම්වලට අනුව, මෝටර් රථ සහ පුද්ගලික අනතුරු ආවරණයට අදාළ හිමිකම් පෑම් සම්බන්ධයෙන් ජාතික රක්ෂණ භාර අරමුදල සතුටුදායක සේවාවක් සපයා නැත. තවද, අග්‍රහාර රක්ෂණ ක්‍රමය සඳහා භාණ්ඩාගාරයේ මුදල් සහාය ලබා දෙනු ලැබේ. එබැවින් එය සුදුසු නොවනු ඇත.
(ඒ)	2021 වසර සඳහා ඇස්තමේන්තු කරන ලද සුභසාධන වියදම රු. 3,036,000 ක් වන නමුත් සැබෑ පිරිවැය රු. 3,477,654 කි. ඒ අනුව, ඇස්තමේන්තු කරන ලද වියදමට වඩා රු. 441,654 ක් (12.7%) වියදම් කර තිබුණි. තවද, කොමිෂන් සභාවේ ප්‍රවාහනය සඳහා වන සුභසාධන වියදම් හැර අනෙකුත් සුභසාධන වියදම් සලකා බැලීමේ දී සමාලෝචිත වර්ෂය සඳහා එක් සේවකයෙකුට කොමිෂන් සභා අරමුදල් මගින් දරනු ලබන වාර්ෂික සුභසාධන වියදම රු. 36,640 ක් වේ.	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් 2021 සුභසාධන වියදම් සඳහා රුපියල් 3,100,000 මුදලක් වෙන් කරන ලදී. පසුව, කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව රුපියල් මිලියන 1.3ක් කාර්ය මණ්ඩල සුබසාධනය වෙත මාරු කරන ලදී (අංක 206/08 හා 2021/03/05දිනැති කොමිෂන් සභා පත්‍රිකාව). කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයට ප්‍රවාහන පහසුකම් සැපයීමට සිදු විය. කොවිඩ් කාලසීමාව තුළ ප්‍රවාහනය කාර්ය මණ්ඩල සුබසාධනය සහ ප්‍රාදේශීය සංචාර සඳහා වන අයවැයෙන් භාවිතා කර තිබුණි. ඒ අනුව, විස්තරය | අයවැය (රු) | තථ්‍ය (රු) කාර්ය මණ්ඩල සුභසාධනය | 4,400,000/- (රු.මි. 1.3 ක් මාරු කිරීම ඇතුළුව) | 4,518,164 ගමන් වියදම් - දේශීය | 260,000/- | එකතුව | 4,660,000/- | 4,518,164 එබැවින්, වියදම අයවැය සීමාව තුළ පවතියි.

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31 දිනට

	සටහන්	31.12.2021 දිනට රු.	31.12.2020 දිනට රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	1	**23,827,365**	15,984,713
ස්ථාවර සහ ආපසු ගෙවිය හැකි තැන්පතු	2	**445,593,949**	868,593,949
වෙනත් ජංගම නොවන වත්කම්	3	**9,639,737**	8,034,020
මුළු ජංගම නොවන වත්කම්		**479,061,051**	892,612,682
ජංගම වත්කම්			
භාණ්ඩ තොග	4	**598,430**	522,560
රක්ෂණ ඔප්පු හිමියන්ගේ හා වෙනත් ආරක්ෂණ අරමුදල	2	**7,995,830,615**	6,605,893,807
වෙනත් ජංගම වත්කම්	5	**12,448,937**	13,164,043
ස්ථාවර තැන්පතුවල අයෝජන		**-**	35,000,000
රජයේ සුරැකුම්පත්වල ආයෝජනය- ප්‍රති මිලදී ගැනුම්		**220,000,000**	110,000,000
මුදල් හා මුදල් සමාන දෑ	6	**6,320,185**	5,673,130
මුළු ජංගම වත්කම්		**8,235,198,168**	6,770,253,540
මුළු වත්කම්		**8,714,259,219**	7,662,866,222
සංචිත හා වගකීම්			
සංචිත හා අරමුදල්			
රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල	7	**8,441,424,564**	7,468,719,235
ප්‍රත්‍යාගණන සංචිතය		**28,593,684**	17,689,652
සමුච්චිත අරමුදල		**162,942,114**	92,731,913
මුදල් අමාත්‍යාංශය වෙතින් ලද ප්‍රදානය		**552,384**	307,535
මුළු සංචිත සහ අරමුදල්		**8,633,512,746**	7,579,448,336
වගකීම්			
ජංගම නොවන වගකීම්			
ප්‍රදානය	8	**5,061,291**	10,829,811
විලම්බිත බදුකරණය	21	**1,898,049**	483,021
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	9	**21,614,840**	19,473,749
මුළු ජංගම නොවන වගකීම්		**28,574,180**	30,786,581
ජංගම වගකීම්			
අත්තිකාරම් ලැබීම්		**16,380,329**	14,140,076
වෙනත් ජංගම වගකීම්	10	**35,791,964**	37,085,332
බැංකු ඍණ ශේෂය	6 & 22	**-**	1,405,898
මුළු ජංගම වගකීම්		**52,172,293**	52,631,306
මුළු සංචිත සහ වගකීම්		**8,714,259,219**	7,662,866,222

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සාමාජිකයන් සතුය. ඉහත මූල්‍ය ප්‍රකාශනය පිටු අංක 136 සිට 154 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් සමග සංයෝජිතව කියවිය යුතුය.

රසික් සරුක්
සභාපති

දමයන්ති ප්‍රනාන්දු
අධ්‍යක්ෂ ජෙනරාල්

සාමාජික

සතිෂ් කුමාර්
අධ්‍යක්ෂ - මූල්‍ය හා පරිපාලන

කොළඹ, ශ්‍රී ලංකා
2022 සැප්තැම්බර් 30 දින

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

	සටහන්	31.12.2021 දිනට රු.	31.12.2020 දිනට රු.
ආදායම			
විනිමය නොවන ගණුදෙනුවලින් ලැබෙන ආදායම			
වාර්ෂික ගාස්තු සහ අලුත් කිරීමේ ගාස්තු	11	**272,610,654**	259,396,415
ප්‍රදාන හඳුනා ගැනීම්	8	**-**	2,905,041
ලෝක බැංකු ව්‍යාපෘතිය මගින් ලද ආදායම	12	**255,150**	12,344,401
විනිමය ගණුදෙනුවලින් ලැබෙන ආදායම			
පොළී ආදායම	13	**12,609,727**	12,784,254
වෙනත් ආදායම්	14	**425,296**	210,661
මුළු ආදායම		**285,900,827**	287,640,772
වියදම			
කාර්ය මණ්ඩල පිරිවැය	15	**(127,134,065)**	(110,760,060)
වෘත්තීය ගාස්තු	16	**(320,576)**	(302,000)
මෙහෙයුම් ගාස්තු	17	**(71,346,108)**	(66,594,283)
ලෝක බැංකු ව්‍යාපෘතිය සඳහා දරණ ලද වියදම්	18	**(255,150)**	(640,875)
මූල්‍ය සහ අනෙකුත්	19	**(54,613)**	(70,628)
මුළු වියදම්		**(199,110,512)**	(178,367,845)
බදුවලට පෙර ශුද්ධ අතිරික්තය/ (ඌණතාවය)		**86,790,315**	109,272,927
බදුකරණය	21	**(16,014,436)**	(16,348,823)
අතිරික්තය රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරු කිරීම්		**-**	(93,214,934)
බදුවලට පසු ශුද්ධ අතිරික්තය/ (ඌණතාවය)		**70,775,879**	290,831
සමුච්චිත අරමුදලට මාරු කෙරෙන අතිරික්තය		**70,279,670**	-
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් මත ආයුගණන අලාභය / (ලාභය)	9	**496,209**	(290,831)
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය		**69,783,461**	-

පිටු අංක 136 සිට 154 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

ශුද්ධ වත්කම් හා ප්‍රාග්ධන වෙනස්වීමේ ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

	ප්‍රත්‍යාගණන සංචිත රු.	සමුච්චිත අතිරික්ත/ (ඌණතාවය). රු.	එකතුව රු.
2019 ජනවාරි 1 දිනට ශේෂය	17,689,652	41,337,937	59,027,589
වැටුප් සංශෝධනයට අදාළ පෙර වර්ෂයේ ගැලපීම	-	(11,643,186)	(11,643,186)
2018 වර්ෂයට අදාළ ආදායම් බදු ගැලපීම	-	(11,190,575)	(11,190,575)
2018 වර්ෂයේ අතිරික්තය රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරු කිරීම	-	(18,504,176)	(18,504,176)
වර්ෂයට අදාළ අතිරික්තය	-	(2,189,555)	(2,189,555)
ආයුගණක අලාභය/ (ලාභය)	-	515,801	515,801
ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරු කිරීම	-	1,673,754	1,673,754
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**17,689,652**	**-**	**17,689,652**
2020 ජනවාරි 1 දිනට ශේෂය	17,689,652	-	17,689,652
ආරම්භක ශේෂය මත විලම්බිත බදු බලපෑම	-	(633,973)	(633,974)
වර්ෂයට අදාළ අතිරික්තය	-	96,001,300	96,001,300
රක්ෂණ ඔප්පු හිමයන්ගේ ආරක්ෂණ අරමුදලට මාරු කිරීම	-	(95,600,233)	(95,600,233)
ආයුගණක ලාභය මත විලම්බිත බදු බලපෑම	-	40,716	40,716
ආයුගණක අලාභය/ (ලාභය)	-	(290,831)	(290,831)
2020 වසර සඳහා රක්ෂණ ඔප්පු හිමයන්ගේ ආරක්ෂණ අරමුදලට මාරු කළ අතිරික්තය ආපසු හැරවීම	-	93,214,934	93,214,934
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**17,689,652**	**92,731,913**	**110,421,565**
2021 ජනවාරි 1 දිනට ශේෂය	17,689,652	92,731,913	110,421,565
2021 වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය	-	69,783,461	69,783,461
වත්කම් ප්‍රත්‍යාගණනයේ ලාභය	12,679,107	-	12,679,107
විලම්බිත බදු	(1,775,075)	-	(1,775,075)
ආයුගණක අලාභය/ (ලාභය)	-	496,209	496,209
විලම්බිත බදු	-	(69,469)	(69,469)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**28,593,684**	**162,942,114**	**191,535,798**

ප්‍රත්‍යාගණනය කිරීමේ සංචිතය මෝටර් වාහන, ගෘහ භාණ්ඩ සහ පිරවුම් හා කාර්යාල උපකරණ සහ විද්‍යුත් දත්ත තක්සේරු කිරීමේදී පැන නගින අතිරික්තය/හිඟය නියෝජනය කරයි.%

සමුච්චිත අතිරික්තය/ හිඟයන් මගින් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙන් මාරු කරන ලද අතිරික්තය/ හිඟය නියෝජනය කරයි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

	සටහන්	31.12.2021 දිනට රු.	31.12.2020 දිනට රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ			
කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/ (ඌණතාවය)		**86,790,315**	109,563,757
ක්ෂය සඳහා ගැලපීම්	1	**7,861,456**	5,480,041
විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන	9	**3,634,057**	3,925,559
ප්‍රදාන හඳුනා ගැනීම්	9	**(1,989,175)**	-
කාරක ප්‍රාග්ධනයවෙනස් වීමට පෙර ශුද්ධ වැඩි වීම	8	**-**	(2,905,041)
පොළී ආදායම	13	**(12,609,727)**	(12,784,254)
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර ශුද්ධ වැඩි වීම		**83,686,926**	103,280,062
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම			
තොගවල (වැඩි වීම)/ අඩු වීම	4	**(75,870)**	131,762
ලැබිය යුතු දෑවල (වැඩි වීම)/ අඩු වීම	5	**(1,127,676)**	374,136
අත්තිකාරම් ලැබීම්වල (වැඩි වීම)/ අඩු වීම		**2,240,252**	(192,760)
ණය හිමියන් සහ උපචිතයන්හි (වැඩි වීම)/ අඩු වීම	10	**(464,970)**	3,704,753
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද මුදල් ප්‍රවාහ		**571,736**	4,017,891
ගෙවන ලද ආදායම් බදු	21	**(16,063,744)**	(12,931,704)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**68,194,918**	94,366,249
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබූ/(ක්‍රියාකාරකම් සඳහා යෙදූ) මුදල් ප්‍රවාහ			
රජයේ සුරැකුම්පත්වල ආයෝජනය		**(110,000,000)**	52,000,000
ස්ථාවර තැන්පතුවල අයෝජනය		**35,000,000**	(35,000,000)
පොළී ආදායම		**11,638,186**	12,661,839
දේපළ පිරියත හා උපකරණ මිලට ගැනීම	1	**(3,025,000)**	(5,773,521)
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**(66,386,814)**	23,888,318
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ			
රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් ප්‍රාග්ධන මාරු කිරීම්		**-**	5,773,521
අතිරික්තය 2019 රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරු කිරීම		**-**	(129,844,897)
මුදල් අමාත්‍යාංශය වෙතින් ලද ප්‍රදානය		**244,849**	(668,591)uu
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**244,849**	(124,739,967)
මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		**2,052,952**	(6,485,399)
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ		**4,267,233**	10,752,632
වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ		**6,320,185**	4,267,233
අතැති සහ බැංකුවේ ඇති මුදල්	6 හා 22		
අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය		**5,437,940**	5,014,430
ලංකා බැංකුව - ලෝක බැංකු ව්‍යාපෘති ගිණුම		**508,578**	658,147
ලංකා බැංකුව 1877		**373,073**	-
ඉතුරුම් - ජාතික ඉතිරි කිරීමේ බැංකුව		**595**	554
		6,320,185	5,673,131
ලංකා බැංකුව - ඍණ ශේෂය*			
ලංකා බැංකුව 1877 - ලෙජරයට අනුව		**-**	1,405,898
		6,320,185	4,267,233

පිටු අංක 136 සිට 154 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

	31.12.2021 දිනට රු.	31.12.2020 දිනට රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ		
රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ශුද්ධ වැඩි වීම	**972,710,329**	1,215,761,003
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර ශුද්ධ වැඩි වීම	**972,710,329**	1,215,761,003
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම		
රජයේ සුරැකුම්පත්වලින් ලැබිය යුතු පොළියෙහි (වැඩි වීම)/ අඩුවීම	**(35,502,718)**	(71,803,279)
ලැබිය යුතු සෙස් බදුවල (වැඩි වීම)/අඩු වීම	**(20,875,866)**	(13,765,866)
රක්ෂණ ඔප්පු හිමියන්ගේ අරමුදලින් මාරු කළ යුතු ප්‍රමාණයේ වැඩිවීම/ (අඩුවීම)	**87,981,414**	36,871,008
	31,602,829	(48,698,137)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ	**1,004,313,159**	1,167,062,867
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබූ/(ක්‍රියාකාරකම් සඳහා යෙදූ) මුදල් ප්‍රවාහ		
රජයේ සුරැකුම්පත්වල ආයෝජන	**-**	1,076,659,000
ස්ථාවර තැන්පතුවල අයෝජන	**(1,153,407,500)**	(2,111,732,500)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(1,153,407,500)**	(1,035,073,500)
මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)	**(149,094,341)**	131,989,367
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ	**150,396,035**	18,406,669
වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ	**1,301,693**	150,396,035
ජංගම ගිණුමේ ශේෂය	**1,000,000**	1,000,000
අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය	**301,693**	149,396,035
	1,301,693	150,396,035

ගිණුම්කරණ ප්‍රතිපත්ති

1 වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති

1. 1 වාර්තා කිරීමේ ආයතනය

1.1.1 නෛතික ආකෘතිය

2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි විගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කරනු ලැබ ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය 2001 පෙබරවාරි 23 දින රජයේ ගැසට් නිවේදනය අංක 1172/27 මගින් බලය දී ඇති පරිදි 2001 මාර්තු 01 දින සිට ක්‍රියාත්මකවන පරිදි මෙහෙයුම් කටයුතු අරඹන ලදී.

කොමිසමේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ 11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක බැංකු වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01 යන ලිපිනයෙහිය.

1.1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය.

කොමිෂන් සභාවේ අරමුණ හා වගකීම වන්නේ ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර අවංකව, වෘත්තීමය වශයෙන් හා විචක්ෂණශීලීභායෙන් පවත්වාගෙන යාම තුළින් ඔප්පු හිමියන්ගේ සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කිරීමයි.

පනතට අනුව කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය පහත පරිදි වේ.

(අ) ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යන තැනැත්තන් රක්ෂණකරුවන් වශයෙන් ලියාපදිංචි කිරීම,

(ආ) රක්ෂණ තැරැව්කරුවන් වශයෙන් තැනැත්තන් ලියාපදිංචි කිරීම,

(ඇ) රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම හා විධිමත් කිරීම සම්බන්ධයෙන් රජය වෙත උපදෙස් ලබා දීම,

(ඈ) රක්ෂණ කර්මාන්තය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,

(ඉ) කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ, කාර්ය ඉටු කිරීමේ හා කර්තව්‍ය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යම් නිලධරයන් හා සේවකයන් සේවයෙහි නියුක්ත කිරීම,

(ඊ) නිශ්චල හෝ චංචල දේපළ කිසිවක් අත්කර ගැනීම හා දැරීම, ඒ දේපළ විකිණීම, බද්දට දීම, උකස් කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම,

(උ) කොමිසමේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යම් ගිවිසුම් වලට ඇතුළත් වීම සහ,

(ඌ) මෙම පනත යටතේ යථා පරිදි කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා කිරීම.

1.2 සකස් කිරීමේ පදනම

1.2.1 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, සම කොටස්හි/ ශුද්ධ වත්කම්හි වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහයන් හා මූල්‍ය ප්‍රකාශනවල සටහන් ඇතුළත් වන අතර ඒවා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇති අතර එම ප්‍රමිතීන්ට අනුකූල වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් 2022 සැප්තැම්බර් 30 වන දින නිකුත් කිරීමට අවසර ලබා දී ඇත.

1.2.2 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇති අතර පහත සඳහන් කරුණු හැර මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමන සාධක සඳහා කිසිඳු ගැලපීමක් සිදු නොකර අඛණ්ඩව අදාළ කර ඇත.

සටහන 3.1.1 හි පැහැදිලි කර ඇති පරිදි ආයුගණක තක්සේරුවක් මත පදනම්ව එහි වර්තමාන අගය අනුව අර්ථ දක්වන ලද ප්‍රතිලාභ බැඳීම් මනිනු ලැබේ.

යථායෝග්‍ය පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරියෙන් දැක්වෙන සටහන් මගින් ආනාවරණය කර ඇත.

1.2.3 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ දී කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ තහවුරු කර ඇත. රක්ෂණ නියාමන කොමිෂන් සභාව චිරස්ථායී අනාගතයක් උදෙසා අඛණ්ඩව මෙහෙයුම් පවත්වාගෙන යන බවටත් එහි ව්‍යවස්ථාපිත වගකීම් සපුරාලන බවටත් කොමිෂන් සභාවේ සාමාජිකයින්හට සාධාරණ තක්සේරුවක් ඇත. අනාගත සියළුම තොරතුරු සැලකිල්ලට ගැනීමෙන් පසුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ඈවර

ගිණුම්කරණ ප්‍රතිපත්ති

කිරීමේ හෝ එහි මෙහෙයුම් නවතාලීමේ අවශ්‍යතාවක් හඳුනාගෙන නොමැත. ඒ අනුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ අඛණ්ඩ පැවැත්ම පදනම් කර ගෙන ඇත.

1.2.4 භාවිත සහ වාර්තා කරන මුදල්

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන කොමිෂන් සභාවේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කෙරේ. රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලුම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියලට වටයා ඇත.

1.2.5 සංසන්දනාත්මක තොරතුරු

වඩා හොඳ තත්වයෙන් ඉදිරිපත් කිරීම සහ වත්මන් වර්ෂය සමග සැසඳිය හැකි පරිදි පෙර වසරේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇත.

1.2.6 ද්‍රව්‍යමය බව සහ එකතු කිරීම

සමාන අයිතමවල සෑම ද්‍රව්‍යමය පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කර ඇත. ස්වභාවය හෝ ක්‍රියාකාරීත්වය සමාන නොවන අයිතම ද්‍රව්‍යමය නොවන්නේ නම් හැර වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

1.2.7 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී කළමනාකාරීත්වය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගැනීම සහ වාර්තා කළ වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් සිදු කළ යුතුය. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක වූ උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ. ඇස්තමේන්තු සංශෝධනය කෙරෙන කාලපරිච්ඡේදය සහ බලපෑමට ලක්වන ඕනෑ ම අනාගත කාල පරිච්ඡේදයක දී ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධන පිළිගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති මුදලට සැලකිය යුතු බලපෑමක් එල්ල කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගැනීමට අදාළ තීරණාත්මක විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සටහන්වල ඇතුළත් වේ.

දුර්වලතා තක්සේරු කිරීම - වටිටම් කළ මුදල් ප්‍රවාහ ප්‍රක්ෂේපනවල දී භාවිතා වන ප්‍රධාන උපකල්පනයන්

වත්කමකට හෝ වත්කම් කළඹකට හානි වී ඇති බවට වාස්තවික සාක්ෂි තිබේද යන්න කොමිෂන් සභාව වාර්තා කරන සෑම දිනකම ඇගයීමට ලක් කරයි. වත්කමක අය කරගත හැකි ප්‍රමාණය එහි භාවිතයේ ඇති වටිනාකමට වඩා වැඩි වන අතර එහි සාධාරණ වටිනාකම විකිණීමේ අඩු පිරිවැයක් වේ. භාවිතයේ දී පවතින වටිනාකම තක්සේරු කිරීමේදී ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් වර්තමාන වටිනාකමට වටිටම් කරනු ලබන්නේ මුදල්වල කාල අගය සහ වත්කමට විශේෂිත වූ අවදානම පිළිබඳ වර්තමාන වෙළඳපල තක්සේරු කිරීම් පිළිබිඹු කරන සුදුසු වටිටම් අනුපාත භාවිතා කරමින්ය.

ක්ෂය

ක්ෂය වීමේ ක්‍රමය, ප්‍රයෝජනවත් ආයු කාලය සහ ශේෂ වටිනාකම තීරණය කිරීමේදී විනිශ්චය අවශ්‍ය වේ.

විලම්බිත බදුකරණය

අනාගත බදු සැලසුම් උපාය මාර්ග සමග අනාගත බදු අය කළ හැකි ලාභ මට්ටම මත පදනම්ව, හඳුනාගත හැකි විලම්බිත බදු වත්කම් ප්‍රමාණය තීරණය කිරීමට කළමනාකරණ විනිශ්චය අවශ්‍ය වේ.

අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම්

අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීම්වල වගකීම තක්සේරු කිරීමට උපකල්පනවල සැලකිය යුතු කොටසක් අදාළවේ; එයට වටිටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම් සහ මරණ අනුපාත ඇතුළත් වන අතර මෙම සැලසුම් දිගුකාලීන වන බැවින් එවැනි ඇස්තමේන්තු අවිනිශ්චිතතාවයට යටත් වේ.

වත්මන් බදුකරණය

කළමනාකාරීත්වය විශ්වාස කරන පරිදි තථ්‍ය බැඳීම් නිරූපණය කෙරෙන අදාළ බදු ප්‍රඥප්ති සහ රෙගුලාසි අදාළ කර ගනිමින් මූල්‍ය ප්‍රකාශනවල වත්මන් බදු වගකීම් ඉදිරිපත් කරනු ලැබේ. ගණුදෙණු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය ආදායම් බලධාරීන් විසින් විවාදයට ලක් කරන අවස්ථා ද තිබිය හැකිය. මෙම ගැටළුවලට අදාළ ඕනෑම අමතර පිරිවැයක් කොමිෂන්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

සභාවේ වගකීමක් ලෙස තහවුරු කරන අවස්ථාවේ දී බදු වියදමක් ලෙස ගණන් ගනු ලැබේ.

1.2. 8. වාර්තා කරන කාල සීමාවෙන් පසු හට ගන්නා සිදුවීම්

වාර්තා කරන කාල සීමාවෙන් පසුව හටගන්නා සියළුම ප්‍රමාණාත්මක සිද්ධීන් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ කාර්යයේ සැලකිල්ලට ගෙන අවශ්‍ය ගැලපීම් හෝ අනාවරණයන් කර ඇත.

1.3 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

සියළුම විදේශ මුදලින් සිදු වූ ගනුදෙනු ඒවා සිදු වූ අවස්ථාවේ දී පැවති විනිමය අනුපාතිකයන් පාදකව වාර්තා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කර ඇත. විදේශ මුදල්හි වත්කම් හා වගකීම් ශේෂ පත්‍රයේ පවතින විනිමය අනුපාත මත පරිවර්තනය කරනු ලැබේ. ඇති වන ලාභ හා අලාභ සම්බන්ධයෙන් ආදායම් හා වියදම් ගිණුම තුළ කටයුතු කරනු ලැබේ.

1.4 මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු හා ප්‍රතිපත්ති

කොමිෂන් සභාවේ මූල්‍ය වගකීම් පෙර ලැබීම් හා වෙනත් ගෙවිය හැකි දෑවලින් සමන්විත වේ. කොමිෂන් සභාවේ මූල්‍ය වගකීම්වලට ලැබිය යුතු දෑ සහ එහි කටයුතුවලින් සෘජුවම ලැබෙන මුදල් හා වෙනත් කෙටිකාලීන ආයෝජන ඇතුළත් වේ.

1.4.1 වෙළඳපළ අවදානම

වෙළඳපළ අවදානම යනු වෙළඳපළ මිල වෙනස් වීම හේතුවෙන් මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහයෙහි සාධාරණ වටිනාකම උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපළ මිල අවදානම් වර්ග දෙකකින් සමන්විත වේ. වෙළඳපළ අවදානම මගින් බලපෑමට ලක් වන මූල්‍ය උපකරණවලට මූල්‍ය ආයතනවල තැන්පතු ඇතුළත් වේ.

1.4.1.1 පොළී අනුපාත අවදානම

පොළී අනුපාත අවදානම යනු වෙළඳපළ පොළී අනුපාත වෙනස් වීම හේතුවෙන් මූල්‍ය උපකරණයක සාධාරණ වටිනාකම හෝ අනාගත මුදල් ප්‍රවාහයෙහි උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපළ පොළී අනුපාත වෙනස් වීමේ අවදානම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අනාවරණය මූලික වශයෙන් පාවෙන පොළී අනුපාතත් කොමිෂන් සභාවේ වගකීමට අදාළ වේ.

1.4.1.2. ද්‍රවශීලතා අවදානමට අදාළව

කොමිෂන් සභාව විසින් අඛණ්ඩව මුදල් ප්‍රවාහ පුරෝකථනයන් හා මුදල් අයවැයකරණය භාවිත කරමින් එහි අරමුදල් හිඟයක් ඇති වීමේ අවදානම අධීක්ෂණය කරයි.

2. වත්කම් හා අගය කිරීමේ පදනම

2. 1 දේපළ, පිරියත හා උපකරණ

ස්වසන්තක අයිතිය සහිත දේපළ පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැයෙන්/ ප්‍රත්‍යාගණන අගයෙන් සමුච්චිත ක්ෂය අඩු කළ අගයට නිරූපණය කර ඇත. දේපළ, පිරියත හා උපකරණවල පිරිවැයට ඇතුළත් වන්නේ අත්පත් කර ගැනීමේ පිරිවැය සමග එම වත්කම් අපේක්ෂිත භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම්වල එකතුවයි.

හුවමාරු නොවන ගනුදෙනුවක දී වත්කමක් ශූන්‍ය හෝ නාමික සලකා බැලීමක් සඳහා අත්පත් කර ගන්නා විට වත්කම මුලින් මනිනු ලබන්නේ එහි සාධාරණ වටිනාකමෙනි.

අයිතමයට සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ගෙන යාමට හෝ ගලා ඒම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා පසුකාලීනව දරන ලද පිරිවැය ප්‍රාග්ධන වියදම් ලෙස සලකන ලදී. අනෙකුත් අලුත්වැඩියාවන් සහ නඩත්තු කටයුතු සඳහා වන වියදම් ඒවා දරණ ලද මූල්‍ය වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙන් අය කරනු ලැබේ.

වසර තුනකට වරක් ප්‍රත්‍යාගණනය කරනු ලබන මෝටර් රථ සඳහා ප්‍රත්‍යාගණන ආකෘතිය අදාළ කරගන්නා අතර ඉන් පසුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 7 යටතේ වන ප්‍රත්‍යාගණන ආකෘතියේ අවශ්‍යතාවලට අනුකූල වන බවට වග බලා ගනු ලැබේ.

කාර්යාලීය උපකරණ, ගෘහ භාණ්ඩ සහ උපාංග වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

ක්ෂය

වත්කම් ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය පුරා පහත අනුපාත පාදකව සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කරනු ලැබේ. ප්‍රයෝජනවත් ආයු කාලය, ක්ෂය වීමේ ක්‍රම සහ අවශේෂ අගයන් වාර්ෂිකව හෝ එවැනි තක්සේරුවක් අවශ්‍ය වන බව පෙන්නුම් කරන අවස්ථාවට පෙර දිනයක දී තක්සේරු කරනු ලැබේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

වාර්ෂික	(%)
මෝටර් වාහන	25
ලී බඩු, වෑද්දුම සහ සවි කිරීම	12.5
කාර්යාල හා විද්‍යුත් උත්තා සැකසුම	25
පුහුණු උපකරණ	25

මිල දී ගත් දින සිට බැහැර කරන දින දක්වා ක්ෂය ලබා දෙනු ලැබේ. විකුණුම් මත ලාභ සහ අලාභ තීරණය කරනු ලබන්නේ විකුණුම් ආදායම ගෙන යන මුදල සමග සංසන්දනය කිරීමෙනි.

2.2 ආයෝජන

බලපත්‍රලාභී රජයේ බැංකුවල ස්ථාවර තැන්පතු සහ කෙටි කාලීන ආයෝජන, රජයේ භාණ්ඩාගාර බිල්පත් සහ රජයේ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කරනු ලබන අතර වාර්තා කරන කාල සීමාව දක්වා පිරිවැය සහ උපචිත පොලී ලෙස දක්වා ඇත. මෙම ආයෝජන වාර්තා කරන කාල සීමාව දක්වා පිරිවැය සහ එකතු කළ පොළියෙන් දක්වා ඇත. එබැවින් මූල්‍ය වර්ෂය අවසානයේ දී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය උපකරණවල අවදානමක් නොමැත.

2.3 තොග

තොග ඒවායේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්වලින් අඩු අගයට දක්වා ඇත. තොගවල පිරිවැය නිශ්චය කිරීමේ දී ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමය (ප්‍ර.ලැ.ප්‍ර.නි) ඒ සඳහා පාදක කරගෙන ඇත.

2.4 ලැබිය යුතු දෑ

හානිය සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් පසුව ලැබිය යුතු දෑ අපේක්ෂිත යථාර්ථවාදී අගයට රැගෙන යනු ලැබේ. වාස්තවික සාක්ෂි සලකා බැලීම මගින් සියලු ම ලැබිය යුතු දෑ නිශ්චිත හානි සඳහා තක්සේරු කරනු ලැබේ.

2.5 මූල්‍ය නොවන වත්කම් හානි වීම

කොමිෂන් සභාව සෑම මූල්‍ය කාල සීමාවක් අවසානයේ ම මූල්‍ය නොවන වත්කම් හානි විය හැකි බව පෙන්නුම් කරන සිදුවීම් හෝ වෙනස් වීම් තක්සේරු කරයි. එවැනි ඇඟවීමක් තිබේ නම්, කොමිෂන් සභාව අය කරගත හැකි ඇස්තමේන්තුගත වත්කම් ප්‍රමාණය ලබා දෙයි. වත්කමක ගෙන යා හැකි මුදල එහි අයකර ගත හැකි මුදල ඉක්මවන විට, වත්කම හානි වූවා සේ සලකනු ලබන අතර එහි අයකර ගත හැකි මුදලට ලියා දක්වනු ලැබේ.

2.6 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශන සකස් කිරීමේ පරමාර්ථය සඳහා මුදල් හා මුදල් සමාන දෑවලින් නියෝජනය වන්නේ සෑම විටම මුදල් ලෙස ලබා ගැනීමේ හැකියාව ඇති සහ අගය වෙනස් වීමේ සුළු අවදානමකට යටත් වන බැංකුවේ මුදල් සහ අතැති මුදල්, කෙටිකාලීන තැන්පතු සහ මුල් කල් පිරීම මාස තුන හෝ ඊට අඩු වන ද්‍රවශීල ආයෝජනයයි.

3. බැරකම් සහ ප්‍රතිපාදන

ශේෂ පත්‍ර දිනයට සියළු භෞතික බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු ලබන අතර පවතින බැරකම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සපයා ඇත. මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සියළු ම දන්නා බැරකම් ඒවායේ පිරිවැයට ඇතුළත් කර ඇත.

3.1 වාර්තා කරන දිනයෙන් පසු වර්ෂයක් තුළ දී හෝ ඉල්ලුම් කළ විටක දී ගෙවිය යුතු වන දෑ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම බැරකම් සේ වර්ගීකරණය කර ඇත.

3.2 වාර්තා කරන දිනයෙන් පසු වර්ෂයක් තුළ දී ගෙවිය යුතු වන දෑ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම බැරකම් සේ වර්ගීකරණය කර ඇත.

3.3 අවිනිශ්චිත වගකීමක් යනු කොමිෂන් සභාවේ පාලනයෙන් ඔබ්බට ඇති අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ කිහිපයක් සිදුවීම හෝ සිදු නොවීම මගින් හෝ පියවීමට සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය විය හැකි නිසා පිළිගත නොහැකි වර්තමාන වගකීමක් හේතුවෙන් පැන නැගිය හැකි වගකීමකි.

3.4 අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස කොමිෂන් සභාවට දැනට නෛතික හෝ සාධනීය වගකීමක් ඇති විට ප්‍රතිපාදන පිළිගනු ලබන අතර එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය විය හැකි අතර වගකීමේ ප්‍රමාණය පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තු කිරීමක් සිදු කළ හැකිය.

3.5 සංචිතවල ස්වභාවය සහ අරමුණ

නිශ්චිත දේශීය අවශ්‍යතා සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව තුළ සංචිත නිර්මාණය කර පවත්වාගෙන යයි.

(අ) සමුච්චිත සංචිත

කොමිෂන් සභාවේ අතිරික්තය/හිඟය සමුච්චිත අරමුදලට මාරු කරනු ලැබේ.

(ආ) ප්‍රත්‍යාගණන සංචිතය

වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී ලැබෙන ලාභය/අලාභය පරිත්‍යාගණය සංචිතයට මාරු කරනු ලැබේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

3.1 විශ්‍රාම ප්‍රතිලාභ

3.1.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

කොමිෂන් සභාව විසින් 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත යටතේ සියළු සුදුසුකම් ලත් සේවකයන් සඳහා අවශ්‍ය පරිදි විශ්‍රාම ප්‍රතිලාභ සැලසුමක් සකස් කරගන්නා ලදී. විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම මගින් විශ්‍රාම ගැනීමේ දී සේවකයෙකුට ලැබෙන ප්‍රතිලාභ ප්‍රමාණය අර්ථ දැක්වේ.

කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 19 සේවක ප්‍රතිලාභ යටතේ දක්වා ඇති ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කර නිශ්චිත ප්‍රතිලාභ සැලසුමට අදාළ මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති වගකීම වාර්ෂිකව ගණනය කරනු ලැබේ.

2021 මූල්‍ය වසර ආරම්භයේ දී	19,473,748
වර්තමාන සේවා පිරිවැය	2,465,632
පොළී පිරිවැය	1,168,425
ආයුගණක අලාභ/ (ලාභ)	496,209
ආදායම් ප්‍රකාශයෙහි ලාභ හා අලාභවලට අදාළ ගැලපීම්	4,130,266
ගෙවන ලද ප්‍රතිලාභ	(1,989,175)
2021 මූල්‍ය වසර අවසානයේ දී	21,614,840

පූර්ව වර්ෂයේ ඌණ හෝ අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ඇති වූ වෙනස්කම් නිසා ලැබූ ලාභ හා අලාභ වීවා ඇති වූ කාල සීමාවේ ආදායම් ප්‍රකාශයට අදාළ කරනු ලැබේ. වසර සඳහා වන බැඳීම් ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇත.

භාවිතා කරන ද ප්‍රධාන ආයුගණක උපකල්පන පහත පරිදි වේ.

වට්ටම් අනුපාතය	:	වසරකට 11%
වැටුප් වැඩිවීමේ අනුපාතය	:	9%
විශ්‍රාම වයස	:	අවුරුදු 62

3.1.2 නිශ්චිත සහාගත සැලසුම - සේ.අ.අ. සහ සේ.නි.හා.අ.

අදාල ව්‍යවස්ථාවන් සහා රෙගුලාසිවලට අනුකූව කොමිෂන් සභාවේ සියළු ම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලට දායක වීමට සහ සේවක භාරකාර අරමුදලට දායක වීමට සුදුසුකම් ලබයි. කොමිෂන් සභාව සේවක අර්ථසාධක අරමුදලට සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකය මත පිළිවෙලින් 12% හා 3%ක මුදලක් දායක කරයි.

3.2 ප්‍රදානය

3.2.1 රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු කරනු ලබන ප්‍රාග්ධන වියදම් ප්‍රදාන සේ හඳුනා ගන්නා අතර එම වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය තුළ දී වීවා හඳුනා ගනු ලැබේ. කෙසේ වුවද, කොමිෂන් සභා අරමුදලේ අතිරික්තය හේතුවෙන් මෙම ක්‍රියාවලිය නතර විය.

3.2.2 මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රදාන සාධාරණ වටිනාකමට අනුව හඳුනා ගැනේ. වියදමකට අදාළ ප්‍රදානය වය ක්‍රමානුකූල පදනමක් මත ගෙවීමට අදහස් කරන පිරිවැයට අනුරූප වීමට අවශ්‍ය කාල සීමාව තුළ ආදායමක් ලෙස හඳුනා ගැනේ.

අමාත්‍යාංශය වෙතින් ලද ප්‍රදාන [බෙදාහැරීම් සම්බන්ධිත දර්ශකය (ඩීවිල්අයි)] ආදායමක් ලෙස හඳුනාගෙන ඇත. ආයෝජන ව්‍යාපෘති මූල්‍යකරණය සඳහා ලද ප්‍රදාන දරණ ලද පිරිවැයට අනුව ආදායමක් ලෙස හඳුනා ගනු ලැබේ.

3.3 අදාළ පාර්ශවයන්

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අදාළ පාර්ශවයක් ලෙස සලකනු ලබන්නේ තනි තනිව හෝ ඒකාබද්ධව පාලනය කිරීමට හෝ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කිරීමට හැකියාව ඇති පුද්ගලයෙකු හෝ ආයතනයකි. ප්‍රධාන කළමනාකාරීත්වයේ සාමාජිකයන් අදාළ පාර්ශ්ව ලෙස සලකනු ලබන අතර ඊට රේඛීය අමාත්‍යාංශය සහ කොමිෂන් සභාවේ සාමාජිකයන් ඇතුළත් වේ.

4. ආදායම් හා වියදම්

4.1 ආදායම හඳුනා ගැනීම

4.1.1 නුවමාරු නොවන ගණුදෙනුවලින් ලැබෙන ආදායම

ගාස්තු සහ බදු

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සිදුවීම සිදු වූ විට සහ වත්කම් හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන විට ගාස්තු සහ බදුවලින් ලැබෙන ආදායම හඳුනා ගනී. වත්කම් ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ වත්කම ආශ්‍රිත සේවා විභවයන් ආයතනය වෙත ගලා ඒමේ

ගිණුම්කරණ ප්‍රතිපත්ති

සම්භාවිතාවක් ඇති විට සහ වත්කම්වල සාධාරණ වටිනාකම විශ්වාසනීය ලෙස මැනිය හැකි වූ විට වෙනත් හුවමාරු නොවන ආදායම් හඳුනා ගනු ලැබේ.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ආදායම වාර්ෂික ගාස්තු, අලුත් කිරීමේ ගාස්තු, ලියාපදිංචි ගාස්තු සහ ප්‍රකාශන විකිණීම යනාදියෙන් සමන්විත වේ.

4.1. 2 හුවමාරු වන ගණුදෙනුවලින් ලැබෙන ආදායම

පොළී ආදායම

වත්කම්වල ඵලදායී ආදායම සැලකිල්ලට ගත් කාලයට සමානුපාතිකව පොළී ආදායම හඳුනාගෙන ඇත.

වත්කම් අලෙවිය

වත්කම් විකිණීමෙන් ලැබෙන ආදායම සාමාන්‍යයෙන් භාණ්ඩ භාරදීමේදී, හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරු වෙත මාරු කර ඇති විට හඳුනා ගැනේ.

4.2 වියදම් හඳුනා ගැනීම

කොමිෂන් සභාව පවත්වාගෙන යෑමේ දී දරනු ලබන සියළුම වියදම් වියදමට වැඩි ආදායම ගණනය කිරීමේ කාර්යය සඳහා ආදායමට එරෙහිව ලියා හරිනු ලැබේ.

4.2.1 පොළී ආදායම සහ වියදම

පොළී වියදම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි උපචිත පදනම මත පිළිගනු ලැබේ.

4.3 ආදායම් බදු වියදම්

වත්මන් බදුකරණය

කොමිෂන් සභාවේ බදු වියදම, වත්මන් බදුකරණය සහ වසර තුළ විලම්බිත බදු ලාභය හෝ අලාභය යනාදියෙන් සමන්විත වේ. බදුකරණය සඳහා වන ප්‍රතිපාදන බදුකරණ අරමුණු සඳහා සකස් කරන ලද වර්ෂයට අදාළ ලාභය/අතිරික්තය මත පදනම් වේ.

විලම්බිත බදු

මූල්‍ය වාර්තා කිරීම සඳහා වත්කම් සහ බැරකම් ඉදිරියට ගෙන යන මුදල් සහ බදුකරණ අරමුණු සඳහා භාවිතා කරන ප්‍රමාණයන් අතර තාවකාලික වෙනස්කම් සඳහා පහසුකම් සලසන ක්‍රමයක් වන ශේෂ පත්‍ර වගකීම් භාවිතා කරමින් විලම්බිත බදුකරණය සපයනු ලැබේ. විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලබන්නේ වත්කම් භාවිතා කළ ප්‍රමාණයට සාපේක්ෂව අනාගත බදු අය කළ හැකි ලාභ ලැබීමට ඉඩ ඇති ප්‍රමාණයට පමණි. විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරනු ලබන අතර තවදුරටත් අදාළ බදු ප්‍රතිලාභය ලබා ගැනීමට හැකියාවක් නැති වන තරමට අඩු කරනු ලැබේ.

4.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත්තේ වක්‍ර ක්‍රමය මතයි.

4.5 අයවැය තොරතුරු

වාර්ෂික අයවැය උපචිත පදනම මත සකස් කර ඇත; එනම්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අවශ්‍යතා තීරණය කිරීම සඳහා සියලු සැලසුම්ගත පිරිවැය සහ ආදායම තනි ප්‍රකාශයක් තුළ ඉදිරිපත් කෙරේ.

මෙම අයවැය සංඛ්‍යාවන් මූල්‍ය වර්ෂය ආරම්භයේ දී කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඒවා වේ.

5 රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

5.1 නෛතික ආකෘතිය

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ (RII පනත) 103(1) වගන්තිය ප්‍රකාරව රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල ස්ථාපිත කරන ලද අතර එහි රක්ෂණ කර්මාන්ත නියාමනය කිරීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ අය කෙරෙන සෙස් බද්ද බැර කරනු ලබන රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල ලෙස හැඳින්විය යුතු අරමුදලක් තිබිය යුතු වන්නේය" යනුවෙන් දැක්වේ.

5.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය.

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනතේ (RII පනත) 103(1) වගන්තිය ප්‍රකාරව මෙම අරමුදලේ බැර කිරීමට ඇති අරමුදල් රක්ෂණ ඔප්පු හිමියන්ගේ පොදු ආරක්ෂාව සඳහා සහ ඒ වෙනුවෙන් සාදන ලද නීති මගින් කොමිෂන් සභාව විසින් තීරණය කළ හැකි වෙනත් ඕනෑම විශේෂිත අරමුණක් සඳහා යොදා ගත යුතුය.

තවද, ඉහත සඳහන් කර ඇති ඕනෑම අරමුණක් සඳහා ක්ෂණිකව අවශ්‍ය නොවන ඕනෑම මුදලක් කොමිෂන් සභාව විසින් මනා ප්‍රතිලාභයක් ලබා දෙන සහ ආයෝජනය සුරක්ෂිත වන පරිදි දූරදර්ශී ලෙස ආයෝජනය කළ යුතුය.

සමාලෝචිත මූල්‍ය කාලපරිච්ඡේදය තුළ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ස්වභාවයෙහි කිසිදු වෙනසක් සිදු නොවීය.

5.3 සකස් කිරීමේ පදනම.

මූල්‍ය ප්‍රකාශන චෛතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇති අතර මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමන සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදු නොකර අඛණ්ඩව අදාළ කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1 දේපළ, පිරියත හා උපකරණ

	මෝටර් වාහන	ලී බඩු, වැද්දුම් හා සවි කිරීම්	කාර්යාල උපකරණ (විද්‍යුත් දත්ත සහ වෙනත්)	පුහුණ උපකරණ	එකතුව
	රු	රු	රු	රු	රු
පිරිවැය/ ප්‍රත්‍යාගණන					
2019 ජනවාරි 1 දිනට ශේෂය	10,300,000	14,152,432	26,635,537	141,450	51,229,419
එකතු කිරීම්	-	1,508,944	3,392,354	-	4,901,298
බැහැර කිරීම්	-	(18,895)	(2,271,627)	-	(2,290,522)
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**10,300,000**	**15,642,481**	**27,756,264**	**141,450**	**53,840,195**
2020 ජනවාරි 1 දිනට ශේෂය	10,300,000	15,642,481	27,756,264	141,450	53,840,195
එකතු කිරීම්	-	1,383,081	4,390,440	-	5,773,521
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**10,300,000**	**17,025,562**	**32,146,704**	**141,450**	**59,613,716**
2021 ජනවාරි 1 දිනට ශේෂය	10,300,000	17,025,562	32,146,704	141,450	59,613,716
එකතු කිරීම්	-	-	3,025,000	-	3,025,000
බැහැර කිරීම්	-	-	-	-	-
නැවත තක්සේරු කෙරෙහි බලපෑම	2,500,000	(7,950,627)	(11,817,033)	-	(17,267,660)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**12,800,000**	**9,074,935**	**23,354,671**	**141,450**	**45,371,056**
සමුච්චිත ක්ෂය					
2019 ජනවාරි 1 දිනට ශේෂය	-	12,675,881	22,722,663	141,450	35,539,995
වර්ෂයට සඳහා අය කිරීම	2,575,000	533,646	1,790,844	-	4,899,489
බැහැර කිරීම්	-	(18,895)	(2,271,627)	-	(2,290,522)
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,575,000**	**13,190,632**	**22,241,880**	**141,450**	**38,148,962**
2020 ජනවාරි 1 දිනට ශේෂය	2,575,000	13,190,632	22,241,880	141,450	38,148,962
වර්ෂයට සඳහා අය කිරීම	2,575,000	580,890	2,324,151	-	5,480,041
බැහැර කිරීම්	-	-	-	-	-
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**5,150,000**	**13,771,522**	**24,566,031**	**141,450**	**43,629,003**
වර්ෂයට සඳහා අය කිරීම	2,575,000	1,499,751	3,786,704	-	7,861,456
බැහැර කිරීම්	-	-	-	-	
නැවත තක්සේරු කිරීම කෙරෙහි බලපෑම	(7,725,000)	(9,878,066)	(12,343,701)	-	(29,946,767)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**5,393,207**	**16,009,034**	**141,450**	**21,543,691**
ලියා අඩු කළ අගය					
2021 දෙසැම්බර් 31 දිනට	**12,800,000**	**3,681,727**	**7,345,638**	**-**	**23,827,365**
ලියා අඩු කළ අගය					
2020 දෙසැම්බර් 31 දිනට	5,150,000	3,254,039	7,580,674	-	15,984,713

2021.12.31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් වල අගය රු.34,964,431 ක් වන අතර එවා තවමත් භාවිතයේ පවතී. ප්‍රත්‍යාගණන අගය රු. 2,454,107 කි.

භාණ්ඩ සමීක්ෂණයේ වත්කම්වල තත්ත්වය පරීක්ෂා කර ප්‍රයෝජනවත් ආයු කාලය ප්‍රත්‍යාගණනය කර ඇත. එහි ප්‍රතිඵලය වන බලපෑම අපේක්ෂිත පරිදි සකස් කරනු ඇත.

මෝටර් වාහන නැවත ඇගයීමට ලක් කරන ලද්දේ ලංකා ඔටෝමොබයිල් සංගමයේ වෘත්තීයමය වටිනාකම මගිනි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		සටහන්	31.12.2021 දිනට රු.	31.12.2020 දිනට රු.
2	**රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල් ආයෝජන හා වෙනත්**			
	ජංගම නොවන වත්කම්			
	කුළී සහ විද්‍යුත් තැන්පතු		**9,593,949**	9,593,949
	ස්ථාවර තැන්පතු		**436,000,000**	859,000,000
			445,593,949	868,593,949
	ජංගම වත්කම්			
	ස්ථාවර තැන්පතුවල අයෝජනය		**7,449,100,000**	5,872,692,500
	රජයේ සුරැකුම්පත් හා ස්ථාවර තැන්පතුවලින් ලැබිය යුතු පොළිය		**384,766,481**	349,263,763
	ලැබිය යුතු සෙස් බදු		**161,202,441**	140,326,575
	අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය		**301,693**	149,396,035
	බැංකුවේ ඇති ශේෂය		**1,000,000**	1,000,000
	රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරු කළ යුතු ප්‍රමාණය		**-**	93,214,934
			7,996,370,615	6,605,893,807
	අඩු කළා			
	රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් මාරු කළ යුතු ප්‍රමාණය		**540,000**	-
			7,995,830,615	6,605,893,807
	මුළු වත්කම්		**8,441,424,564**	7,474,487,756
3	**වෙනත් ජංගම නොවන වත්කම්**			
	නැවත ගෙවිය හැකි තැන්පතු		**2,688,246**	2,688,246
	කලින් ගෙවීම්		**775,242**	-
	සේවක ණය *		**6,176,249**	5,345,774
			9,639,737	8,034,020
4	**භාණ්ඩ තොග**			
	මුද්‍රණ, ලිපි ද්‍රව්‍ය හා පරිගණක උපාංග		**519,010**	490,870
	මුද්දර		**79,420**	31,690
			598,430	522,560
5	**වෙනත් ජංගම වත්කම්**			
	විනිමය නොවන ගණුදෙනුවලින් ලැබිය යුතු දෑ			
	වෙනත් ලැබිය යුතු දෑ		**239,953**	227,953
	විනිමය ගණුදෙනුවලින් ලැබිය යුතු දෑ			
	රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් මාරු කළ යුතු ප්‍රමාණය		**540,000**	-
	අත්පත් කර ගැනීම් සඳහා ප්‍රතිපාදන	5.1	**2,200,000**	3,193,650
	සේවක ණය *		**2,292,955**	2,052,354
	උත්සව අත්තිකාරම්*		**1,170,100**	1,360,100
	අත්තිකාරම් හා පෙර ගෙවීම්		**4,101,974**	4,649,569
	චිකතු කළ අගය මත බදු පාලනය		**581,313**	129,409
	තැන්පතු	5.2	**228,686**	219,987
	ලැබිය යුතු පොළී - රජයේ සුරැකුම්පත්		**1,093,957**	122,415
	ලැබිය යුතු රඳවා ගැනීමේ බදු		**-**	1,208,606
			12,448,937	13,164,043

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

5.1 2021 දෙසැම්බර් මාසයේදී ප්‍රදානය කරන ලද ලැප්ටොප් පරිගණක සම්බන්ධයෙන් අත්පත් කර ගැනීම සඳහා ප්‍රතිපාදන වේ.

5.2 තැන්පතු ඉන්ධන තැන්පතු සහ ආරක්ෂිත ලොකරය සඳහා NSB තැන්පතු නියෝජනය කරයි

		සටහන්	31.12.2021 දිනට රු.	31.12.2020 දිනට රු.
	*කාර්ය මණ්ඩලය සඳහා ප්‍රදානය කළ ණය			
	2021 ජනවාරි 1 දිනට ශේෂය		**8,758,228**	5,347,093
	වර්ෂය තුළදී ප්‍රදානය කළ ණය		**7,257,500**	6,436,900
			16,015,728	11,783,993
	වර්ෂය තුළ දී ණය ආපසු ගෙවීම්		**(6,376,424)**	(3,025,765)
	2021 දෙසැම්බර් 31 දිනට ශේෂය		**9,639,304**	8,758,228
6	**මුදල් හා මුදල් සමාන දෑ**			
	බැංකුවේ ඇති මුදල්			
	අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය	22	**5,437,940**	5,014,430
	අතැති මුදල		**-**	-
	ලංකා බැංකුව 1877		**373,073**	-
	ලංකා බැංකුව - ලෝක බැංකු ව්‍යාපෘති ගිණුම		**508,578**	658,147
	ඉතුරුම් ගිණුම - ජාතික ඉතිරි කිරීමේ බැංකුව		**595**	554
			6,320,185	5,673,130
	ලංකා බැංකුව -සෘණ ශේෂය*			
	ලංකා බැංකුව 1877 - ලෙජරයට අනුව	22	**-**	1,405,898
			6,320,185	4,267,232
7	**රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල**			
	ආරම්භක ශේෂය		**7,468,719,235**	6,252,958,232
	වර්ෂය තුළ දී ලද සෙස් බදු		**543,906,322**	506,139,149
	ප්‍රති මිලදී ගැනුම් මත පොළී		**334,087**	479,514
	භාණ්ඩාගාර බැඳුම්කර මත පොළී		**-**	33,151,511
	ස්ථාවර තැන්පතු මත පොළී		**515,764,257**	588,341,378
	අරමුදල් කළමනාකරණ ගිණුම මත පොළී		**150,009**	211,291
	වත්මන් වර්ෂයේ ශුද්ධ අතිරික්තය		**-**	93,219,934
			8,528,873,909	7,474,501,007
	අඩු කළා:			
	අතිරික්තය රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට නැවත මාරු කිරීම්		**87,446,414**	-
	ප්‍රාග්ධන වියදම් සඳහා මාරු කිරීම්		**-**	5,773,520
	රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මුළු මාරු කිරීම්		**87,446,414**	5,773,520
	බැංකු ගාස්තු		**2,932**	8,251
			87,449,347	5,781,772
	අවසාන ශේෂය		**8,441,424,564**	7,468,719,235

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		සටහන්	31.12.2021 දිනට රු.	31.12.2020 දිනට රු.
8	**ප්‍රදාන**			
	සටහාන - ප්‍රදාන හඳුනා ගැනීම		10,829,811	7,966,331
	රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් ප්‍රාග්ධන වියදම්		(5,773,521)	5,773,521
	අඩු කළා: වර්ෂය තුළ දී ක්‍රමක්ෂය කිරීම්		-	(2,905,041)
	සටහාන - ප්‍රදාන හඳුනා ගැනීම		5,061,291	10,829,811

වර්ෂය අවසානයේ දී ශේෂය

ප්‍රදාන හඳුනා ගැනීම ප්‍රදානයන්, මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ ප්‍රකාශයේ පහත අනුපාත යටතේ හඳුනාගෙන ඇත.

(උදා: අදාළ වත්කම්වල ඵලදායී ජීවිත කාලයට අදාළව ක්‍රමානුකූල පදනමකින්)

කෙසේ වෙතත්, කොමිෂන් සභා අරමුදලෙහි අතිරික්තය හේතුවෙන් ප්‍රාග්ධන වියදම් රක්ෂණ ඔප්පු හිමියන්ගේ අරමුදලින් මාරු කිරීම නවත්වන ලදී. පසුගිය වසරේ සංඛ්‍යා වත්මන් වසරේ ඉදිරිපත් කිරීම් පිළිබිඹු වන පරිදි සකස් කර ඇත.

මෝටර් වාහන	25%	25%
කාර්යාල උපකරණ - වෙනත් හා විද්‍යුත් දත්ත සැකසුම	25%	25%
ලී බඩු, වෑද්දුම් හා සවි කිරීම්	12.5%	12.5%
පුහුණු උපකරණ	25%	25%

		සටහන්	31.12.2021 දිනට රු.	31.12.2020 දිනට රු.
9	**විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්**			
	වර්ෂය ආරම්භයේ දී ශේෂය		19,473,749	15,839,021
	වසර තුළ ප්‍රතිපාදන		3,634,057	3,925,559
	ආයු ගණක (ලාභය)/අලාභය		496,209	(290,831)
	(-) වසර තුළ සිදු කරන ලද ගෙවීම්		(1,989,175)	-
	වර්ෂය අවසානයේ දී ශේෂය		21,614,840	19,473,749
	වට්ටම් අනුපාතය		11%	6%
	අනාගත වැටුප් වර්ධක අනුපාතය		9%	9%

9.1 භාවිතා කරන ලද උපකල්පනවල සංවේදිතාව

උපකල්පනවල එක් ප්‍රතිශතයක වෙනසක් මගින් පහත බලපෑම් ඇති කරයි.

	වට්ටම් අනුපාතය	අනාගත වැටුප් වර්ධක අනුපාතය
1% වැඩිවීම	20,022,506	23,553,736
1% අඩු වීම	23,426,500	19,889,539

ඇක්චූරියල් මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ්හි වෘත්තීය ආයුගණකවරයෙකු විසින් 2021 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම පාරිතෝෂික වගකීම පිළිබඳ ආයුගණක තක්සේරුවක් සිදු කරන ලදී. රාජ්‍ය අංශයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියෙන් නිර්දේශිත "සේවක ප්‍රතිලාභය" පිළිබඳ වන SLPSAS 19හි දක්වා ඇති "ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය ආයුගණකවරයා විසින් භාවිතාකර ඇත"

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		සටහන්	31.12.2021 දිනට රු.	31.12.2020 දිනට රු.
10	**වෙනත් ජංගම වගකීම්**			
	උපචිත වියදම්		**25,008,338**	25,591,998
	ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල්		**1,247,337**	1,258,891
	ගෙවිය යුතු සේවක භාර අරමුදල්		**187,102**	188,834
	උපයන විට බදු සඳහා කළ යුතු ගෙවීම්		**35,068**	30,320
	රඳවා ගැනීම සඳහා කළ යුතු ගෙවීම්		**36,228**	36,228
	ගෙවිය යුතු ආදායම් බදු		**5,948,270**	6,776,668
	ආපසු ගෙවීම් සහ අනෙකුත් ගෙවිය යුතු දේ		**3,329,621**	3,202,393
			35,791,964	37,085,332
	*කොමිෂන් සභා අරමුදලෙන් මාරු කළ අතිරික්තය 2020 සිට නතර කරන ලදී.			
11	**හුවමාරු නොවන ගණුදෙනුවලින් ලැබෙන ආදායම**			
	රක්ෂණ සමාගම්වලින් අය කරන වාර්ෂික ගාස්තුව		**257,764,270**	244,899,120
	ලියාපදිංචි කිරීමේ සහ අලුත් කිරීමේ ගාස්තු		**14,846,384**	14,497,295
			272,610,654	259,396,415
12	**ලෝක බැංකු ව්‍යාපෘති ආදායම**			
	ප්‍රදාන - ලෝක බැංකු ව්‍යාපෘතිය		**-**	11,675,810
	ප්‍රදාන නොවන - ලෝක බැංකු ව්‍යාපෘතිය		**255,150**	668,591
			255,150	12,344,401
13	**හුවමාරු වන ගණුදෙනුවලින් ලැබෙන ආදායම**			
	ස්ථාවර තැන්පතු මත පොලිය		**5,514,050**	7,748,539
	අරමුදල් කළමනාකරණ ගිණුමේ පොලී		**201,853**	228,338
	ඉතුරුම් ගිණුමේ පොලී		**41**	-
	ප්‍රති මිලදී ගැණුම් මත පොලී		**6,893,783**	4,807,377
			12,609,727	12,784,254
14	**වෙනත් ආදායම්**			
	වාහන ණය මත පොළිය		**274,395**	83,622
	ආපදා ණය මත පොළිය		**149,012**	127,039
	ස්ථාවර වත්කම් විකුණුම් ලාභ		**1,890**	-
			425,296	210,661

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		සටහන්	31.12.2021 දිනට රු.	31.12.2020 දිනට රු.
15	**කාර්ය මණ්ඩල පිරිවැය**			
	කාර්ය මණ්ඩල වැටුප්		**77,422,627**	69,948,812
	සේවක අර්ථසාධක අරමුදල 12%		**9,293,499**	8,365,679
	සේවක භාර අරමුදල 3%		**2,323,376**	2,091,420
	සභාපතිගේ වියදම් - දීමනා		**1,200,000**	1,162,466
	සභාපතිගේ ඉන්ධන දීමනා		**241,050**	238,887
	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ ගාස්තු		**1,384,859**	865,972
	පුහුණු වන නිලධාරී දීමනාව		**242,000**	283,500
	අතිකාල		**527,240**	306,761
	කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම්		**2,773,703**	2,416,726
	කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණය		**2,328,894**	2,001,327
	රක්ෂණය - ගිනි හා පුද්ගලික		**587,977**	379,922
	කාර්ය මණ්ඩල සුභසාධනය		**4,459,324**	2,038,778
	කාර්ය මණ්ඩල පුහුණු - දේශීය		**921,188**	401,492
	කාර්යසාධනය මත පදනම් වූ දිරි දීමනා		**9,096,187**	8,438,186
	ප්‍රචාරණය - බඳවා ගැනීම		**732,740**	128,975
	අධ්‍යක්ෂ දුරකථන - නිවස		**786,390**	439,740
	නිවාඩු දීමනා		**1,796,425**	1,673,310
	වාහන මෙහෙයුම් කල්බදු ගාස්තු		**1,455,048**	1,455,048
	අධ්‍යක්ෂවරුන්ගේ වාහන දීමනා		**4,570,890**	3,166,986
	අධ්‍යක්ෂවරුන්ගේ ඉන්ධන දීමනා		**1,356,590**	1,030,514
	සේවක පාරිතෝෂිත*		**3,634,057**	3,925,559
			127,134,065	110,760,060

* පසුගිය වසරේ මූල්‍ය පිරිවැය යටතේ වර්ග කරන ලද පාරිතෝෂිත පොලී පිරිවැය කාර්ය මණ්ඩල පිරිවැය යටතේ නැවත වර්ගීකරණය කර ඇත.

16	**වෘත්තීමය ගාස්තු**			
	බදු සහ පාරිතෝෂිත තක්සේරු ගාස්තු		**320,576**	302,000
			320,576	302,000

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		සටහන්	31.12.2021 දිනට රු.	31.12.2020 දිනට රු.
17	**මෙහෙයුම් වියදම්**			
	කුලී සහ සේවා ගාස්තු		**44,182,960**	41,537,311
	රථ ගාල් කිරීමේ ගාස්තු		**763,550**	761,000
	දුරකථන හා අන්තර්ජාල වියදම්		**1,690,919**	1,329,925
	විදුලිය		**1,626,825**	1,602,200
	කාර්යාල නඩත්තු කිරීම්		**618,023**	1,476,835
	මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය		**2,764,004**	2,413,783
	මහජන දැනුවත් කිරීම්		**1,814,843**	1,459,568
	ගමන් වියදම් - දේශීය		**58,840**	112,381
	කාර්යාල උපකරණ (වි.ද.සැ. හා වෙනත්)		**2,103,839**	3,298,073
	සාමාජිකත්වය		**4,516,334**	4,124,500
	ප්‍රචාරණය - වෙනත්		**355,255**	135,000
	රැස්වීම් ගාස්තු		**290,520**	279,330
	පුවත්පත් හා පුස්තකාල පොත්		**164,694**	236,414
	තැපැල් හා පණිවිඩ ගාස්තු		**62,438**	152,900
	විගණන ගාස්තු - විගණකාධිපති		**504,000**	457,200
	විගණන ගාස්තු - අභ්‍යන්තර		**1,262,200**	1,050,000
	ක්ෂය		**7,861,456**	5,480,041
	පොදු වියදම්		**112,778**	73,730
	නීති වියදම්		**-**	64,000
	විමර්ශන වියදම්		**12,921**	1,850
	අධීක්ෂණ වියදම්		**-**	6,020
	වාහන නඩත්තුව		**223,973**	215,300
	වාහන රක්ෂණය		**96,464**	90,626
	වාහන ඉන්ධන වියදම්		**259,272**	97,780
	ජාතිය ගොඩනැගීමේ බදු		**-**	138,516
			71,346,108	66,594,283
18	**බඳවා ගැනීම සඳහා දැන්වීම්**		**253,150**	640,875
	බැංකු ගාස්තු		**2,000**	-
			255,150	640,875
19	**මූල්‍ය හා වෙනත් වියදම්**			
	බැංකු ගාස්තු		**54,613**	70,628
			54,613	70,628

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		සතය 2021 Rs.	අයවැය 2021 Rs.	විචලණය
20	**අයවැයට සාපේක්ෂව සත්‍ය ආදායම සහ වියදම් සංසන්දනය කිරීම**			
	ආදායම			
	රක්ෂණ සමාගම්වලින් අය කරන වාර්ෂික ගාස්තුව	257,764,270	262,900,000	-2%
	ලියාපදිංචි කිරීමේ සහ අලුත් කිරීමේ ගාස්තු	14,846,384	14,100,000	5%
	අඩු කළා: වියදම			
	කාර්ය මණ්ඩල පිරිවැය	127,134,065	146,750,000	13%
	වෘත්තීය ගාස්තු සහ මෙහෙයුම්	71,666,684	97,465,000	26%
	මූල්‍ය සහ අනෙකුත්	16,069,049	20,350,000	21%

		31.12.2021 දිනට රු.	
21	**බදුකරණය**		
	වත්මන් ආදායම් බදු		
	වත්මන් ආදායම් බදු ගාස්තුව	16,443,952	
	විලම්බිත බදු		
	තාවකාලික වෙනස්කම් වල ආරම්භය සහ ආපසු හැරවීම සම්බන්ධ	(429,516)	
	තාවකාලික වෙනස්කම් වල ආරම්භය සහ ආපසු හැරවීම සම්බන්ධ මූල්‍ය කාර්ය සාධනය මූල්‍ය තත්ව ප්‍රකාශයේ වාර්තා කර ඇති ආදායම් බදු වියදම් සම්බන්ධය	**16,014,436**	
	අ. ව්‍යාපාරික ආදායම		
	බදු පෙර ලාභය	86,790,315	
	එකතු: ඉඩ නොදෙන අඩු කිරීම්		
	දේපළ, පිරියත හා උපකරණ මත ක්ෂය වීම ගිණුම්කරණය	7,861,456	
	විශ්‍රාම දායක මුදල් සඳහා ප්‍රතිපාදන (පාරිතෝෂිත)	3,634,057	
	අධ්‍යක්ෂවරුන්ගේ ගෘහස්ථ දුරකථන	786,390	
	අඩු කළා: ඉඩ දෙන අඩු කිරීම්		
	ක්ෂය කළ හැකි වත්කම් මත ප්‍රාග්ධන දීමනා	(3,771,616)	
	ගෙවන ලද පාරිතෝෂිතය	(1,989,175)	
	අඩු කළා: ආයෝජන ආදායම		
	පොළී ආදායම	(12,609,727)	
	මුළු ව්‍යාපාර ආදායම		
	14% ට ගෙවිය යුතු බදු	80,701,699	11,298,238
	ආ. ආයෝජන ආදායම		
	28% ට ගෙවිය යුතු බදු	12,609,727	3,530,724
	වර්තමාන වසරේ බදු		14,828,961
	ප්‍රතිපාදන යටතේ පෙර වසරේ ආදායම් බදු		1,614,991
	මුළු බදු		16,443,952

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	සටහන්	31.12.2021 දිනට රු.	31.12.2020 දිනට රු.
විලම්බිත බදු			
බදු අරමුණු සඳහා වේගවත් ක්ෂයවීම්			
ජනවාරි 1 දිනට ශේෂය		**483,021**	633,974
වර්ෂය තුළ ආරම්භය/(ආපසු හැරවීම).		**1,415,028**	(150,953)
දෙසැම්බර් 31 දිනට ශේෂය		**1,898,049**	483,021
වසර අවසානයේ දී විලම්බිත බදු ප්‍රතිපාදන පහත පරිදි සකස් කර ඇත			
තාවකාලික වෙනස්කම් වලින් විලම්බිත බදු ප්‍රතිපාදන			
- දේපළ පිරියත හා උපකරණ		**2,197,895**	991,882.78
- පාරිතෝෂිතය		**(299,847)**	(508,861.92)
- නැවත තක්සේරු කිරීමේ අතිරික්තය			-
		1,898,048	483,021

22. අරමුදල් කළමනාකරණ ගිණුම්, ලෙජර් ශේෂයන් හා බැංකු ශේෂයන්

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාව සඳහා අපගේ ජංගම ගිණුම් 2ට සම්බන්ධව අරමුදල් කළමනාකරණ ගිණුම් 2ක් පවත්වාගෙන යන අතර ජංගම ගිණුමේ ශේෂය රු. 1000,000/- (බැංකු වාර්තාවලට අනුව) ඉක්මවන විට එම මුදල අරමුදල් කළමනාකරණ ගිණුමට මාරු කරනු ලැබේ. කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන චෙක්පත් සෑම විටම එසැනින් බැංකුවට ගෙවීම් සඳහා ඉදිරිපත් නොකරන බැවින් ඉහත අරමුදල් කළමනාකරණ ගිණුම් හා සම්බන්ධිත ගණු දෙනු කොමිෂන් සභාවේ ගිණුම්වලට ඇතුළත් කළ පසු ලෙජරයේ දැක්වෙන බැංකු ශේෂය ඍණ අගයක් ගත හැක.

2021 දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂය පහත පරිදි වේ.

ජංගම ගිණුමේ ශේෂය	-	Rs. 373,073
අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය	-	Rs. 5,437,940
එකතුව	-	Rs. 5,811,012

23. ප්‍රාග්ධන බැඳියාවන්

2021 දෙසැම්බර් 31 දිනට කිසිඳු ප්‍රාග්ධන බැඳියාවකට එළැඹ නොමැත.

24. අවිනිශ්චිත වගකීම් සහ අවිනිශ්චිත වත්කම්

2021 දෙසැම්බර් 31 දිනට කිසිඳු අවිනිශ්චිත වගකීමක් සහ අවිනිශ්චිත වත්කමක් නොමැත.

25. වාර්තා කරන කාල සීමාවෙන් පසු හට ගන්නා සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතු හෝ අනාවරණය කිරීම අවශ්‍ය වන කිසිඳු සිද්ධියක් වාර්තා කරන දිනට පසු සිදු වී නැත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

26. බදුකරණය

බදුකරණය සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත්තේ 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලවයි.

විස්තරය	2021. 12. 31	
අ. ව්‍යාපාර ආදායම		
බදු පෙර ලාභය	86,294,106	
එකතු කළා: ඉඩ නොදෙන අඩු කිරීම්		
දේපළ, පිරියත උපකරණ මත ක්ෂය ගිනුම්කරණය	7,861,456	
විශ්‍රාම දායකත්වය සඳහා වන විධිවිධාන (පාරිතෝෂිකය)	4,130,266	
අධ්‍යක්ෂවරුන්ගේ ගෘහස්ථ දුරකථන	786,390	
අඩු කළා: ඉඩ දෙන අඩු කිරීම්		
ක්ෂය විය හැකි වත්කම් මත ප්‍රාග්ධන දීමනා	(3,771,616)	
ගෙවන ලද පාරිතෝෂිකය	(1,989,175)	
අඩු කළා: ආයෝජන ආදායම		
පොළී ආදායම	(12,609,727)	
මුළු ව්‍යාපාර ආදායම	**80,701,699**	
ගෙවිය යුතු බදු 14%		11,298,237.87
ආ. ආයෝජන ආදායම	**12,609,727**	
ගෙවිය යුතු බදු 28%		3,530,724
		14,828,961
පෙර වසරේ ආදායම් බදු ඌණ පතිපාදන		1,614,991
		16,443,952
අඩු කළා: බදු බැර		
ඉදිරියට රැගෙන ආ ආදායම් බදු		(39,000)
රැඳවුම් බද්ද		(1,208,606)
ස්වයං තක්සේරු ගෙවීම්		(7,633,085)
ගෙවිය යුතු ශේෂය		**5,948,271**

27. ශ්‍රී ලංකා මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතිය

මූල්‍ය අංශය සංවර්ධනය කිරීම ඉලක්ක කර ගත් ක්‍රියාකාරකම් සඳහා කාර්මික හා මූල්‍ය සහාය ලබා දීමට ශ්‍රී ලංකා රජය විසින් ලෝක බැංකුව වැනි සංවර්ධන හවුල්කරුවන් ගේ සහාය අපේක්ෂා කරන ලදී. වසර පහක (5) කාලයක් පුරාවට ක්‍රියාත්මක කිරීමේ හවුල්කරුවන් ලෙස මූල්‍ය අංශ නියාමකයන් තිදෙනෙක් (3) සමග "ශ්‍රී ලංකා මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය" සඳහා සහාය ලබා දීමට ලෝක බැංකුව එකඟ විය.

ව්‍යාපෘති සංවර්ධන අරමුණ වන්නේ ඉහළ යන මූල්‍ය වෙළඳපොළ හා රක්ෂණ අංශ කාර්යක්ෂමතාව සඳහා දායක වීම සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් හා පුද්ගලයන් අතර මූල්‍ය/ රක්ෂණ සේවාවන් භාවිතා කිරීමයි. මෙම ව්‍යාපෘතිය මගින් මූල්‍ය වෙළඳපොළ යටිතළ පහසුකම් නවීකරණය, මූල්‍ය පද්ධතිය සඳහා නෛතික සහ නියාමන රාමුව උත්ශ්‍රේණිගත කිරීම සහ මූල්‍ය අංශ නියාමකයන්ගේ ඵලදායීතාව ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සුරුකුම් පත් හා විනිමය කොමිෂන් සභාව යන ආයතනවල ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම හරහා ව්‍යාපෘති සංවර්ධන අරමුණු ළඟා කරනු ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ඒ අනුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ණය අංකය 6006-LK) අතර මූල්‍ය ගිවිසුමක් අත්සන් කරන ලද අතර එය 55,400,000 ක් වූ විශේෂ ගැණුම් හිමිකම්වලට සමාන ණයකි. (ඇ.ම.ඩො.මි. 75 ක් පමණ) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව අදාළ විසඳුම් සම්බන්ධිත දර්ශක (Disbursement Linked Indicators) ළඟා කර ගන්නා බැවින් 6,650,000 ක් (ඇ.ම.ඩො.මි. 9ක් පමණ) විශේෂ ගැණුම් හිමිකමෙහි ප්‍රදානයක් ලෙස ලබා දීම සඳහා ණය මුදලට අදාළව රජය විසින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සමග අතිරේක ගිවිසුමක් අත්සන් කරන ලදී.

ලෝක බැංකුව විසින් පහත දෑ මුදල් අමාත්‍යංශය වෙත ප්‍රේෂණය කරන ලදී.

(i) ශ්‍රී ලංකා මූල්‍ය අංශ නවීකරණ ආයෝජන ව්‍යාපෘති මූල්‍යකරණය

නීතිමය සහ නියාමන රාමුව වැඩිදියුණු කිරීම සහ මූල්‍ය වෙළඳපල යටිතල පහසුකම් නවීකරණය කිරීම මගින් නියාමකයින්ගේ ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම.

දිනය	වටිනාකම(ඇ.ඩො.)
14/01/2019	523,000
ගෙවීම්	(48,352)
	474,648

(ii) ප්‍රතිඵල පාදක මූල්‍යකරණය

විසැඳුම් සම්බන්ධිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමට එරෙහිව යෝග්‍ය වියදම් වැඩසටහන සඳහා මූල්‍යමය ආධාර සැපයීම.

දිනය	වටිනාකම(ඇ.ඩො.)
27/03/2019	261,163.13
25/05/2019	64,677.66
09/10/2019	64,039.69
17/12/2019	64,803.28
12/02/2020	64,208.44

28. සම්බන්ධිත පාර්ශව අනාවරණ

ජනාධිපති නීතිඥ රසික් සරූක් මහතා 2020 ජනවාරි 3 වන දින සිට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි සභාපති ලෙස පත් කරන ලදී.

ආර්.එම්.පී. රත්නායක මහතා මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා ලෙස ධුර දැරීම හේතුවෙන් 2021 ජනවාරි 22 දින සිට නිල බලයෙන් සාමාජිකයෙකු ලෙස පත් විය.

ටී.එම්.ජේ.වයි.ජී. ප්‍රනාන්දු මහත්මිය නියෝජ්‍ය මහා බැංකු අධිපති ලෙස ධුර දැරීම හේතුවෙන් 2021 ජනවාරි 1 දින සිට නිල බලයෙන් සාමාජිකයෙකු ලෙස පත් විය.

සංජීව දිසානායක මහතා සමාගම් රෙජිස්ට්‍රාර් ලෙස ධුර දැරීම හේතුවෙන් 2021 ජූලි 8 දින සිට නිල බලයෙන් සාමාජිකයෙකු ලෙස පත් විය.

හරිස් සල්පිටිකෝරාල මහතා 2020 ජනවාරි 3 වන දින සිට කොමිෂන් සභාවෙහි සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

රාජා ගුණරත්න මහතා 2020 ජනවාරි 3 වන දින සිට කොමිෂන් සභාවෙහි සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

ඉන්ද්‍රා බදුගේ මෙනවිය 2020 ජනවාරි 3 වන දින සිට කොමිෂන් සභාවෙහි සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස නිල බලයෙන් පත් වූ පහත සඳහන් නිලධාරීන්ගේ ධුර කාලය අවසන් විය.

මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා ලෙස ධුර දැරීම හේතුවෙන් නිල බලයෙන් සාමාජිකයෙකු ලෙස පත් වූ පී. අල්ගම මහතාගේ ධුර කාලය 2021 ජනවාරි 22 දිනෙන් අවසන් විය.

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් රෙජිස්ට්‍රාර් ලෙස ධුරය දැරීම හේතුවෙන් නිල බලයෙන් සාමාජිකයෙකු ලෙස පත් වූ ඒ.කේ.ඩී.ඩී. අරන්දර මහතාගේ ධුර කාලය 2021 ජූලි 7 දිනෙන් අවසන් විය.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

28.1 සමාලෝචිත වසර තුළ කොමිෂන් සභාවෙහි සාමාජිකයන්ගේ සබැඳියාවන් පහත වගුවෙන් දැක්වේ.

සාමාජිකයාගේ නම	සම්බන්ධිත ආයතනය	සබැඳියාව
රසික් සරූක් මහතා	මුදල් කොමිෂන් සභාව බණ්ඩාරණායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව	සාමාජික (2021 ජනවාරි 1 සිට 2021 දෙසැම්බර් 31 දක්වා) සාමාජික (2021 ජනවාරි 1 සිට 2021 දෙසැම්බර් 31 දක්වා)
ආර්.එම්. රත්නායක මහතා	සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව ලංකා බැංකුව(BOC) දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDF)	අධ්‍යක්ෂ (2021 ජනවාරි 1 සිට 2021 දෙසැම්බර් 31 දක්වා) අධ්‍යක්ෂ (2021 ජනවාරි 1 සිට 2021 දෙසැම්බර් 31 දක්වා) සභාපති (2021 ජනවාරි 1 සිට 2021 දෙසැම්බර් 31 දක්වා)
සංජීව දිසානායක මහතා	සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය ගිණුම්කරණ ප්‍රමිති කමිටුව	නිල බලයෙන් පත් වූ සාමාජික (2021 ජූලි 8 සිට 2021 දෙසැම්බර් දක්වා) නිල බලයෙන් පත් වූ සාමාජික (2021 ජූලි 8 සිට 2021 දෙසැම්බර් දක්වා) නිල බලයෙන් පත් වූ සාමාජික (2021 ජූලි 8 සිට 2021 දෙසැම්බර් දක්වා)
ටී.එම්.ජේ.වයි.ජී. ප්‍රනාන්දු මහත්මිය	ශ්‍රී ලංකා මහ බැංකු අධිපති ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය(CRIB) ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (IBSL)	නියෝජ්‍ය මහ බැංකු අධිපති (2021 ජනවාරි 1 සිට 2021 දෙසැම්බර් 31 දක්වා) සභාපති (2021 ජනවාරි 1 සිට 2021 දෙසැම්බර් 31 දක්වා) සභාපති (2021 ජනවාරි 1 සිට 2021 දෙසැම්බර් 31 දක්වා)
හරිස් සල්පිටිකෝරාල මහතා	-	-
රාජා ගුණරත්න මහතා	ජාතික ඖෂධ නියාමන අධිකාරිය	සාමාජික (2021 ජනවාරි 1 සිට 2021 දෙසැම්බර් දක්වා)
ඉන්ද්‍රා බදුගේ මෙනවිය	-	-

28. 2 වෙළඳපල මිල ගණන් යටතේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලට අදාළව පහත සඳහන් ගනුදෙනු හැරුණු විට, සමාලෝචිත වර්ෂය තුළ ඉහත සඳහන් ආයතන සමග කිසිදු ගනුදෙනුවක් වාර්තා කර නොමැත. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් පහත සඳහන් ජංගම ගිණුම් 2ක් සහ ඉතිරිකිරීමේ ගිණුම් 3ක් ලංකා බැංකුවේ (BOC) පවත්වාගෙන යන අතර බැංකු ශේෂයන් පහත වගුවේ දක්වා ඇත

ගිණුමේ නම	ගිණුම් අංකය	21.12.31 දිනට ශේෂය	20.12.31 දිනට ශේෂය
ලංකා බැංකුව	1877	රු. 373,073	(රු. 1,405,898)
ලංකා බැංකුව	74236358	රු. 5,437,940	රු. 5,014,430
ලංකා බැංකුව	83094438	රු. 508,578	රු. 658,147
ලංකා බැංකුව	1886	රු. 1,000,000	රු. 1,000,000
ලංකා බැංකුව	74236394	රු. 301,963	රු. 149,396,035

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

28. 3 2021 වර්ෂය තුළ ලංකා බැංකුව හරහා පහත සඳහන් ආයෝජන යොමු කරන ලදී.

ආයෝජන වර්ගය	වසර තුළ සිදු කළ ආයෝජන (රු.)	2021.12.31 දිනට ශේෂය (රු.)
ප්‍රති මිලදී ගැනුම්	මිලියන 586	මිලියන 95
ස්ථාවර තැන්පතු	මිලියන 265	-

ආයෝජන වර්ගය	වසර තුළ සිදු කළ ආයෝජන (රු.)	2021.12.31 දිනට ශේෂය (රු.)
ප්‍රති මිලදී ගැනුම්	රු.696,900,000	-
ස්ථාවර තැන්පතු	රු.2,260,000,000	රු.2,260,000,000

28.4 වසර තුළදී මුදල් අමාත්‍යාංශයේ, මුදල් අමාත්‍යවරයා සහ භාණ්ඩාගාර ලේකම්වරයා තේරී පත් වූ හෝ පත්කළ නියෝජිතයන්ගෙන් සැදුම්ලත් පාලක මණ්ඩලය සමග සාමාන්‍ය ව්‍යාපාර ගනුදෙනු හැර වෙනත් කිසිඳු ගනුදෙනුවක් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් වාර්තා කර නොතිබිණි.

28.5 ප්‍රධාන කළමනාකාරිත්වය සමග සිදු වූ ගනුදෙනු

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය - SLPSAS 14 එනම් "අදාළ පාර්ශ්ව හෙළිදරව් කිරීම්" අනුව ප්‍රධාන කළමනාකරිත්වයට ආයතනයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා බලය සහ වගකීම ඇති අය ඇතුළත් වේ.

28.5.1 ප්‍රධාන කළමනාකරිත්වය සඳහා වන වේතනය

පාලක මණ්ඩලයේ සාමාජිකයන්	
ප්‍රවාහන වියදම් ඇතුළුව සමස්ථ වේතනය (සාමාජිකයින් 7)	රු. 2,656,685
සාමාජිකයින් 2 ක් සඳහා වෛද්‍ය රක්ෂණ වාරිකය	රු. 103,546

ප්‍රධාන විධායක සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම	
පුද්ගලයන් 6 දෙනෙකු සඳහා වන මුළු වේතනය	රු. 25,183,970
මුදල් නොවන ප්‍රතිලාභ	රු. 1,455,048
පුද්ගලයන් 6 ක් සඳහා වෛද්‍ය රක්ෂණ වාරිකය	රු. 285,820

29. සංසන්දනාත්මක තොරතුරු

විගණකාධිපති විසින් ලබා දුන් නිර්දේශ මත පදනම්ව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුව විලම්බිත බදුකරණය සඳහා අයදුම් කිරීම ආරම්භ කරන ලදී. මින් පෙර ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් තාවකාලික කාල වෙනස්කම් සඳහා විධිවිධාන සම්පාදනය කර නොතිබුණු බැවින් ගිණුම්කරණ ප්‍රතිපත්තියක වෙනසක් සිදු විය. ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් කිරීම සහ දෝෂ පිළිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 3 ට අනුකූල වීම සඳහා පෙර වසර දෙක ප්‍රතිස්ථාපනය කෙරිණි.

පරිශිෂ්ඨය I

2021 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි වූ රක්ෂණ සමාගම්.

අංකය	රක්ෂණ සමාගමේ නම	රක්ෂණ ව්‍යාපාරයේ පන්තිය
1	ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්.	දිගුකාලීන රක්ෂණය
2	ඒඅයිපී ඉන්ෂුවරන්ස් ලිමිටඩ්*	සාමාන්‍ය රක්ෂණය
3	අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
4	අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්.	දිගුකාලීන රක්ෂණය
5	අමානා ටකාෆුල් ලයිෆ් පීඑල්සී	දිගුකාලීන රක්ෂණය
6	අමානා ටකාෆුල් පීඑල්සී	සාමාන්‍ය රක්ෂණය
7	ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී	දිගුකාලීන රක්ෂණය
8	සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
9	සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය
10	කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
11	කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
12	කෝප් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය
13	ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
14	එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී	දිගුකාලීන රක්ෂණය
15	එච්එන්බී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
16	ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී	දිගුකාලීන රක්ෂණය
17	ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ්.	දිගුකාලීන රක්ෂණය
18	එල්ඕඑල්සී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
19	එල්ඕඑල්සී ලයිෆ් ඇෂුවරන්ස් ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය
20	එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ්**	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
21	ජාතික රක්ෂණ භාර අරමුදල	සාමාන්‍ය රක්ෂණය
22	ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
23	පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී	සාමාන්‍ය රක්ෂණය
24	සණස ජෙනරල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
25	සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් කම්පනි පීඑල්සී	දිගුකාලීන රක්ෂණය
26	සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී	දිගුකාලීන රක්ෂණය
27	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්.	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
28	යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී	දිගුකාලීන රක්ෂණය

* තවදුරටත් කිසිඳු නව රක්ෂණ ව්‍යාපාරයක් පිළිනොගන්නා අතර ශ්‍රී ලංකාවෙන් පිට වීම සඳහා වන ක්‍රියාවලියෙහි යෙදී සිටියි.

** 2020.06.01 දින සිට බලපැවැත්වෙන පරිදි නව ජීවිත රක්ෂණ ප්‍රතිරක්ෂණය කිරීම නවත්වන බව සමාගම විසින් තහවුරු කරන ලදී.

පරිශිෂ්ඨය II

2021 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි වූ රක්ෂණ තැරැව්කාර සමාගම්

අංකය	තැරැව්කාර සමාගමේ නම	රක්ෂණ ව්‍යාපාර පන්තිය
1	3 ඩී එච් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
2	ආසියාන් ඉන්ටර්නැෂනල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
3	ඒ.එම්.ඩබ්ලිව්. ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
4	ඒඩ්ඉසෙඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
5	එයිටිකන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
6	ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
7	ඇලියෝන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
8	ඇම්ට්‍රස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
9	ඇක්විලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
10	අසේකි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
11	ඒෂියා කෝප් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් (මින් පෙර ජේ එෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ්)	සාමාන්‍ය රක්ෂණය
12	ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
13	ඇක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
14	බිමා ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
15	බ්‍රිලියන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
16	සියෙක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
17	සීලෑන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
18	සිනර්ජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
19	සීවීෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
20	කලම්බුරේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
21	කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
22	ඩී එස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
23	ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
24	ඊගල් ඩී වී ආර් එස් ඉන්ෂුවරන්ස් ඇන්ඩ් රීඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
25	ඊගල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
26	ඉක්විටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
27	එස්නා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
28	එසාපි කර්ම්පි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
29	ෆෙයාර්වේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
30	ෆයින්ඩ් මයි ඉන්ෂුවරන්ස් ඇන්ඩ් රීඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
31	ෆොර්මෝස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
32	ජෝර්ජ් ස්ටුව(ර්)ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
33	ග්ලෝබල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
34	ග්‍රෑන්ඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය

පරිශිෂ්ඨය II

අංකය	තැරැව්කාර සමාගමේ නම	රක්ෂණ ව්‍යාපාර පන්තිය
35	ගාඩියන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
36	අයිකොන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
37	අයි අයි ආර් එම් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් (මින් පෙර ෆින්ලේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ්)	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
38	ඉන්ෂුවර්මී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
39	ජේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
40	ලක් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
41	ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
42	එම් ආර් යූ එස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
43	මැක්ස්වෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
44	මර්කන්ටයිල් ෆොර්චූන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
45	මර්කන්ටයිල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
46	මියුචුවල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
47	එල් එම් ඇන්ඩ් ඒ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
48	මයි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
49	නේෂන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
50	ප්ලැසිඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
51	ප්‍රෙස්ටීජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
52	ප්‍රෝකෙයා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
53	ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් ඇෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
54	ප්‍රයෝරිටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
55	රෙඩ්මෝ ස්විස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
56	රිලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
57	රින්කූන් ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
58	සැම්සන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
59	සේනාරත්න ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
60	සෙන්කඩගල ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
61	සෙරන්ඩිබ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
62	ස්ට්‍රැටජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
63	සන්ගේට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
64	ට්‍රස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය
65	යූවින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
66	යුනයිටඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
67	වෙරාසිටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
68	වික්ටර් එමානුවෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
69	වොලන්කා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
70	සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය

පරිශිෂ්ඨය III

2021 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි වූ අලාභ ගැලපුම්කරුවන්

අංකය	අලාභ ගැලපුම්කරුගේ නම	බලපත්‍රය බලාත්මක වන දිනය
1	උදිතමාලා ජිනාදරී කුරුකුලසූරිය මෙය	2018 ජූනි 13
2	රන් බණ්ඩා තෙන්නකෝන් මයා	2018 ජූනි 25
3	විජිතසේන ලීලාරත්න ප්‍රනාන්දු මයා	2018 ජූනි 25
4	ගාමිණී කිනිගම මයා	2018 ජූනි 25
5	අහමඩ් නසීම් නස්වි රහමන් මයා	2018 ජූනි 25
6	ගුණවර්ධන මුදියාන්සේලාගේ ආනන්ද උදය කුමාර මයා	2018 ජූනි 25
7	මහබාලගේ දොන් සිසිර උපාලි පෙරේරා මයා	2018 ජූනි 26
8	නිරෝෂ් සංජීව වතුකාරවත්ත මයා	2018 ජූනි 26
9	සුසන්ත මහින්ද්‍රත්න වීරකෝන් මයා	2018 ජූනි 26
10	රාජපක්ෂ පතිරාජ දොන් කාන්චනා සුරංගික මයා	2018 සැප්තැම්බර් 10
11	ද ෂීල්ඩ් එජස්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	2019 මාර්තු 29
12	ඒ.ඩබ්.එම්. බන්දුල විජේකෝන් මයා	2019 මාර්තු 29
13	ලලින්ද්‍ර ක්‍රිෂාන්ත කරුණාරත්න මයා	2019 මාර්තු 29
14	රාජපක්ෂ මුදියාන්සේලාගේ හේරත් රාජපක්ෂ මයා	2019 සැප්තැම්බර් 26
15	ජාසින් බස්තියන් ආරච්චිගේ රවිනාත් නිරෝෂන මයා	2019 සැප්තැම්බර් 26
16	කීර්ති දෙල්වත්ත මයා	2019 සැප්තැම්බර් 26
17	එන්ට්‍රස්ට් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්	2020 ජූනි 08
18	අලි මොහිදීන් මොහොමඩ් කලීල් මයා	2020 අගෝස්තු 12
19	ශෙල්වින් මාලිගස්පේ කෝරලගේ මයා	2020 අගෝස්තු 12
20	ශ්‍රීනාත් බන්දුල අමරසේකර මයා	2020 අගෝස්තු 12
21	අනුර මහින්සක දැඩිගම මයා	2020 අගෝස්තු 12
22	මංගල කීර්ති අශෝක කුමාර ධර්මරත්න මයා	2020 අගෝස්තු 12
23	සිතිර පන්ඩිතසුන්දර මයා	2020 අගෝස්තු 12
24	හේමා ගෝඨාභය මහානාම ලියනගේ මයා	2021 මාර්තු 16
25	ජොහෑන් අමරතුංග මයා	2021 පෙබරවාරි 08
26	මාම්පේ විතානගේ රුපසේන පෙරේරා මයා	2021 ජූලි 07
27	පියල් වතුදුර මයා	2021 ජූලි 05
28	සුගත් වීරරත්න මයා	2021 ජූලි 07
29	ස්වර්ණකමල් ස්වර්ණරාජ් මයා	2021 ජනවාරි 21
30	තනූජ හිගුලගේ මයා	2021 දෙසැම්බර් 06

පාරිභාෂික ශබ්ද මාලාව

සමුච්චිත වීම
එක් සමාගමක් සමග පවතින සැලකිය යුතු රක්ෂිත හෝ ප්‍රතිරක්ෂිත අවදානම් සංඛ්‍යාවක් පාඩු ලබන සිදුවීමක් නිසා එක්වර පීඩාකාරී බවට පත්වන තත්වයකි.

අත්කර ගැනීමේ වියදම්
අභිනව රක්ෂණ ගිවිසුම අත්කර ගැනීම සහ දැනටමත් පවත්නා රක්ෂණ ගිවිසුම් අළුත් කිරීම (උදා: කොමිස් මුදල්) යන අවස්ථාවලදී වෙනස්වීම්වලට ලක්වන සහ එයට මූලික වශයෙන් සම්බන්ධතාවක් දක්වන සියළු වියදම්.

ජීවගණකඥ
ජීවගණකඥයෙක් යනු අවිනිශ්චිත අවස්ථාවන්හි මූල්‍යමය ප්‍රතිමානයන් ඇගයීම සඳහා පුහුණුව ලබා ඇති වෘත්තීයවේදියෙකි. රක්ෂණයේ සහ අනිකුත් මූල්‍ය සේවාවන්හි අනුමානික ස්වභාවය, වත්කම්වලට ආවේණික අවදානම් සහ සංඛ්‍යාලේඛන ආකෘතීන් පිළිබඳ අවබෝධයක් ජීවගණකඥයින් සතු විය යුතුය. මේ අනුව උදාහරණයක් ලෙස වාර්ෂික, තාක්ෂණික ප්‍රතිදාන සහ ප්‍රාග්ධන මට්ටම තහවුරු කිරීම සිදු කරනු ලැබෙයි.

පරිපාලන වියදම්
දේපළ, පිරියත හා උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදන සහ සේවක පිරිවැය සහිතව වාර්ෂික එකතු කිරීමේ දී ආයෝජන කළඹ පරිපාලනයේ දී ජනනය වන පරිපාලන ස්වභාවයේ වියදම්.

ආවේශ්‍යතා දැක්විය හැකි වත්කම්
ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය නිශ්චය කිරීමේ දී ඇතුළත් කරනු ලැබෙන වත්කම් වේ. මෙවැනි වත්කම් 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත නියාමන පනතෙහි නිශ්චිතව දක්වා තිබේ.

වාර්ෂිකය
යම් කිසි නිශ්චිත කාල සීමාවක් සඳහා වාර්ෂිකලාභියාගේ ආයු කාලය මුළුල්ලේ හෝ වාරමය වශයෙන් ආදායම් ප්‍රතිලාභ ගෙවන ජීවිත රක්ෂණයකි. විලම්භිත වාර්ෂිකය - ගෙවීම් සිදු කිරීම යම්කිසි අනාගත කාලයකදී ආරම්භ වන්නේ නම් එය විලම්භිත වාර්ෂිකය නම් වේ. ක්ෂණික වාර්ෂිකය - ගිවිසුම ආරම්භ වන අවස්ථාවේ දීම අදාළ ගෙවීම් සිදු කිරීම අරඹන්නේ නම් එය ක්ෂණික වාර්ෂිකය නම් වේ.

බැංකු රක්ෂණ සේවාව
රක්ෂකයා විසින් රක්ෂණ සහ ආයෝජන නිෂ්පාදන බැංකු පාරිභෝගිකයින් වෙත අළෙවි කිරීමේ වැඩ පිළිවෙලකි.

ප්‍රතිලාභියා
ඔප්පු හිමියාගේ මරණයක දී රක්ෂිත මුදල් සහ අනෙකුත් ප්‍රතිලාභ ලැබිය යුතු ආදායක ලෙස ඔප්පු හිමියා විසින් නම් කරනු ලබන පුද්ගලයා.

ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය (CAR)
අවශ්‍ය කරනු ලබන අවදානම් පාදක ප්‍රාග්ධනය (RCR) ට සහාය දැක්වීම පිණිස වූ පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (TAC), ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය මගින් මනිනු ලබයි.

$$\text{ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය} = \frac{\text{(පූර්ණ පවත්නා ප්‍රාග්ධනය)}}{\text{(නියමිත අවදානම් ප්‍රාග්ධනය}} \times 100$$

ප්‍රතිරක්ෂිතයා
ප්‍රතිරක්ෂණ සමාගමක සේවාදායකයෙක් (ප්‍රාථමික රක්ෂණ සමාගම). දායකය - රක්ෂණ සමාගම් විසින් ප්‍රතිරක්ෂකයින් වෙතට මාරු කරනු ලබන අවදානම් කොටස.

හිමිකම් පෑම්
දේපළ විනාශ වීම හෝ හානි වීම සහ වී ආශ්‍රිත මරණය හෝ තුවාල සිදුවීම, ආරෝග්‍ය ශාලා හෝ වෛද්‍ය බිල්පත් දැරීම, රක්ෂිතයාගේ මරණය හෝ ආබාධිත වීම, උපපාදන ඔප්පුවක් කල් පිරීම, විශ්‍රාමික වයසට පත්වීම යනාදී ආකාරවලට රක්ෂණයට බඳුන් වූ කාරණය සිදුවීම හේතු කරගෙන හෝ ඔප්පුවක් පවාරණය කිරීමේ දී රක්ෂණ ගිවිසුම පරිදි ගෙවිය යුතු මුදල.

දරන ලද හිමිකම් පෑම
වර්ෂය ආරම්භයේ දී සහ වර්ෂය අවසානයේ දී හිඟ තබා ඇති හිමිකම් පෑම් සඳහා වූ ප්‍රතිපාදන වෙනුවෙන් අවශ්‍ය අවස්ථාවලදී ගැලපීම් කළ පසු ගිණුම් වර්ෂය තුළ හිමිකම් පෑම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට දරන වියදම සහිතව ගෙවන ලද මුළු හිමිකම් පෑම් වටිනාකම.

සිදු වී ඇති නමුත් වාර්තා නොකරන ලද හිමිකම් පෑම් (IBNR)
දේපළ, වගකීම් සහ මූල්‍ය යන රක්ෂණ පිළිබඳව සිදු වී ඇති නමුත් රක්ෂකයා වෙත තවමත් වාර්තා කරනු ලැබ නැති අලාභ ආවරණය කිරීම සඳහා දැරීමට සිදුවනු ඇතැයි අපේක්ෂිත පිරිවැය නිරූපණය කරමින් වර්ෂය අවසානයේ දී ඇති කරනු ලබන සංචිතයකි.

හිඟ සිටි හිමිකම් පෑම් සංචිතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය
කටයුතු සිදු වූ නමුත් වාර්තා කරනු ලැබ නොතිබූ හිමිකම් සහ ඒවා පිළිබඳ කටයුතු කිරීමේ දී දරන්නට සිදුවන පිරිවැය සහිතව ශේෂ පත්‍ර දිනය වන විට වී ඇති සිද්ධි වෙනුවෙන් ඒවා ආවරණය කිරීමට දැරිය යුතු ඇස්තමේන්තුගත පිරිවැයෙන් වැඩිහි හිමිකම් පෑම් සඳහා මේ වන විටත් ගෙවා ඇති මුදල අඩු කළ පසු ලැබෙන අගය.

සහභාග රක්ෂණය
නිශ්චිත වාර මුදල් වකඟ වුණු අනුපාතයක් මත ගෙවීමේ පදනම මත අවදානම් ආවරණය සඳහා රක්ෂකයන් දෙදෙනෙකු හෝ කිහිප දෙනෙකු රක්ෂිතයා සමග ඇති කර ගන්නා තනි ගිවිසුමක්.

කොමිස්
රක්ෂකගේ නිෂ්පාදනයක් විකිණීම හෝ සේවාකරණය වෙනුවෙන් තැරැව්කරුවකුට හෝ රක්ෂණ නියෝජිතයෙකුට කරන ගෙවීමක්.

සංකේන්ද්‍රණ අවදානම
නෛසර්ගික ණය අවදානම යෝග්‍ය ලෙසින් අවම කරලීම පිණිස රක්ෂණ හිමියන්ගේ වත්කම් ප්‍රමාණවත් ලෙස විවිධාංගීකරණය වී නොමැති නම්, පවතින අතිරේක ණය අවදානම.

ණය අවදානම
ශ්‍රේණිගත සුරැකුම්පත් නිකුත් කරන්නන් (ආයෝජකයාගේ ආයෝජන කළඹෙහි), ණය ගැතියන්, (උදා: උකස්කරුවන්) හෝ ප්‍රතිපාර්ශවකරුවන් (උදා: ප්‍රතිරක්ෂණ ගිවිසුම්, ව්‍යුත්පන්න ගිවිසුම් හෝ තැන්පතු මත) සහ මැදිහත්කරුවන්ගේ ණය ප්‍රමාණන පැවරීම්වල පැහැර හැරීම් හෝ සංචලනයන් නිසා ඇති වන මූල්‍ය අලාභ අවදානම. ණය අවදානම තුළ පැහැර හැරීමේ අවදානම, අවශ්‍රේණිගත වීම හෝ සංක්‍රමණික අවදානම, වක්‍ර ණය හෝ ව්‍යාප්ත වීමේ අවදානම, සංකේන්ද්‍රණ අවදානම හා සහ සම්බන්ධ අවදානම අන්තර්ගත වේ. ණය අවදානම් මූලාශ්‍රයන්ට ආයෝජන ප්‍රතිපාර්ශවකරුවන් රක්ෂණ ඔප්පු හිමියන් (හිඟ වාරික හරහා)

පාරිභාෂික ශබ්ද මාලාව

ප්‍රතිරක්ෂණකරුවන්, මැදිහත්කරුවන් සහ ව්‍යුත්පන්න ප්‍රතිපාර්ශවකරුවන් ඇතුළත් වේ.

විලම්බිත අත්කර ගැනීමේ පිරිවැය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය
වාර්ෂික පදනමට ගිණුම්කරණයේ දී එක් ගිණුම් වර්ෂයක සිට ඊළඟ ගිණුම් වර්ෂයට ගෙන යා යුතු, අවදානම හා සම්බන්ධ ගිවිසුම්වල කල් ඉකුත් නොවූ කාලය සඳහා අදාළ වන අත්පත් කර ගැනීමේ පිරිවැය.

අත්හිටවූ මෙහෙයුම්
සමාගමක සමස්ත අංශයක්, අනුබද්ධිත ආයතනයක් හෝ කොටසක්, සමාගමෙන් ඉවත් කරලීම සඳහා විධිමත් සැලසුමක් පවතින විට ඒවායේ මෙහෙයුම්.

ඉපැයූ වාරික
වර්ෂය තුළ ඉපැයූ ලිඛිත වාරිකවලට වර්ෂය ආරම්භයේ දී සහ අවසානයේ දී ඇති නොඉපැයූ වාරික ආදායම ගලපා සකස් කරගත් වාරික ආදායමයි.

උත්පාදන/ දායාද
අභාග්‍ය සම්පන්න අවස්ථාවක දී රක්ෂිතයාගේ ජීවිතය පමණක් ආවරණය වනවාට අමතරව රක්ෂණ ඔප්පුව කල්පිරීමේ දී ප්‍රතිලාභ හිමිකර දෙන ජීවිත රක්ෂණ ගිවිසුම්. (නිශ්චිත කාල සීමාවකින් පසුව ("කල් පිරීමේ දී") හෝ මරණයේ දී එකවර මුදලක් ලබා දීම සඳහා වන ජීවිත රක්ෂණ ගිවිසුමක්.)

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු
ගිනි, මුහුදු උවදුරු, මෝටර් වාහන හෝ මිශ්‍ර රක්ෂණ ව්‍යාපාර කටයුතු එකක් හෝ කිහිපයක් තනිව හෝ ඒකාබද්ධව පවත්වාගෙන යාම. ගිණුම් කාල පරිච්ඡේදයක් තුළ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු සම්බන්ධව සියලු මූලාශ්‍ර වෙතින් ලද මුළු වාරික හෝ ලැබිය යුතු මුළු වාරික ප්‍රතිරක්ෂණ කටයුතු සඳහා ලැබිය යුතු වාරික ද සහිත අගය.

දළ ලිඛිත වාරිකය (GWP)
වට්ටම්, ආපසු ගෙවීම් හා ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසුව එහෙත් ඉඩ දෙන ලද ප්‍රතිරක්ෂණ සඳහා රක්ෂණකරුවෙකු විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු වාරික කිසිවක් අඩු කිරීමට පෙර වූ වාරිකය.

රක්ෂකයා
2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ පොදු සමාගමක් ලෙස සංස්ථාපිත කර ඇති සහ 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති සමාගමකි.

අහෝසි වූ ඔප්පුව
වාරික මුදල් නොගෙවීම මත සහන කාලය අවසානයේ දී අවලංගු වූ රක්ෂණාවරණය.

වගකීම් ප්‍රමාණිකතා පරීක්ෂණය (LAT)
අනාගත මූල්‍ය ප්‍රවාහයන්ගේ වර්තමාන අගය ඒවායේ රක්ෂණ ගිවිසුම් යටතේ යොදා ගනිමින් එහි හඳුනාගත් රක්ෂණ වගකීම් ප්‍රමාණවත් ද යන වග වාර්තා කරනු ලබන එක් එක් කාලසීමාව අවසානයේ ඇගයීම.

වගකීම් අවදානම
රක්ෂකයා විසින් ස්ථාපනය කරනු ලබන තාක්ෂණික සංචිත සහ ඔප්පු හිමියාගේ වගකීම් දැනට බලපවත්වන ඔප්පු සම්බන්ධ අනාගත හිමිකම් සහ වියදම් සඳහා ප්‍රමාණවත් වේවිද යන අවදානම.

ජීවිත අතිරික්තය
රක්ෂණ ඔප්පු හිමියන්ට ප්‍රසාද දීමනා බෙදා දීමෙන් පසුව, ජීවගණකාඥයා විසින් තීරණය කරනු ලබන (ණය ගෙවීමේ හැකියාවේ සීමා නීර්ණයන් සැලකිල්ලට ගනිමින්) වගකීම්වලට වඩා වත්කම්වල අතිරික්තය වේ.

දිගුකාලීන රක්ෂණය ව්‍යාපාරය
මරණයක හෝ මනුෂ්‍ය ජීවිතයට බලපාන යම් අවිනිශ්චිත සිද්ධියක් වූ විට මුදල් ගෙවීම සඳහා සහතික කෙරෙන ගිවිසුම ද ඇතුළුව මනුෂ්‍ය ජීවිතය පිළිබඳ රක්ෂණ ගිවිසුම්වලට සහ මනුෂ්‍ය ජීවිතය මත රඳා සිටිමින් යම් කාල පරිච්ඡේදයක් සඳහා වාරික ගෙවීමට යටත් ගිවිසුම්වලට වෙළඹීමේ හෝ එවැනි ගිවිසුම් පවත්වාගෙන යාමේ ව්‍යාපාරයකි.

වෙළඳපළ අවදානම
රක්ෂකයාගේ වත්කම්වල වෙළඳපළ වටිනාකම අඩුවීමේ අවදානම.

කල්පිරීම
දිගුකාලීන රක්ෂණ ඔප්පුවක් යටතේ එහි වගන්ති ප්‍රකාරව කාලය අවසන් වීමෙන් රක්ෂිත මුදල් ගෙවිය යුතු අවස්ථාව.

මරණ අනුපාතය
මුළු ජනගහනයට හෝ විශේෂිත වයස් කණ්ඩායමකට මරණ අනුපාතය. එය ගෝලීය වශයෙන් අනුපාත සංඛ්‍යාවන් ලෙසින් ප්‍රකාශිත අතර මරණ අනුපාත වගුව දක්වා ඇත.

ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය හෝ ශුද්ධ ඇලාභ අනුපාතය
ශුද්ධ හිමිකම් පෑමේ අනුපාතය, ප්‍රතිරක්ෂණකරුවන්ගෙන් අයකර ගත් පසු ශුද්ධ හිමිකම් පෑම, ප්‍රතිරක්ෂණකරුවන් වෙත වාරික ලබා දීමෙන් පසු ශුද්ධ වාරිකයෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරයි. දළ ලිඛිත හිමිකම් පෑමේ අනුපාතය, ප්‍රතිරක්ෂණය සැලකිල්ලට ගැනීමට පෙර පිහිටීම පිළිඹිබු කරයි.

අලාභ අනුපාතය විශයෙන් ද මෙය හැඳින්වේ.

$$\frac{\text{(දරණ ලද ශුද්ධ හිමිකම් පෑම්)}}{\text{(ඉපැයූ ශුද්ධ වාරික ආදායම)}} \times 100$$

ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර
ජීවිත නොවන ශුද්ධ අලාභ අනුපාතය සමග ශුද්ධ වියදම් අනුපාතය සම්බන්ධ කර රක්ෂකයාගේ මෙහෙයුම්වල ලාභදායීත්වය මෙයින් නිරූපණය වෙයි මෙම ඒකාබද්ධ අනුපාතය ගණනය කිරීමේ දී ආයෝජන ආදායම සැලකිල්ලට නොගැනෙයි.

$$\frac{\text{(දරණ ලද ශුද්ධ හිමිකම් පෑම් x 100)}}{\text{(ඉපැයූ ශුද්ධ වාරිකය)}} + \frac{\text{(වියදම් x 100)}}{\text{(ඉපැයූ ශුද්ධ වාරිකය)}}$$

ශුද්ධ ඉපැයූ වාරිකය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර
නොඉපැයූ වාරිකයේ අඩු වීම හෝ වැඩි වීම සහ දරන ලද ප්‍රතිරක්ෂණය අනුව සකස් කරන ලද දළ ලිඛිත වාරිකය.

ශුද්ධ වියදම් අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර
ජීවිත නොවන ආදායම් අත්පත් කර ගැනීමේ සහ පරිපාලන වියදම් (උදා: කොමිස්, බදු, සේවක පිරිවැය, අලෙවිකරණ සහ මෙහෙයුම් වියදම්) අදාළ කර ගැනීම සඳහා රක්ෂණ සමාගම් විසින් යොදා ගනු ලබන සූත්‍රයකි.

ශුද්ධ ලිඛිත වාරිකය යනු රක්ෂණ සමාගමක් විසින් යම් කාල සීමාවක් තුළ ලිඛිත වාරිකවල එකතුවෙන් ප්‍රතිරක්ෂණ සමාගම්වලට පවරා ඇති වාරික අඩු කර භාර ගන්නා ලද ඕනෑම ප්‍රතිරක්ෂකයන් එකතු කිරීම වේ. එමෙන්ම ලියා ඇති ශුද්ධ වාරික මඟින් අවදානම් උපකල්පනය කිරීම සඳහා සමාගමකට කොපමණ වාරික ප්‍රමාණයක් තබාගත හැකි ද යන්න නිරූපණය කරයි.

පාරිභාෂික ශබ්ද මාලාව

සහභාගීත්වය රහිත ඔප්පු - දිගුකාලීන රක්ෂණය ව්‍යාපාර
ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතුවලදී ඔප්පු හිමියාට අදාළ ජීවිත රක්ෂණ අරමුදලේ අතිරික්තයට හිමිකම ලැබීමට හිවිසුම්මය අයිතියක් නොමැති රක්ෂණ ඔප්පු.

එක් වරක් පමණක් ලැබෙන අතිරික්තය
2016 ජනවාරි 01 දිනට අවදානම් පාදක ප්‍රාග්ධන රිතිය යටතේ දළ වාරික තක්සේරු ක්‍රමවේදය අනුව මුළු රක්ෂණ වගකීම්වලට වඩා 2015 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වාරික තක්සේරු ක්‍රමවේදය අනුව මුළු ඔප්පු වගකීම්වල අතිරික්තය. (ඔප්පු වගකීම් තක්සේරු කිරීමේ ක්‍රමවේදය ශුද්ධ වාරික තක්සේරුවේ සිට දළ වාරික තක්සේරුවට වෙනස් වීම නිසා ඇති වූ අතිරික්තය)

එක් වරක් පමණක් ලැබෙන අතිරික්තය මාරු කිරීම
ඔප්පු වගකීම් තක්සේරු කිරීමේ ක්‍රමවේදය ශුද්ධ වාරික තක්සේරුවේ සිට දළ වාරික තක්සේරුව වෙත වෙනස් වීම නිසා ඇති වූ අතිරික්තය කොටස් හිමියන්ගේ අරමුදලට මාරු කිරීම.

මෙහෙයුම් ලාභය
ආයෝජන ආදායම්, ශුද්ධ ප්‍රාග්ධන ලාභ සහ වෙනත් ආදායම් සැලකිල්ලට ගත් පසු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවලින් උපයා ගන්නා ලද ලාභය.

මෙහෙයුම් අවදානම
මූල්‍යමය අලාභයන්ට හේතුවන අභ්‍යන්තර පද්ධතිවල, සේවක මණ්ඩලයේ කාර්ය පරිපාටි හෝ පාලනයන්හි ප්‍රමාණවත් නොවන බව හෝ අසාර්ථක වීම නිසා පැන නගින අවදානම. මෙහෙයුම් අවදානමට භාරකාරීත්ව අවදානම ද ඇතුළත් වේ.

ඔප්පුව
ඔප්පු හිමියා වෙත නිකුත් කරනු ලබන රක්ෂණ ගිවිසුමක නියම හා කොන්දේසි ඇතුළත් කර ඇති ලියවිල්ලකි.

ඔප්පු හිමියා
රක්ෂණකරු සමග අදාළ ගිවිසුමට පැමිණ අදාළ රක්ෂණ ඔප්පුවේ තත්කාලීන නෛතික හිමිකරු වන තැනැත්තා.

ඔප්පු ණය
ජීවිත රක්ෂණ ඔප්පුවක පවාරණ අගය ඇපයට තබමින් ඔප්පු හිමියෙකු විසින් රක්ෂකයාගෙන් ගනු ලබන ණය මුදලකි. මෙම ණය මුදල සාමාන්‍යයෙන් ඔප්පුවේ වර්තමාන පවාරන වටිනාකමේ ප්‍රතිශතයක් සඳහා සීමාවන අතර එවැනි ණය මුදල් සඳහා පොළී අය කරනු ලැබේ.

ප්‍රතිරක්ෂණය
එක් පාර්ශවයක් (ප්‍රතිරක්ෂකයා) විසින් කිසියම් ප්‍රතිශ්ඨාවක් සමග අනෙකුත් පාර්ශවයක් (ප්‍රතිරක්ෂිතයා - ප්‍රාථමික රක්ෂණකරු) විසින් ඔප්පුවක හෝ ඔප්පුවල වගකීම්වලින් කොටසක් හෝ මුළුමනින් ම හානිපූරණය කිරීමට ඇති කර ගනු ලබන එකඟතාවයකි.

ප්‍රතිරක්ෂණ කොමිස්
ප්‍රතිරක්ෂකයාට ගෙවූ හෝ ගෙවිය යුතු වාරිකවලට අදාළව ලැබුණු හෝ ලැබිය යුතු කොමිස් මුදල්.

භාර ගනු ලබන ප්‍රතිරක්ෂණ
ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් භාර ගැනීම.

භාර දෙනු ලබන ප්‍රතිරක්ෂණ
ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් ස්ථානගත කිරීම.

ප්‍රතිරක්ෂණ ලාභ කොමිස්
ප්‍රතිරක්ෂිත ගිවිසුමක් යටතේ ප්‍රතිරක්ෂිතයා විසින් උපයන ලද ශුද්ධ ලාභය (ප්‍රතිරක්ෂණ ගිවිසුමෙහි නිර්වචනය කර ඇති පරිදි) පාදක කරගෙන ප්‍රතිරක්ෂයෙකුගෙන් ප්‍රාථමික රක්ෂණ සමාගම් වෙත ලැබිය යුතු කොමිස් මුදල්.

සීමා කරන ලද නියාමන සංචිතය
16 වන විධිවිධානයට අනුව සහභාගීත්ව දිගුකාලීන ව්‍යාපාරය හැර කොටස් හිමියන්ගේ අරමුදලට මාරු කරන ලද එක් වරක් පමණක් ලැබෙන අතිරික්තය.

රඳවා ගැනීම
භාරගනු ලැබූ අවදානමින් රක්ෂණකරු/ ප්‍රතිරක්ෂණකරු විසින් ප්‍රතිරක්ෂණය කරනු නොලබන/ පවරනු නොලබන කොටස හෙවත් ස්වකීය ගිණුම් වෙනුවෙන් රඳවාගත් ආදායම.

ප්‍රතිපවරා දීම
ප්‍රතිරක්ෂකයා විසි ඇති අවදානම වෙනත් ප්‍රතිරක්ෂකයෙකු වෙත පැවරීම සිදු කරන ගණුදෙනුවකි.

නියමිත අවදානම් ප්‍රාග්ධනය (RCR)
2015 ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පදනම් වූ ප්‍රාග්ධනය) රිති ප්‍රකාරව තක්සේරු කරනු ලබන සහ නිශ්චය කරනු ලබන අවදානම් ප්‍රාග්ධන ගාස්තුවේ මුළු මුදල.

නියමිත අවදානම් ප්‍රාග්ධනය සාමාන්‍ය සහ දිගුකාලීන රක්ෂණය සඳහා වෙන් වෙන්ව ගණනය කරන අතර රක්ෂණය සහ කොටස් හිමියන්ගේ අරමුදල යන දෙකම ඇතුළත් වේ.

(අ) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා:
RCR = √: (ණය අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + සංකේන්ද්‍රණ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + ප්‍රතිරක්ෂණ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව) + වෙළඳපළ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව)^2 + වගකීම් අවදානම් ප්‍රාග්ධන ගාස්තුව^2 + මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන ගාස්තුව^2

සහ

(ආ) දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය:
RCR -උපරිම {(SVCC,[(ණය අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + සංකේන්ද්‍රණ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + ප්‍රතිරක්ෂණ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + වෙළඳපළ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව)^2 + වගකීම් අවදානම් ප්‍රාග්ධන ගාස්තුව^2 + මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන ගාස්තුව^2

ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පදනම් වූ ප්‍රාග්ධනය)
රක්ෂණ ඔප්පු හිමියන්ගේ වගකීම්වලට අදාළ තාක්ෂණික ප්‍රතිපාදන අවශ්‍යතාව සැපිරීමට රක්ෂණකරුවෙකු විසින් වෙන් කළ යුතු නිර්බාධීය වත්කම් නිර්ණයට අමතරව 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 26(1) වගන්තිය යටතේ ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පදනම් වූ ප්‍රාග්ධනය) රිති ප්‍රකාරව අර්ථ දක්වා ඇති රක්ෂණකරුවෙකු විසින් සැපිරිය යුතු පූර්ණ පවත්නා ප්‍රාග්ධන අවමය සහ ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාත අවමයෙහි අවශ්‍යතාවන්.

පවාරණ අගය
ජීවිත රක්ෂණයක් සම්බන්ධව එම රක්ෂණ ඔප්පුව කල්පිරීමට පෙර ඔප්පු හිමියකු ජීවිත රක්ෂණය අත්හිටුවීමේ දී රක්ෂකයා විසින් ඔප්පු හිමියාට ගෙවනු ලැබිය යුතු මුදල. පවාරණ අගයක් ඇතිවීම සඳහා අවම වශයෙන් වසර 3ක් වත් අඛණ්ඩව එම ජීවිත රක්ෂණ ඔප්පුව ක්‍රියාත්මකව පැවතිය යුතුය.

පවාරණ වටිනාකම් ප්‍රාග්ධන ගාස්තු (SVCC)
සියලු ජීවිත රක්ෂණ ගිවිසුම් සමගාමීව පවාරණය වී ඇති විට, අත්‍යන්ත හානිකර වාතාවරණයක් පිළිබඳ පවත්නා අවදානම.

කාලීන රක්ෂණය
කිසියම් කාල පරිච්ඡේදයක් සඳහා හෝ නිශ්චිත වසර කාල සීමාවකට ආවරණය සපයා දෙන ජීවිත රක්ෂණ ඔප්පු වර්ගයකි.

පාරිභාෂික ශබ්ද මාලාව

ඔප්පුවෙහි සඳහන් කර ඇති කාලසීමාව තුළ රක්ෂණකරු මියයාමකදී ඔප්පුව සක්‍රීයව පවතින්නේ නම් හෝ බලාත්මකව පවතී නම් මරණ ප්‍රතිලාභය ගෙවනු ලැබේ.

තාක්ෂණික ප්‍රතිපාදන
ස්වකීය රක්ෂණ බැඳියාවන් ඉටු කිරීමට සහ ඔප්පු හිමියන්ගේ සියලුම වගකීම් නිරාකරණය කිරීමට ඔප්පුවල පරිපාලන කටයුතු සඳහා, ප්‍රතිරක්ෂණය සඳහා සහ ඉතිරිව ඇති අවදානම් ආවරණය කිරීම සඳහා වන වියදම් ද වෙනුවෙන් රක්ෂණකරුවකු විසින් වෙන් කරනු ලබන මුදල් ප්‍රමාණය වේ.

පළමු වන ස්ථරයේ ප්‍රාග්ධනය
ක්‍රියාත්මකව පවතින විට සහ ඈවර කිරීමේ දී යන අවස්ථා දෙකෙහි සියලු අවස්ථාවන්හි දී රක්ෂණකරුවෙකුගේ අලාභ ආවරණය කිරීම සඳහා පූර්ණ වශයෙන් පවතින ස්ථිර ප්‍රාග්ධනය.

දෙවන ස්ථරයේ ප්‍රාග්ධනය
පළමුවන ස්ථරයේ ප්‍රාග්ධනයේ ඇතැම් අන්තර්ග්‍රහණ ලක්ෂණ මෙහි නොමැති වුවද, ක්‍රියාත්මකව පවතින විට සහ ඈවර කිරීමේ දී කිසියම් අලාභ අවශෝෂණයක් සපයා දෙන ප්‍රාග්ධනය.

පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (TAC)
පළමු වන ස්ථරයේ ප්‍රාග්ධනය සහ දෙවන ස්ථරයේ ප්‍රාග්ධනය එකතු කර 2015 ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පදනම් වූ ප්‍රාග්ධනය) ඊති ප්‍රකාරව කිසියම් නියමිත අඩුකිරීම් සිදු කිරීමෙන් පූර්ණ පවත්නා ප්‍රාග්ධනය නිර්ණය කරනු ලබයි.

ප්‍රාරක්ෂණ ලාභය
ආයෝජන ආදායම සහ අනෙකුත් ආදායම් සැලකිල්ලට නොගෙන සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ගනුදෙනු මගින් උත්පාදනය කර ගනු ලබන තාක්ෂණික ලාභය.

නොඉපැයූ වාරිකය
ගෙවීමට නියමිතව ඇතැයි හිණුම්වලට මේ වන විටත් ඇතුළත් කරනු ලැබ ඇති නමුත් ශේෂ පත්‍ර දිනට අනතුරුව වළඹෙන යම් අවදානම් කාල සීමාවකට අදාළ වාරික මුදල්වල කොටසක් මෙයින් නියෝජනය වෙයි.

නොඉපැයූ වාරික සංචිතය
දැනටමත් ක්‍රියාත්මකව පවතින රක්ෂණ ඔප්පු යටතේ අනාගතයේ දී උද්ගත විය හැකි හිමිකම් පෑම් සඳහා ප්‍රතිපාදනය කිරීම අරඹයා සාමාන්‍ය රක්ෂණකරු විසින් පවත්වාගෙන යනු ලබන අරමුදලකි.

කල් ඉකුත් නොවූ අවදානම් සංචිතය
ශේෂ පත්‍ර දිනට පෙර ගිවිසුම් හමාර කළ නමුත් ශේෂ පත්‍ර දිනයෙන් පසුව ඇති විය හැකි හිමිකම් පෑම්වල වන්දි සහ වියදම් සඳහා ඇස්තමේන්තු කළ අගයෙන් මේ දක්වා නොඉපැයූ වාරික වශයෙන් (කිසියම් විලම්භිත අත්පත් කර ගැනීමේ පිරිවැයක් ඇත්නම් එය අඩු කළ පසු) ප්‍රතිපාදනය කරන ලද අගය ඉක්මවා යන ප්‍රමාණය.

සර්වත්‍ර ආයුකාලය
ආයෝජන ඉතිරි කිරීමේ සංරචකය සහ අඩු වාරික සහිත කාලීන ජීවිත රක්ෂණය වැනි ස්ථිර ජීවිත රක්ෂණය. බොහෝමයක් සර්වත්‍ර ජීවිත රක්ෂණ ඔප්පුවල නම්‍යශීලී වාරික විකල්පයන් අඩංගු වේ. තවද, ඇතැම් තනි වාරික (එක්වර ගෙවන තනි වාරිකය) හෝ ස්ථිර වාරික (නියමිත ස්ථිර වාරික) අවශ්‍ය කෙරේ.

පූර්ණ ජීවිත රක්ෂණය
පූර්ණ ජීවිත රක්ෂණය, රක්ෂණය වූ තැනැත්තාගේ ජීවිතය සඳහා ආවරණය සපයයි. මරණ ප්‍රතිලාභයක් ලබා දීමට අමතරව, මුදල් වටිනාකම ක්‍රමයෙන් එක් රැස්වන ඉතිරි කිරීමේ සංරචකයක්ද පූර්ණ ජීවිත රක්ෂණයෙහි අන්තර්ගත වේ. මෙම ඔප්පු ස්ථිර හෝ සාම්ප්‍රදායික ජීවිත රක්ෂණ ලෙසින් ද හඳුන්වනු ලැබේ

සටහන්

සටහන්

පොදු තොරතුරු

කාර්යාලීය ලිපිනය
11 මහල, නැගෙනහිර කුළුන, ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01
ශ්‍රී ලංකාව.

දුරකථන : +94112396184-9
ෆැක්ස් : +94112396190
ඊමේල් : info@ircsl.gov.lk
වෙබ් අඩවිය : www.ircsl.gov.lk

නෛතික ආකෘතිය
2001 පෙබරවාරි 23 දිනැති අංක 1172/27 දරණ රජයේ ගැසට් පත්‍රය මගින් 2001 මාර්තු 01 දින සිට ක්‍රියාකාරී තත්වයට පත් වූ 2000 අංක 40 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත ප්‍රකාරව ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

කොමිෂන් සභාවේ අරමුණ හා වගකීම
කොමිෂන් සභාවේ අරමුණ සහ වගකීම වන්නේ ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරය අවංකව, වෘත්තීමය වශයෙන් හා විචක්ෂණශීලීභාවයෙන් පවත්වාගෙන යාම තුළින් ඔප්පු හිමියන්ගේ සහ අනාගත ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කිරීම.

ගිණුම්කරණ වර්ෂය
31 දෙසැම්බර්

විගණකයන්
විගණකාධිපති

බැංකුකරුවන්
ලංකා බැංකුව

විගණන කමිටුව
ආර්. එම්. පී. රත්නායක මහතා
ඉවෙට් ප්‍රනාන්දු මහත්මිය
හරිස් සල්පිටිකෝරාල මහතා
ඉන්ද්‍රා බදුගේ මෙනවිය



ශ්‍රී ලංකා
රක්ෂණ නියාමන
කොමිෂන් සභාව

11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන : +94 11 2396184-9 | ෆැක්ස් : +94 11 2396190
විද්‍යුත් තැපෑල : info@ircsl.gov.lk | වෙබ් අඩවිය : www.ircsl.gov.lk